ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, තමුන්නාන්සේම දන්නවා, heart surgeries කරන්න ගියාම තිබෙන ප්‍රශ්නය. Waiting list එකේ ඉඳලා මිනිස්සු මැරිලා යනවා. ඒක විසඳන්න තවම ක්‍රියා මාර්ගයක් අරගෙන නැහැ. මම අහන්නේ මේ ප්‍රායෝගික ප්‍රශ්නයට විසඳුම මොකක්ද කියායි. නිදහස් අධ්‍යාපනය දෙන එක ගැන නොවෙයි අහන්නේ. වෛද්‍යවරු කී දාහක් විදේශ රටවලට ගිහින් තිබෙනවාද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
තමුන්නාන්සේලා විදේශ රටවල් එක්ක අපේ රට සංසන්දනය කළා නේ. මම කිව්වේ එහෙම සංසන්දනය කරන්න එපාය කියායි. අද අපේ රටේ වෛද්‍යවරයෙක් බිහි කරන්න කිසිම මුදලක් අය වෙන්නේ නැහැ. පිට රට සහ මේ රටේ තිබෙන වෙනස ගැනයි මම කිව්වේ. රට හැර යන එක නවත්වන්න බැහැ. රටට ආදරේ මිනිස්සු මේ රටේ ජීවත් වෙනවා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, සුදුසුකම් නැති වෛද්‍යවරු ඇවිත් අපේ රටේ පෞද්ගලික රෝහල්වල විශාල වශයෙන් සේවය කරනවා. දැන් වෛද්‍ය සභාව තහනම් කර තිබෙනවා. මම අහන්නේ මෙයයි. ලංකාවේ සිටින පිරිස වැඩි වැටුප් ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් බහුල වශයෙන් විදේශ රටවලට ඇදිලා යනවා. මේ නිසා අද ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. වෛද්‍යවරුන්ගේ හිඟයක් තිබෙනවා. සුදුසුකම් නැති අය මෙහෙ සිටිනවා. මේ තත්ත්වය නැති කරන්න තමුන්නාන්සේලා ගන්නා ස්ථිරසාර ක්‍රියා මාර්ගයක් කියන්න.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතක් තිබෙනවා. පැහැදිලිවම යම් ආයතනයක් නිසියාකාරයෙන් කටයුතු නොකරනවා නම් වෛද්‍ය සභාවට පැමිණිලි කර ඒ අනුව කටයුතු කරන්නත් පුළුවන්. ඒ වාගේම ඔබතුමා කී ආකාරයට අපට මෙන්න මේ ආයතනයේ මේ විධියට සුදුසුකම් නැති වෛද්‍යවරු සේවය කරනවාය කියා පැමිණිල්ලක් ලැබුණොත් අපි ඒ අනුව කටයුතු කරනවා. ඒ ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. ඒ නිසා මේක මතයක් හැටියට කියනවා. මෙච්චර සංඛ්‍යාවක් හොර වෛද්‍යවරු සිටිනවාය කියා -එහෙම කියන්න පුළුවන්.- අපිට පැමිණිල්ලක් ලැබුණොත් අනිවාර්යයෙන්ම ඒ ගැන සොයා බලනවා. හොර වෛද්‍යවරයෙක් අහු වුණොත් අදාළ දඬුවම දෙනවා.

## අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටික නීතිය : පැනවීම
## நீதிமன்றத்தை அவமதித்தல் தொடர்பான நடைமுறைச் சட்டம்: விதிப்பு
## PROCEDURAL LAW ON CONTEMPT OF COURT : IMPOSITION

2917/'12

6. **ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) අධිකරණයට අපහාස කිරීම පිළිබඳ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන කාර්ය පටිපාටික නීතියක් නොපවතින බවත්;

(ii) ශ්‍රී ලංකාව තුළ අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටික නීතියක් පැනවීම සිදු කළ යුතු බව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව විසින් "ටොනි ෆනැන්ඩු" නඩුවේදී නිර්දේශ කර ඇති බවත්;

(iii) අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටික නීති කෙටුම්පතක් ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් අනුමත කොට, අධිකරණ අමාත්‍යාංශය වෙත ලබාදී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව තුළ අධිකරණයට අපහාස කිරීමට අදාළව කාර්ය පටිපාටික නීතියක් ඉක්මනින් පැනවිය යුතු බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඊට අදාළ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நீதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நீதிமன்றத்தை அவமதித்தல் தொடர்பில் இலங்கையில் அமுலிலுள்ள நடைமுறைச் சட்ட மொன்று கிடையாதென்பதையும்;

(ii) இலங்கையினுள் நீதிமன்றத்தை அவமதித்தல் தொடர்பாக நடைமுறைச் சட்டமொன்று விதிக்கப்படல் வேண்டுமென ஐக்கிய நாடுகள் மனித உரிமைகள் குழுவினால் "ரொனீ பர்னாந்து" வழக்கில் விதப்புரை செய்யப் பட்டுள்ளதென்பதையும்;

(iii) நீதிமன்றத்தை அவமதித்தல் தொடர்பான நடைமுறைச் சட்டமூலம் ஒன்று இலங்கைச் சட்டத்தரணிகள் சங்கத்தினால் அங்கீகரிக்கப் பட்டு நீதி அமைச்சரிடம் வழங்கப்பட்டுள்ள தென்பதையும் அவர் அறிவாரா?

(ஆ) (i) இலங்கையினுள் நீதிமன்றத்தை அவமதித்தல் தொடர்பாக நடைமுறைச்சட்டமொன்று விரை விலேயே விதிக்கப்படல் வேண்டுமென்பதை அவர் ஏற்றுக்கொள்கிறாராவென்பதையும்;

(ii) ஆமெனில், அதனோடு தொடர்புடைய சட்ட மூலத்தை பாராளுமன்றத்தில் சமர்ப்பிக்கும் திகதி யாதென்பதையும் அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

asked the Minister of Justice:

(a) Is he aware that -

(i) there is no procedural law on contempt of court in effect in Sri Lanka;

(ii) it has been recommended by the United Nations Human Rights Committee in the "Tony Fernando" case that a procedural law on contempt of court should be imposed in Sri Lanka; and

(iii) a draft of the procedural law on contempt of court has been passed by the Bar Association of Sri Lanka and submitted to the Ministry of Justice?

(b) Will he state -

(i) whether he admits that a procedural law in relation to contempt of court should be imposed in Sri Lanka soon; and

(ii) if so, the date on which the relevant Bill will be moved in Parliament?

(c) If not, why?

**ගරු රවුෆ් හකීම් මහතා (අධිකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு றவுப் ஹக்கீம் - நீதி அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of Justice)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) (i) ශ්‍රී ලංකාව තුළ දැනට අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටික නීතියක් පවතී. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 65 (LXV) පරිච්ඡේදයේ අධිකරණයට අපහාස කිරීම පිළිබඳ ලඝු කාර්ය පටිපාටිය පිළිබඳ විධිවිධාන යොදවා ඇත.

(ii) ඔව්.

(iii) ඔව්.

(ආ) (i) ඔව්. දැනට මේ සම්බන්ධයෙන් පවතින සිවිල් නඩුවිධාන සංග්‍රහයේ විධිවිධාන ඇතත්, සෑම අධිකරණයකටම අදාළ කර ගත හැකි වන පරිපූර්ණ නීතියක් සැකසීම වඩාත් සුදුසු යයි හැඟේ.

(ii) මේ සම්බන්ධයෙන් දැනට ශ්‍රී ලංකා නීතිඥ සංගමය සහ ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාව විසින් කෙටුම්පත් දෙකක් සකස් කර අධිකරණ අමාත්‍යාංශයේ අවධානය පිණිස යොමු කර ඇත. එම පනත් දෙක අධ්‍යයනය කිරීමෙන් සහ අදාළ විවිධ ක්ෂේත්‍රයන් සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව කෙටුම්පත් සකස් කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි. පහළ අධිකරණවලට එනම් දිසා අධිකරණය දක්වා අධිකරණවලට අදාළව මේ කාර්ය පටිපාටිය තිබුණත් මහාධිකරණය, පළාත්බද මහාධිකරණය, අභියාචනාධිකරණය සහ ශ්‍රේෂ්ඨාධිකරණය කියන අධිකරණ හතර සඳහාම කාර්ය පටිපාටික නීතියක් නැහැ.

ඒ වාගේම පසු ගිය දවස්වල සිදු වුණු අත් දැකීම් දිහා බලන කොට ඉතා ඉක්මනින්ම මේ කාර්ය පටිපාටික නීතිය හඳුන්වා දීමේ අවශ්‍යතාව මතු වෙලා තිබෙනවා. ඔබතුමා මේ කාරණයට ප්‍රමුඛත්වයක් දෙනවාද කියන කාරණය මම දැන ගන්න කැමැතියි.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவுப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
ගරු කථානායකතුමනි, මෑතකදී සභාව කල් තබන අවස්ථාවේදී මේ පිළිබඳව යෝජනාවක් ඉදිරිපත් කර විවාදයකුත් පැවැත් වුවා. එහිදීත් අපි මේ පිළිබඳව සඳහන් කළා.

ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාව විසින් දැනටම ඒ පිළිබඳව වූ පනත් කෙටුම්පතක් සකස් කර, අපට යොමු කර තිබෙනවා. ඒකට අවශ්‍ය කැබිනට් අනුමැතිය ලබා ගැනීමෙන් පසුව අප පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ විෂයය සම්බන්ධවම මතු වන තවත් ප්‍රශ්නයක් තිබෙනවා. ශ්‍රී ලංකා නීති විද්‍යාලය හා සම්බන්ධ නීති අධ්‍යාපන සභාව ඔබතුමාගේ විෂය පථයටයි අයිති වෙන්නේ. නීති අධ්‍යාපන සභා පනතේ 7(අ) වගන්තිය අනුව ප්‍රතිපත්තිමය කරුණු තීරණය කිරීම ඔබතුමා වෙත පැවරිලා තිබෙනවා. නීති විද්‍යාල ප්‍රවේශ විභාගයේ විෂය නිර්දේශය වෙනස් කිරීමට තීරණය කර තිබෙනවා. ඒ අලුත් විෂය නිර්දේශය ඉතාම සුදුසු විෂය නිර්දේශයක්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ ප්‍රශ්නය මෙයට අදාළද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
නමුත් එක කරුණක්-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ ප්‍රශ්නයට අදාළ නැහැ නේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, එතුමාට උත්තර දෙන්න පුළුවන්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම බැහැ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
එකම කරුණක් ගරු ඇමතිතුමනි. දැන් ඒ පිළිබඳව ඔබතුමාගේ ස්ථාවරය කුමක්ද කියලා දැන ගන්න කැමැතියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ අතුරු ප්‍රශ්නය අදාළ නැහැ. ඒ නිසා ඊළඟ ප්‍රශ්නයට යනවා. ක්‍රමවේදය අනුගමනය කරන්න.

## ගොනාමුල්ල වැවේගොඩ තේ කර්මාන්තශාලාව : නිෂ්පාදනය යළි ආරම්භ කිරීම
### கொனாமுல்ல வெவேகொட தேயிலைத் தொழிற்சாலை : உற்பத்தியை மீள ஆரம்பித்தல்
### GONAMULLA, WEWEGODA TEA FACTORY : RESTARTING OF PRODUCTION

1953/'11

7. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, අක්මීමන ප්‍රදේශයේ, තල්ගම්පල, ගොනාමුල්ල වැවේගොඩ තේ කර්මාන්ත ශාලාව වර්ෂ පහක පමණ කාලයක සිට වසා දමා ඇති බවත්;

(ii) එම නිසා ප්‍රදේශයේ කුඩා තේ වතු හිමියන්ට තම තේ දළු අලෙවි කර ගැනීමේදී ගැටලු රැසකට මුහුණ පෑමට සිදුවී ඇති බවත්;

(iii) ඉහත කර්මාන්ත ශාලාව තුළ රුපියල් කෝටියකට වඩා වටිනා දේපළ දිරාපත් වෙමින් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම තේ කම්හල වසා දැමීමට හේතු වූ කරුණු කවරේද;

(ii) එවැනි තේ කම්හලක් විනාශ වී යාමට හැරීම ජාතික අපරාධයක් බැවින් එහි නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කිරීමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) காலி மாவட்டத்தின், அக்மீமன பிரதேசத்தின் தல்கம்பல கொனாமுல்ல வெவேகொட தேயிலைத் தொழிற்சாலை ஐந்து வருட காலமாக மூடப்பட்டுள்ளதென்பதையும்;

(ii) இதன் காரணமாக பிரதேசத்தைச் சேர்ந்த சிறு தேயிலைத் தோட்ட உரிமையாளர்களுக்குத் தமது தேயிலைக் கொழுந்துகளை விற்பனை செய்வதில் பல்வேறு சிரமங்களை எதிர்கொள்ள நேரிட்டுள்ளதென்பதையும்;

(iii) மேற்படி தொழிற்சாலையில் ரூபா ஒரு கோடிக்கு அதிகமான பெறுமதியுடைய ஆதனங்கள் சேதமடைந்து வருகின்றதென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி தேயிலைத் தொழிற்சாலை மூடப் பட்டமைக்கான காரணங்கள் யாவையென்பதையும்;

(ii) இவ்வாறான தேயிலைத் தொழிற்சாலை யொன்றை அழிவதற்கு இடமளிப்பதானது பெரும் தவறாகும் என்பதால் அதன் உற்பத்திப் பணிகளை மீள ஆரம்பிப்பதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(iii) ஆமெனில், அத்திகதி யாதென்பதையும் அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation Industries:

(a) Is he aware that-

(i) the tea factory of Thalgampola, Gonamulla, Wewegoda in Akmeemana of Galle District has been closed for about five years now;

(ii) therefore, the tea smallholders of the said area have to face several difficulties, in selling their leaf tea; and

(iii) property, valued over ten million rupees, is going waste inside the aforesaid factory?

(b) Will he state -

(i) the reasons for the closure of that tea factory;

(ii) whether steps will be taken to restart production, as it is a national crime to leave such a tea factory to destruction; and

(iii) if so, when?

(c) If not, why?

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க)
(The Hon. Mahinda Samarasinghe)
ගරු කථානායකතුමනි, ප්‍රශ්නයට පිළිතුර.

(අ) (i) රජය සතු වතු 1992 වර්ෂයේදී පෞද්ගලීකරණය කරන ලද අවස්ථාවේ සිට්‍රස් වතු යාය, අනෙකුත් වතු 24ක් සමඟ වර්ෂ 53ක බදු කාලයක් සඳහා නමුණුකුල වැවිලි සමාගමට බදු පදනම යටතේ ලබාදී ඇත.

සිට්‍රස් වතු යායේ වැවේගොඩ කොටසේ ස්ථාපිත කර ඇති වැවේගොඩ තේ කර්මාන්ත ශාලාව පිටතින් දළු මිලදී ගෙන පවත්වා ගෙන යන ලද නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් වන අතර, පිටතින් අමු දළු ලබා ගැනීමේ අපහසුතා හේතුවෙන් 2008.09.04 දින සිට වසා දමා ඇත.

(ii) ප්‍රදේශයේ අලුතින් ඉදි කරන ලද පෞද්ගලික තේ කර්මාන්තශාලා කිහිපයක් පවතින බැවින් ගැටලුකාරී තත්ත්වයක් මතු වී නොමැත.

(iii) නමුණුකුල වැවිලි සමාගමට අයත් එම ප්‍රදේශයේ ඇති තවත් කර්මාන්තශාලා හයකට සේවා සැපයෙන නැවත තේ සැකසුම් කරන - tea

[ගරු මහින්ද සමරසිංහ මහතා]

reprocessing - කර්මාන්ත ශාලාවක් ලෙස මෙම කර්මාන්තශාලාව පවත්වාගෙන යාම සඳහා අලුත්වැඩියා කර ආරම්භ කිරීමට කටයුතු කර ඇත.

(ආ) (i) පෞද්ගලික තේ කර්මාන්තශාලා මෙම ප්‍රදේශයේ අලුතෙන් බිහිවීමත් සමඟ මෙම කර්මාන්ත ශාලාව උපරිම ධාරිතාවක් ලාභදායීව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය අමු තේ දළු ප්‍රමාණය පිටතින් ලබා ගැනීමට නොහැකි විය.

(ii) නැවත ආරම්භ කිරීමට පියවර ගෙන ඇත. නමුණුකුල වැවිලි සමාගමට අයත් එම ප්‍රදේශයේ ඇති අනෙකුත් කර්මාන්ත ශාලා හයකට සේවා සැපයෙන නැවත තේ සැකසුම් කරන - tea reprocessing - කර්මාන්ත ශාලාවක් ලෙස පවත්වා ගෙන යාම සඳහා ඇලුත්වැඩියා කර ආරම්භ කිරීමට කටයුතු කර ඇත.

(iii) කර්මාන්තශාලාව 2013 අප්‍රේල් මාසයේ 1වැනි දා විවෘත කරන්න සූදානම් බවට නමුණුකුල වැවිලි සමාගම ලිඛිතව අපට දැනුම් දීලා තිබෙනවා.

(ඇ) අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. තේ දළු කිලෝ 12,000ත්- 20,000ත් අතර ප්‍රමාණයක් අඹරපු මේ තේ කම්හලේ සේවකයන් 100ක් විතර හිටියා. ඒක වසා දමනවාත් එක්කම එහි සේවකයන් සිය දෙනෙකුගේ රැකියා අහිමි වුණා. ඒ අයගේ රැකියා අහිමි වීමෙන් ඔවුන් ලොකු අපහසුතාවට පත් වුණා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නයක් හැටියට අහන්න. ප්‍රශ්නයක් හැටියට අහන්නේ නැත්නම් මම ඊ ළඟ ප්‍රශ්නයට යනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මොකක්ද මේ සේවකයන් සිය දෙනා සම්බන්ධව ගන්නා වූ ක්‍රියා මාර්ගය?

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க)
(The Hon. Mahinda Samarasinghe)
ඒ කියන්නේ රැකියා-

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඒ සිය දෙනාට අලුතෙන් ආරම්භ කරන කර්මාන්තශාලාව තුළ රැකියා ලැබෙනවාද? එහෙම නැත්නම් ඒ අයට වෙන විකල්ප හොයා ගන්න-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එක අතුරු ප්‍රශ්නයක් අහලා අනෙක් අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க)
(The Hon. Mahinda Samarasinghe)
මම ඒක ගරු මන්ත්‍රීතුමාට හොයලා දන්වන්නම්.

ඒ පිළිබඳව අපි දරන මතයත් ගරු මන්ත්‍රීතුමා දරන මතයම තමයි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඒ කියන්නේ?

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க)
(The Hon. Mahinda Samarasinghe)
ඒ අයට ප්‍රමුඛත්වය දිය යුතුයි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. මේ තේ කර්මාන්තශාලාව සතුව රුපියල් ලක්ෂ ගණනක් වටිනා යන්ත්‍ර සූත්‍ර පැවතුණා. දැන් ගරු ඇමතිතුමනි, ඔබතුමා සඳහන් කළා, මේ කර්මාන්තශාලාව බදු දුන්නා කියලා. මේ කම්හල පිළිසකර කරන්නට කලින් මෙහි තිබුණු සමහර යන්ත්‍ර සූත්‍ර මේ සමාගම වෙනත් ප්‍රදේශවල තිබෙන කර්මාන්තශාලාවලට ගෙන ගියා. රජය සතු දේපොළක් බදු දීමක් නේ මේ වෙලා තිබෙන්නේ. එතකොට මේ යන්ත්‍ර සූත්‍රවලට මොකද වෙන්නේ? මේ යන්ත්‍ර සූත්‍ර ආපසු ගෙනෙනවාද? මොකක්ද ගන්නා ක්‍රියා මාර්ගය? ඒ ගැන රජයේ තක්සේරුවක් තිබෙනවාද?

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க)
(The Hon. Mahinda Samarasinghe)
ඔබතුමා අහපු මූලික ප්‍රශ්නයට උත්තරයක් හැටියට මා පැහැදිලිව කිව්වා, 2013 අප්‍රේල් මාසයේ 01 වැනිදා නමුනුකුල වතු සමාගම අපට දන්වා තිබෙනවා කියලා නැවත වරක් කර්මාන්තශාලාව ආරම්භ කරන්න සූදානම් වෙලා ඉන්න බව. ඉතින් යන්ත්‍ර සූත්‍ර පදනම් කරගෙනයි කර්මාන්තශාලාව ක්‍රියාත්මක කරන්න වෙන්නේ. ඔබතුමාගේ මූලික ප්‍රශ්නයේදී යන්ත්‍ර සූත්‍ර පිළිබඳව අහලා තිබුණේ නැති නිසා මට පුළුල් උත්තරයක් දෙන්න බැහැ. මා ඒ ගැන හොයා බලා ඔබතුමාට පසුව උත්තරයක් ලබා දෙන්නම්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ මූලික ප්‍රශ්නයේ (අ)(iii) යටතේ ඒ සම්බන්ධයෙන් අහලා තිබෙනවා. කර්මාන්තශාලාවේ දේපොළ කිව්වාම ඒකේ තිබෙන ගොඩනැඟිලි විතරක් නොවෙයි, යන්ත්‍ර සූත්‍රත් ඇතුළත්. දැන් ගරු ඇමතිතුමා කියනවා මේක විවෘත කරනවා කියලා. හැබැයි විවෘත කරන්නේ තවදුරටත් තේ කර්මාන්තශාලාවක් විධියටද කියලා මා දැන ගන්න කැමැතියි. නැත්නම් අවට තේ කර්මාන්තශාලාවලට යම් පහසුකම් සලසන ආයතනයක් විධියට නම් අර සියලුම යන්ත්‍ර සූත්‍ර මෙතැන ස්ථානගත නොවීමේ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ කියන්නේ මෙතැන තිබී පිට තැන්වලට ගෙන ගිය යන්ත්‍ර සූත්‍ර ආපසු මෙතැනට නොපැමිණීමේ අවදානමක් තිබෙනවා. ඒ ගැන ගරු ඇමතිතුමා හොයා බලා පරීක්ෂණයක් කරනවාද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සාකච්ඡා කරන්න අවශ්‍ය නම් සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ගෙනෙන්න වෙලාවක් ඉල්ලා ගන්න.

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க)
(The Hon. Mahinda Samarasinghe)
අපි මේ කර්මාන්තශාලාව නමුණුකුල වතු සමාගමට දීලා තිබෙන්නේ බදු ක්‍රමයකටයි. එතකොට ඒ යන්ත්‍ර සූත්‍ර පිළිබඳ වගකීම නමුණුකුල වතු සමාගම දරන්න ඕනෑ. ඒ පිළිබඳව අපි සොයා බලා ඔබතුමාට කියන්නම්. යන්ත්‍ර සූත්‍රවල අඩු පාඩුවක් තිබෙනවා නම්, ඒකට ඒ නමුණුකුල වතු සමාගම වග කියන්න ඕනෑ. එහි තිබෙන යන්ත්‍ර සූත්‍ර ඒගොල්ලන්ට අයිති යන්ත්‍ර සූත්‍ර නොවෙයි. මේ කර්මාන්තශාලාව ඔවුන්ට දීලා තිබෙන්නේ බදු ක්‍රමයකටයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 8 - 2282/'12 - (1), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම ඒ ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 9 - 2464/'12 - (1), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම ඒ ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇමතිතුමා නැති නිසාද පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලන්නේ? දැන් ඇමති මණ්ඩලයේ 67ක් ඉන්නවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මේ වෙලාවේ ගරු ඇමතිතුමා සභාවේ නැහැ. එපමණයි මට කියන්න පුළුවන්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දවල් කෑම වෙලාවේ සිටියා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කෑම වෙලාවේ සිටියාට දැන් මේ ගරු සභාවේ නැහැ නේ? කෑම වෙලාවේ එතැන සිටියේ කවුද කියලා මම කොහොමද දන්නේ?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මෙතුමා ලොකු කාර්ය භාරයක් ඉෂ්ට කරනවා. ඒක අගය කරනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 10 - 1955/'11 - (1), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

අලුත් අධ්‍යාපන ඇමතිතුමාත්, නියෝජ්‍ය ඇමතිතුමාත් මේ ගරු සභාවේ නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එය අනවශ්‍ය දෙයක්. පාර්ලිමේන්තු සම්ප්‍රදාය ගැන, පාර්ලිමේන්තුවේ කථා කරන විධිය ගැන තමුන්නාන්සේ තව හුඟක් දේවල් ඉගෙන ගන්න ඕනෑ. තමුන්නාන්සේට මෙහෙම කථා කරන්න ඉඩ දෙන්න බැහැ. මෙතැන වේදිකාවක් කර ගන්න දෙන්න බැහැ. ප්‍රශ්නය පිළිවෙළකට අහන්න. ගරු මන්ත්‍රීතුමනි, නැවත ස්ථාවර නියෝග කියවන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නය අහන්නේ පළමුවැනි වරටයි. අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම ඒ ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 11 -2373/'12- (1), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා (සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன - சிவில் விமான சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Gitanjana Gunawardena - Deputy Minister of Civil Aviation)
ගරු කථානායකතුමනි, සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඇමතිතුමන්ලා නිවාඩු ගත කරන්න ගිහිල්ලා වාගෙයි.

## වී වගාව සඳහා සහනාධාර : වෙන් කළ මුදල
## நெற்செய்கை மானியம் : ஒதுக்கிய தொகை
## SUBSIDIES FOR PADDY CULTIVATION : FUNDS ALLOCATED

2466/'12

12.**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) 2006 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ කාලය තුළ එක් එක් වර්ෂයේදී,

(i) වී වගාව සඳහා සහනාධාර ලබා දීම සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) යල හා මහ කන්නවල මුළු වී අස්වැන්න කොපමණද;

(iii) එක් එක් දිස්ත්‍රික්කයෙහි අක්කරයකින් ලැබූ සාමාන්‍ය අස්වනු ප්‍රමාණය කොපමණද;

(iv) යල සහ මහ කන්නවල වී අස්වනු ප්‍රමාණයන් 2005 වර්ෂයේ යල සහ මහ කන්න හා සංසන්දනාත්මකව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ගොවීන්ට ලබා දුන් සහනාධාරය ඔවුන්ගේ නිෂ්පාදනය වැඩි කිරීමටත්, රටේ වී අස්වනු ප්‍රමාණය ඉහළ නැංවීමටත් ඉවහල් වී තිබේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2006 ஆம் ஆண்டு முதல் 2012 ஆம் ஆண்டு வரையான காலப்பகுதியில், ஆண்டு அடிப்படையில் வெவ் வேறாக,

(i) நெற்பயிர்ச்செய்கைக்கு மானியமாகக் கொடுப்பதற்கு ஒதுக்கப்பட்ட தொகையையும்;

(ii) சிறுபோக மற்றும் பெரும்போகத்தின் மொத்த நெல் விளைச்சலையும்;

(iii) ஒவ்வொரு மாவட்டத்திலும் ஒரு ஏக்கருக்கான சராசரி விளைச்சலையும்; மற்றும்

(iv) சிறுபோக மற்றும் பெரும்போக விளைச்சல் களுடன் 2005 ஆம் ஆண்டில் அதே போகங் களின் நெல் விளைச்சல் ஒப்பீட்டையும் அவர் கூறுவாரா?

(ஆ) விவசாயிகளுக்கு வழங்கப்பட்ட மானியங்கள் நாட்டின் உற்பத்தியையும் நெல் விளைச்சலையும் அதிகரிப் பதற்கு உதவியதா என்பதையும் அவர் கூறுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture:

(a) Will he state for the period from the year 2006 to 2012 separately, on per year basis -

(i) the amount of funds allocated for giving subsidy for the paddy cultivation;

(ii) the total paddy harvest of Yala and Maha seasons;

(iii) the average yield per acre in each district; and

(iv) the comparison of the paddy yield in Yala and Maha seasons with the same of the year 2005?

(b) Will he also state whether the subsidies given to the farmers who have helped to increase the production and the yield of paddy in the country?

(c) If not, why?

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Yapa Abeywardena - Minister of Agriculture)
ගරු කථානායකතුමනි, පිළිතුර සඳහා දීර්ඝ විස්තරයක් තිබෙනවා. එම නිසා මා එම පිළිතුර table කළාට කමක් නැද්ද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, පිළිතුර table කළාට කමක් නැහැ.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ගරු කථානායකතුමනි, මා මෙම පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(ඇ) (i) වී වගාව සඳහා සහනාධාර ලබා දී නොමැත. නමුත් පොහොර සඳහා සහනාධාර ලබා දී ඇත..

| වර්ෂය | වෙන් කරන ලද මුදල් ප්‍රමාණය රු.මිලියන |
|---|---|
| 2006 | 10,696.25 |
| 2007 | 10,167.06 |
| 2008 | 24,382.72 |
| 2009 | 23,117.93 |
| 2010 | 20,277.75 |
| 2011 | 36,955.54 |
| 2012 | 31,947.86 |

(ii)

| වර්ෂය | මුළු නිෂ්පාදනය (මෙ.ටො.) | | එකතුව |
|---|---|---|---|
| | මහ කන්නය | යල කන්නය | |
| 2005/06 | 2,135,605 | - | 3,341,922 |
| 2006 | - | 1,206,317 | |
| 2006/07 | 1,972,931 | - | 3,131,081 |
| 2007 | - | 1,158,150 | |
| 2007/08 | 2,125,219 | - | 3,875,249 |
| 2008 | - | 1,750,030 | |
| 2008/09 | 2,383,989 | - | 3,651,681 |
| 2009 | - | 1,267,692 | |
| 2009/10 | 2,629,566 | - | 4,300,620 |
| 2010 | - | 1,671,054 | |
| 2010/11 (1) | 1,996,184 | - | 3,894,224 |
| 2011 | - | 1,898,040 | |
| 2011/12 | 2,716,961 | - | 3,848,366 |
| 2012* (2) | - | 1,131,405 | |

*යාවත්කාලීන

(1) නැගෙනහිර පළාතට ප්‍රධානව බලපෑ අධික ගංවතුර තත්වය හා අයහපත් කාලගුණික තත්වය මත දිවයිනේ සමස්ත ඒකක ඵලදායීතාව අඩුවීම මත 2010/11 මහ කන්නයේ වී නිෂ්පාදනය මෙ.ටො. මිලි. 1.996 දක්වා පහත වැටී ඇත.

(2) දිස්ත්‍රික් කිහිපයකට බලපෑ නියං තත්වය මත 2012 යල කන්නයේ වී නිෂ්පාදනය අඩු වී ඇත.

(iii)

දිස්ත්‍රික්ක වශයෙන් වී නිෂ්පාදනයේ ඒකක ඵලදායීතාවය (අක්කරයට බුසල්)

| දිස්ත්‍රික්කය | 2005/06 මහ | 2006 යල | 2006/07 මහ | 2007 යල | 2007/08 මහ | 2008 යල | 2008/09 මහ | 2009 යල | 2009/10 මහ | 2010 යල | 2010/11 මහ | 2011 යල | 2011/12 මහ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කොළඹ | 63.52 | 49.21 | 58.82 | 64.90 | 67.91 | 61.52 | 68.92 | 58.26 | 67.98 | 62.23 | 52.49 | 58.15 | 67.44 |
| ගම්පහ | 69.88 | 51.57 | 60.77 | 70.90 | 67.79 | 62.90 | 65.02 | 65.76 | 66.93 | 71.51 | 59.36 | 66.24 | 66.98 |
| කළුතර | 55.48 | 52.23 | 61.48 | 59.34 | 55.93 | 53.20 | 60.41 | 56.21 | 62.22 | 52.02 | 56.58 | 47.13 | 65.30 |
| මහනුවර | 70.22 | 75.55 | 71.96 | 75.69 | 73.00 | 75.54 | 73.07 | 68.75 | 67.31 | 69.19 | 60.53 | 72.47 | 80.87 |
| මාතලේ | 67.34 | 69.58 | 74.99 | 79.25 | 69.03 | 73.39 | 72.91 | 70.64 | 87.15 | 83.25 | 69.80 | 81.50 | 85.02 |
| නුවරඑළිය | 75.59 | 60.51 | 67.08 | 71.91 | 76.20 | 71.53 | 80.39 | 56.50 | 80.18 | 85.72 | 74.60 | 81.61 | 77.62 |
| ගාල්ල | 67.84 | 52.91 | 66.29 | 63.27 | 61.86 | 58.71 | 58.81 | 58.12 | 63.72 | 57.08 | 57.57 | 56.71 | 66.55 |
| මාතර | 78.06 | 68.86 | 71.60 | 71.99 | 75.39 | 72.82 | 70.41 | 70.36 | 70.62 | 66.24 | 67.38 | 63.98 | 70.84 |
| හම්බන්තොට | 98.31 | 86.69 | 101.15 | 95.81 | 92.36 | 91.65 | 102.70 | 97.24 | 100.53 | 99.19 | 99.54 | 97.88 | 100.82 |
| යාපනය | 38.35 | - | 41.52 | - | 55.99 | - | 48.61 | - | 50.52 | - | 51.58 | - | 51.97 |
| කිලිනොච්චි | 64.88 | 69.06 | 64.86 | 68.03 | 55.99 | 59.84 | - | - | - | 50.02 | 55.35 | 50.73 | 59.33 |
| මන්නාරම | 79.72 | 78.88 | 75.13 | 81.92 | 54.36 | 83.16 | 71.19 | - | 104.80 | 75.81 | 77.60 | 74.51 | 93.05 |
| වවුනියා | 75.61 | 85.96 | 83.93 | 86.23 | 69.56 | 85.15 | 90.94 | 77.53 | 104.10 | 91.62 | 80.28 | 80.50 | 77.04 |
| මුලතිව් | 70.29 | 70.79 | 70.29 | 73.02 | 66.53 | 57.46 | - | - | 103.10 | 75.19 | 47.63 | 71.16 | 58.07 |
| මඩකලපුව | 62.20 | 70.76 | 56.08 | 71.38 | 71.00 | 76.48 | 70.58 | 81.24 | 78.17 | 77.73 | 46.53 | 78.17 | 72.41 |
| අම්පාර | 88.76 | 94.73 | 95.70 | 96.84 | 94.34 | 95.55 | 100.03 | 96.29 | 104.11 | 94.59 | 64.65 | 94.31 | 97.48 |
| ත්‍රිකුණාමලය | 76.90 | 85.63 | 82.63 | 84.87 | 84.98 | 87.36 | 86.56 | 94.08 | 84.01 | 94.13 | 46.32 | 91.36 | 86.97 |
| කුරුණෑගල | 70.89 | 70.85 | 78.25 | 72.83 | 74.43 | 61.05 | 76.42 | 68.54 | 78.22 | 77.45 | 64.23 | 72.88 | 76.29 |
| පුත්තලම | 66.93 | 70.73 | 76.85 | 80.39 | 74.36 | 72.65 | 77.11 | 70.85 | 77.06 | 69.17 | 70.62 | 71.44 | 79.26 |
| අනුරාධපුර | 87.66 | 88.43 | 91.67 | 93.18 | 83.62 | 85.26 | 89.86 | 86.31 | 95.49 | 94.78 | 83.65 | 92.62 | 96.63 |
| පොළොන්නරුව | 95.25 | 95.01 | 99.29 | 98.07 | 95.03 | 96.41 | 101.29 | 91.88 | 103.49 | 98.80 | 74.30 | 97.51 | 98.64 |
| බදුල්ල | 82.97 | 85.11 | 86.00 | 89.98 | 79.40 | 89.31 | 86.96 | 90.64 | 83.87 | 86.88 | 64.47 | 85.24 | 87.54 |
| මොණරාගල | 76.74 | 78.65 | 79.30 | 84.88 | 77.44 | 82.86 | 85.59 | 70.70 | 85.59 | 81.65 | 76.55 | 79.96 | 82.59 |
| රත්නපුර | 58.41 | 65.31 | 64.82 | 76.99 | 64.10 | 68.96 | 67.14 | 63.55 | 64.35 | 63.62 | 59.11 | 64.29 | 65.30 |
| කෑගල්ල | 78.20 | 60.70 | 60.95 | 63.83 | 72.72 | 64.45 | 72.16 | 65.43 | 73.53 | 55.20 | 58.04 | 53.44 | 70.38 |
| උඩවලව | 110.17 | 105.20 | 109.30 | 109.40 | 109.80 | 120.20 | 126.40 | 118.40 | 121.70 | 126.56 | 122.90 | 126.69 | 124.10 |
| මහවැලි 'H' | 102.86 | 91.49 | 107.90 | 99.61 | 106.74 | 104.80 | 117.06 | 93.50 | 125.60 | 108.10 | 97.06 | 104.21 | 119.37 |
| ශ්‍රී ලංකාව | **78.92** | **82.68** | **83.38** | **88.10** | **81.08** | **81.36** | **85.74** | **81.21** | **88.88** | **86.19** | **71.30** | **84.30** | **86.20** |

සටහන : මහවැලි 'H' සහ උඩවලව විශේෂ කෘෂිකාර්මික දිස්ත්‍රික්ක ලෙස සලකා ඊට අදාළ දත්ත ඇතුළත් කොට ඇති අතර අනෙකුත් මහවැලි කලාපවල දත්ත ඊට අදාළ දිස්ත්‍රික්කවලට ඇතුළත් කොට ඇත.

[ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා]

(iv)

| මහ කන්නය | නිෂ්පාදනය (මෙ.ටො.) | 2004/05 මහට සාපේක්ෂව ප්‍රතිශතාත්මක වෙනස |
|---|---|---|
| 2004/05 මහ | 2,012,706 | |
| 2005/06 මහ | 2,135,605 | 6.1% |
| 2006/07 මහ | 1,972,931 | -2.0% |
| 2007/08 මහ | 2,125.219 | 5.6% |
| 2008/09 මහ | 2,383,989 | 18.4% |
| 2009/10 මහ | 2,629,566 | 30.6% |
| 2010/11 මහ | 1,996,184 | -0.8% |
| 2011/12 මහ | 2,716,961 | 35.0% |

| යල කන්නය | නිෂ්පාදනය (මෙ.ටො.) | 2004/05 යලට සාපේක්ෂව ප්‍රතිශතාත්මක වෙනස |
|---|---|---|
| 2005 යල | 1,233,484 | |
| 2006 යල | 1,206,317 | -2.2% |
| 2007 යල | 1,158,150 | -6.1% |
| 2008 යල | 1,750,030 | 41.9% |
| 2009 යල | 1,267,692 | 2.8% |
| 2010 යල | 1,671,054 | 35.5% |
| 2011 යල | 1,898,040 | 53.9% |
| 2012 යල | 1,131,405 | -8.3 |

(ආ) - ඔව්.

2005 සාපේක්ෂව 2012 වන විට සාමාන්‍යයෙන් 35% සිට 54% දක්වා නිෂ්පාදනයේ වැඩිවීමක් වාර්තා වී ඇත.

(ඇ) : අදාළ නොවේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

කරුණාකරලා සහනාධාර කොපමණ ප්‍රමාණයක් දීලා තිබෙනවාද කියන ප්‍රශ්නයට උත්තරය කියන්න. රුපියල් කෝටි ගණනක් සහනාධාර දුන්නා කියලා කියනවානේ.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

වී වගාව සඳහා 2006 සිට 2012 වර්ෂය දක්වා සහනාධාර -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

2006 වර්ෂයේ ඒවා එපා. 2010, 2011 වර්ෂවල විස්තර කියන්නකෝ ගරු ඇමතිතුමනි.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

වී වගාව සඳහා සහනාධාරයක් ලබා දී නැහැ. නමුත් පොහොර සහනාධාරය ක්‍රියාත්මක වෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මම අහලා තිබෙන්නේ සම්පූර්ණ සහනාධාර ප්‍රමාණය. ඔබතුමා කියනවා පොහොර විතරයි දීලා තිබෙන්නේ කියලා. මම අහලා තිබෙන්නේ සම්පූර්ණ වශයෙන් කොච්චර මුදලක් සහනාධාර වශයෙන් දීලා තිබෙනවාද කියායි.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

වී වගාව වෙනුවෙන් වෙනත් සහනාධාරයක් දැනට ක්‍රියාත්මක වෙන්නේ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

හොඳයි.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

පොහොර සහනාධාරය සඳහා 2006 දී රුපියල් මිලියන 10,696ක්, 2007 දී රුපියල් මිලියන 10,167ක්, 2008 දී රුපියල් මිලියන 24,382ක්, 2009 දී රුපියල් මිලියන 23,117ක්, 2010 දී රුපියල් මිලියන 20,277ක්, 2011 දී රුපියල් මිලියන 36,955ක්, 2012 දී රුපියල් මිලියන 31,947ක් වෙන් කර තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුර මඟින් දැන ගන්න ලැබුණේ රුපියල් මිලියන 31,970ක පොහොර සහනාධාර දීලා තිබෙනවා කියලායි. ඒක හරිද?

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

හරි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒ මඟින් කොතරම් අස්වනු ප්‍රමාණයක් වැඩි වෙලා තිබෙනවාද? ඒකයි මා අහලා තිබෙන්නේ.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

ඒක තමයි මා කිව්වේ. සියයට 35 ඉඳලා සියයට 54 දක්වා වැඩි වීමක් වාර්තා වෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඉතින් ගරු ඇමතිතුමනි, ඒ වැඩි වීම -සියයට 19කින්- සිදු වෙලා තිබෙන්නේ රුපියල් කෝටි 3,600ක් වියදම් කරලායි. ඒ දිහා බැලුවාම, ඉතාම අධික වියදමක් දරා තිබෙනවා නේ. නමුත් අස්වනු ඒ තරම් ප්‍රමාණයකින් වැඩි වෙලා නැහැ නේ. ඔබතුමා රුපියල් කෝටි 3,600ක් වියදම් කරනවා. ඒ මගින් අස්වනු වැඩි වෙලා තිබෙන ප්‍රමාණයේ ප්‍රතිශතය එතරම් නැහැ. එතරම් සල්ලි ප්‍රමාණයක් වියදම් කරලාත් මොකක්ද කරලා තිබෙන්නේ? ඒ සම්බන්ධයෙන් දූෂණ සිදු වෙලා තිබෙනවාද? ඔබතුමන්ලා ඡන්ද කාලයේ කිව්වේ පොහොර සහනාධාරවලට රුපියල් කෝටි 5,000ක් වියදම් කළා කියලායි.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
හැබැයි අප ඒක නොකළා නම් අපට ඒ ප්‍රමාණය ආනයනය කරන්න වෙනවා මීට වඩා විශාල මුදලක් වියදම් කරලා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ආනයනය කරන්න අවශ්‍ය වන්නේ, මේ රටේ නිෂ්පාදනය කරන්න යනවාට වඩා අඩු මිලකට-

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ආනයනය කිරීමේ ප්‍රතිපත්තියේ අපි නැහැ. අපේ රටේ නිෂ්පාදනය කරන්න පුළුවන් සියලු දේ අපේ රටේ නිෂ්පාදනය කරනවා කියන ප්‍රතිපත්තියක තමයි අප ඉන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හරි, අපි එහෙම කියමු කෝ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ අහිංසක ගොවියා තවමත් ණය බරතාවෙනුයි සිටින්නේ.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
නැහැ, නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමන්ලා පොහොර සහනාධාරය, අර සහනාධාරය, මේ සහනාධාරය දෙනවා කිව්වාට-

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ඔබතුමන්ලා කියන තරම් ප්‍රශ්නයක් රටේ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමන්ලා කියන එක නොවෙයි ඒ අහිංසක ගොවියාගේ-

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ඒ කාරණයේදී මා ඔබතුමාත් එක්ක එකඟ වන්නේ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එකඟ වන්නේ නැහැ?

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ඔබතුමා කියන තරම් දුර්වල මට්ටමක අපේ ගොවියා නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කියන තරම් දුර්වල මට්ටමක නැති වුණාට අප කියන දේ ඔබතුමන්ලාට-

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
අපේ ගෝවියෝ දැන් හොඳ ආර්ථික ශක්තියක ඉන්නවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ප්‍රශ්නය අහන්න. මොකද, මමත් ගොවියකු නිසා මමත් දන්නවා-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක තමයි. ගරු කථානායකතුමනි, ඔබතුමාත් ගොවියකු නිසා මේ සම්බන්ධයෙන් හොඳට දන්නවා ඇති.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය ආපසු අහන්න බලන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මා අහන්නේ, රුපියල් කෝටි 3,600ක් වියදම් කරලා තිබියදීත් නිෂ්පාදන වියදමට සරිලන මිලක් ලැබිලා තිබෙනවාද කියලායි.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
මිලක්?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මා කියන්නේ, රට වෙනුවෙන්. රටේ බදු ගෙවන්නන්ගේ සල්ලිවලින් රුපියල් කෝටි 3,600ක් පාවිච්චි කරනවා පොහොර සහනාධාරය දෙන්න.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඡන්ද ගුණ්ඩුවක් නොවෙයි නේ. බදු සල්ලිවලින් තමයි මේක දුවන්නේ.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
එහෙනම් මේ පොහොර සහනාධාරය දෙන්න එපා කියලාද ඔබතුමා කියන්නේ? ඔබතුමා කියන විධියට "පොහොර සහනාධාරය දෙන්න එපා, පොහොර සහනාධාරයෙන් වැඩක් නැහැ." එහෙමද? ඔබතුමා කියන්නේ, පොහොර සහනාධාරය ප්‍රතිඵලදායී නැහැයි කියලාද? [බාධා කිරීමක්] ඔබතුමා කියන්නේ පොහොර සහනාධාරය ඵලදායී නැහැයි කියලාද? ඒක නේ කියන්නේ? ඔබතුමන්ලා බලයට ආවොත් පොහොර සහනාධාරය නැති කරනවා කියලාද මේ කියන්නේ? පිට රටින් ලාබෙට සහල් ගෙන්වනවාය කියලා කියනවාද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේ නිලධාරින් තමයි මේකෙන් වාසි ලබා ගන්නේ. ඇමතිතුමනි, ඔබතුමා කෘෂිකර්ම ඇමතිතුමා වෙන්නට පුළුවන්. නමුත් ගරු කථානායකතුමාට ඊට වඩා ලොකු ප්‍රායෝගික දැනුමක් තිබෙනවා.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ඔබතුමන්ලා බලයට ආවොත් මේ පොහොර සහනාධාරය නැති කරනවාද? ඔබතුමා කියන විධියට මේක ඵලදායී නැහැ නේ. ඔබතුමන්ලා බලයට ආවොත් මේ පොහොර සහනාධාරය නැති කරනවාද? එහෙනම් සහල් පිට රටින් ගෙන්වනවාද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමා දන්නවා, මෙහි සැබෑ තත්ත්වය. ඒකයි එතුමා මේ බලාගෙන සිටින්නේ, මොන ප්‍රශ්නයද අහන්නේ කියලා.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ඔබතුමා සහල් පිට රටින් ගෙන්වන්න කටයුතු කරන්නද බලාපොරොත්තු වන්නේ?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා ඒ වාගේ උත්තර දෙනවා නම්, උත්තර දෙන්න. මම අහන්නේ මේකයි. අද අපේ කොළඹ දිස්ත්‍රික්කයේ අහිංසක මිනිසුන්ගේ ගෙවල් කඩලා, ඒ වෙනුවට ගෙවල් හදලා දීලා නැහැ. බදු සල්ලිවලින් පොහොර සහනාධාරය දීලා, රජයේ නිලධාරින්ට විතරයි ඒකෙන් සල්ලි ලැබෙන්න සලස්වලා තිබෙන්නේ. අහිංසක ගොවියා තවමත් සිටින්නේ ණය බරතාවයෙන්. [බාධා කිරීමක්] නිකම් ඇත්ත තත්ත්වය විකෘති කරන්න එපා.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
කොහේද දැන් ගොවියා ණය වෙලා සිටින්නේ? ඒ කාලයේ තමයි ගොවියා ණය ගෙවා ගන්න බැරිව වහ බිව්වේ. ඒ තමුන්නාන්සේලාගේ කාලයේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ කාලයේ නිෂ්පාදනයන් සඳහා නියමිත මිලක් ලැබුණා; පාරිභෝගිකයාත් සතුටු වුණා; සහල් අපනයනයත් කළා.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
මොකක්ද දුන්න මිල? රුපියල් 10ක මිලක් දුන්නා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමාත් එක්සත් ජාතික පක්ෂයේ හිටපු මන්ත්‍රීවරයෙක් නේ. ඇයි ඔය වාගේ ලජ්ජා නැති කථා කියමින් ඇත්ත තත්ත්වය විකෘති කරන්න හදන්නේ?

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
මමත් අහන්නේ ඒක තමයි. ඇයි, ඔබතුමා ඔය විධියට ලජ්ජා නැති කථා කියන්නේ? ඒ කාලයේ වී කිලෝව රුපියල් 10ටත් විකුණා ගන්න බැරිව ගොවියෝ වහ බිව්වා. ඔබතුමා දැන් මෙහෙම කථා කළාට දැන් වී කිලෝ එකට රුපියල් 35ක මිලක් ලබා දෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමන්ලා ඡන්දය කාලයේ කිව්වේ, රුපියල් කෝටි 5,000ක් වියදම් කළා කියලායි. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හරි, දැන් කථාව ඇති.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ගරු කථානායකතුමනි, එතුමා කොළඹ ඉඳගෙනයි මේ ගොවියා ගැන කථා කරන්නේ. එතුමා අමුඩයක් ගහගෙන කථා කළා නම් මම පිළිගන්නවා. ටයි කෝට් ගහගෙන මෙතැන කථා කරන වචන පිළිගන්න බැහැ. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා, කුඹුරක් වපුරලා බලන්න. අක්කරයක විතර ගොවිතැනක් කරලා බලන්න, එතකොට කොහොමද කියලා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා හිතන්නේ අපි මේ ටයි කෝට් ගහන නිසා වී ගොවිතැන ගැන දන්නේ නැහැයි කියලාද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දන්නවා නම් කුඹුරට බහින්න. [බාධා කිරීම්] ගරු අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා තුන්වැනි අතුරු ප්‍රශ්නය අහනවා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු ඇමතිතුමනි, අපේ පැත්තේ වී වගාව තිබෙනවා නේ. [බාධා කිරීමක්] ගරු කථානායකතුමනි, -[බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තමුන්නාන්සේලාගේ මන්ත්‍රීතුමා තමුන්නාන්සේට අවස්ථාව දෙන්නේ නැහැ. ඒ නිසා වාඩි වෙන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම තුන්වැනි අතුරු ප්‍රශ්නය එතුමාට අහන්න දෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් අතුරු ප්‍රශ්න ඇහුවා ඇති. අතුරු ප්‍රශ්න තුනක් නොවෙයි හතරක් විතර ඇහුවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, වී කිලෝවක් නිෂ්පාදනය කරන්න රුපියල් 35.37ක් යනවා. ඒ සම්බන්ධයෙන් තමයි අපි අහන්නේ. දැන් පොහොර සහනාධාරයත් දෙනවා. මේ සම්බන්ධයෙන් මොනවාද වෙන්නේ? බදු ගෙවන අයගේ සල්ලිත් එක්කද මේ සෙල්ලම් කරන්නේ? හිතන්න එපා, මේවා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ගෙදරින් ගෙනැල්ලා දෙනවා කියලා.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
නැහැ, නැහැ, නැහැ. අපොයි නැහැ, එතුමා ගෙදරින් ගෙනාවේ නැහැ. මේ රටේ සල්ලිවලින් දුන්නේ. මේ රටේ සල්ලිවලින් තමයි දෙන්නේ. [බාධා කිරීම්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා - [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
අපේ ප්‍රදේශවල ගොවි ජනතාව බහුලව ඉන්න නිසායි මම මේක කියන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු අස්වර් මන්ත්‍රීතුමා point of Order එකක් මතු කරනවා. Point of Order එක මොකක්ද?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, twice, the Hon. Member mentioned the name of the President of this country as "Mahinda Rajapaksa" and also said "Mahinda Rajapaksa *gunduwa*". He cannot say like that. He is suffering from a disease. He is a

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

Sir, it must be expunged. He cannot refer to the Executive. Sir, he is debarred by the Standing Orders from doing so.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම එකක් කියලා තිබෙනවා නම් අපි ඒ ගැන අවශ්‍ය කටයුතු කරන්නම්. ඒ ගැන සොයා බලා හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කිරීමට කටයුතු කරන්නම්. [බාධා කිරීමක්] දැන් අතුරු ප්‍රශ්නය අහන්න. [බාධා කිරීමක්]

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, පොහොර සහනාධාරය දීම බොහොම හොඳ දෙයක්. අපි ගරු ඇමතිතුමාට ඒක මතක් කරන්න ඕනෑ. නමුත් මෙතැන තිබෙන ප්‍රශ්නය මේ දෙන්නේ බාල පොහොර වීමයි. ගොවි ජනතාව කියනවා මේ පොහොර පාවිච්චි කළාට අස්වැන්නේ කිසිම වෙනසක් නැහැයි කියලා. ප්‍රමිතියෙන් තොරයි. අන්න ඒකයි ප්‍රශ්නය.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, sample එකක් ගෙනැල්ලා test කරලා බලන්න. ප්‍රමිතිය බලන්න. එතකොට ඉවරයි.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
මේ ගරු මන්ත්‍රීවරු දෙදෙනාම උත්සාහ කරන්නේ පොහොර සහනාධාරය නවත්වන්න කියලා කියන්නයි. එතුමන්ලාට ඕනෑ කරන්නේ පොහොර සහනාධාරය නතර කරන්නයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කවුද එහෙම කියන්නේ?

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
අර ගරු අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා කිව්වේ ඒක නේ. පොහොර බාලයි කියනවා. පොහොරවලින් වැඩක් නැහැයි කියනවා. ඉතින් ඒ වැඩේ ඔහොම කරන්න බැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බොරු කරන එක තමයි අපි කියන්නේ. බාල ඉන්ධන ගෙන්වනවා. බාල පොහොර ගෙන්වනවා. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. දැන් දෙවන වටය.

## සීමාසහිත ගුවන් තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම : ලාභ අලාභ
## வரையறுக்கப்பட்ட விமான நிலைய, விமான சேவைகள் (ஸ்ரீ லங்கா) கம்பனி : இலாப நட்டம்
## AIRPORT AND AVIATION SERVICES (SRI LANKA) LIMITED : PROFIT/ LOSS

2185/'11

2. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) සීමාසහිත ගුවන් තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගමට අදාළව පසු ගිය වර්ෂ පහක කාලය තුළ, එක් එක් වර්ෂයේදී,

(i) උපයෝජිත සමස්ත ප්‍රාග්ධනය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(ii) ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(iii) සමස්ත කාර්ය මණ්ඩලය සඳහා දරන ලද පිරිවැය සහ එක් සේවකයකුගෙන් ඉපැයූ ලාභය කොපමණද;

(iv) එක් මගියකු වෙනුවෙන් දැරූ පිරිවැය කොපමණද;

(v) රජය වෙත ගෙවනු ලැබූ තීරු බදු හෝ අනෙකුත් බදු ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ලබාදී ඇති ප්‍රාග්ධනය, මුදල්, ණය සහ ඇපකර කවරේද;

(ii) ඒවා පිළිබඳ විස්තර කවරේද;

(iii) ඒවා ලබාදී ඇත්තේ කවර කාර්යයන් සඳහාද;

යන්න එතුමා තවදුරටත් සඳහන් කරන්නෙහිද?

(ඇ) සීමාසහිත ගුවන්තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම විසින් මෙතෙක් ගෙවා නොමැති සමස්ත ණය ප්‍රමාණය කොපමණදැයි එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) கடந்த ஐந்து வருடங்களில் வரையறுக்கப்பட்ட விமானநிலைய, விமானசேவைகள் (ஸ்ரீ லங்கா) கம்பனி தொடர்பாக,

(i) உபயோகிக்கப்பட்ட மொத்த மூலதனம், ஒதுக் கங்கள் ஆகியவற்றையும்;

(ii) இலாபமா அல்லது நட்டமா என்பதையும்;

(iii) மொத்த பணியாள்தொகுதி உறுப்பினர்களுக் குரிய செலவினம், ஊழியர் ஒருவருக்கான இலாபம் ஆகியவற்றையும்;

(iv) பிரயாணி ஒருவருக்கான செலவினத்தையும்;

(v) அரசாங்கத்திற்குச் செலுத்தப்பட்ட தீர்வைகள் அல்லது வரிகளின் தொகையையும் வருட வாரியாக அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) வழங்கப்பட்ட மூலதனம், கடன்கள், உத்தர வாதங்கள் ஆகியவற்றையும்;

(ii) அவற்றின் விபரங்களையும்;

(iii) அவற்றை வழங்குவதற்குரிய நோக்கத்தையும் அவர் மேலும் குறிப்பிடுவாரா?

(இ) வரையறுக்கப்பட்ட விமான நிலைய, விமான சேவைகள் (ஸ்ரீ லங்கா) கம்பனியின் இற்றைவரை நிலுவையாக உள்ள மொத்தக் கடன்களையும் அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Civil Aviation:

(a) Will he state pertaining to the Airport and Aviation Services (Sri Lanka) Limited for the last five years on per year basis -

(i) the total capital and reserves utilized;

(ii) the profit or loss;

(iii) the total staff cost and the profit per employee;

(iv) the cost per passenger; and

(v) the amount of duties or taxes paid to the Government?

(b) Will he further state -

(i) the capital, money, loans and guarantees that have been given;

(ii) the details of them; and

(iii) the purpose of giving them?

(c) Will he inform this House the total loans outstanding of the Airport and Aviation Services (Sri Lanka) Limited as at today?

(d) If not, why?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன )
(The Hon. Gitanjana Gunawardena)

ගරු කථානායකතුමනි, සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මම ඒ ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) සී/ස ගුවන්තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී,

(i) උපයෝජිත සමස්ත ප්‍රාග්ධනය සහ සංචිත ප්‍රමාණය :

| වර්ෂය | උපයෝජිත සමස්ත ප්‍රාග්ධනය (රුපියල්) | සංචිත ප්‍රමාණය (රුපියල්) |
|---|---|---|
| 2007 | 20,000,200 (මිලියන විස්සයි, දෙසියයි) | 4,170,188,157 (මිලියන හාර දහස් එකසිය හැත්තෑවයි, එක් ලක්ෂ අසූ අට දහස් එකසිය පනස් හතයි.) |
| 2008 | 20,000,200 (මිලියන විස්සයි, දෙසියයි) | 5,147,042,066 (මිලියන පන්දහස් එකසිය හතළිස් හතයි, හතළිස් දෙදහස් හැට හයයි.) |
| 2009 | 20,000,200 (මිලියන විස්සයි, දෙසියයි) | 5,881,396,580 (මිලියන පන්දහස් අටසිය අසූ එකයි තුන් ලක්ෂ අනූ හය දහස් පන්සිය අසූවයි.) |
| 2010 | 20,000,200 (මිලියන විස්සයි, දෙසියයි) | 6,443,244,239 (මිලියන හය දහස් හාරසිය හතළිස් තුනයි,දෙලක්ෂ හතළිස් හතර දහස් දෙසිය තිස් නමයයි) |
| 2011 | 20,000,200 (මිලියන විස්සයි, දෙසියයි) | 6,709,108,578 (මිලියන හය දහස් හත්සිය නමයයි, එක් ලක්ෂ අට දහස් පන්සිය හැත්තෑ අටයි.) |

(ii) ලැබූ ලාභය :

| වර්ෂය | ලැබූ ලාභය - බදු ගණනයෙන් පසු (රුපියල්) |
|---|---|
| 2007 | 1,508,427,690 (මිලියන එක්දහස් පන්සිය අටයි, හාර ලක්ෂ විසි හත් දහස් හයසිය අනූවයි.) |
| 2008 | 1,168,647,032 (මිලියන එක්දහස් එකසිය හැට අටයි, හය ලක්ෂ හතළිස් හත් දහස් තිස් දෙකයි.) |
| 2009 | 934,354,514 (මිලියන නමසිය තිස් හතරයි, තුන් ලක්ෂ පනස් හතර දහස් පන්සිය දහතරයි.) |
| 2010 | 1,161,847,659 (මිලියන එක්දහස් එකසිය හැට එකයි, අට ලක්ෂ හතළිස් හත් දහස් හයසිය පනස් නමයයි.) |
| 2011 | 2,372,279,939 (මිලියන දෙදහස් තුන්සිය හැත්තෑ දෙකයි, දෙලක්ෂ හැත්තෑ නම දහස් නමසිය තිස් නමයයි.) |

(iii) සමස්ත කාර්ය මණ්ඩලය සඳහා දරන ලද පිරිවැය සහ එක් සේවකයෙකුගෙන් ඉපැයූ ලාභය :

| වර්ෂය | සමස්ත කාර්ය මණ්ඩලය සඳහා දරන ලද පිරිවැය (රුපියල්) | එක් සේවකයෙකුගෙන් ඉපැයූ ලාභය බදු ගණනයෙන් පසු (රුපියල්) |
|---|---|---|
| 2007 | 1,984,657,452 (මිලියන එක් දහස් නමසිය අසූ හතරයි, හය ලක්ෂ පනස් හත් දහස් හාරසිය පනස් දෙකයි.) | 502,642 (පන් ලක්ෂ දෙදහස් හයසිය හතළිස් දෙකයි.) |
| 2008 | 2,934,843,564 (මිලියන දෙදහස් නමසිය තිස් හතරයි, අට ලක්ෂ හතළිස් තුන් දහස් පන්සිය හැට හතරයි.) | 373,131 (තුන් ලක්ෂ හැත්තෑ තුන් දහස් එකසිය තිස් එකයි.) |
| 2009 | 2,662,564,708 (මිලියන දෙදහස් හයසිය හැට දෙකයි, පන් ලක්ෂ හැට හතර දහස් හත්සිය අටයි.) | 293,637 (දෙලක්ෂ අනූ තුන් දහස් හයසිය තිස් හතයි.) |
| 2010 | 2,807,809,779 (මිලියන දෙදහස් අටසිය හතයි, අට ලක්ෂ නම දහස් හත්සිය හැත්තෑ නමයයි.) | 365,476 (තුන් ලක්ෂ හැට පන් දහස් හාරසිය හැත්තෑ හයයි.) |
| 2011 | 3,106,384,728 (මිලියන තුන් දහස් එකසිය හයයි, තුන් ලක්ෂ අසූ හතර දහස් හත්සිය විසි අටයි.) | 717,568 (හත් ලක්ෂ දහත් දහස් පන්සිය හැට අටයි.) |

(iv) එක් මගියෙකු වෙනුවෙන් දැරූ පිරිවැය :

| වර්ෂය | එක් මගියෙකු වෙනුවෙන් දැරූ පිරිවැය (රුපියල්) |
|---|---|
| 2007 | 586 |
| 2008 | 881 |
| 2009 | 955 |
| 2010 | 798 |
| 2011 | 740 |

(v) රජය වෙත ගෙවනු ලැබූ තීරු බදු හෝ අනෙකුත් බදු ප්‍රමාණ :

| වර්ෂය | රජය වෙත ගෙවනු ලැබූ තීරු බදු හෝ අනෙකුත් බදු ප්‍රමාණ (රුපියල්) |
|---|---|
| 2007 | 1,314,934,050 (මිලියන එක්දහස් තුන්සිය දහතරයි, නම ලක්ෂ තිස් හතර දහස් පනහයි.) |
| 2008 | 964,180,909 (මිලියන නමසිය හැට හතරයි, එක් ලක්ෂ අසූ දහස් නමසිය නමයයි.) |
| 2009 | 872,163,015 (මිලියන අටසිය හැත්තෑ දෙකයි, එක් ලක්ෂ හැට තුන් දහස් පහළොවයි.) |
| 2010 | 1,184,008,027 (මිලියන එක්දහස් එකසිය අසූ හතරයි, අට දහස් විසි හතයි.) |
| 2011 | 1,179,340,748 (මිලියන එක් දහස් එකසිය හැත්තෑ නමයයි, තුන් ලක්ෂ හතළිස් දහස් හත්සිය හතළිස් අටයි.) |

(ආ) (i) ලබාදී ඇති ප්‍රාග්ධනය/මුදල්/ඇපකර : නැත.

ණය :රු . 889,820,272/- (මිලියන අටසිය අසූ නමයයි, අට ලක්ෂ විසි දහස් දෙසිය හැත්තෑ දෙකයි)

(ii) ලබාදී ඇති ණය පිළිබඳ විස්තර :

| වර්ෂය | මිහින් ලංකා සමාගමට ලබාදී ඇති ණය (රුපියල්) | සී/ස ගුවන්තොටුපල හා ගුවන්සේවා සමාගමෙහි සේවකයින්ට ලබාදී ඇති ණය (රුපියල්) |
|---|---|---|
| 2007 | - | 59,072,710 (මිලියන පනස් නමයයි , හැත්තෑ දෙදහස් හත්සිය දහයයි) |
| 2008 | 500,000,000 (මිලියන පන්සියයයි) | 78,218,071 (මිලියන හැත්තෑ අටයි, දෙලක්ෂ දහඅට දහස් හැත්තෑ එකයි.) |
| 2009 | - | 81,640,856 (මිලියන අසූ එකයි, හය ලක්ෂ හතළිස් දහස් අටසිය පනස් හයයි.) |
| 2010 | - | 87,882,560 (මිලියන අසූ හතයි, අට ලක්ෂ අසූ දෙදහස් පන්සිය හැටයි.) |
| 2011 | - | 83,006,075 (මිලියන අසූ තුනයි, හය දහස් හැත්තෑ පහයි.) |

- මිහින් ලකා සමාගමට ලබාදී ඇති ණය එම ආයතනය විසින් 2010 වසරේදී පොලියද සමඟ සම්පූර්ණයෙන් ගෙවා අවසන් කර ඇත.
- සී/ස ගුවන්තොටුපල හා ගුවන්සේවා සමාගමේ සේවකයින්ට ලබාදී ඇති ණය, වසර 04කදී ගෙවා නිමකිරීම යටතේ එක් අයෙකුට රු.100,000/- බැගින්වේ.

(iii) ණය ලබාදී ඇති කාර්යයන් :

- මිහිත් ලංකා සමාගමට ලබාදී ඇති ණය - එම සමාගමේ කෙටි කාලීන මූල්‍ය අවශ්‍යතා සඳහා
- සී/ස ගුවන්තොටුපල හා ගුවන්සේවා සමාගමේ සේවකයින්ට ලබාදී ඇති ණය - ආපද ණය වශයෙන්

(ඇ) ණය වාරික සම්පූර්ණයෙන් ගෙවා ඇත.

(ඈ) පැන නොනගී.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, (අ) (i) ප්‍රශ්නයට පිළිතුර කුමක්ද?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

උපයෝජිත සමස්ත ප්‍රාග්ධනය 2007 දී රුපියල් 20,000, 200යි; 2008 දී රුපියල් 20,000, 200යි; 2009 දී රුපියල් 20,000,200යි; 2010 දී රුපියල් 20,000,200යි; 2011 දී රුපියල් 20,000,200යි.

සංචිත ප්‍රමාණය - 2007 දී රුපියල් 4,170,188,157යි; 2008 දී රුපියල් 5,147,042,066යි; 2009 දී රුපියල් 5,881,396,580යි; 2010දී රුපියල් 6,443,244,239යි; 2011දී රුපියල් 6,709,108,578යි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, (අ) (ii) ප්‍රශ්නයට පිළිතුර කුමක්ද?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ලැබූ ලාබය බදු ගණනයෙන් පසු 2007 දී රුපියල් 1,508,427,690යි; 2008 දී රුපියල් 1,168,647,032යි; 2009 දී රුපියල් 934,354,514යි; 2010 දී රුපියල් 1,161,847,659යි; 2011 දී රුපියල් 2,372,279,939යි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, කරුණාකර අපට කියන්න පුළුවන්ද මත්තල, ගුවන් තොටුපළ සම්බන්ධයෙන් කොතරම් මුදල් ප්‍රමාණයක් වියදම් කර තිබෙනවාද, 2013 මාර්තු 18වැනි දා එය විවෘත කරනවාද කියා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ පසු ගිය වසර 5 තුළ ගුවන් තොටුපළ අධිකාරිය විසින් කරන ලද වියදම් සහ ආයෝජන පිළිබඳවයි. එනම් 2011ට ඉස්සෙල්ලා කාලය ගැනයි. ගරු කථානායකතුමනි, තවම මේ ගුවන් තොටුපළ විවෘත කරලා නැහැ. ඇමෙරිකානු ඩොලර් මිලියන180ක ණයක් අරගෙන මත්තල ගුවන් තොටුපළ සෑදීම සඳහා කටයුතු කරන බව පමණයි මට කියන්න පුළුවන්. දැන් එහි වැඩ කටයුතුවලින් සියයට 80ට වැඩි ප්‍රමාණයක් සම්පූර්ණ කර තිබෙනවා.

මාර්තු මාසයේ විවෘත කිරීමට නියමිත බව පමණයි මට කියන්නට පුළුවන්. නැවත මත්තල ගුවන් තොටුපොළ පිළිබඳව ප්‍රශ්නයක් අහනවා නම් ඒ සම්පූර්ණ විස්තර ලබා දෙන්න පුළුවන්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මාගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. කරුණාකරලා කියන්න පුළුවන්ද මේ වන විට මත්තල ගුවන් තොටුපොළට මොන වාගේ ගුවන් යානා යනවාද කියලා. මේ වන විට ඒ සම්බන්ධයෙන් ගිවිසුම්වලට ඇතුළත් වෙලා තිබෙනවාද, නැද්ද? තව දවස් 20යි තිබෙන්නේ. මිහින් ලංකා ආයතනයත්, ශ්‍රීලංකන් ගුවන් සේවා ආයතනයත් හැර Mattala International Airport එකට සම්බන්ධ වෙන වෙනත් ගුවන් සමාගම් මොනවාද?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ඒ පිළිබඳව වෙනම ප්‍රශ්නයක් මතු කළොත් ඔබතුමාට සම්පූර්ණ උත්තරය ලබා දෙන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා නියෝජ්‍ය අමාත්‍යතුමානේ, ඒ නිසා දන්නවා නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතුමා දුන්න පිළිතුර නිවැරදියි. තුන්වෙනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මත්තල ගුවන් තොටුපොළ සඳහා මේ වන විට රුපියල් මිලියන 42,000ක් වියදම් කරලා තිබෙනවා. දැනට මිහින් ලංකා ආයතනයටයි, ශ්‍රීලංකන් ගුවන් සේවා ආයතනයටයි විතරයි ඒ ගුවන් තොටුපොළට යන්න පුළුවන් කියන බවයි අප දන්නේ. වෙනත් කිසිම ගිවිසුමක් දීලා නැහැ. මේ මොහොත වන විටත් මේක airport එකක් කියලා International Air Transport Agreement එක ලැබිලා නැහැ. ඔබතුමා නියෝජ්‍ය ඇමතිතුමා වශයෙන් කරුණාකරලා මේ සම්බන්ධයෙන් සොයා බලා, මෙය සැබෑ තත්ත්වයක්ද කියලා මේ පාර්ලිමේන්තුව දැනුවත් කරන්න.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
සොයා බලලා උත්තර දෙන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැත්නම් වරායට වාගේ මාස ගණනාවකට- [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳ උපදෙසක්.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු කථානායකතුමනි, මාර්තු මාසයේ 08 වෙනි දා උපදේශක කාරක සභාව රැස් වෙනවා. එහිදී ඔබතුමාට පෞද්ගලිකව මේ පිළිබඳ උත්තරය ලබා ගන්නට පුළුවන් වෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳට ඒ උපදෙස් ගන්න.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### කුරුණෑගල සහ හිරියාල මුස්ලිම් දේවස්ථානවලට පහර දීමේ සිද්ධිය
### குருநாகல் மற்றும் ஹிரியாலை பள்ளிவாசல்கள் மீதான தாக்குதல் சம்பவங்கள்
### INCIDENTS OF ATTACKS IN MOSQUES IN KURUNEGALA AND HIRIYALA

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)
Hon. Speaker, on the $6^{th}$ of February, 2013, I had occasion to raise a question relating to a matter of public

importance, namely, the ethnic and communal incidents that were taking place in the country and referred to the Statement made in the House by the Deputy Minister of Buddha Sasana and Religious Affairs, the Hon. M.K.A.D.S. Gunawardana who denied that there were such incidents.

The Leader of the House replying on the 7th of February, 2013 stated that I had distorted the facts. He went on to inquire which were the mosques that had been attacked and what was the period during which these incidents had occurred and challenged me to give details. He also stated that the Inspector-General of Police had referred that there had been no incidents of attacks on mosques or religious groups other than what had been referred to in the Statement.

As I had stated, I will be writing to the Minister with details because I do not want to make a public issue of all those incidents but I would like to make a statement regarding the incidents which occurred in Kurunegala and Hiriyala, which the police had denied.

In the first instance, I would like to refer to the front page report of the Tamil newspaper "Sudar Oli" of 26th July, 2012 which refers to an incident where some Bhikkus had forcibly entered the Mosque at Inguruwatte and demanded that the Mosque be shut down. Another incident referred to in the same newspaper refers to the Ambanpola Mosque where some people have forcibly thrown away the Holy Quran.

As the police say that there have been no reports on these incidents, I want to refer to the letter dated 14th April, 2012, addressed to the President by M.T. Baddurdeen referring to an incident at the Akram Mosque, Makulwewa with an attached petition and a letter dated 29th December, 2011, addressed to the Viharadhipathi of Makulwewa by the Divisional Secretary of Ganewatte, Nikadalupotha. I do not want to read out all these details. What I have been saying is that these issues have not yet been resolved and the problems are continuing. I think the Hon. Minister of Justice also wrote at that time about the Al-Akram Jummah Muslim Mosque. He wrote to the DIG of North Western Province. I do not know how the police can say that they are not aware of it.

The Police Report that no incidents have taken place in Hiriyala and Kurunegala are incorrect. There is continuing tension in the area. Therefore, will the Government have an independent inquiry into this matter on what the police have said after consulting the Provincial Council Members and Members of Parliament who have made complaints and brought this to the notice of the police? Many of them are on the Government side. That is all that we are asking, Sir.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, විපක්ෂ නායක ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් අද දින ස්ථාවර නියෝග 23 (2) යටතේ නඟා ඇති ප්‍රශ්නයට පදනම් වී ඇත්තේ මා විසින් මෙම ගරු සභාවේදී 2013 පෙබරවාරි මස 07වන දින ලබා දී තිබෙන පිළිතුරයි. විපක්ෂ නායකවරයා විසින් 2013 පෙබරවාරි මස 06වන දින මතු කරන ලද ප්‍රශ්නය සම්බන්ධයෙන් විස්තරාත්මක පිළිතුරක් මා 2013 පෙබරවාරි මස 07වන දින මෙම ගරු සභාවේදී ලබා දුන් අතර එතුමාගේ ප්‍රකාශයේ සඳහන් පහත දැක්වෙන ඡේදය කරුණු විකෘති කොට දැක්වීමක් බවත්, එම ඡේදයට අදාළව පහර දීම් කර ඇත්තේ කුමන ස්ථානයන්හි පිහිටි කුමන මුස්ලිම් දේවස්ථානයන්ටද යන්නත්, එසේ පහර දුන්නේ යයි කියනු ලබන දින වකවානු මොනවාද යන්නත් ඉදිරිපත් කරන ලෙස මා එතුමාට අභියෝග කළ බව සත්‍යයකි.

එතුමා විසින් නඟන ලද ප්‍රශ්නයේ පහත සඳහන් කොටස උපුටා දැක්වීම කාලෝචිත වේ. "Altogether there have been 10 attacks on mosques and 10 protests at various towns". ඒ අනුව එතුමා පැහැදිලිව ප්‍රකාශ කර සිටියේ මුස්ලිම් දේවස්ථාන 10කට පහර දීම් කර ඇති බවය. එහෙයින් මාගේ අභියෝගය භාර ගනිමින් එතුමා කළ යුතුව තිබුණේ මෙම ප්‍රකාශයේදී එකී මුස්ලිම් දේවස්ථාන නම් කිරීමත්, සිද්ධීන් සිදු වූයේ නම් එසේ සිදු වූ දිනයන් ඉදිරිපත් කිරීමත්ය.

එහෙත් ඒ වෙනුවට විපක්ෂ නායකවරයා කර ඇත්තේ ප්‍රශ්නයෙන් ලිස්සා යෑමක් පමණකි. එතුමා අද දින කළ ප්‍රකාශයේ සඳහන් කර ඇත්තේ, 2012 ජූලි 26වන දින "සුඩර් ඔළි" නම් පුවත් පතෙහි වාර්තා කර ඇතැයි කියන ඉඟුරුවත්ත පල්ලියට භික්ෂූන් වහන්සේලා බලෙන් ඇතුළු වූවා යැයි කියන සිද්ධිය හා අඹන්පොල පල්ලියට පිරිසක් බලහත්කාරයෙන් ඇතුළු වූවා යැයි කියන සිද්ධියත්, 2012 අප්‍රේල් 14වන දින ටී.එම්. බදුර්දීන් නමැත්තකු විසින් අතිගරු ජනාධිපතිතුමා වෙත යවන ලදැයි කියන ලිපියක සඳහන් අක්‍රම් පල්ලියේ වූයේ යැයි කියන සිද්ධියත් පමණකි. එතුමා තමන්ගේ මුල් ප්‍රකාශයේ සඳහන් කරන ලද පල්ලි 10ට පහර දීම පිළිබඳ විස්තර හා දින වකවානු කිසිවක් ලබා දී නැත. එසේ ලබා දී නැත්තේ එවැනි සිද්ධීන් සිදු නොවූ නිසා බව නිගමනය කළ හැක.

විපක්ෂ නායකතුමා "සුඩර් ඔළි" පුවත් පතේ වාර්තා කළේ යැයි කියනු ලබන ඉඟුරුවත්ත මුස්ලිම් දේවස්ථානය වෙත සංඝයා වහන්සේලා පිරිසක් කඩා වැදී එහි පිරිත් සජ්ඣායනා කරමින් එම දේවස්ථානය වැසීමට ක්‍රියා කළ බවට කියන සිදු වීමක් සිදු වී නොමැති බව පොලිස් පරීක්ෂණවලින් වාර්තා වී ඇත. එහෙයින් එය හුදෙක් මනඃකල්පිත පුවත් පත් වාර්තාවක් පමණකි. තවද, අඹන්පොල මුස්ලිම් දේවස්ථානය වෙත කලහකාරී පිරිසක් කඩා වැදීමක් හෝ ශුද්ධ වූ කුරානය විසි කළ බවට වූ සිද්ධියක් පිළිබඳව පොලීසිය වෙත වාර්තා වී නොමැති බවත් තවදුරටත් පොලිස්පතිවරයා දන්වා තිබේ.

මකුල්වැව අල්අක්‍රම් මුස්ලිම් දේවස්ථානය මීට වසර 12කට පෙර ළදරු පාසලක් ලෙස ආරම්භ වී ඇති අතර, එම දේවස්ථානයේ ශබ්ද විකාශන යන්ත්‍ර භාවිත කිරීමේ ප්‍රශ්නයක් මත නුදුරු විහාරස්ථානයක විහාරාධිපති ස්වාමීන් වහන්සේ නමක් විසින් කරන ලද පැමිණිල්ලක් අනුව වැල්ලව පොලීසිය මඟින් පරීක්ෂණ පවත්වා දෙපාර්ශ්වය සමථයකට පත් කොට තිබේ.

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

එහෙයින් ඉහත කී සිද්ධිය සිදු වී ඇත්තේ විපක්ෂ නායකවරයා 23 (2) ස්ථාවර නියෝගය යටතේ ප්‍රශ්නය ඇසීමට මාස 6කටත් පෙරය ගරු කථානායකතුමනි. ස්ථාවර නියෝග 23(2) යටතේ මතු කරනු ලබන සෑම ප්‍රශ්නයක්ම ජාතික වැදගත්කමකින් යුතු කාලීන ප්‍රශ්නයක් විය යුතු බව විපක්ෂ නායකතුමාට අමුතුවෙන් මතක් කර දීමට අවශ්‍ය නොවනු ඇතැයි සිතමි.

අද දින විපක්ෂ නායකතුමා විසින් මතු කරනු ලැබූ ප්‍රශ්නයද මාස 6ත්-9ත් අතර, පෙර කාල සීමාවකදී පැන නැඟුණු ප්‍රශ්න බව විපක්ෂ නායකතුමාගේ ප්‍රකාශයෙන්ම පැහැදිලිය. එහෙත් එවැනි සිද්ධීන් සිදු නොවූ බවත්, මුස්ලිම් දේවස්ථානවලට පහරදීමක් සිදු වී නැති බවත්, "සුඩර් ඔළි" පුවත් පතේ ප්‍රකාශයන් හා ප්‍රවෘත්තීන් අසත්‍ය ප්‍රවෘත්තීන් බවත් අවධාරණය කරනු කැමැත්තෙමි.

තවද බොහෝ මාධ්‍ය ආයතන ඉතා සුළු සිද්ධීන් පුම්බා බරපතළ සිද්ධීන් ලෙස හුවා දැක්වීමට කටයුතු කිරීම කනගාටුවට කරුණකි. එසේම මෙකී සිද්ධීන් ඇති වී මාස 6ක් 9ක් ගත වන තුරුත් පාර්ලිමේන්තුවේදී මේ පිළිබඳව වහා ප්‍රශ්න නොකළේ මන්දැයි ප්‍රශ්න කළ යුතුව ඇත. මේ ප්‍රශ්නය පිළිබඳව එතරම් උනන්දුවක් දක්වන්නේ නම් එකී සිද්ධීන් ඇති වූ අවස්ථාවේදීම මෙම ප්‍රශ්නය මතු කළ හැකිව තිබුණි. ඒ නිසා ඉතා පැහැදිලිව පෙනී යන්නේ වැරදි පුවත් පත් වාර්තාවන් හා තොරතුරු පදනම් කර ගනිමින් විපක්ෂ නායකවරයා මෙම ප්‍රකාශය කර ඇති බවයි.

මාගේ මුල් ප්‍රකාශයේ හිරියාල හා කුරුණෑගල කිසිදු සිද්ධියක් වාර්තා වී නොමැති බව පොලීසිය වාර්තා කරන ලදැයි මා ප්‍රකාශ කර නැත. ඒ පිළිබඳව මවිසින් කරන ලද ප්‍රකාශයේ පහත සඳහන් ඡේදය මෙම ගරු සභාවේ දැන ගැනීම සඳහා නැවතත් උපුටා දක්වමි.

"පොලිස්පතිතුමාගේ වාර්තාව අනුව වදුරඹ, නවගමුව, අලුත්ගම, බදුල්ල, පයාගල, කුරුණෑගල යන නගරවල හලාල් ආහාර වර්ජනය කිරීමේ තේමාව හා වෙනත් කරුණු මුල් කොට ගෙන සුළු සිද්ධීන් කිහිපයක් වාර්තා වී ඇති අතර, එකී සිද්ධීන් පිළිබඳව පොලීසිය වහාම ක්‍රියාත්මක වී මෙකී සිද්ධීන්ට වග කිව යුතු පුද්ගලයින් අත් අඩංගුවට ගෙන අධිකරණයේ නඩු පැවරීමත්, සිද්ධීන් කිහිපයකදී පාර්ශ්වකරුවන් කැඳවා පොලීසිය විසින් අදාළ සිද්ධිය පිළිබඳව වාර්තා කර සමථයකට පත් කිරීමත් සිදු කර ඇත. මෙවැනි සිද්ධීන් ඇති වූ විට ඉතා ඉවසිල්ලෙන් හා දූරදර්ශීව කටයුතු කොට ඒවා පැතිරී යාම වැළැක්වීමේ අදහසින් කටයුතු කර ඇති අතර, එකවරම දැඩි ක්‍රියාමාර්ග ගැනීම තුළින් ප්‍රතිවිරුද්ධ කොටස් අතර තවදුරටත් ගැටුම් නිර්මාණයවීමට ඉඩ ඇති බවද අවධාරණය කරනු කැමැත්තෙමි. පොලීසිය විසින් පහත සඳහන් නීතිමය ක්‍රියා මාර්ගයන් දැනටමත් ගෙන ඇති බව මෙම ගරු සභාවට වාර්තා කරනු කැමැත්තෙමි.” - මෙය තමයි මා එදා කළ ප්‍රකාශයේ කොටස.

මෙවැනි ආගමික ගැටුම් වළක්වාලීමේ බලාපොරොත්තුවෙන් බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය ආගමික ස්ථාන ගොඩ නැඟීමට අදාළ පරිපාටීන් සඳහන් කරමින් 2008.10.09 වන දින චක්‍රලේඛනයක් නිකුත් කොට ඇති අතර, 2012.07.01 වන දින නව ආගමික ස්ථාන ඉදිකිරීම් සමීක්ෂණය කිරීම සඳහා කමිටුවක් ද පත් කර තිබේ. මෙම කමිටුවට බෞද්ධ, හින්දු, මුස්ලිම් හා ක්‍රිස්තියානි දෙපාර්තමේන්තු අධ්‍යක්ෂවරුන් හා බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයාද ඇතුළත් ය. මෙම චක්‍රලේඛයන්හි සඳහන් කරුණු ගැන සියලු ප්‍රාදේශීය ලේකම්වරුන් හා පොලිස් දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇති අතර, පොලිස් මූලස්ථානය මගින්ද මීට අදාළව නව ආගමික ස්ථාන ඉදිකිරීම පිළිබඳව චක්‍රලේඛනයක් නිකුත් කර තිබේ. මෙයින් බලාපොරොත්තු වන්නේ අනවශ්‍ය ගැටීම් හා කලබල වළක්වාලීමයි. ජාතිවාදී හා ආගම්වාදී ගිනිදැල් ඇවිලවීම සඳහාත් ඒ තුළින් රජය අපහසුතාවට පත් කිරීම සඳහාත් මෑතක සිට විවිධ බලවේග මෙරට ක්‍රියාත්මක වන බව බව නොරහසකි. මේ සඳහා සමහර ජනමාධ්‍යද දැනුවත්ව හෝ නොදැනුවත්ව උපකාරී වන බව සුළු සිද්ධීන් බරපතළ සිද්ධීන් ලෙස අතිශයෝක්තියෙන් හුවා දක්වමින් පළ කරනු ලබන ප්‍රවෘත්ති වාර්තාවලින් පැහැදිලි වේ. විපක්ෂ නායකතුමාට, "සුඩර් ඔළි" පුවත් පතෙහි පළ වූයේ යැයි කියනු ලබන මාස 06ක් කල් ගිය ප්‍රවෘත්ති දෙකක් හා එම්.ටී. බදුර්දීන් නැමැත්තෙකු විසින් අතිගරු ජනාධිපතිතුමා වෙත යවන ලද්දේ යයි කියනු ලබන ලිපියක සඳහන් වූයේ යයි කියන මාස 08ක් පැරණි ප්‍රවෘත්තියක් හැරෙන්නට වෙනත් කිසිදු සාක්ෂි මත පදනම් වූ සිද්ධීන් ඉදිරිපත් කිරීමට නොහැකි වී තිබේ.

එහෙයින් මා මෙම ගරු සභාවට රජය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද ස්ථාවරය නිවැරදි බව නැවතත් කියා සිටිමි.

අන්තවාදීන් විසින් ජාතික හා ආගමික සමගිය විනාශ කිරීම සඳහා ගෙන යනු ලබන ක්‍රියාවන් පිළිබඳව විමසිලිමත්ව විමර්ශනය කොට ඒවා මැඩලීම සඳහා අවශ්‍ය වාතාවරණය සකස් කිරීමත් මේ පිළිබඳ සෑම ජන කොටසක්ම දැනුවත් කොට ආගමික හා ජාතික සමගියේ වැදගත්කම ජනතාවට ඒත්තු ගැන්වීම රජයේ මෙන්ම විපක්ෂයේද කාර්ය භාරය වේ. එහෙත් විපක්ෂ නායකතුමා නැවත නැවතත්, සුළු සිද්ධීන් හාරා අවුස්සා අසත්‍ය පුවතපත් වාර්තා මත කරනු ලබන මෙවැනි ප්‍රකාශයන් ජාතිවාදී හා අගම්වාදී ගිනිදැල් නිමා දැමීම සඳහා නොව ඒවා ලැව් ගින්නක් මෙන් පැතිරවීම සඳහා උපයෝගී වන බව කාරුණිකව පෙන්වා දෙනු කැමැත්තෙමි.

අතිගරු ජනාධිපතිතුමා හා රජයේ මැති ඇමතිවරුන්ගේ පූර්ණ සහයෝගය හා කැපවීම මතත්, ගරුතර මහා සංඝරත්නය හා සියලු ආගම්වලට අයත් ගෞරවණීය පූජකතුමන්ලාගේ හා ආගමික නායකයින්ගේ බලවත් අධිෂ්ඨානය හා ක්‍රියාශීලීත්වය මතත්, පොලිස් දෙපාර්තමේන්තුවේ බලවත් පරිශ්‍රමය මතත් ජාතිවාදී හා ආගම්වාදී ක්‍රියාවන් පැතිර යාමට ඉඩ නොදී මුල් අවස්ථාවේදීම ඒවා යටපත් කර දැමීමට හැකි වීම ජනතා ජයග්‍රහණයකි. ජාතිවාදී හා ආගම්වාදී ගැටුම්, කෝලාහල මතු නොවන ලෙස ඉවසිල්ලෙන් හා ඥානාන්විතව කටයුතු කිරීමේ වගකීම රජයට මෙන්ම විපක්ෂයටද ඇති බව පෙන්වා දෙන අතර, මේ සඳහා විපක්ෂය ලබා දෙන සහයෝගය රජයට ලබා දෙන සහයෝගයක් නොව අප මාතෘ භූමිය වෙනුවෙන් ඉටු කළ යුතු යුතුකමක් හා වගකීමක් බවද පෙන්වා දෙනු කැමැත්තෙමි. බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමාගේ අභියෝගය භාර ගෙන ලිඛිතව මම ඒ විස්තර එවන්නම්. මම ප්‍රසිද්ධියේ ඒවා ගැන ප්‍රකාශ කරන්න කැමැති නැහැ. මොකද, රටේ තිබෙන තත්ත්වය තවත් අවුල් කරන්න මට වුවමනාවක් නැහැ. අනික, හිරියාලේ, කුරුණෑගල සිද්ධීන් තවමත් සිදු වෙනවා. විශේෂයෙන්ම "සුඩර් ඔළි" පුවත් පතේ සඳහන් වුණු දේවල් ගැන මා ප්‍රකාශ කළේ හසන් අලි මන්ත්‍රීතුමාගේ ප්‍රකාශයක් තිබුණු නිසායි. ඒ නිසා මම ඒ ගැන වැඩිය කථා කරන්නේ නැහැ. හසන් අලි මන්ත්‍රීතුමාගෙනුයි, රවුෆ් හකීම් ඇමතිතුමාගෙනුයි අහන්න මේ ප්‍රශ්නය තිබෙනවාද, නැද්ද කියලා. ඒ ගැන ක්‍රියා කරන්නය කියලා මම ඉල්ලා සිටිනවා.

I also have another issue to raise. I spoke to the Hon. Leader of the House about this, Hon. Speaker. It is an important issue. That is, vacancies in the local authorities

are not filled. The Commissioner-General of Elections has stated that the amendment is unclear as to whether the vacancies should be filled according to the earlier method or whether it has to be filled under the new law to represent a ward.

Our intention in this House very clearly was that the new system applies when the next elections are held. Therefore, the vacancies should be filled now. It affects all the parties.

Secondly, Hon Speaker, I think we all agreed that the elections to a local authority is done on the basis of the local authority. Everyone in the area voted for one of the parties. Then, you apportioned it and gave a certain number of members for each of the parties. Now, you cannot go and set this aside by trying to elect people who are part of the ward. That means, the whole value of the votes of the voters in that area is dislodged. It is against the sovereignty of the people. In 1977, we came up with a Constituency system. We made provision for the PR system and, if necessary, to hold by-elections also. But, here we are going from a PR system into a Constituency system. So, that can only operate, as we decided, at the time that the new system comes in. I think we should ask the Ministers to go into it. I am told that the Attorney-General is going into it. The best that we can do is, the Party Leaders can speak with the Attorney-General and the Commissioner-General of Elections and ask them to fill up the vacancies and we can bring any covering legislation that is required. Otherwise, you cannot do it. In any case, you cannot fill it up ward-wise because then, you will be going against the franchise exercised under the PR system.

## II

## නීති විද්‍යාල ප්‍රවේශ විභාගයේ විෂය නිර්දේශය වෙනස් වීම

சட்டக் கல்லூரிப் பிரவேசப் பரீட்சைப் பாடத்திட்டத்தில் மாற்றம்

CHANGE OF LAW COLLEGE ENTRANCE EXAMINATION SYLLABUS

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, 23(2) ස්ථාවර නියෝගය යටතේ මෙම ප්‍රකාශය කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මම ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

මේ වන විට උසස් පෙළ සමත් සිසු සිසුවියන් විශාල පිරිසකට බලපා තිබෙන නීති විද්‍යාල ප්‍රවේශ විභාගයේ විෂය නිර්දේශය වෙනස් වීම සම්බන්ධයෙන් මෙම ගරු සභාවේ අවධානය යොමු කරවීමට මා අපේක්ෂා කරනවා.

උසස් අධ්‍යාපනය අපේක්ෂා කරන උසස් පෙළ සමත් සිසු සිසුවියන් විශාල පිරිසකට වෘත්තීමය ක්ෂේත්‍රයකට මඟ පෙන්වන ආයතනයක් වන්නේ ශ්‍රී ලංකා නීති විද්‍යාලයයි. ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ඇතුළත් වීම සඳහා පවත්වනු ලබන ප්‍රවේශ විභාගයට වසරකට 8,000ක පමණ සංඛ්‍යාවක් පෙනී සිටින අතර, ඉන් සමත් වන සිසුන් 225ක් පමණ නීති විද්‍යාලයට ඇතුළත් කර ගැනෙනවා. 1999 වසරට පෙර මෙම ප්‍රවේශ විභාගය භාෂාව, බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම යන විෂයයන්ගෙන් සමන්විත වුණා. එම විෂය නිර්දේශය ග්‍රාමීය පසුබිමකින් පැමිණෙන, අඩු ඉංග්‍රීසි දැනුමක් ඇති සිසුන්ට අසාධාරණයක් වන බවට මතු වූ විවේචන හේතුවෙන් නීතියේ ස්වභාවය, භූමිකාව, ප්‍රභවය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, කාලීන නෛතික තොරතුරු ආශ්‍රිත නීතියේ පසුබිම නම් නව ප්‍රශ්න පත්‍රයක් හඳුන්වා දෙනු ලැබ මේ වන තෙක් එය ක්‍රියාත්මක වූවා.

කෙසේ වුවද නීති විද්‍යාලය මේ වන විට, එනම් අගෝස්තු මාසයේ පවත්වනු ලබන විභාගයට මාස 06කට පෙර - ඒ කියන්නේ මෙම පෙබරවාරි මස මුල සතියේදී- නිවේදනය කර ඇත්තේ 2013 ප්‍රවේශ විභාගයේ විෂය නිර්දේශය බුද්ධි පරීක්ෂණය, සාමාන්‍ය දැනීම හා භාෂා හැකියා පරීක්ෂණය ලෙස වෙනස් වන බවයි.

ඒ කියන්නේ 1999ට පෙර පැවැති තත්ත්වයට තමයි මේ ගිහින් තිබෙන්නේ. ග්‍රාමීය පසුබිමකින් පැමිණෙන සිසු දූවා දරුවන්ට නීති විද්‍යාලයට ප්‍රවේශ වීම සඳහා අවශ්‍ය වන ඉඩකඩ නිර්මාණය කිරීම වෙනුවෙන් තමයි මෙම විෂය සංශෝධනය කළේ. මෙම හදිසි නිවේදනය 2013 වසරේ විභාගයට පෙනී සිටීමට සූදානම් සිසු සිසුවියන් බරපතළ අපහසුතාවකට ඇද දමා තිබෙනවා. ඔවුන් මෙම විභාගයට සූදානම් වීම ඇරඹුවේ පසු ගිය වසරේ අගෝස්තු මාසයේ සිටයි. සාමාන්‍යයෙන් පෞද්ගලික පන්ති තමයි මේ සඳහා තිබෙන්නේ. එළඹෙන වසරේ විභාග වෙනුවෙන් ඊට පෙර අගෝස්තු මාසයේ සිට පැවැත්වෙනවා. මාස 06ක් පැරණි විෂය නිර්දේශය යටතේ විභාගයට සූදානම් වූ ඔවුන්ට නව විභාගයට සූදානම් වීම සඳහා ඇත්තේ තව මාස 06ක් පමණයි. පසු ගිය 2012 වසරේ නීති ප්‍රවේශ විභාගයේ ප්‍රතිඵල සම්බන්ධයෙන් මහත් ආන්දෝලනාත්මක තත්ත්වයක් ඇති වූ පරිසරයක් තුළ බොහෝ දෙනෙකුගේ බලාපොරොත්තුව වී තිබුණේ මෙවර විභාගය සඳහා හොඳින් පෙනී සිටීමයි. කෙසේ වුවද නීති විද්‍යාලයේ නව තීරණය අනුව පසු ගිය වසරවල විභාගයට පෙනී සිටි සහ 2013 වර්ෂයේ පළමුවරට විභාගයට පෙනී සිටින සිසු සිසුවියන් බලවත් මානසික පීඩාවකට පත්ව තිබෙනවා.

මෑත කාලීන විභාග ක්ෂේත්‍රයේ අර්බුදකාරී තත්ත්වයන් නිතර පැන නඟිමින් තිබෙනවා. මෙවැනි තත්ත්වයන්ට හේතු වී තිබෙන්නේ, එම ක්ෂේත්‍රවල හිතුවක්කාරී හා අත්තනෝමතික තීන්දු තීරණයි. ඒවා එක් අයෙකුගේ හෝ කිහිප දෙනෙකුගේ ක්‍රියා කලාපයන්හි ප්‍රතිඵල වුවද විශාල තරුණ පිරිසකගේ ජීවිතවලට බලපානු ලබනවා. සාමාන්‍යයෙන් විභාග බඳු සංකීර්ණ හා සංවේදී ක්ෂේත්‍රයක සිදු කරනු ලබන වෙනස්කිරීම් ක්ෂණිකව සිදු කරනු ලබන්නේ නැහැ. විෂය ක්ෂේත්‍රයේ විද්වතුන්ගේ නිර්දේශ සහිතව ගනු ලබන තීරණ ප්‍රසිද්ධියට පත් කොට ක්‍රියාත්මක වීමට අවම වශයෙන් වසර 2ක පමණ කාලයක් ලබා දෙනවා. සැබැවින්ම මෙවැනි ක්ෂේත්‍රයක ක්ෂණික අත්හදා බැලීම් සිදු කිරීම මඟින් සිසු සිසුවියන්ගේ ජීවිත ඇද දමන්නේ බරපතළ අවදානමකටයි. එය බොහෝකොටම රැකියා විරහිත තරුණ තරුණියන් අපේක්ෂාභංගත්වයට තවදුරටත් ඇද දමනවා. මෙම තත්ත්වය තුළ නීති විද්‍යාල ප්‍රවේශ විභාගයේ සිදු කරනු ලබන විෂය නිර්දේශ වෙනස්කම් කිසිදු සිසු කොටසක් අසාධාරණයට ලක් නොවන ලෙසට සංශෝධනය කිරීම සඳහාත් එම වෙනස්කම් කඩිමුඩියේ 2013 වසරේ සිදු නොකර පසුව සිදු කිරීම සඳහාත් පියවර ගැනීමට මෙම ගරු සභාව මැදිහත්විය යුතු යැයිද යෝජනා කරනවා, ගරු කථානායකතුමනි. මොකද, 1999 හඳුන්වා දෙන ලද නව විෂය නිර්දේශය තමයි ඉවහල් වුණේ ග්‍රාමීය වශයෙන් අඩු ඉංග්‍රීසි දැනුමක් සහිත පිරිසකට නීති විද්‍යාලයට ප්‍රවේශ වෙන්න. නමුත් නව විෂය නිර්දේශය අනුව සිදු වන්නේ 1999ට පෙර තිබුණු

[ගරු අනුර දිසානායක මහතා]

තත්ත්වයට පත් වීමයි. නගරබද යමක් කමක් හැකියාවක් සහිත පිරිසකට නීති විද්‍යාලයේ දොරටු විවර කිරීම සඳහා දරන ප්‍රයත්නයක් ලෙස තමයි එම සංශෝධනය සිදු වී තිබෙන්නේ.

මේ අනුව පැන නඟින පහත ප්‍රශ්නවලට අදාළ අමාත්‍යවරයා මෙම සභාව හමුවේ පිළිතුරු දෙනු ඇතැයි අපේක්ෂා කරනවා.

01. ශ්‍රී ලංකා නීති විද්‍යාල ප්‍රවේශ විභාගයේ විෂය නිර්දේශ වෙනස්කමේදී 1999ට පෙර පැවැති පැරණි ක්‍රමවේදය කරා ආපසු යාමේ පදනම කුමක්ද?

02. නව විෂය නිර්දේශය සකස් කරන ලද්දේ කවුරුන් විසින්ද? ඒ සඳහා සලකා බලන ලද්දේ කවර විද්වතුන්ගේ නිර්දේශයන්ද?

03. නව විෂය නිර්දේශ සංශෝධනය මඟින් නාගරික හෝ ග්‍රාමීය සිසු කොටස්වලට විශේෂ වාසිදායක තත්ත්වයක් හෝ අසාධාරණයක් සිදුවීමට ඉඩක් නොමැතිද?

04. විභාගයට මාස 06ක් තිබියදී වෙනස්කම් සිදු නොකොට විෂය නිර්දේශ සංශෝධන පසුවට කල් තැබීමට කටයුතු නොකරන්නේ මන්ද?

මේ පිළිබඳව ගරු අමාත්‍යතුමා පිළිතුරු ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරනවා. බොහොම ස්තුතියි ගරු කථානායකතුමනි.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவுப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)

ගරු කථානායකතුමනි, ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා නඟපු මේ ප්‍රශ්නය පිළිබඳව විශාල ශිෂ්‍ය පිරිසක් අමාත්‍යාංශයේදීත් මාව හමු වෙලා කරුණු දැක්වූවා. ඒත් සමඟම අද දින මම අග්‍ර විනිශ්චයකාරතුමා - එතුමා තමයි නීති අධ්‍යාපන කවුන්සිලයේ සභාපතිතුමා- සමඟත් මේ පිළිබඳව කථා කළා. මේ අලුත් විභාග ක්‍රමය පිළිබඳව කාල පරිච්ඡේදයක් අවශ්‍ය බවටත්, ඒකට ඉඩ දීම පිළිබඳව සලකා බැලීම සාධාරණ බවටත් මම එතුමාට කරුණු දැක්වූවා. ඒ පිළිබඳව එතුමා මට පොරොන්දු වී තිබෙනවා, නීති අධ්‍යාපන කවුන්සිලය සමඟ සාකච්ඡා කරලා, කිසිම පාර්ශ්වයකට අසාධාරණයක් නොවන සේ මෙය නැවත පරීක්ෂණයට ලක් වීමට අදහස් කරන බව. එබැවින් ඒ තීරණය එන තෙක් ඉවසීමෙන් කටයුතු කරනු ඇතැයි මම බලාපොරොත්තු වනවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, පැහැදිලි කර ගැනීමකට විනාඩියකට ඔබතුමාගෙන් අවසර පතනවා.

අපි අධිකරණ ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි, අග්‍ර විනිශ්චයකාරවරු දෙන්නෙක් ඉන්නවාද, එක්කෙනාද, කොයි එක්කෙනාද කියන එක.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

පිරිමිද, ගැහැනුද?

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவுப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)

මේ රටට එක් අග්‍ර විනිශ්චයකාරතුමෙක් විතරයි ඉන්නේ කියන එක ඉතාම පැහැදිලිව කිව යුතුයි.

## වරප්‍රසාද : පාර්ලිමේන්තු රැස්වීම්වලට සහභාගිවීම වැළැක්වෙන අන්දමින් නිවස සෝදිසි කිරීම
## சிறப்புரிமை: பாராளுமன்றக் கூட்டத்துக்குச் சமுகமளிப்பதைத் தடுக்கும்வகையில் வீட்டைச் சோதனையிட்டமை
## PRIVILEGE : SEARCH OF HOUSE RESTRAINING PARTICIPATION AT PARLIAMENT SESSIONS

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

ගරු කථානායකතුමනි, 2013 පෙබරවාරි මස 08 වන දින "ත්‍රස්තවාදීන්ට සහයෝගය දීම වැළැක්වීම" සඳහා ගෙන එන ලද පනත් කෙටුම්පතේ විවාදය සහ ඡන්දය විමසීමට නියමිත පාර්ලිමේන්තු රැස්වීම පවත්වන ලදී. මෙම රැස්වීමට සහභාගිවීම සඳහා මා නුගේගොඩ පිහිටි මාගේ නිවසේ සිට පිටත්වීමට සූදානම් වන විට මිරිහාන පොලිසියට අනුයුක්ත කාන්තා උප පොලිස් පරීක්ෂක නිලංගනී මහත්මිය, පොලිස් කොස්තාපල් 70445 ඇල්වත්ත, කාන්තා පොලිස් කොස්තාපල් 8130 ගංගා යන නිලධාරින් තිදෙනා මගේ නිවසට පැමිණ දුරකථන අංක 119 මඟින් පණිවිඩයක් ලැබී ඇති බවත්, එම පණිවිඩයට අනුව මගේ නිවස සෝදිසි කිරීමට අවශ්‍ය බවත් ප්‍රකාශ කර සිටියහ. එම පණිවිඩය කුමක්දැයි විමසීමේදී කාන්තාවක් නිවසේ සිරකර ගෙන සිටින බවට ලද පණිවිඩයක් බව ඇය වැඩිදුරටත් ප්‍රකාශ කළාය. කථානායකතුමාට මේ පිළිබඳව දැනුම්දී අවසරයක් ලබා ගත්තේද විමසන විට එවැනි අවසරයක් ලබා ගෙන නොමැති බව ද, අධිකරණ සෝදිසි වරෙන්තුවක් ලබා ගෙන තිබේදැයි විමසීමේදී එවැනි සෝදිසි වරෙන්තුවක් ලබා ගෙන නොමැති බව ද මිරිහාන මූලස්ථාන පොලිස් පරීක්ෂක; ප්‍රධාන පොලිස් පරීක්ෂක රොහාන් රාජපක්ෂ මහතාගේ නියෝග මත පැමිණි බවද ප්‍රකාශ කළාය.

ඒ අනුව නිලධාරින්ට සෝදිසි කිරීමට අවශ්‍ය සහාය ලබා දුනිමි. මෙම නිලධාරින්ගේ පැමිණීමත් සෝදිසි කිරීමත් ඇතුළු රාජකාරි කටයුතු සඳහා නිලධාරින්ගේ නියෝග මත මට නිවසේ රැඳී සිටීමට සිදු විය. මේ නිසා මෙදින පවත්වන ලද පාර්ලිමේන්තු රැස්වීමට සහ ඡන්ද විමසීමට සහභාගි වීමට පැමිණීමට නොහැකි විය. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් පාර්ලිමේන්තු රැස්වීම්වලට සහභාගි වීමට ඇති මගේ වරප්‍රසාද මෙම නිලධාරින් විසින් හිතාමතාම උල්ලංඝනය කරන ලදී.

තවද 2013 පෙබරවාරි 07 වන දිනද පෙර වරු 10.00ට පමණ මිරිහාන පොලිසියේ පොලිස් කොස්තාපල් 58913 අනිල් සහ පොලිස් කොස්තාපල් 60449 ධර්මසේන යන නිලධාරින් දෙදෙනා මාගේ වැඩිමහල් දියණිය පමණක් නිවසේ සිටි අවස්ථාවේ ඉහත කාන්තා උප පොලිස් පරීක්ෂක නිලංගනී විසින් ප්‍රකාශ කරන ලද පරිදි 119 දුරකථන අංකයට ලද පණිවිඩයක් අනුව නිවස පරීක්ෂා කිරීමට අවශ්‍ය බව කියා නිවස පරීක්ෂා කර පිටව ගොස් ඇත.

එමෙන්ම 2013 පෙබරවාරි 08 වන දින පෙ. ව. 9.30ට පමණ මගේ වැඩිමහල් සහෝදරිය, මගේ පුතා, රියැදුරු සහ සහෝදරියගේ පුතා යන සිව් දෙනා නිවසේ සිටියදී මිරිහාන පොලිසියේ උප පොලිස් පරීක්ෂක සල්වතුර මහතා සමඟ නිලධාරින් තිදෙනෙකු පැමිණ දුරකථන අංක 119ට ලැබුණු තොරතුරක් අනුව නිවස පරීක්ෂා කිරීමට අවශ්‍ය බව කියා මගේ නිවස සෝදිසියට ලක් කර ඇත.

පැය 36ක් ඇතුළත එකම පොලිසියේ නිලධාරින් කණ්ඩායම් තුනක් විසින් එකම හේතුව ඉදිරිපත් කරමින් සෝදිසි වරෙන්තුවක්

හෝ කථානායකතුමාගෙන්ලබා ගන්නා ලද අවසරයක් නොමැතිව හිතාමතාම මා ඇතුළු පිරිස අප්‍රසාදයට සහ අපහසුතාවට පත් කිරීම සඳහා මාගේ නිවස සෝදිසියට ලක් කර ඇත. මේ පිළිබඳව මිරිහාන මූලස්ථාන පොලිස් පරීක්ෂක රොහාන් රාජපක්ෂ මහතා හමු වී කථා කළ විට ඔහු පවසා සිටියේ, "ඔබට ඕනෑ දෙයක් කරන්න, මම ඕනෑම උසාවියකට, ඕනෑම විභාගයකට උත්තර දී ගන්නම්, අපි එහිදී බලා ගනිමු" කියාය.

ගරු කථානායකතුමනි, මේ පොලිස් නිලධාරීන් නිවසේ සිටියදීම මා ඔබතුමාට දුරකථනයෙන් මේ පිළිබඳව දැනුම් දීමට කටයුතු කළෙමි. ඔබතුමාගේ උපදෙස් පරිදි පොලිස්පතිවරයාට දුරකථනයෙන් දැනුම් දී, කොළඹ බස්නාහිර පළාත භාර නියෝජ්‍ය පොලිස්පති සුමිත් එදිරිසිංහ මහතා වෙත 2013 පෙබරවාරි 08වන දින පස් වරු 4.00ට පමණ පැමිණිලි කරන ලදී.

මෙම පොලිස් නිලධාරීන්ගේ ක්‍රියා කලාපයන් නිසා මට පාර්ලිමේන්තු රැස්වීමට සහභාගි වීමට නොහැකි වීමෙන් මාගේ වරප්‍රසාද උල්ලංඝනය වී ඇති බැවින් මෙය වරප්‍රසාද කමිටුව වෙත යොමු කර නිසි ක්‍රියා මාර්ග ගන්නා මෙන් කාරුණිකව ඉල්ලමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු කථානායකතුමනි, මගේ වරප්‍රසාද ප්‍රශ්නය වරප්‍රසාද කමිටුවට යොමු කරනවාද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ ගැන පසුව දැනුම් දෙන්නම්.

## උපදේශක කාරක සභා
## ஆலோசனைக் குழு
## CONSULTATIVE COMMITTEE

### I

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා :

"2010 මැයි මස 05 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, "පරිසර කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව" සහ "තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව", පිළිවෙළින් "පරිසර හා පුනර්ජනනීය බලශක්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව" සහ "තාක්ෂණ, පර්යේෂණ හා පරමාණුක බලශක්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව" යනුවෙන් හැඳින්විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

### II

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා :
"මතු දැක්වෙන පරිදි උපදේශක කාරක සභා පහක් (05) පත් කළ යුතු ය.

1. සීනි කර්මාන්ත සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
2. ආයෝජන ප්‍රවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
3. උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
4. අධ්‍යාපන සේවා කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
5. වනජීවී සම්පත් සංරක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව

අංක 109 දරන ස්ථාවර නියෝගය අනුව කාරක සභාව වෙත යොමු කරනු ලබන කරුණු සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා ඒ පිළිබඳව වාර්තා කිරීම සඳහා 106 දරන ස්ථාවර නියෝගයේ විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද එක් එක් උපදේශක කාරක සභාව පස් දෙනෙකුට (05) නොඅඩු සහ විසිපස් දෙනෙකුට (25) නොවැඩි සාමාජිකයන් සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය. එක් එක් උපදේශක කාරක සභාවේ ගණපූරණය සභික මන්ත්‍රීන් තුන් දෙනෙකු (03) විය යුතුය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
Sir, I rise to a point of Order.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා විසින් අංක 1 සහ 2 යෝජනා ඉදිරිපත් කළා. අලුතෙන් පත් කරන ලද අමාත්‍යාංශ සඳහා පාර්ලිමේන්තුවේ උපදේශක කාරක සභාවන් පත් කිරීම වෙනුවෙන් වූ යෝජනාව තමයි ඉදිරිපත් කරලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, එක ගැසට් එකක් ඉදිරිපත් කළා, එහි ඒ අමාත්‍යවරුන්ගේ නම් ඇතුළත් කරලා තිබුණා. නමුත් ගරු කථානායකතුමනි, තවමත් මෙම අමාත්‍යාංශවලට අයත් වන ආයතන සහ විෂයයන් ගැසට් කරලා නැහැ. ආයතන සහ විෂයයන් ගැසට් කරන්නේ නැතුව මේ පාර්ලිමේන්තුවේ උපදේශක කාරක සභාවන් පත් කරන්නේ කොහොමද?

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා (ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ - பொருளாதார அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Basil Rohana Rajapaksa - Minister of Economic Development)
ගැසට් කරලා තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කොහේද ගැසට් කරලා තිබෙන්නේ? [බාධා කිරීමක්] පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා නැහැ තවම.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
නැත්තේ මොකද? අරගෙන බලන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කොහේද තිබෙන්නේ? [බාධා කිරීමක්] පාර්ලිමේන්තුවේ නැහැ. [බාධා කිරීම්] අරගෙන බලන්න තිබෙන්න එපායැ? ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ තිබෙන්නේ අමාත්‍යාංශවලට ලේකම්වරුන් පත් කිරීමේ ගැසට් නිවේදනය. මීට පෙර ඉදිරිපත් කළා, අමාත්‍යවරුන් පත් කිරීම පිළිබඳ ගැසට් නිවේදනය. ඒ අමාත්‍යවරුන්ට අදාළ විෂයයන් සහ කාර්යයන් ගැසට් කරලා නැහැ තවම. එවැනි ගැසට් එකක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා නැහැ.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
ගැසට් එක එහෙනම්-

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මේ ගරු සභාවට ඉදිරිපත් කරලා නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, ගරු මන්ත්‍රීතුමා මතු කරන ලද කරුණ පිළිබඳව දැන් සොයා බලනවා. මීළඟට ගරු මනුෂ නානායක්කාර මන්ත්‍රීතුමා විසින් පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීම.

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
## தனி உறுப்பினர் சட்டமூலங்கள்
## PRIVATE MEMBERS' BILLS

### මොහාන් ලාල් ග්‍රේරු පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### மொஹான் லால் கிரேரு மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### MOHAN LAL GRERO FOUNDATION (INCORPORATION) BILL

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා :

"මොහාන් ලාල් ග්‍රේරු පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***
***වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත අධ්‍යාපන අමාත්‍යතුමා වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் நிலைக்கட்டளை இல. 47(5) இன்படி கல்வி அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*
*The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Education for report.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රධාන කටයුතු.

## ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත : නියමය
## செயல்நுணுக்க அபிவிருத்திக் கருத்திட்டங்கள் சட்டம்: கட்டளை
## STRATEGIC DEVELOPMENT PROJECTS ACT: ORDER

[අ.භා. 2.13]

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation and Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා :

"2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2012 දෙසැම්බර් 19 දිනැති අංක 1789/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.02.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද සුවිශේෂ පනතක් තමයි ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත. අපේ රටේ ආර්ථිකයට වැදගත්, ඒ වාගේම ආයෝජන ක්ෂේත්‍රයේ සුවිශේෂ තත්ත්වයක් දරන ආයෝජන ඇතුළත් ව්‍යාපෘති සම්බන්ධයෙන් මේ සභාවට කරුණු ඉදිරිපත් කරලා මේ නියමය සඳහා සභාවේ අනුමැතිය ලබා ගෙන ඒ කටයුතු ඉදිරියට ගෙන යන්න අප බලාපොරොත්තු වනවා.

මම පළමුවෙන්ම කියන්න ඕනෑ, මෙය ඉතා ප්‍රගතිශීලී පියවරක්ය කියලා. ලෝකයේ බොහෝ රටවල මේ වාගේ නීතියක් නැහැ. අපි ඒ සෑම ආයෝජනයක් පිළිබඳවම මේ ගරු සභාවට කරුණු ඉදිරිපත් කරලා මේ ගරු සභාවේ අනුමැතිය ලබා ගන්නවා.

මේ පනත එච්චර පරණ පනතක් නොවෙයි. මේ පනත යටතේ දැනටමත් අපි ඒ වාගේ සුවිශේෂ ආයෝජන මේ රටට ගෙනැල්ලා තිබෙනවා. නිදසුන් වශයෙන් මන්නාරම ද්‍රෝණියේ තෙල් ගවේෂණය, කොළඹ සහ හම්බන්තොට ෂැන්ග්‍රි-ලා හෝටල් සංකීර්ණ, ලංකා වානේ සංස්ථාව වැඩිදියුණු කිරීම, දකුණු කොළඹ වරාය විකාශන ව්‍යාපෘතිය, සාම්පූර්වල ඉදි වන ගල් අඟුරු බලාගාරය සඳහන් කරන්න පුළුවන්. ඒ වාගේම පසු ගිය දවසක මෙම ගරු සභාව අනුමත කරපු නියමය අනුව සීමාසහිත වෙල්කම් හොටෙල්ස් ලංකා පුද්ගලික සමාගමත් එක්ක විශේෂයෙන්ම ෂෙරටන් සමාගම ගෙන්වා ගන්න අපි බලාපොරොත්තු වනවා.

අපේ සංචාරක ක්ෂේත්‍රය සම්බන්ධව දැන් අපි තවත් නියමයක් ඉදිරිපත් කරනවා. ගරු කථානායකතුමනි, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ වූ මෙම නියමයෙන් සීමාසහිත සිනෝ ලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගම ඇති කරන්න යන ව්‍යාපෘතියට -මම කෙටියෙන් එය විස්තර කරන්නම්- යම් යම් විධියේ පිළිගැනීම් සහ සහන ලබා දෙන්න අප බලාපොරොත්තු වනවා.

සීමාසහිත සිනෝ ලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගම බලාපොරොත්තු වෙනවා කාමර 475කින් සහ සේවා බද්ධ නිවාස 90කින් සමන්විත හෝටල් සංකීර්ණයක් හදන්න. දැන් ඒ අය එළැඹී තිබෙන ගිවිසුම අනුව ලංකාවේත් හෝටලයක් ක්‍රියාත්මක කිරීමට "හයට් රීජන්සි" කියන ජාත්‍යන්තර හෝටල් සමූහයට අවස්ථාව දෙනවා. පසු ගිය දිනවල අපි ITC එකේ ආයෝජනය ගැන සාකච්ඡා කරන වෙලාවේ - Welcomgroup කියලා කිව්වේ- ඒ හෝටල් සංකීර්ණයේ අයිතිය සහ පරිපාලනය - ownership and management - පිළිබඳව පොඩි ප්‍රශ්නයක් ඇති වුණා; ව්‍යාකූලත්වයක් ඇති වුණා. හෝටල් ක්ෂේත්‍රයේදී මුළු ලෝකයම පිළිගන්නා දෙයක් තමයි යම් කිසි කොම්පැනියක්, නැත්නම් යම් කිසි ආයෝජකයෙක් ඒ ගොඩනැඟිල්ල හදනවා, එතකොට - [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Minister, can I just have a clarification on one matter?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

Yes. - [*Interruption.*] About this? Yes, I am telling you.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

You said Sinolanka Hotels and Spa (Pvt.) Limited. Who are the shareholders of that?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

I will give you the details. Sinolanka Hotels and Spa (Pvt.) Limited is a subsidiary of another company by the name of Canwill Holdings (Pvt.) Limited operating with two other minority shareholder companies: the Sri Lanka Insurance Corporation and Litro.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Minister -

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

Let me finish. After that, you can raise any question.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

I have here a copy of the Application for the registration of that company, Sinolanka Hotels and Spa (Pvt.) Limited. Annex I of that gives the following four names as its Directors: Gamini Sedara Senarath, Piyadasa Kudabalage, Adambarage Modantha Mohan De Alwis, Hapuhinne Karunadhipathi Divarathna Wasala Mudiyanselage Neel Bandara Hapuhinne. Then, Annex II also gives the same names as its shareholders.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

So, they are Directors of the Sri Lanka Insurance Corporation.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

A share is Rs. 10 each in cumulative terms and the entire share capital is Rs. 40. So, Hon. Minister, if the Government of Sri Lanka is permitting a strategic development company, Hyatt Regency, which is supposed to come up through Sinolanka Hotels and Spa (Pvt.) Limited such tax advantages, what is the benefit that is accrued to the country?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

That is exactly what I am trying to explain. මම ඒක තේරුම් කරලා දෙන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Minister, Parliament must know who the owners are. - [*Interruption.*] Of the four shareholders, one is at the Presidential Secretariat.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු කථානායකතුමනි, මා ඒක මගේ කථාවේ දී සම්පූර්ණයෙන් තේරුම් කරලා දෙන්නම්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

හොඳයි, කථාවේ දී තේරුම් කරන්න.

[ගරු කථානායකතුමා ]

Order, please! ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා, ඔබතුමා නැඟූ ප්‍රශ්නය සම්බන්ධවයි. 2013 පෙබරවාරි 07වැනිදා සියලුම මන්ත්‍රීවරුන්ගේ මේසය මත ගැසට් පත්‍රය තබා තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
විෂයයන් ගැසට් කරපු එක?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔව්. විෂයයන් ගැසට් කරපු එක. ඔබතුමාට ලැබිලා නැද්ද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙනම් ලබා දෙන්න කියලා කියන්නම්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එවන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු කථානායකතුමනි, මෙම ගිවිසුම අනුව කොටස් මුදල් කෙසේ වුණත් අයිතිකාරයෝ තුන් දෙනෙකු ඉන්නවා. එහි පසු බිම මා කියන්නම්. ප්‍රධාන ගිවිසුම තිබෙන්නේ අර මා සඳහන් කළ විධියට සීමාසහිත සිනෝ ලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගමටයි. එය එක කොටසක් වෙන්න පුළුවන්. රජයට අයිති, රජය සම්බන්ධ වුණු ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සහ ලිට්‍රෝ ගෑස් කියන සමාගම් දෙක ඒකට ඒකාබද්ධ වෙලා තිබෙනවා. මා කියාගෙන ආව විධියට මේ හෝටල්වල ගොඩනැඟිලි අයිතිය මේ සමාගම සමඟ තිබෙන අතර, ඒකේ පාලනය - management එක-හයට් සමාගමට දෙන්න අප බලාපොරොත්තු වෙනවා. අපේ ගරු මන්ත්‍රීතුමා කිව්ව විධියට ගිය වතාවේ ෂෙරටන් එකත් එක්ක සාකච්ඡා තිබුණාට මේ අවස්ථාවේදී හයට් එකත් එක්ක ගිවිසුමක් ගහලා තිබෙනවා, ඒ ගොල්ලෝ ඒ පාලනය කරනවාය කියලා. අපේ අදහස ගරු -[බාධා කිරීමක්] ගරු කථානායකතුමනි, මගේ කථාව ඉවර වුණාට පස්සේ එතුමාට කථා කරන්න කියන්න. එතුමාට වෙලාව දීලා තිබෙනවා, ඕනෑම දෙයක් අහන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කාලයේ ප්‍රශ්නයක් ඇති වෙනවා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
You cannot anticipate me to answer all this. මගේ කථාව අවසාන කොටසේ මන්ත්‍රීතුමා අහන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඇමතිතුමාට දීලා තිබෙන කාලය පිළිබඳව ප්‍රශ්නයක් ඇති වෙනවා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
කරුණාකරලා -[බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඇමතිතුමාගේ කථාවෙන් පස්සේ ප්‍රශ්න අහන්න.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
මේ විධියට වැඩ කරන්න බැහැ නේ. මේ විධියට වැඩ කරන්න බැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කමක් නැහැ, ඔබතුමාගේ කථාවේ දී කියන්න-

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
මේ විධියට වැඩ කරන්න බැහැ. ගරු කථානායකතුමනි, මේ සම්ප්‍රදාය-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පිළිතුරු දෙන වෙලාවට -

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඒ ගොල්ලන්ට වෙලාව දීලා තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Order, please! කරුණාකර නිශ්ශබ්ද වන්න. මේ අවස්ථාවේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අප එකක් පැහැදිලි කර ගන්න ඕනෑ. මේ රටේ ආණ්ඩු කරන්නේ අපි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ වුණාට වංචා කරන්න බැහැ නේ.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
අපි අපේ තීරණ ඉදිරිපත් කරනවා. තමුන්නාන්සේලාට ඕනෑම විවේචනයක් ඉදිරිපත් කරන්න පුළුවන්. එතකොට අපට මේ පාර්ලිමේන්තුවේදී ඒවාට උත්තර දෙන්න පුළුවන්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මතක තියා ගන්න, කරන හැම වංචාවක් සම්බන්ධයෙන්ම අපි කටයුතු කරනවා, අපි බලයට ආවාට පස්සේ. [බාධා කිරීම්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කවදාද?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
වංචා ගැනත්, වංචා කප්පිත්තන් ගැනත් අපට කථා කරන්න පුළුවන්. [බාධා කිරීමක්] අපි ඉස්සර වෙලාම මේක මොකක්ද කියලා තේරුම් කරලා දෙන්න ඕනෑ නේ. අපේ පනතක් තිබෙනවා Strategic Development Projects Act කියලා. අප තෝරා ගත්තු ව්‍යාපෘති තිබෙනවා. තමුන්නාන්සේලා නොවෙයි, අපයි ඒවා තෝරා ගත්තේ. අප තෝරා ගත් ව්‍යාපෘති යෝජනා අපි මේ ගරු සභාව ඉදිරියට ගෙනෙනවා. තමුන්නාන්සේලාට ඒවා විවේචනය කරන්න අයිතියක් තිබෙනවා. ඒ විවේචනත් සලකා බලා අවසාන වශයෙන් අපි අපේ තීරණය ක්‍රියාත්මක කරනවා. මේ ගරු සභාවට ඉදිරිපත් කරලා මේ ගරු සභාවේ වැඩි ඡන්දයෙන් ඒ පනත යටතේ අපි ඒවා ක්‍රියාත්මක කරනවා. ඇයි අප මේ විධියට ක්‍රියා කරන්න බලාපොරොත්තු වන්නේ? බලන්න, පසු ගිය වර්ෂය දිහා. එක පැත්තකින් ෂැන්ග්‍රි-ලා; අනෙක් පැත්තෙන් ෂෙරටන්; ඒ වාගේමයි හයට්. දැනටමත් හිල්ටන් එක තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රට වැදගත් සංචාරක මධ්‍යස්ථානයක් හැටියට ඉදිරිපත් වන කොට මේ වාගේ හෝටල් හදන්න ඕනෑ. ලෝකයේම සංචාරකයන්ගෙන් ඉල්ලුමක් තිබෙනවා මේ වාගේ හෝටලවලට. එතකොට තමයි සංචාරකයන් මේ රට වැදගත් සංචාරක මධ්‍යස්ථානයක් හැටියට සලකන්නේ. සමහර අවස්ථාවලදී දේශීය ආයෝජකයන් තමන්ගේ නමින් හෝටල් හදා ගන්න පුළුවන්. දැන් "කිංස්බරි" කියලා හෝටලයක් තිබෙනවා; "සිනමන් ලේක්" කියලා තවත් එකක් තිබෙනවා. ඒවායේ පාලනය ඒ අයට කරන්න පුළුවන්. එහෙම නැත්නම් තවත් කෙනකුට හිතන්න පුළුවන් විවිධ හේතුන් නිසා -ඒ හේතුනුත් මා තමුන්නාන්සේලාට තේරුම් කරලා දෙන්නම් - global chain එකක් එක්ක අප සම්බන්ධ වන්න ඕනෑ කියලා. අද global chains එක්ක සම්බන්ධ වන්නේ නැතිව සංචාරක වැඩ කරන්න බැහැ. මොකද, හෝටලය තිබුණාට ඒ හෝටලයට සංචාරකයන් ගෙන්වා ගන්න ජාත්‍යන්තර ප්‍රචාරය, booking systems ආදි වශයෙන් විශාල ජාලයක් තිබෙන්න ඕනෑ. එය විශාල සංවිධානයක්. ඒ නිසා මා කියන්න සන්තෝෂයි, එක පැත්තකින් අපේ රටේ අර කිව්ව විධියේ ස්වාධීන හෝටල් තිබෙනවා. අපේම කොම්පැනි දියුණු කරපු හෝටල් තිබෙනවා. ඒවාත් six-star වෙන්න පුළුවන්, five-star වෙන්න පුළුවන්. ඒ වාගේම අප මේ chains ද මේ රටට ගෙනෙනවා. එහිදී පළමුවැනි දේ විධියට අපට කියන්න තිබෙන්නේ මේකයි. එවැනි chain එකක් හෝටලයක් හදන්නේ රට ගැන හොඳ විශ්වාසයක් තිබෙන නිසායි. අපේ ඉතිහාසයේ පළමුවැනි වතාවට පසු ගිය වර්ෂයේ සංචාරකයෝ මිලියනයක් - ලක්ෂ 10ක්- ලංකාවට ආවා.

2016 වසර වනකොට සංචාරකයන් මිලියන 2.5ක්, ඒ කියන්නේ සංචාරකයන් ලක්ෂ 25ක් මේ රටට එයි කියලා අපි බලාපොරොත්තු වනවා. එතකොට අපි බලාපොරොත්තු වන්නට ඕනෑ ඒ සඳහා කාමර 50,000ක් හදන්න. ඒ යටිතල පහසුකම් නැතිව සංචාරක ව්‍යාපාරය පවත්වාගෙන යන්න බැහැ. අනෙක් එක, අපි මුළු රටේම යටිතල පහසුකම් ඇති කරන්න ඕනෑ. පාරවල්, වරායවල්, ගුවන් තොටුපොළවල්, නගර අලංකරණය යන මේ සියල්ලම සම්බන්ධ කර ගන්නට ඕනෑ, අපේ සංචාරක ව්‍යාපාරයෙන් ප්‍රතිලාභ ලබා ගන්න. අන්න ඒකයි අපේ අදහස. මේ කරුණු වෙන වෙනම ගන්න බැහැ. ඒ නිසා මේ හෝටල් සංකීර්ණය තුළින් ඉහළ මට්ටමේ සංචාරකයන් මේ රටට ගෙන්වාගන්නට අපි බලාපොරොත්තු වෙනවා.

අද අපේ රටට සංචාරකයන් එන profile එකක් තිබෙනවා. මේ රටට එන සංචාරකයන් අපට හඳුනා ගන්නට පුළුවන් වන්නේ කොයි විධියටද? ඒ ගැන තිබෙන එක විවේචනයක් තමයි, වැඩි වියදමක් කරන අය එන අනුපාතය මදියි කියන එක. ඒකට high-end traffic කියලා කියනවා. ඒ අනුපාතය වැඩි කරන්න නම් අපි ඒ පහසුකම් ලබා දෙන්න ඕනෑ. හිල්ටන් වන්නට පුළුවන්, ෂෙරටන් වන්නට පුළුවන්, හයට් වන්නට පුළුවන්, ෂැන්ග්‍රි - ලා වන්නට පුළුවන්, ඒවායේ ඒ ඔක්කොම පහසුකම් ඇති කරලා තමයි ඉහළ මට්ටමේ සංචාරකයන් අපේ රටට ගෙන්වා ගන්නට පුළුවන් වෙන්නේ. එතකොට තමයි අපි ආයෝජනය කරලා තිබෙන මේ යටිතල පහසුකම්වලින් උපරිම ප්‍රයෝජනය ගන්න පුළුවන් වෙන්නේ. ඒ නිසා 2015 වසර වනකොට හෝටල් කාමර 50,000ක් හදන්නත්, ඒ වාගේම සංචාරකයන් ලක්ෂ 25ක් මේ රටට ගෙන්වා ගන්නත් අපි බලාපොරොත්තු වනවා.

ඊළඟට මා කියන්නට ඕනෑ, මේ සංචාරක ක්ෂේත්‍රයෙන් අපේ රටට ලැබෙන ආදායමත් දැන් ක්‍රම ක්‍රමයෙන් වැඩි වෙන බව. මේ රටට මුදල් ගලාගෙන එන ක්ෂේත්‍ර අතරින් සංචාරක ව්‍යාපාරය ඉහළම මට්ටමකට එයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. මේක අලුත් දෙයක් නොවෙයි. මට මතකයි, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේත් අභිප්‍රායක් තිබුණා, සංචාරක ව්‍යාපාරය ඉහළම මට්ටමකට ගෙන එන්නට. ඒ වාගේම ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේත් අභිප්‍රායක් තිබුණා. අද මේ සංචාරක ව්‍යාපාරය ඉහළ මට්ටමකට ගෙන එන්නට හැකි වී තිබෙන එක හේතුවක් තමයි යුද්ධය අවසන් වී තිබීම. යටිතල පහසුකම් ඇති වීමත් තව හේතුවක්. එම ක්ෂේත්‍රයේ හොඳ පාලනයක් තිබීම තවත් හේතුවක්. මේ තුළ දැන් අපට සංචාරක ව්‍යාපාරය ඉහළ මට්ටමකට ගෙන ඒමේ කටයුත්ත කරන්නට හැකියාව ලැබී තිබෙනවා.

දැන් අපි බලාපොරොත්තු වන්නේ මේකයි. විශේෂයෙන්ම මෙය නාගරික හෝටලයක්. හෝටල් හදනකොට නාගරික හෝටල් තිබෙන්නට ඕනෑ. Resort hotels ඒ ඒ කලාපවල තිබෙන්නට ඕනෑ. වෙනත් විවිධ තැන්වල හෝටල් තිබෙන්නට ඕනෑ. ඒ නිසා තමයි අපි ඒ පහසුකම් නගරයේත් ඇති කරන ගමන් පිටස්තර පළාත්වලත් ඇති කරමින් සංචාරක ව්‍යාපෘතියකට අත හිත දෙන්නේ.

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

දැන් මේ ව්‍යාපෘතියේ සුවිශේෂ ලක්ෂණයක් තිබෙනවා. ඒ සුවිශේෂ ලක්ෂණය මේකයි. මේ ව්‍යාපෘතිය කොතලාවල මහතාගේ ව්‍යාපෘතියක් ලෙස මුලින් ආරම්භ කරපු එකක්. ඒ සඳහා ශ්‍රී රාම් කියන කොම්පැනියත් එක්ක ගිවිසුම් ගහලා ආධාර ලබාගෙන තිබෙනවා. මේ ව්‍යාපෘතියට ලැබෙන මුදල්වලින් ඇමෙරිකන් ඩොලර් බිලියන 158.8ක් ආයෝජනය කරන්නට බලාපොරොත්තු වනවා. අක්කරයයි, රූඩ් 02යි, පර්චස් 1.7ක් සඳහා රුපියල් මිලියන 266ක් ආයෝජනය කර තිබෙනවා. ඒ මුදලින් දැනට කිසිම ප්‍රතිලාභයක් නොලබා සිටින ආයෝජකයන්ටත් යම් කිසි සහනයක් ලබා දෙන්න අපට අවස්ථාවක් ලැබෙනවා. ඒ නිසා මේක අපේ සංචාරක සැලැස්මේ පියවරෙන් පියවර ඉදිරියට යන වැදගත් කොටසක් බවත් මම කියන්න කැමැතියි. අපේ රටට පැමිණෙන සංචාරකයන් ගණනත්, ඒ tourist plant කියලා කියන යටිතල පහසුකම්වල ප්‍රමාණයත් අද වැඩිදියුණු වෙලා තිබෙනවා. ඒ වාගේම හෝටල් ක්ෂේත්‍රය පිළිබඳ තිබෙන පාලන දැනුම අනුව අද අපේ රටේ හුඟක් සේවකයන් විදේශ රටවල පවා ගිහිල්ලා මේ සංචාරක ක්ෂේත්‍රයේ, හෝටල් ක්ෂේත්‍රයේ හොඳින් කටයුතු කරනවා. ඔබතුමාත් දන්නවා ඇති, මැද පෙරදිග රටවලට ගියත්, බටහිර රටවලට ගියත් ඒ ලොකු හෝටල්වල හුඟක් දුරට අපේ ලාංකිකයන් වැඩ කරනවා අපට දකින්න ලැබෙන බව. විශේෂයෙන්ම මැද පෙරදිග. අපේ රටේ අයට ඇවිල්ලා වැඩ කරන්න කියලා අද ඉන්දියාවේ විශාල ඉල්ලීමක් තිබෙනවා. ඉන්දියාවේ දවසකට හෝටල් දහයක් ඇරෙනවා. මේක අපේ රටේ ජනතාව කැමැති ක්ෂේත්‍රයක්; තරුණ අය කැමැති ක්ෂේත්‍රයක්. ඒ නිසා අපි ඒ ක්ෂේත්‍රය දියුණු කරන්න ඕනෑ.

අපි ආර්ථිකය විග්‍රහ කරන කොට බොහෝ විට සාම්ප්‍රදායික විධියටමයි හිතන්නේ. මුදල් ලබා ගැනීමේ නව ක්‍රම ගැන එච්චර කල්පනා කරන්නේ නැහැ. නමුත් ඒ ඒ රටවල සුවිශේෂ ලක්ෂණ අනුව අපට ආර්ථික ව්‍යූහය සකස් කරන්න සිද්ධ වෙනවා. දැන් බලන්න, අපේ ශ්‍රමිකයෝ පිට රටවලට ගිහිල්ලා එවන සල්ලි ගැන හුඟක් බටහිර අර්ථ ශාස්ත්‍රඥයෝ, ආර්ථික විද්‍යාඥයෝ තවම කල්පනා කරලා නැහැ. ඒවා ඒ ගොල්ලන්ගේ තර්ක විතර්කවලට එකතු කරලා නැහැ. අනාගතයේදී එකතු කරයි. නමුත් අපි පිලිපීනය, තායිලන්තය, නේපාලය, ඉන්දියාව, වියට්නාමය වැනි රටවල් ගත්තොත් ඒ හැම රටකටම වාගේ අද විශාල මුදල් ප්‍රමාණයක් විදේශ විනිමය හැටියට ගලා ගෙන එනවා, ශ්‍රමිකයන් එවන මුදල් ප්‍රමාණය - remittances - නිසා.

දැන් බොහෝ දෙනෙක් IMF එක ගැන කථා කරනවා. ඇත්ත වශයෙන්ම තත්ත්වය මොකක්ද? IMF එකත් එක්ක අපේ stand-by arrangement එකක් තිබුණා. ඒක අපි ඉතාම සාර්ථකව අවසන් කළා. ඇමෙරිකන් ඩොලර් බිලියන 1.6ක් ඉතාම සාර්ථකව අවසන් කළා. ඒ ගැන ඒ ගොල්ලොත් සතුටු වුණා; අපිත් සතුටු වුණා. නමුත් ඒ කාල පරිච්ඡේදය ඉවරයි. ඒ ලැබෙන tranches ඒ විධියට ලැබිලා ඉවර කළා. එතකොට IMF එකෙන් යෝජනාවක් ආවා, තව programme එකක් කරන්න ඔයගොල්ලෝ කැමැතිද කියලා. ඇමෙරිකන් ඩොලර් බිලියන 1.5ක වටිනාකමක් තිබෙන programme එකක් දිගටම ගෙන යන්න. මේ ගැන බොහෝ වැරදි මත ඉදිරිපත් වුණා. අපේ ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ඒ ගැන පැහැදිලිව කියා තිබෙනවා. ඒ ගැන මට බොහොම සන්තෝෂයි. ඒ ගැන විවිධ මත තිබෙනවා; පැහැදිලි මතයක් නැහැ. IMF එකේ සල්ලි ගලා ගෙන එන්නේ අපේ balance of payment තත්ත්වය තහවුරු කරලා විදේශ සංචිතය වැඩි කරන්නයි. ඒකේ හොඳ ලකුණු තිබෙනවා. එහෙම එකක් තිබෙන කොට රටේ විශ්වාසය ඇති වෙනවා. ඕනෑම කෙනෙක් හිතනවා, මේක ශක්තිමත් රටක්, මේ රටේ අවශ්‍යතාවලට -මාස හයකට, නැත්නම් මාස අටකට- මුදල් ඒ ගොල්ලෝ ළඟ තිබෙනවා කියලා.

නමුත් ඒ මුදල් අය වැය පරතරය පියවා ගන්න යොදා ගන්න බැහැ. නමුත් ආර්ථිකය කඩා ගෙන වැටෙන ඉතාම අමාරු රටවලට ඒ ආධාරය දෙනවා. ඒ විධියට පකිස්ථානයට දීලා තිබෙනවා. මා හිතන විධියට ග්‍රීසියටත් දෙන්න ලැහැස්තියි. නමුත් ලංකාවේ එහෙම තත්ත්වයක් නැහැ. අද අපි මැදි ආදායම් ලබන රටක්. අවුරුදු කිහිපයකට කලින් තිබුණ ආර්ථිකයට වඩා ස්ථාවර ආර්ථිකයක් දැන් අපේ රටේ තිබෙන්නේ. ඒ නිසා ඒ විධියට මුදල් ලබා දෙන්න කියලා ඒ ගොල්ලන්ට කියන්නත් බැහැ, අපට කියන්නත් බැහැ. ඒ නිසා මේ වෙලාවේ ඒ මුදල අවශ්‍ය නැහැ කියලා අපි බොහොම සාමකාමීව, හොඳට සතුටින් සාකච්ඡා කරලා තීරණය කළා. එතැන ජයග්‍රහණයක්, පරාජයක් වාගේ දෙයක් නැහැ. මෙතෙක් කල් අපට ඒ විධියේ programme එකක් තිබුණා, දැනට නැහැ. නමුත් IMF එකේ surveillance function කියලා එකක් තිබෙනවා. ඕනෑම ආර්ථිකයක ස්වරූපය, අපේ රටේ විතරක් නොවෙයි ඇමෙරිකාවේ ආර්ථිකයත් ඒගොල්ලෝ ඒ surveillanceවලට යටත් කරනවා. ග්‍රීසියේ හෝ ලෝකයේ ඕනෑම රටක. ඒ වාගේ සාකච්ඡා කරනවා. නමුත් අපි මේ අවස්ථාවේ ඒ programme එකට යන්නේ නැති බව පැහැදිලිව කියන්න ඕනෑ. මොකද, අපට පිටරටවලින් සල්ලි ලැබෙන ක්‍රම හැදිලා තිබෙනවා. විශේෂයේම remittances සහ tourism හරහා. ඒ දෙක මත අපේ කටයුතු සාර්ථක වෙයි කියලා අපට ලොකු විශ්වාසයක් තිබෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අවසරය ඇතිව මම මේ කියන්නේ. අපට වෙනත් අංශවලින් සල්ලි ලැබෙන නිසා, අපට මුදල් තිබෙන නිසා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් අපට මුදල් එපා කිව්වාද, එහෙම නැත්නම් අප යෝජනාවලියක් ඉදිරිපත් කරලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ණය ඉල්ලුවත්, ඒ අය ඒකට අකමැති වෙලා ණය දෙන්න බැහැ කිව්වාද?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ඉතාම පැහැදිලිව, වගකීමෙන් මම කියන්න ඕනෑ අපි ණය ඉල්ලුවේ නැති බව. ඒ වාගේම ඒ ගොල්ලන්ට ඒක ප්‍රතික්ෂේප කරන්න අවශ්‍යතාවක් තිබුණේත් නැහැ. එහෙම කිසි විධියකින් අපි ඉල්ලුවේ නැහැ. ඇත්ත වශනේම අපට මේ විධියට මුදල් අවශ්‍ය නැහැයි කියලා කිව්වේ අපි තමයි කියන එක මා ඉතාම වගකීමෙන් කියනවා. ඔබතුමා ඒ ප්‍රශ්නය නඟපු එක ගැන බොහොම ස්තූතියි. ඒ ගැන කිසිම වාදයක් විවාදයක් නැහැ.

ඒක ඉතාමත්ම පැහැදිලියි. ඒක ඒ ගොල්ලන්ගේ සටහනේ තිබෙනවා. ළඟදීම ඒ ගොල්ලන්ගේ ප්‍රකාශයක් website එකේ පළ වේවි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ඒ ප්‍රශ්නය ආවේ කොහොමද?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

අපි නිරන්තරයෙන්ම IMF එකත් එක්ක සාකච්ඡා කරනවා. අපි විතරක් නොවෙයි හැම රටක්ම සාකච්ඡා කරනවා. මේක, ඒ සාකච්ඡා කරන වෙලාවේදී ඒ ගොල්ලන්ගෙන් ආපු යෝජනාවක්. අපි වොෂින්ටන්වල ඉන්නකොට තමයි ඒ ගොල්ලන් ඇහුවේ අලුත් programme එකකට යන්න කැමතිද කියලා. නමුත් අපේ වත්කම් දිහා බැලුවාම, විශේෂයෙන් අපේ විදේශ සංචිත දිහා

බැලුවාම, අපි හිතුවා ඒ වෙලාවේ අපට ඒක අවශ්‍ය නැහැයි කියලා. මොකද, අපේ සංචිතයේ මාස හතකට විතර අවශ්‍ය මුදල් අතිරික්තයක් තිබෙන නිසායි. ඒ වාගේම ඒක අද අපි මේ කථා කරන මාතෘකාවට අදාළ වෙනවා. මොකද, අපි බලාපොරොත්තු වෙනවා, සංචාරක ව්‍යාපාරයෙනුත් - remittancesවලිනුත්- අපේ විදේශ සංචිතය වැඩි වේවිය කියා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

එහෙම නැතිව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල භාණ්ඩාගාරයට ණය දෙන්න අකැමැති වෙලා මහ බැංකුවට ණය දෙන්න කැමැති වීම නිසා, මහ බැංකුවට නොවෙයි භාණ්ඩාගාරයටයි ඕනෑය කියා ඉල්ලපු එකේ ප්‍රතිඵලයක් නිසා නොවෙයිද මෙහෙම වුණේ?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

නැහැ, නැහැ. එහෙම දෙයක් නැහැ. මේ සම්බන්ධයෙන් වෙච්ච දේ වචනයෙන් වචනය මට කියන්න පුළුවන්. අපට හංගන්න දෙයක් නැහැ. [බාධා කිරීමක්] නැහැ, නැහැ. ඒ ප්‍රශ්නයේදී මෙහෙමයි වුණේ. අපේ programme එක ඉවර වුණු වෙලාවේ ඒ ගොල්ලන් තමයි යෝජනාවක් කළේ අපි දෙවැනි programme එකකට යමුය කියලා. ඒක පිළිගන්න එක හෝ නොපිළිගන්න එක අපේ වැඩක්. නමුත් ඇත්ත වශයෙන්ම අපේ අය වැය පරතරය - fiscal gap - එක ගැන අපට ප්‍රශ්නයක් තිබුණා. අපි විතරක් නොවෙයි, මේ රට පාලනය කරන ඕනෑම කෙනෙක් බලන්නේ ඒක අඩු කර ගන්නයි. යම්කිසි විධියකට budgetary support එකක් විධියට ඒ මුදල් ගන්න පුළුවන්ද කියා අපි බැලුවා. අපි විග්‍රහ කරලා බැලුවා. ඒ ගොල්ලන්ට නීතියක් නැහැ; ඒ ගොල්ලන්ට බලයක් නැහැ ඒ විධියට budgetary supportවලට සල්ලි වැය කරන්න. ඒක ඉතාම පැහැදිලියි. IMF එකේ ගනු දෙනු තිබෙන්නේ සම්පූර්ණයෙන්ම මහ බැංකුවත් එක්කයි. අන්න ඒකයි නියම තත්ත්වය. ලබන අවුරුද්දේදී අපි budgetary gap එක තවත් අඩු කරනවා. ඒ සඳහා තමයි අපි සංචාරක ව්‍යාපාර ආදී නොයෙක් මාර්ගවලින් අපේ ආදායම වැඩි කර ගන්නේ. ඒක ඉතාමත්ම පැහැදිලියි. ඒ නිසා මා අද මේ ක්‍රමෝපාය සංවර්ධන පනත යටතේ නියමය ඉදිරිපත් කරනවා. මේ ව්‍යාපෘතිය විතරක් නොවෙයි අනාගතයේදී තවත් ව්‍යාපෘති එනවා. ඒවා මේ රටේ ආර්ථික දේහයට ඉතාමත් වැදගත් ආයෝජනයි යම්කිසි සැලැස්මක් අනුවයි අපි ඉදිරියට යන්නේ. ඒ සැලැස්මට මේවා එකින් එක ඇතුළත් කරලා අපේ ආර්ථික ගමන යන්න අප බලාපොරොත්තු වන බව සඳහන් කරමින්, ඒ සඳහා තමුන්නාන්සේලාගේ සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

[අ.භා. 2.40]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින ඉදිරිපත් කරන ලද ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය ගැන කථා කරන්නට පෙර, ගරු සරත් අමුණුගම ඇමතිතුමා කරන ලද ප්‍රකාශයක් සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්න මා විනාඩි දෙකක් ගන්නවා. මට කියවන්න ලැබුණු පොතක මෙවැනි කථාවක් සඳහන් වී තිබුණා:

> "......... දුප්පතුන්ට කොහෙත්ම ප්‍රයෝජනයක් නැති, විදුලි බලාගාර, අධිවේගී මාර්ග, වරායන්, කාර්මික උද්‍යාන ඒ වෙනුවෙන් එම රටට ඉදි කර දෙනු ඇති."

රටක් තවත් රටකට දෙන ණය සම්බන්ධයෙනුයි මේ කථාවේ තිබෙන්නේ. අති විශාල ලෙස ණය දෙනවාය; ඒ ණය මුදල්වලින් දුප්පතුන්ට කොහෙත්ම ප්‍රයෝජනයක් නැති විදුලි බලාගාර, අධිවේගී මාර්ග, වරායන්, කාර්මික උද්‍යාන ඒ වෙනුවෙන් එම රටට ඉදි කර දෙනවාය කියන එකයි මෙයින් කියා තිබෙන්නේ. [බාධා කිරීමක්] ගරු ඇමතිතුමනි, පොඩ්ඩක් ඉන්නකෝ. ඊටපසුව සඳහන් කර තිබෙනවා, ඒ වෙනුවෙන් අති විශාල මුදලක් ගෙවන්න තිබෙනවාය කියා. ඒ මොනවාටද? ගත්තු ණයවලටයි. ඒ මුදල් ගත්තේ මොනවාටද? දුප්පතුන්ට අවශ්‍ය නැති වරායවල්, ගුවන් තොටුපළවල් හදන්නයි. එහි තවදුරටත් මෙසේ සඳහන්ව තිබෙනවා:

> "බලන්න, ඔබට අති විශාල මුදලක් ගෙවන්නට තිබෙනවා. ඔබට ඔබේ ණය ගෙවිය නොහැකියි. එබැවින් අපට මස් රාත්තලක් දෙන්න. "

ඔය මස් රාත්තලේ කථාවෙන් තමයි "ආර්ථික ඝාතකයා" කියන වචනය ආවේ. මම මේ කියවන්නේ කාගේ පොතකින්ද? මම මේ කියවන්නේ විමල් වීරවංශ මහත්මයාගේ පොතකින්. මේ පොත විමල් වීරවංශ මහත්මයා විසින් ලිව්වාය කියනවා. ඇත්ත වශයෙන්ම පොතක් ලිව්වාම, සාමාන්‍යයෙන් ඒ පොතේ නම සඳහන් කරන්න ඕනෑ, කවුද ලිව්වේ කියලා. මේකේ එහෙම නමක් නැහැ. නමුත් මේකේදී ගුණදාස අමරසේකර මහත්මයා කියනවා, එදා විමල් වීරවංශ මන්ත්‍රීතුමා විසින් මේක ලිව්වාය කියලා. මට එය සඳහන් තැන සොයා ගන්න අපහසුයි. නමුත් මම මේ පොත කියෙව්වා, මේ පොතේ තිබෙනවා. එතැනින් තමයි ඔය ඝාතක කථාව ආවේ.

අද විමල් වීරවංශ මහත්මයා "ඝාතකයා, ඝාතකයා" කියලා කියනවා. මට මතකයි "ජඩයා" කියලාත් බැණ්ණා. "මහ ජඩයෙක්" කියලාත් කිව්වා. මේ කාටද බණින්නේ? බණින්නේ ආචාර්ය පී.බී. ජයසුන්දර කියන මුදල් මා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්වරයාටයි. මේ ණය හුටපටයේ ප්‍රශ්නය නේ මෙතැන තිබෙන්නේ. අපේ ගරු ඇමතිතුමා කියනවා, ආණ්ඩුව ණය ඉල්ලුවේ නැහැයි ලු. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ආණ්ඩුවට බලෙන් ණය දෙන්න ගියා ලු. ඒක පුදුම කථාවක්. මම නම් අහලාම නැහැ මේ වාගේ විහිළු කථා. මම හිතන හැටියට Parliament jokes කියන්නේ මෙන්න මේවාට තමයි. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න කෝ. මේක මා කියන දෙයක් නොවෙයි. ගරු විමල් වීරවංශ ඇමතිතුමා කිව්වාය කියන "බටහිර බලය සහ ලංකාවේ ඉරණම" කියන පොතේ තිබෙන දෙයක්. මම හිතන විධියට සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා මේ ගැන හොඳට දන්නවා ඇති. සමහර විට ඒ කාලයේ ඉන්න විට ලියපු එකක් වෙන්නත් ඇති. මෙහෙම බලෙන් ණය දෙන්න ගියා, අපි එපා කිව්වා කියලා ඇමතිතුමා කියනවා. නමුත් අපි හොඳට දන්නවා, ආචාර්ය පී. බී. ජයසුන්දර ලේකම්තුමා මාධ්‍ය සාකච්ඡාවක් කැඳවලා කිව්වා; ඔවුන් ඒ කියන්නේ රජය, ඒ කියන්නේ ඔබතුමාගේ අමාත්‍යාංශය, "budgetary support" කියන වචනය කිව්වා; අය වැය පියවා ගැනීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණයක් ලබා ගන්න බලාපොරොත්තු වෙනවා කියලා. මේක අපි කියපු එකක් නොවෙයි. ඉන් පසුව ඔබතුමා මෙතැනදී කියනවා IMF එකට අය වැය පියවා ගන්න ණය දෙන්න නීතියකුත් නැහැ, බලයකුත් නැහැ කියලා. මේක හරි පුදුම වැඩක්. මොකද, ආචාර්ය පී.බී. ජයසුන්දර මහත්මයා මේක ගැන හොඳට දන්නවා. එතුමා නොදැන සිටියේ නැහැ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් මේ විධියේ ණය දෙන්නේ නැහැ කියලා. ඔබතුමා කියන්නේ එතුමා මේ ගැන දන්නේ නැහැ කියලාද? එතුමා හොඳට දන්නවා. නමුත් ඔබතුමන්ලා බලාපොරොත්තු වුණා, අර වැටිලා සිටින රටවලට ඉඳලා හිටලා දෙනවා වාගේ කොහොම හරි මේ කට්ටියට බටර් ගාලා මේ මුදල් ටික ලබා ගන්න.

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

නමුත් එතැනදී සිද්ධ වුණේ මෙයයි. ඔවුන් කිව්වා, "අපි සල්ලි දෙන්නම්." කියලා. එහෙම නැත්නම් ඒ සාකච්ඡාව ඇරඹෙන්නේ නැහැ නේ ගරු ඇමතිතුමා. ඔබතුමා කිව්වා හොඳට සාකච්ඡා කරලා, අපි ණය ගන්නේ නැහැ කියලා බොහොම සන්තෝෂයෙන් නිගමනයකට ආවා කියලා. ඒ කියන්නේ සාකච්ඡාවක් තිබුණා. ඔබතුමන්ලා කියනවා නම් අපට ණය ඕනෑ වුණේ නැහැ, බලෙන් දෙන්න ගියා කියලා. එහෙම නම් සාකච්ඡාවක් තිබෙන්නට විධියක් නැහැ. ගෙවුම් ශේෂයේ අර්බුදය පිළිබඳව සාකච්ඡාවක් තමයි ඇති වුණේ. ඔවුන් කිව්වා Extended Fund Facility කියන ක්‍රමයට ඇමෙරිකන් ඩොලර් බිලියන එකක ණයක් දෙන්න පුළුවන්, නමුත් ඒ සඳහා ආර්ථිකයේ නොයෙකුත් ප්‍රතිසංස්කරණයන් සිදු කරන්නට ඕනෑ කියලා. ඔබතුමන්ලා ඒ දෙයට කැමැති වුණාද, නැද්ද කියන කාරණය අපි දන්නේ නැහැ. නමුත් අපට එළියට පෙනෙන දෙය තමයි, කෙටි කාලීනව ඔබතුමන්ලා එයට කැමැති වුණේ නැහැ, ඒ නිසා ඔවුන් ණය දෙන්නට කැමැති වුණේ නැහැ කියන කාරණය.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට පැහැදිලි කිරීමට මොහොතක් ලබා දෙන්න. I just want to inform you about the facts because I am the person who held the discussions. It was never a question of what you say.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

Hon. Minister, you had your time. I did not disturb you when you spoke.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

There is a question of the IMF's ability to provide budgetary support.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

The IMF does not provide budgetary support. මෙක ඔබතුමා දන්නවා. You are Sri Lanka's Governor on the Board of the International Monetary Fund. Obviously, you know - [*Interruption.*]

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

That is why I am telling you - [*Interruption.*]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

So then, why did your Secretary ask for it? I think he is the alternate Governor. Dr. P.B. Jayasundera knows about this. Now, it is established that you all had a discussion and that discussion failed. I am not going into that anymore. Now, I want to get back to the day's topic.

දැන් හරි අමුතු කථාවක් තමයි මේ ගරු සභාවේ කථා වුණේ. දැන් Welcom Hotel එක ගැන කථා කළා; Krrish Group එක ගැන කථා කළා. අපේ අලුත් ගරු ඇමතිතුමාත් මේ ගරු සභාවේ ඉන්නවා. අපි එතුමාට ශුභ පතනවා, මෙම වැඩ කටයුතු හොඳට කර ගෙන යන්න පුළුවන් වෙන්න කියලා.

ඊළඟට දැන් කථා කරන්න යන්නේ Hyatt Regency Hotel එක ගැනයි. මේ Hyatt Regency Hotel එක කියන්නේ වෙන මොකක්වත් නොවෙයි; Ceylinco Celestial Towers කියන එකයි; අරලියගහ මන්දිරය ඉදිරිපිට තිබෙන භාගයට හදපු building එකයි. මාධ්‍යයේ පළ වෙලා තිබෙනවා, මෙම ආයතනය ලබා ගන්න ගණකාධිකරණ ආයතනය මඟින් රුපියල් බිලියන 9.2ක් ඉදිරිපත් කර තිබෙනවා කියලා. නමුත් රුපියල් බිලියන 9.2ට මෙම ආයතනය විකුණලා නැහැ. ඔවුන් කියා තිබෙන්නේ, එම ආයතනය අරගෙන එම මුදල් ලැබුණාම, ගෝල්ඩන් කී ආයතනයේ depositorsලාට ඒ සල්ලි දෙන්න Ceylinco Celestial Towers ආයතනයට හැකි වෙයි කියලායි. ගණකාධිකරණ ආයතනයට මෙම ආයතනය දෙන්නේ නැති වුණාම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙනම consortium එකක් හදලා රුපියල් බිලියන 6.8කට මෙම ආයතනය ගන්න යෝජනා කර තිබෙනවා. එය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ නිල වාර්තාවක ප්‍රකාශ වනවා. නමුත් ඒ කටයුත්තත් හදිසියේම නවතිනවා. ඒ කටයුත්ත හදිසියේම නැවතිලා, රුපියල් බිලියන 4.2ක් වැනි මුදලකට -අර මුලින් ආපු offer එකේ මුදලින් සියයට 50කටත් අඩු මුදලකට- කාට හෝ පුද්ගලයකුට හෝ පුද්ගලයන් කණ්ඩායමකට මෙම ආයතනය විකුණනවා. ඒකයි සිද්ධ වන්නේ.

දැන් අපි අහන ප්‍රධාන ප්‍රශ්නය තමයි, මෙය විකුණුවේ කාටද කියන එක. රුපියල් බිලියන 9.2ක offer එකක් තිබෙනවා නම්, ඊට අමතරව රුපියල් බිලියන 6.8ක Sri Lanka Insurance Corporation එකේ offer එකක් තිබෙනවා නම්, ඒ දෙකටම නොදී රුපියල් බිලියන 4.2ට කාට හෝ දුන්නේ ඇයි? මේ ආයෝජකයා කවුද? මේ ලාභය ගියේ කාටද?

දැන් අපි ITC Limited එකයි, Welcom Hotel එකයි ගැන කථා කරන කොට අපි විදේශ ආයෝජකයන් ගැන තමයි කථා කළේ. ගරු ඇමතිතුමාම ෂැන්ග්‍රි-ලා ගැන කිව්වා, තවත් නොයෙකුත් ආයතන ගැන කිව්වා, Indian Tobacco Company එක ගැන කිව්වා. දැන් අපි පොඩ්ඩක් පිටි පස්සට ගියොත්, 2009 ජුනි මාසයේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපති වශයෙන් සිටි ධම්මික පෙරේරා කියනවා, 2012වන කොට ඇමෙරිකන් ඩොලර් බිලියන 4ක ආයෝජනයක් ලංකාවට ලැබෙනවා කියලා. නමුත් ජනවාරි සිට සැප්තැම්බර් දක්වා අපට ලැබී තිබෙන්නේ ඩොලර් මිලියන 614ක් පමණයි. ඊයේ මා අපේ ඇමතිතුමාත් එක්ක කථා කරන කොට එතුමා කිව්වා, "නැහැ, හර්ෂ. මා දන්නවා. මා වග කීමෙනුයි කියන්නේ. ඩොලර් බිලියන 1.2ක් ලැබී තිබෙනවා"යි කියලා. හොඳයි. අපි එතුමා කියන එක විශ්වාස කරමු. ඒත් ඒ බලාපොරොත්තු වුණු ඩොලර් බිලියන හතරෙන් සියයට 25යි ලැබී තිබෙන්නේ. ඉතින් අපි එය සංසන්දනය කරන්න ඕනෑ, මේ පැත්තේ අනික් දියුණු වන රටවල් එක්ක. අපේ ගරු ඇමතිතුමා ඒ ගැන හොඳට දන්නවා.

මා බැලුවා, ගිය අවුරුද්දේ වියට්නාමය වාගේ රටකට කොපමණ ආයෝජන ලැබී තිබෙනවාද කියලා. ඇමෙරිකන් ඩොලර් බිලියන 11ක ආයෝජන ඇවිත් තිබුණා. ශ්‍රී ලංකාවට ආයෝජන එන්නේ නැත්තේ ඇයි? මා හිතන හැටියට ඔන්න ඔය ගැටලුව ගැන තමයි අපි මූලිකව කල්පනා කර බලන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නීතියක් නැති දේ ගැන අපි දිගින් දිගටම කථා කරනවා. යහ පාලනයේ බිඳ වැටීම ගැන අපි දිගින් දිගටම කථා කරනවා. Hyatt Regency Hotel කියන හෝටලය පවා expropriation Bill එකෙන් ආණ්ඩුව පවරා ගත්ත

ආයතනයක්. ආණ්ඩුව ඒ ආයතනය පවරා ගෙන -මා පස්සේ කියන්නම්, කාටද කියලා- බිලියන 4.2කට විකුණලා තිබෙනවා. කුණු කොල්ලයට තමයි මෙය දීලා තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි. පාඩු ලබනවා කියලා රජය සමහර ආයතන පවරා ගත්තා. උදාහරණයක් වශයෙන් අපේ ගරු අනෝමා ගමගේ මන්ත්‍රීතුමියගේ සෙවණගල සීනි කර්මාන්තශාලාව අත් පත් කර ගත්තා. හැරී ජයවර්ධන මැතිතුමාගේ පැල්වත්ත සීනි කර්මාන්තශාලාවත් අත් පත් කර ගත්තා. හැබැයි අජිත් දේවසුරේන්ද්‍රගේ ආයතනය අත්පත් කර ගත්තේ නැහැ. ඒ ගොල්ලන්ගේ හිඟුරාණ, ගල්ඔය සීනි කර්මාන්තශාලා අත්පත් කර ගත්තේ නැහැ. ඒවා කොපමණ පාඩු ලබන ආයතන වුණත්, ඔවුන්ට ඒවා කර ගෙන යන්න ඉඩ දෙනවා. එතකොට මෙතැන අපට ඉතාමත්ම පැහැදිලිව පෙනෙනවා, ආණ්ඩුව සමහර පුද්ගලයන්ට එක නීතියකුත්, අනික් පුද්ගලයන්ට තව නීතියකුත් බල පවත්වනවා කියලා. එම නිසා තමයි ආයෝජකයෝ මේ රටට එන්න මෙපමණ භය. ඔවුන් දන්නේ නැහැ, මොන විධියේ නීතියකට ඔවුන්ට මුහුණ දෙන්න සිද්ධ වෙයිද කියලා. Actually, I met and had a long discussion with Daniel Kaufmann, who is at the Brookings Institution. He had looked at 90 countries in the world and analysed foreign investments of those countries over a number of years. He told me, "Harsha, if there is one thing that is going to ensure a sustained flow of foreign direct investments into an economy, that is good governance. Unless and until you have good governance, it is impossible to attract the kind of investors that you like to bring in".

I think you have been to the School for Oriental and African Studies - SOAS - at the University of London. There is a Professor called Mushtaq Khan there and he has come up with an alternative theory. ඒ alternative theory එකේ මොකක් ද කියන්නේ? අර සාමාන්‍ය යහ පාලනය තිබෙන රටවලට නීතිය හැමෝටම එක විධියට බලපාන නිසා ඔවුන්ට ප්‍රශ්නයක් නැහැ. ඔවුන් ඒ රටවලට එනවා. ඇවිත් ඒ ආයතන පිහිටුවනවා. නමුත් මුෂ්ටාක් ඛාන් කියනවා, සමහර රටවල එහෙම වෙන්නේ නැහැ කියා. සමහර රටවල ඒ නීතියේ රැකවරණය ලබා දෙන්නේ පුද්ගලික කොන්ත්‍රාත්තු මතයි කියා. It is a private contract between two entities which ensures that the person who is investing is safe in the country that he is investing the money in. එතැනදී තමයි, අපට ඔය සියයට දහයේ, සියයට පහළොවේ සියයට විස්සේ, සියයට තිහේ කථා එන්නේ. මොකද, that is the price that they have to pay to obtain safety to operate in those countries. එතැන තමයි අපේ කථා හුඟක් දුරට දූෂණය, අක්‍රමිකතාව, කොමිෂන් ගැහිල්ල පැත්තට යන්නේ. මොකද, මේ එන ආයෝජකයෝ වැඩි හරියක් පිළිගත් ආයෝජකයෝ නොවෙයි. දැන් Krrish Group එක ගන්න. Krrish Group එක හතර වරක් සංශෝධනය කළ Agreement එකට තවම සල්ලි ගෙවා ඉවර නැහැ.

අපේ ගරු ඇමතිතුමා නොවැම්බර් මාසයේ 24 වන දා කිව්වා, දෙසැම්බර් මාසයේ 15 වනදා වෙනකොට මේක සම්පූර්ණයෙන්ම ගෙවනවාය කියා. නමුත් අද වෙනකොටත් ගෙවා නැති බව මම හොඳටම දන්නවා. එම නිසා තමයි මේ ණය හබයට අප ඔක්කොම පැටලෙන්නේ.

වීරවංශ මහත්මයා කිව්වේ, "ජඩයා " කියලා නොවෙයි. මම ඉස්සෙල්ලා කිව්ව වචනය වැරදියි. එහෙම කිව්වේ නැහැ. "ජඩයා" නොවෙයි "තක්කඩියා" කියා කිව්වේ. සමා වෙන්න මා ඒක ඉල්ලා අස් කර ගන්නවා. මට වැරදීමක් සිද්ධ වුණේ. "තක්කඩියා" කියා ආචාර්යතුමාට බැන්නේ, මෙන්න මේ ණය ප්‍රශ්නය නිසා යි. එතුමා කල්පනා කරනවා, කොහෙන් හෝ අපට දැන් මේ ණය ගන්නට සිද්ධ වෙලා තිබෙනවාය කියා. ආයෝජකයෝ එන්නේ නැත්නම්, අපේ රටේ ඉතිරි කිරීම් අඩු නම් ආයෝජනය කරන්නේ කොහොමද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි honestly, as you know, අපේ රටේ දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 17ක වාගේ ප්‍රමාණයක් තමයි මිනිස්සු ඉතිරි කරන්නේ. අවුරුදු හතර පහකටම ඔන්න ඔය වාගේ සමස්තයක් තමයි තියෙන්නේ. සියයට 17ක් ඉතිරි කර, සියයට 39ක්, සියයට 40ක් ආයෝජනය කරන්නේ කොහොමද? අපට සියයට 9ක, සියයට 10ක ආර්ථික වර්ධනයක් ලබා ගන්නට ඕනෑ නම්, එච්චර විතර ආයෝජනයක් කරන්න ඕනෑ. එච්චර ආයෝජනයක් අපට ලබා ගන්න අමාරුයි. ඒ ආයෝජනය ලබා ගන්න අමාරු නිසා තමයි අපට පිට රටවලින් මේ වාගේ ණය ගන්නට සිද්ධ වෙලා තිබෙන්නේ. එතකොට ආර්ථික ඝාතකයන්ගේ කථාවත්, තක්කඩියන්ගේ කථාවත් ඔය ඔක්කොම කථා එළියට එන්නේ ඔන්න ඔය ගැටලුව නිසා යි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙන්න මේ පසුබිම තුළ තමයි, අද අප විවාද කරන ව්‍යාපෘතිය ගැන කථා කරන්නට වෙන්නේ. ඒ ව්‍යාපෘතියෙන් ලබා දෙන සහන පිළිබඳව මා දීර්ඝව විස්තර කරන්න යන්නේ නැහැ. නමුත් ප්‍රධාන වශයෙන් බදුවලින් නිදහස් වෙනවා. ඒ ලාභවලින් කොටස්කරුවන්ට ලබා දෙන ලාභාංශත් බදුවලින් නිදහස් වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේ බදුවලින් නිදහස් වෙනවා. මෙතැන ගැටලුව තිබෙන්නේ, කවුද මේ ආයෝජකයෝ කියන එකයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා කථා කරනකොට ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා කලින් ඉදිරිපත් කළ ඒ ලියකියවිලි එකතු කළාම අපට ජේන්නේ සිනෝ ලංකා හොටෙල් කියන ආයතනය.

දැන් ඔබතුමාම කිව්වා කැන්විල් කියන සමාගමත් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සහ ලිට්‍රෝ ගෑස් කියන සමාගමට අයිතියි කියලා. මෙහි සඳහන් විධියට මේකේ අධ්‍යක්ෂවරුන් හැටියට ඉන්නේ ගාමිනී සෙනරත් මැතිතුමා, පියදාස කුඩාබාලගේ මැතිතුමා, මොහාන් ද අල්විස් මැතිතුමා සහ නීල් හපුහින්න මැතිතුමා යන අයයි. අප ළඟ තිබෙන රජයේ නිල ලියකියවිලිවලට අනුව රුපියල් දහයේ shares 4ක් දමලා රුපියල් 40ක් තමයි මේ ආයතනයේ ආයෝජනය කර තිබෙන්නේ. එතකොට රුපියල් 40ක් තිබෙන කොම්පැනියක් රුපියල් බිලියන 4.2ක් ගෙවලා මේ ආයතනය ගන්නේ කොහොමද කියන මූලික ප්‍රශ්නය එනවා. එහෙම නම් එතැනදී අප දන්නවා මෙතැන කිසිම විදේශ ආයෝජකයෙකු නැති බව. මේක ITC වාගේ නොවෙයි; මේක ෂැන්ග්‍රි-ලා වාගේ නොවෙයි; මේක වෙන මොකක්වත් වාගේ නොවෙයි; මේක රක්ෂණ සංස්ථාවේ තිබෙන ජනතා මුදල් සමහරුන්ගේ පෞද්ගලික අවශ්‍යතා සඳහා ඔවුන්ට ඕනෑ විධියට ආයෝජනය කිරීමක්. ඇත්ත වශයෙන්ම සිනෝ ලංකා කියන ආයතනය establish කරන්න අවශ්‍යතාවක් තිබුණේ නැහැ. මොකද මුදල් අමාත්‍යාංශය කියන විධියට 2011දී රුපියල් බිලියන 6.8ක් ගෙවලා මේ වැඩ කටයුත්ත භාර ගන්න රක්ෂණ සංස්ථාව කෙළින්ම ඉදිරිපත් වුණා. නමුත් ඒක කරන්නේ නැතිව අලුත් ආයතනයක් ගොඩ නඟලා රුපියල් බිලියන 4.2ක් වැනි අඩු මිලකට වික්කා. මේ අලුත් ආයතනයේ අයිතිකාරයෝ කවුද කියන එක තමයි දැන් පැන නඟින විශාලම ප්‍රශ්නය.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

මගේ කාලය අවසන් නිසා මට කථාව නවත්වන්න සිදු වෙනවා. මේ ප්‍රශ්නයට ගරු ඇමතිතුමාගෙන් අප උත්තර බලාපොරොත්තු වෙනවා. ඇත්ත වශයෙන්ම මේක කරන්නේ Sri Lanka Insurance Corporation එකේ මුදල්වලින් නම් එය මේකට අදාළ වන්නේ නැහැ. 2008 ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් හැටියට මේක ගේන්න ඕනෑ නැහැ. ආණ්ඩුව ඉස්පිරිතාලයක් හදන විට මෙතැනට ගෙනැත් අනුමැතිය අහන්නේ නැහැ නේ? ආණ්ඩුව පාරක් හදන කොට ඒක ව්‍යාපෘතියක් කියලා ගේන්නේ නැහැ නේ? එහෙම නම් ආණ්ඩුව හෝටලයක් හදන කොට මොනවටද මේක ගේන්නේ? මේක ගේන්නේ ආයෝජකයෝ එනවා කියලා ලෝකයට පෙන්වන්නද? නැත්නම් මේකට හේතුව මොකක්ද? කරුණාකරලා ඒවාට උත්තර දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා (ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன - முதலீட்டு ஊக்குவிப்பு அமைச்சர்)
(The Hon. Lakshman Yapa Abeywardena - Minister of INVESTMENT PROMOTION)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට විනාඩියක් දෙන්න. පළමුවෙනි එක-

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

නැහැ, නැහැ. Sir, he cannot reply now.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Minister, you can reply to that in your speech. The next speaker is the Hon. Susantha Punchinilame.

[අ.භා. 3.00]

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Susantha Punchinilame - Deputy Minister Economic Development)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාගේ කථාවට අප සවන් දුන්නා. එතුමා මේ ව්‍යාපෘතිය පිළිබඳව කිව්වා. නතර කර දමා තිබුණු ව්‍යාපෘතියක් අප මේ හදන්න භාර ගත්තේ මේ ව්‍යාපෘතිය නැවත ගොඩ නඟලා රටට ආර්ථික වශයෙන් වාසියක් ලබා දීම, රටේ රැකියා ඇති කිරීම, සංචාරක කර්මාන්තය රට තුළ ප්‍රචලිත කිරීම වැනි කාරණා ගණනාවක් මුල් කර ගෙනයි.

මෙය 2011 අංක 43 දරන ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් සහ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත යටතේ ක්‍රියාත්මක කරන වැඩසටහනක්. ඒ යටතේ සෙලින්කෝ ලෙෂර් ප්‍රොපටීස් සමාගමට අයත්ව තිබූ ඉඩම හා ගොඩනැඟිලි පවරා ගත්තා. එවකට සිටි පරිසර අමාත්‍ය ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා විසින් මීට අදාළව ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සන්දේශයට අනුමැතිය ලැබුණා. ඒ අනුව එය නාගරික සංවර්ධන අධිකාරියට අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් පැවරුණා. 2013 දී පැවැත්වීමට නියමිත පොදු රාජ්‍ය මණ්ඩල නායක සමුළුවේ රාජ්‍ය නායකයන් සහ අමුත්තන් සඳහා යොදා ගැනීම සඳහායි මෙම ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කරන්නට අප මේ සූදානම් වන්නේ.

මේ යන විරුද්ධ පක්ෂයට විවේචනය කරන්න පුළුවන්. විරුද්ධ පක්ෂයේ වගකීම තමයි විවේචනය කරන එක. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ඇතුළුව තවත් අපේ රජයේ ආයතන කිහිපයකුත් ලෝකයේ ප්‍රසිද්ධ හෝටල් ගණනාවක් ඇති හයට් රීජන්සි සමාගමත් එක්කාසු කර ගෙන තමයි මෙම හෝටල් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න යන්නේ. විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තහවුරු කර ඇති රාජ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳව මූල ධර්මවලට අනුකූලව ආර්ථික සාධාරණත්වය, දේශපාලන සාධාරණත්වය, සමාජ යහ පැවැත්ම අරමුණු කර ගෙනයි මෙම කටයුත්ත කරන්නේ. අවශ්‍ය කාලය තුළ දැන්වීම් පුවරු අලවා මේ පිළිබඳව මහ ජනතාව දැනුවත් කිරීමෙන් අනතුරුවයි අනුමැතිය ලබා ගැනීම සඳහා අද දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන්නේ. විශේෂයෙන්ම පොදු මහ ජන යහපත අරමුණු කර ගෙනයි මෙය ක්‍රියාත්මක කරන්නේ.

තමුන්නාන්සේලාත් -විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාත්- දන්නවා, අපේ රටේ මිනිස්සු ගෙවල් සඳහා එහෙම නැත්නම් අනෙකුත් දේවල් සඳහා සෙලින්කෝ ව්‍යාපාරයට මුදල් යට කර තිබෙන බව. මෙම ව්‍යාපෘතිය සාර්ථකව නිම කර ගත්තොත් ඒ අයගේ මුදල් ඒ අයට ලබා දීමටත් එකඟ වෙලා තිබෙනවා.

මෙය මහල් 17ක ගොඩනැඟිල්ලක්. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමැතිය ඇතුවයි මෙය කරන්නේ. ආයෝජන මුදල ඩොලර් මිලියන 159ක්. කාමර 475ක්, සේවා බද්ධ නිවාස 90ක් මෙයට ඇතුළත් වනවා. කැන්විල් හෝල්ඩින් (ප්‍රයිවට්) සමාගමේ අනුබද්ධ සමාගමක් වන සිනෝ ලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම ඉදි කිරීම් කටයුතු කරනවා. මෙය තරු පහේ හෝටලයක්. හයට් රීජන්සි වෙළෙඳ නාමය යටතේයි මෙය ක්‍රියාත්මක වන්නේ. විශේෂයෙන්ම රජයේ ආදායම් උත්පාදනය කර ගැනීම සහ සංචාරක කර්මාන්තයට සුවිශේෂ තැනක් ලබා දීම මේ තුළින් බලාපොරොත්තු වනවා. 2016 වන විට විදේශීය සංචාරකයන්ගේ පැමිණීම මිලියන 2.5 දක්වා වැඩි කිරීමේ අපේක්ෂාවෙන් රජය කටයුතු කරනවා. අමුණුගම ඇමතිතුමා එය සඳහන් කළා. එතුමා සඳහන් කළා වාගේ සංචාරකයන්ගේ පැමිණීම තුළින් විශාල ආදායමක් සහ රැකියා විශාල ප්‍රමාණයක් ලබා ගැනීමට අපි බලාපොරොත්තු වෙනවා.

හයට් රීජන්සි සමූහ ව්‍යාපාරයට වසර 50ක ඉතිහාසයක් තිබෙනවා. රටවල් 45ක මෙය ව්‍යාප්ත වී තිබෙනවා. වෙළෙඳ නාම 7ක් තිබෙනවා. දේපළ ගත්තොත් ලෝකයේ විවිධ රටවල හෝටල් 492ක් තිබෙනවා. හෝටල් කාමර 135,327ක හිමිකමක් තිබෙනවා. කළමනාකරණ කණ්ඩායම 90,000ක් මෙම සමාගමේ සිටිනවා. දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදන අනුව ව්‍යාපෘතිය සඳහා වසර 10කට බදු ගෙවීම අවශ්‍ය නැහැ. බදු නිදහස් කාලයේදී සහ ඉන් මතු වසරක කාලයක් සඳහා කොටස්කරුවන් හට බෙදා දෙනු ලබන ලාභාංශ සඳහා බදු නිදහස ලැබෙනවා. ව්‍යාපෘති සමාගම ලාභ උපයන මුල් වසර ආරම්භයේ සිට හෝ වාණිජමය කටයුතු ආරම්භ කිරීමෙන් වසර 3කට පසු යන දෙකින් කලින් එළඹෙන දින සිට බදු නිදහස් කාලය ආරම්භ වනවා. බදු සහන කාලයෙන් පසු එළඹෙන වසර 15ක කාලය සහනකාරී බදු කාලය හැටියට ගණන් ගැනෙනවා. විශේෂයෙන්ම එවැනි සහන දෙන්නේ රාජ්‍ය ආයතන සම්බන්ධ කර ගෙන මෙම ව්‍යාපෘතිය කරන නිසයි.

අපේ හර්ෂ ද සිල්වා මැතිතුමා කිව්වා, සුළු ගණනක් දීලා ගන්නේ කියලා. විරුද්ධ පාර්ශ්වයේ නිසා ඕනෑ දෙයක් කියන්න එතුමාට නිදහස තිබෙනවා. මම ඉස්සෙල්ලා කිව්වා වාගේ, විරුද්ධ

පාර්ශ්වය නිතරම බලන්නේ කරන හොඳ කටයුත්තකටවත් 'හොඳයි' කියන්නේ නැතිව රජයට මඩ ගහන අදහසින් ක්‍රියා කරන්නයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ඉස්සෙල්ලා කිව්වා වාගේ 2016 සංචාරකයන් දස ලක්ෂයකට අවශ්‍ය පහසුකම් නිර්මාණය කිරීමට අපි බලාපොරොත්තු වනවා. මෙම ව්‍යාපාරය තුළින් මෙම හෝටලය අපේ රටේ ඉදි කිරීම නිසා ලෝකයේ විදේශ සංචාරකයන්ට අපේ රට පිළිබඳව නොදන්නා දේ ගැන පවා දැනුවත් වීමට හොඳ අවස්ථාවක් උදා වෙනවා.

අවුරුදු ගණනාවක් අපේ රටේ තිබුණු යුද වාතාවරණය නිසා, නිදහස අහිමිව තිබීම නිසා උතුරු පළාතට නැඟෙනහිර පළාතට නොතිබුණු යටිතල පහසුකම් අද වන කොට ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතේ සංචාරක කර්මාන්තය වැඩිදියුණු කරන්නට විශාල වශයෙන් ලබා දී තිබෙනවා. තමුන්නාන්සේලා ඒ පැත්තට ගියොත් පෙනේවි, එදා අවුරුදු ගණනාවකට පෙර පැවැති තත්ත්වය නොවෙයි අද තිබෙන්නේ කියන වග. අද මහා මාර්ග පහසුකම්, විදුලිය, ජලය, ඒ වාගේම ඒ අවශ්‍ය කරන සියලු යටිතල පහසුකම් මේ කෙටි කාල සීමාව තුළ අපේ රජය ලබා දීලා තිබෙනවා. ඒ පළාත්වල ගුවන් හමුදා කඳවුරු එදා තිබුණේ ආරක්ෂක කටයුතු සඳහායි. අද අපි ඒවා දේශීය සහ විදේශීය සංචාරකයන් සඳහා සංචාරක ව්‍යාපාරය වෙනුවෙන් යොදවා තිබෙනවා. අවශ්‍ය කරන පහසුකම් ඇතිව ගොල්ෆ් ක්‍රීඩාංගන ඉදි වෙලා තිබෙනවා. ඉදිරියේදී සියලුම දේශීය සහ විදේශීය සංචාරකයන්ට තල් මසුන් විශේෂ, ඩොල්ෆින් විශේෂ මුහුදේදී නරඹන්නට පුළුවන්. ඒ වාගේම ආදි කාලයේ දියේ ගිලුණු පෞරාණික නැව් දිය යට ගිහින් ගවේෂණය කරන්න, ඒ වාගේම ඒවා අධ්‍යයනය කරන්න හැකි වනවා. ඒ වාගේ දැනුමක් ලබා ගත හැකි පරිදි අපේ සංචාරක කර්මාන්තය මේ රටේ විවිධ ක්ෂේත්‍ර ඔස්සේ දියුණු කරන්නට සැලසුම් කර ගෙන යනවා. මේ කටයුතු කරන කොට අපට අනිවාර්යයෙන්ම එවැනි සංචාරකයන් සඳහා මෙවැනි තීන්දු තීරණ ගන්න සිදු වෙනවා.

විශේෂයෙන්ම මේ ව්‍යාපෘතිය අතරමඟ නතර කිරීමෙන් අපේ දේශීය අයට බලවත් අසාධාරණයක් වෙන්නට ගිය ව්‍යාපෘතියක්. රටේ විශාල ආන්දෝලනාත්මක ප්‍රශ්න ඇති කළ ආයතනයකට අනුබද්ධ වුණු ව්‍යාපෘතියක්. මේ ව්‍යාපෘති අපි ක්‍රියාත්මක කරන කොට වග කිය යුතු විපක්ෂයක් වශයෙන් රට ගැන හිතලා, රටට ආදරය කරන අය වශයෙන් මේ ව්‍යාපෘතිවලට අපට හරි උපදෙස් ලබා දුන්නොත් තමයි අපේ රටේ ඉදිරි අනාගතය වෙනුවෙන් ක්‍රියා කරන්න, රටට යහපතක් වන්නට කටයුතු කළ හැකි වන්නේ. ඒ නිසා අපේ කථික මන්ත්‍රීවරුන් ඒ කරුණු කාරණා කිව්වායින් පසුව විරුද්ධ පාර්ශ්වය මේ කාර්යයට අපට සහයෝගය ලබා දෙයි කියලා විශේෂයෙන්ම මම හිතනවා. ඒ මොකද, නැඟෙනහිර සහ උතුරු පළාත්වල රැකියා විරහිත තරුණ තරුණියෝ ලක්ෂ ගණනක් අද ඉන්නවා. එදා ඒ අවුරුදු තිහක අවිධිමත් පාලන කාලය තුළ අධ්‍යාපනය කඩා වැටිලා, ඒ පළාත්වල තරුණ තරුණියෝ පෑන වෙනුවට, පොත වෙනුවට වෙනත් දේවල් අතට ගෙන කටයුතු කළා. ඒ අය මේ රටට සේවයක් කරන්න, මේ රටේ රක්ෂාවක් කරන්න හැකි වන පරිදි, ඒ අයගේ දරුවන්ට මේ රටේ අනාගතයක් තිබිය යුතුය කියන තේමාව යටතේ තමයි අපේ රජය, ඒ වාගේම අපේ අමාත්‍යාංශය යටතේ පවතින අපේ ආයතනවලින් අපි රටේ ආර්ථිකය ගොඩනහන්න කටයුතු කර ගෙන යන්නේ.

ඒ නිසා තමුන්නාන්සේලා මේ කරුණු ගැන සලකා බලා, අද අප මේ ගෙනා නියමයට තමුන්නාන්සේලාගේ සහයෝගය ලබා දෙනු ඇතැයි කියා බලාපොරොත්තු වෙනවා. මට ලබා දී තිබුණු කාල සීමාවත් ඉවර වෙන්නට කිට්ටු බැවින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

[අ.භා. 3.13]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Deputy Chairman of Committees, I would like to contribute to this Debate on an important investment that has been brought in.

අපි මුල ඉඳන්ම කිව්වේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත ගැන කිසි ප්‍රශ්නයක් නැහැ කියලායි. නමුත් මේ නියමය ගෙනෙන ආකාරය සම්බන්ධයෙන්, මොකටද දෙන්නේ, කාටද දෙන්නේ කියන ප්‍රශ්නය තමයි තිබෙන්නේ. දැන් මේ මොහොතේ සභා ගර්භයේ ආණ්ඩුවේ මන්ත්‍රීවරු ඉන්නේ හතර දෙනායි. මේ නියමය ඉදිරිපත් කළ මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය ඇමති දැන් මේ සභාවේ නැහැ. ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන ඇමතිතුමාව මම අගය කරනවා. අලුත් අමාත්‍යාංශයේ වැඩ කටයුතු කර ගෙන යාම සම්බන්ධයෙන් මා ඔබතුමාට සුබ පතනවා. නමුත් -

**ගරු මහාචාර්ය රාජීව විජේසිංහ මහතා**
(மாண்புமிகு பேராசிரியர் ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)

Hon. Member, there are a few more Government Members.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

I am sorry. I did not see that on my left-hand side also there are some Government Members. Okay, we have six Members then, if I may clarify. But, is that sufficient? We can call for the Quorum today because you do not have Government Members here. This is Government Business. I do not want to call for the Quorum, but only to warn you all. Please get the Members to come in here. But, I do not want to call for the Quorum at this particular moment.

මා හිතන හැටියට මේ සම්බන්ධයෙන් උත්තර දෙන්නේ අපේ ලක්ෂ්මන් යාපා අබේවර්ධන ඇමතිතුමායි. අපි සරත් අමුණුගම නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඇහුවා, කරුණාකරලා මේකේ අයිතිකරු කවුද කියලා කියන්න කියලා. නිකම් Sinolanka Hotels and Spa කියන private company එක කියා කියන්නේ නැතිව ඒක අයිති කාටද, මොකක්ද වෙන්නේ කියන එක ගැන අපිව දැනුවත් කරන්න අවශ්‍යයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා වග කීමකින් මෙන්න මේ කාරණය කියනවා. 2012 ජුනි මාසයේ 04වැනි දා මා Registrar of Companiesගෙන් ඡායා පිටපතක් අරගෙන තිබෙනවා. Sinolanka Hotels and Spa (Pvt.) Limited එකේ ආයෝජකයෝ හතර දෙනෙකුගේ නම් ඒකේ තිබෙනවා. ඔවුන් අධ්‍යක්ෂවරුන් වෙනවා. ඒ නම් හතර වන්නේ ගාමිණී සෙනරත්, පියදාස කුඩාබාලගේ, මොහාන් ද අල්විස් හා නීල් බණ්ඩාර හපුහින්න. දැනට ඒ Application for Registration of a Company කියන එකේ තිබෙන නම් හතර ඒවායි. ඊට පස්සේ නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, මේකේ Sri Lanka Insurance Corporation එකේ කොටසක් තිබෙනවා කියලා. Tempelton කියන company එකේ තව කොටසක් තිබෙනවා කියලා කිව්වා. ගරු ඇමතිතුමනි, ඔබතුමා පාර්ලිමේන්තුවට එන්නේ අංග සම්පූර්ණ දැනුවත්කමක් තුළින් ද, නැත්නම් නිකම් ඇවිල්ලා අපේ පාර්ලිමේන්තුවෙන් වරමක් ලබා ගන්න එක විතරක්ද කරන්නේ? මේ සම්බන්ධයෙන් මා ඇමතිතුමාගෙන් උත්තරයක් ඉල්ලන්න කැමැතියි.

[ගරු රවි කරුණානායක මහතා]

දැන් මේ ආයතනය එන්නේ The Finance Company එකේ කොටසක් වශයෙනුයි. The Finance Company එක පටන් ගත්ත මේ ආයතනය ඊට පස්සේ ඔබතුමන්ලා 2011 නොවැම්බර් මාසයේ - under the expropriation Bill, you all expropriated this right - Professor Lakshman R. Watawala යටතේ මහ බැංකුවෙන් පාලනය කරන්න භාර දුන්නා. එතුමා ළඟ තිබුණා, මිලියන 6,900කට තක්සේරු කරපු offer එකක්. ඒක ප්‍රතික්ෂේප කරලා තිබෙනවා. KPMG එකේ තිබුණා මිලියන 9,100ක offer එකක්. ඒකත් ප්‍රතික්ෂේප කරලා තිබෙනවා. නැත්නම් මේ company එකට එන්නේ නැහැ නේ. දැන් ඔබතුමන්ලා අජිත් නිවාඩ් කබ්රාල්ගේ තක්සේරුව අනුව මේක හුවමාරු කරන්නේ මම හිතන විධියට මිලියන 3,500කට ද, 4,000කට ද කොහේදයි. අපි තවම දන්නේ නැහැ මේක තක්සේරු කර තිබෙන්නේ කීයකට ද කියලා. ඒ නිසා මේක කොයි ආකාරයෙන් ද, කාටද, කුමන තක්සේරු ක්‍රමයට ද ලබා දුන්නේ කියන ප්‍රශ්නයට ඔබතුමා උත්තර දෙන්න අවශ්‍යයි. මතක තබා ගන්න, කරන ආයෝජන පිරිසිදු මට්ටමෙන් එනවා නම් අපි විපක්ෂයක් වශයෙන් සම්පූර්ණ සහයෝගය ලබා දෙනවා. නමුත් මේක දූෂණයෙන් යුතුව, වංචා සහගතව සිදු වෙලා තිබෙනවා නම් ඔබතුමන්ලා 2011 නොවැම්බර් මාසයේ ගෙනාව පනත වාගේම පනත් නැවත ඉදිරිපත් වෙන්න අවස්ථාව ඇති කරලා තිබෙනවා කියන එකත් මතක තබා ගන්න අවශ්‍යයි.

මේකේ කිසි සේත්ම විනිවිදභාවයක් පෙනෙන්න නැහැ. මම දන්නවා, ඔබතුමාත් බැසිල් රාජපක්ෂ ඇමතිතුමාත් මේ ගැන බොහොම ඕනෑකමෙන් සටන් කළ බව. මේක වැරදි තක්සේරුවක්; හරි තක්සේරුවක් කරන්න ඕනෑ කියලා ඔබතුමන්ලා සටන් කළා. මේ අවස්ථාවේ මම ඒ කාරණයත් මතක් කරන්න ඕනෑ. මොකද, 2011 නොවැම්බර් මාසයේ අපි මේ ගැන විවාද කරන අවස්ථාවේදී ඔබතුමාගේ මතය මීට වෙනස් බව මම දැක්කා. නමුත් ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙකු වන සරත් අමුණුගම විළි ලජ්ජාවක් නැතුව දැන් ආණ්ඩුවේ ප්‍රතිපත්තියට ඒ වාගේ කියන එකත් අපේ පාර්ලිමේන්තුවට ලජ්ජා සහගත තත්ත්වයක්.

එතුමා කිව්වා, "අපියි දැන් බලයේ ඉන්නේ, ඕනෑ කෙහෙල්මලක් අපට කරන්න පුළුවන්" කියලා. ඔබතුමන්ලා මතක තියා ගන්න. අපි අද විපක්ෂයේ ඉන්නේ. හෙට අපි ආණ්ඩු බලය ගත්තාම ඒ කරපු කථා නැවත සුද්ද කරන්නත් අපට අවස්ථාව ලැබෙනවාය කියන එකත් මතක් කරන්න අවශ්‍යයි. ඒ අවස්ථාවේදී කියන්න එපා, "එක්සත් ජාතික පක්ෂය ආයෝජකයන් දිරි ගැන්වීම නවත්වන්න හදනවා" කියලා. අපි කියන්නේ, හොර, වංචාවක් තිබෙනවා නම් ඒක ශුද්ධ කිරීම අපේ වගකීමක් කියන එකයි. ඒ නිසා ගරු ඇමතිතුමනි, කරුණාකරලා මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරන්න. මේ ව්‍යාපෘතියේ කොටසක් Sri Lanka Insurance Corporation එකට තිබෙනවා කියලා අපව දැනුවත් කළාට, Department of Registrar of Companies එකේ නැහැ ඒ විස්තර. ඒ කොටස් ප්‍රමාණය මොකක්ද, කීයක්ද ආයෝජනය කරලා තිබෙන්නේ, කොහේටද ඒ සල්ලි ගෙවලා තිබෙන්නේ කියන ඒ විස්තර නැහැ.

ඔබතුමන්ලා අග්‍ර විනිශ්චයකාරතුමියට දෝෂාභියෝගය ගෙනාපු වෙලාවේ කිව්වා, ගොල්ඩන් කී කොම්පැනිය සම්බන්ධ සිද්ධිය අග විනිශ්චයකාරවරිය නිසා යටපත් වුණා, ඒ තැන්පත්කරුවන්ට ගෙව්වේ නැහැ, තිස් දෙනෙකු මැරුණා කියලා. දැන් මේ සිද්ධියටත් අවුරුදු හය-හතක් ගත වෙලා තිබෙනවා. කරුණාකරලා කියන්න, ගොල්ඩන් කී කොම්පැනිය මේ සල්ලිවලින් කාටද ගෙවලා තිබෙන්නේ කියලා? ඔබතුමන්ල් Fingara කොම්පැනිය අරගෙන තිබෙනවා. කාටද මුදල් ගෙවලා තිබෙන්නේ? ඔබතුමන්ලා Ceylinco Printing & Stationery (Pvt.) Limited අරගෙන තිබෙනවා. කාටද මුදල් ගෙවලා තිබෙන්නේ? ඇමතිවරයෙකුට ඒකේ අයිතියකුත් තිබෙනවා. ඒ වාගේම සෙලාන් බැංකුවේ රුපියල් බිලියන 2,200ක් ණයක් වශයෙන් තිබෙනවා. අඩු ගණනේ සෙලාන් බැංකුවේ තිබෙන ඒ බිලියන 2,200න් ගෝල්ඩන් කී තැන්පත්කරුවන්ට ගෙවන්න තිබුණා. ඒ සම්බන්ධයෙන් ඔබතුමන්ලා මොනවාද කරලා තිබෙන්නේ? එදා ඒ තැන්පත් කරුවන්ට බොරුවට කිරි බත් කැව්වාට, අන්තිමට මුදල් අරගෙන තිබෙන්නේ එක් කෙනෙක්, වංචා කර තිබෙන්නේ තවත් එක් කෙනෙක්. නමුත් මහ බැංකුවේ අධිපති මොකුත් කරන්නේ නැතුව අලි බබා සහ හොරු හතළිහ වාගේ එතැන ඉන්නවා. මම නැවත අහනවා, KPMG එකේ offer එක ඇයි ප්‍රතික්ෂේප කළේ කියලා. Professor Lakshman R. Watawala බොහොම දැනුමක් තිබෙන පුද්ගලයෙක්.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ගරු මන්ත්‍රීතුමනි, මා ඔබතුමාට බාධා කරන්නේ නැහැ. නමුත් සම්පූර්ණ ආයෝජනය කරන හැටි, අදාළ ප්‍රතිපත්ති පිළිබඳ විස්තරය පිළිතුරු කථාවේදී කරනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මොකක්ද, ගරු ඇමතිතුමනි?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

විනිවිදභාවයෙන් මේ කරපු දේ ගැන සම්පූර්ණ විස්තරයක් පිළිතුරු කථාවේදී කරනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මුදල් නියෝජ්‍ය ඇමතිතුමාට කියන්න බැරි දේ ඔබතුමාට කියන්න පුළුවන් නම් අපි එය අගය කරනවා. නමුත් මා මේවා කිව්වේ සාක්ෂි සහිතව තිබෙන නිසායි. ඔබතුමා සාක්ෂි සහිතව, ඔබතුමාගේ කරුණු ඔප්පු කරන්න පුළුවන් විධියට උත්තර දෙන්නත් අවශ්‍යයි. එහෙම කරනවා නම් මා ඒක අගය කරනවා. ඔබතුමාට ඒක කරන්න පුළුවන් නම් අපි එය හිස නමා භාර ගන්නවා. නමුත් මට පෙනෙන්නේ නැහැ, ඔබතුමාට ඒක සාක්ෂි සහිතව ඔප්පු කරන්න පුළුවන් වේවි කියලා. මොකද, Department of Registrar of Companies එකේ තිබෙන විස්තර ඔබතුමන්ලාට වෙනස් කරන්න බැහැ නේ. මේ ව්‍යාපෘතිය කොහොමද ඇති කරන්නේ, ඇති කරන්න යනවා නම් කා වෙනුවෙන්ද ඇති කරන්නේ කියලා කියන්න. සමහර විට මේ හතර දෙනා තව කෙනකු වෙනුවෙන් කොටස් හතරක් අල්ලා ගෙන ඉන්නවා ඇති. ඒ සල්ලි ටික වියදම් කරලා ඉවරයි. කොහොමද ඒ සල්ලි දැම්මේ? ඒ සල්ලි කොහෙන්ද ආවේ? සල්ලි දැම්මා නම් ඇයි ගෝල්ඩන් කී තැන්පත්කරුවන්ට ගෙවන්න බැරි? ගෝල්ඩන් කී තැන්පත්කරුවන් 30,000ක් විතර ඉන්නවා.

මට තිබෙනවා චෝදනාවක්. මහ ලොකුවට සද්ද කරලා වංචා කළාය කියලා චෝදනාවක් නඟලා තිබෙනවා. මොකක්ද ඒ? බොහොම විනිවිදභාවයෙන් කරපු කටයුත්තක් සම්බන්ධයෙන් අවුරුදු හතරක් ඇද ඇද යනවා. කොහෙන්ද මේ සල්ලි, කොයි රටින්ද මේ සල්ලි ඇවිල්ලා තිබෙන්නේ කියලා අහනවා. ඒ සම්බන්ධයෙන් මහාධිකරණයේ නඩුවක් යනවා.

ගරු ඇමතිතුමනි, මා ඉතාම ඕනෑකමින් ඔබතුමාගෙන් ඉල්ලන්නේ මෙයයි. ඒ ආයතන ගත්තාට පස්සේ ඔබතුමන්ලාට යුතුකමක් තිබෙනවා, ඒ තැන්පත්කරුවන්ගේ මුදල් ගෙවන්න. සෙලාන් බැංකුවේ බිලියන 2,200ක ණයක් තිබෙනවා. ඔබතුමන්ලා ඒ ණය පියවන්න කීයක් ගෙවලා තිබෙනවාද? ඒ ණය පියෙව්වා නම් එයින් තැන්පත්කරුවන් කී දෙනෙකුට ගෙවලා තිබෙනවාද? මම මේ ගෝල්ඩන් කී තැන්පත්කරුවන් වෙනුවෙන් තමයි කථා කරන්නේ. එදා කිරි බත් කෑවාට අද සතයක්වත් ලැබිලා නැති අයට දැන් අපි පෙන්වනවා ඒ සල්ලි ලබා ගන්න පුළුවන් ආකාරය. Fingara වෙන්න පුළුවන්, Ceylinco Printing & Stationery (Pvt.) Limited වෙන්න පුළුවන්. ඔබතුමන්ලා 2011 නොවැම්බර් මාසයේ Celestial Tower භාර ගත්තාට එහි නෛතිකභාවය තිබෙන්නේ වෙනත් කොම්පැනියකට. ඔබතුමන්ලාට ඒ අයිතිය ගන්නත් නැවත පාර්ලිමේන්තුවේ අනුමැතිය ගන්න වේවි. ඔබතුමන්ලා මේ ආයතන තව කෙනෙකුට පරිත්‍යාග කරන්නේ එහි නෛතිකභාවය ඔබතුමන්ලා ළඟ නැතුවයි. ඒ සම්බන්ධයෙන් අපට කියන්න තිබෙන්නේ මෙයයි. විපක්ෂයේ අපි ඒ ගැන හෙළිදරව් කිරීමක් කරලායි තිබෙන්නේ. අපි ඉතාම ඕනෑකමින් ඔබතුමාට කියනවා, කරුණාකරලා ඒ සම්බන්ධව උත්තර දෙන්න කියලා.

මේ රටේ ආර්ථිකය ගැන ඔබතුමන්ලාගේ ආර්ථික විශේෂඥයෙකු වන විමල් වීරවංශ මැතිතුමා ප්‍රකාශයක් කරලා තිබෙනවා. පාර්ලිමේන්තුවේදී අපි ප්‍රශ්නයක් ඇහුවොත් බැසිල් රාජපක්ෂ ඇමතිතුමාත්, ලක්ෂ්මන් යාපා අබේවර්ධන ඇමතිතුමාත් බොහොම මහන්සි වෙලා ඒ ප්‍රශ්නයට උත්තර දෙනවා. අපි එය අගය කරනවා. ඒ සම්ප්‍රදාය ඉදිරියට ගෙන යනවා ඇති කියලා අපි විශ්වාස කරනවා. නමුත් ඒ උනන්දුව සහ ඉදිරි දැක්ම ඔබතුමන්ලාගේ ආණ්ඩුවට ගැළපිලාවත් නැහැ. පට්ටපල් බොරු කරන, හොරකම් කරන ආණ්ඩුවක් බවට ඔබතුමන්ලාගේ ආණ්ඩුව පත් වෙලා තිබෙනවා. මේ කියන කාරණයෙන් මා කියන ඒ කාරණය වඩා ස්ථාපිත කරලා තිබෙනවා. අපි මේ කාරණය අවුරුදු හතරක, පහක-හයක කාලයක් තිස්සේ කියලා තිබෙනවා. නමුත් ඒ වේලාවේ අපි කියපු දේවල් ප්‍රතික්ෂේප කරලා අපට දේශ ද්‍රෝහියෝ කියපු විමල් වීරවංශලා නැගිටලා දැන් කියනවා, "මෙන්න මේ රටේ ආර්ථික ඝාතකයෙක් ඉන්නවා" කියලා. ඒ කවුද කියලා ඇහුවාම, ඒ මුදල් අමාත්‍යාංශයේ ලේකම් කියලා කියනවා. අපි එදා ඒක කිව්වා. හැබැයි ඒ ආර්ථික ඝාතකයාට ඒ රක්ෂාවට එන්න ඇයි විමල් වීරවංශ ඒ අවස්ථාවේදී ඉඩ දුන්නේ?

හැබැයි මා හිතන විධියට දැන් වඩා වැඩි විරෝධයක් පෙන්වනවා. මේ අවස්ථාවේ මුදල් අමාත්‍යාංශය භාරව ඉන්න ඇමති කවුද? ඒ තමයි අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා. ඉතින් මේ දේ ව්‍යංගයෙන් කියන්න හදන්නේ මහින්ද රාජපක්ෂ මුදල් ඇමතිතුමාටද? විමල් වීරවංශ ඇමතිතුමා නින්දෙන් නැඟිටලාද මේ ප්‍රකාශ කරන්නේ? අපි එතුමාගෙන් අහනවා, එතුමා ඒ කථාව කිව්වේ ජනාධිපතිතුමා දැනුවත්වද, එහෙම කියන්න කියලා ජනාධිපතිතුමා එතුමාට කිව්වාද කියලා. එහෙම නැත්නම් මේ අවස්ථාවේදී මුදල් අමාත්‍යාංශයේ ලේකම් ඉලක්ක කර ගන්නේ ඇයි කියලා අපි අහනවා. අපේ බැසිල් රාජපක්ෂ ඇමතිතුමාගේ අමාත්‍යාංශයේ ලේකම් ආර්ථික ඝාතකයකු වුණාට, අඩු ගණනේ ලෝක බැංකුවට, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට අසත්‍ය ගිණුම් හරි ඉදිරිපත් කරලා කටයුතු කරන්න පුළුවන් හැකියාවක් තිබෙනවා.

මහ බැංකුවේ අධිපති ඒ සම්බන්ධයෙන් මොනවාද කරලා තිබෙන්නේ? එයා ආර්ථික ඝාතකයෙක් නොවේද? නැත්නම් මේ ආර්ථික ඝාතකයා ඒ ආර්ථික ඝාතකයා ගැන කියනවාද? අපි කියනවා මේ තුන් දෙනාම රට නැති කරලා තිබෙනවා කියලා. ඉතින් ඒ සම්බන්ධයෙන් අපට උත්තරයක් අවශ්‍යයි. විමල් වීරවංශ ඇමතිතුමා කියා තිබෙනවා, අඩු පොලියට ණය ගන්න හැකියාව තිබෙන කොට ඇයි වැඩි පොලියට ගන්නේ කියලා. අපි ඒක පෙන්වා දුන්නා. Templeton Fund එකෙන් සල්ලි ගත්තේ ඇයි, HSBC එකෙන් ගත්තේ ඇයි කියලා අපි ඇහුවා. මේවාට උත්තර දෙන්න ඕනෑ. අපි අවුරුදු පහ, හයකට ඉස්සෙල්ලා කියාපු ඒවා විමල් වීරවංශ ඇමතිතුමා දැන් කියන එක අපි අගය කරනවා. නමුත් මෙහෙම කියන්න යම් විධියක හේතු සහගත තත්ත්වයක් තිබෙනවා. පී.බී. ජයසුන්දර අස් කරන්න ඕනෑද, රටේ මූල්‍ය අර්බුදයක් තිබෙනවාද, ඒ අර්බුදයෙන් ගලවන්න පී.බී. ජයසුන්දරගේ බෙල්ල දෙනවාද, එහෙම දෙනවා නම් ඊට වැඩිය කටයුතු කරන මහ බැංකුවේ අධිපති සම්බන්ධයෙන් නිශ්ශබ්දව සිටින්නේ ඇයි කියන එක අපි අහනවා. ඒ එක කොටසක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම කියනවා මුදල් අමාත්‍යාංශය පගා ගහනවා කියලා. අපි මේක කියා තිබෙනවා එදා ඉඳන් අද වන තුරු. මේක එක දවසක වුණු එකක් නොවෙයි, හැම දවසේම පගා ගහනවා. අපි ඒක ඔප්පු කරලා ඉවරයි. ඒ නිසා තමයි සුප්‍රීම් උසාවියේදීත් කිව්වේ "කරුණාකර, ගෙදර ඉන්න මේක සතුටුදායක තත්ත්වයක් නොවෙයි" කියලා. එහෙනම් ඇයි විමල් වීරවංශ මේ ආර්ථික ඝාතකයන් ගෙනාවේ? සුප්‍රීම් උසාවියේ එයාට විරුද්ධ තහංචියක් තිබුණා. ඉතින්, දැන් ඒ ගැන කථා කරනවා නම් එතැන ප්‍රශ්නයක් තිබෙනවා.

ඊට වැඩිය මේ කරුණු තවත් සනාථ වන කාරණයක් තිබෙනවා. ඒ මොකක්ද? පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු ඩිව් ගුණසේකර ඇමතිතුමා කියනවා මුදල් අමාත්‍යාංශයේ ලේකම් Chief Accounting Officer කියලා. නමුත් එතුමා යටතේ තිබෙන ආයතන 48ක් පාර්ලිමේන්තුවට වාර්තා ඉදිරිපත් කරලා නැහැ කියලා. ඉතින් ගරු ඇමතිතුමනි, මේවා තමයි අපි පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ඉදිරියේ කිව්වේ. ඉතින් මේ විධියට ගරු ඩිව් ගුණසේකර ඇමතිතුමාත් කිව්වාම, මේ තිබෙන ප්‍රශ්නය තවත් උග්‍ර වෙනවා.

ඔබතුමන්ලාගේ ආණ්ඩුව කියනවා, කරුණාකර Sinolanka Hotels and Spa (Pvt) Limited එකට මේ වරප්‍රසාද දෙන්න කියලා. ඊට ඉස්සෙල්ලා බලන්න, ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලයේ ඉන්න ඇමතිවරු මේ ආර්ථිකය සම්බන්ධයෙන් මොනවාද කියන්නේ කියලා. ඔබතුමන්ලා කියනවා ආර්ථික වර්ධනයක් තිබෙනවා කියලා. මහ බැංකුවේ අධිපති කියනවා සියයට අටක වර්ධනයක් තිබෙනවා කියලා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කියා තිබෙනවා සියයට හයහමාරක වර්ධනයක් තිබෙනවා කියා. මුදල් අමාත්‍යාංශය කියනවා සියයට 6.75යි කියලා. ඉතින් කවුද ඇත්ත කියන්නේ?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම කුමාර වෙල්ගම ඇමතිතුමා මොකක්ද කියන්නේ? මා බොහොම අගය කරනවා එතුමාගේ විනිවිදභාවය ගැන. එතුමා කෙළින්ම කියනවා "මට පෞද්ගලික business එකක් තියෙනවා. මම ඇමති කෙනකු කියලා බැලුවේ නැහැ, රජයේ ඒ දෙපාර්තමේන්තුවේ අයට පගාවක් දීලා මගේ වැඩේ කර ගත්තා" කියලා. හැම අමාත්‍යාංශයකම මේක වෙනවා කියලා තමයි විපක්ෂයේ අපි කියන්නේ. ඔබතුමන්ලාගේ ඇමතිවරුම එහෙම කියන කොට ඒ ඇමතිවරුන්ටත් "දේශද්‍රෝහීන්" කියනවාද? අද මේ රටේ ආර්ථික කටයුතුවලදී මේ විධියට සියයට 15ක්, 20ක් පගා ගහන නිසා, පගා දෙන නිසා නිසා ජීවන වියදම ඉතාම අමාරු තත්ත්වයක තිබෙනවා කියලා අපි බොහොම සද්භාවයෙන් කිව්වේ. ඉතින් දැන් විමල් වීරවංශ ඇමතිතුමා ඒක කියනවා; ඩිව් ගුණසේකර ඇමතිතුමා ඒක කියනවා; කුමාර වෙල්ගම ඇමතිතුමා ඒක කියනවා. ඊට වඩා තවත් කියන්න අවශ්‍ය ද ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි? මා අගය කරනවා දැන්වත් මේ ඇමතිවරු එක්සත් ජාතික පක්ෂය කියන දේ පිළිගන්න එක ගැන. මේ රට හදන්න පුළුවන් එකම පක්ෂය එක්සත් ජාතික පක්ෂයයි කියන එක අපි එදාත් කිව්වා, අදත් කියනවා.

[ගරු රවි කරුණානායක මහතා]

Sir, a heading from the online edition of "The Island" newspaper of Tuesday, 19th February, 2013 says, "Wimal calls for sweeping changes at Finance Ministry." I do not know whether he is taking a potshot at the very President who appointed him. Is he now sulking because he is unable to execute all the promises that he gave during the election? Is he not able to perform the work that he basically said he would be doing? He said he will build two hundred thousand, three hundred thousand houses a year. Has he not been able to fulfill this? Because of the non-fulfilment, are the President, the Secretary, Finance now held responsible for this? I do not know. These are matters that need to be looked into. All what we as the Opposition say is that we appreciate at least in this late stage all these people are suddenly accepting this.

ගරු ඇමතිතුමනි, ඔබතුමා සංචාරක කර්මාන්තය ගැන කිව්වා. මේ සංචාරක කර්මාන්තය අයත් වන්නේ ගරු බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයට. මේ අවස්ථාවේදී අපි පිළිගන්නවා සංචාරක කර්මාන්තයේ වර්ධනයක් තිබෙනවා කියා. අපි ඒක නැහැ කියලා කිව්වේ නැහැ. ඒක උපදේශක කාරක සභාවට ආවාම අපි කියනවා. නමුත් ඔබතුමන්ලා කොතරම් කිව්වත් ලක්ෂ 10ක සංචාරකයෝ ආවා කියලා, ඔබතුමන්ලා මේ යන ගමන සියයට සියයක් හොඳින් ගමන් කරනවා කියලා පෙන්වා දුන්නත්, මේ කර්මාන්තය ඇදගෙන යන බර කරත්තයක් බවට පත් වෙලා තිබෙනවා.

බැසිල් රාජපක්ෂ ඇමතිතුමනි, ඔබතුමා රටින් පිට ගිහිල්ලා ආවාමත් මෙතැන කියනවා, ඔන්න සුද්දෙක් ඇවිල්ලා ගියා කියලා. මම මේක මෙතැන කියන්නේ ඇයි? ඔබතුමන්ලා දරන මහන්සිය-

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට බාධා කරන්නේ නැහැ. නමුත් කිසිම ගණන් හැදිල්ලක් ඒ විධියට එන්නේ නැහැ. ඒක අමූලික අසත්‍යයක් නේ?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක මම කියන්නම්.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
කොහොමද කියන්නේ? අඩුම වශයෙන් transit එකටවත් එන්නේ නැහැ නේ? මේ සභාවට අසත්‍ය ප්‍රකාශ කරන්නේ ඇයි ?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම කියන්නම්. ගරු ඇමතිතුමනි, නොවැම්බර් මාසය වෙනකම් සංචාරකයින් ලක්ෂ දහයක් ඇවිල්ලා තිබෙනවාය කියලා ඔබතුමන්ලා කියනවා. Tourist Hotels Association එක වෙන දෙයක් කියනවා. මම ඒකත් **table*** කරනවා.

The Tourist Hotels Association says that the worst occupancy period was in the month of November and December. [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන ඇමතිතුමනි, කරුණාකරලා අහගෙන ඉන්න කෝ. මහන්සියෙන් වැඩ කරන ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා ගැන යමක් කියනවා කියලායි මම හිතුවේ. එතුමා බොහොම මහන්සියෙන් වැඩ කරනවා කියලා මාත් කියනවා.

Sir, on Page 11 of the "Gain", the supplement of "The Nation" of 3rd February, 2013, it is stated, I quote:

"Star hotels plagued by low-occupancy - Report."

2011 ඔක්තෝබර් මාසයේ 880,000ක් වූ සංචාරකයින්ගේ ප්‍රමාණය 2012 වසර වන කොට ලක්ෂ දහය හමාරක් වුණාය කියනවා. මේ ලිපියේ කියනවා, hotelsවල සංචාරකයින් අඩුම කාලය මේ මාස දෙක කියලා. එහෙනම් ඔබතුමන්ලා කියන්නේ මොනවාද? ඒ විතරක් නොවෙයි,-

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa )
ඔබතුමා පොඩ්ඩක් ගෝල්ෆේස් එකේ එහෙම ඇවිදින්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ කෘෂිකර්ම ඇමති කියනවා, අපි වෙලට බහින්නේ නැහැ කියලා. ඔබතුමා කියනවා අපි හෝටලයට යන්නේ නැහැ කියලා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

එහෙනම් අපි ඉන්නේ ටිම්බක්ටුවලද? [බාධා කිරීම්] මේ මහත්තයෝ; ඇමතිතුමෝ ඔබතුමන්ලා එහෙම හිතන්න එපා. ඔබතුමන්ලා ආණ්ඩුවේ ඉන්න නිසා තමයි එහේ මෙහේ යන්න බැරි වන්නේ? විපක්ෂයේ අපි හැම කොනකටම ගිහිල්ලා ජනතාව කියන දේ තමයි කියන්නේ? අර හිස්බුල්ලා නියෝජ්‍ය ඇමතිතුමා දිහා බලන්න. මඩකලපුවට කොහේද සුද්දෝ එන්නේ? මාස දෙකක් තිස්සේ එහේ ගංවතුර ගලලා.

**ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் -பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. M.L.A.M. Hisbullah - Deputy Minister of Economic Development)
හැම දාම සුද්දෝ එනවා.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දවස් 28ක් තිස්සේ වාකරේ තිබෙන පාලම කැඩිලා තිබෙනවා.

**ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා**
(மாண்புமிகு எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. M.L.A.M. Hisbullah)
කොහේද පාලම කැඩිලා තිබෙන්නේ?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා කියන්නේ කැඩිලා නැහැ කියලාද?

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
තමුන්නාන්සේ ගියාද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අර අතැන තිබෙන පාලම.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
වාකරේ කොහේද පාලම් තිබෙන්නේ?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
වාකරේ නොවෙයි, වාකරේ පහු කරලා කිලෝමීටර්- [බාධා කිරීම්] ත්‍රිකුණාමලයේ ඉඳන් මඩකලපුවට යන්න තිබෙන්නේ ඒ පාලම හරහායි. හිස්බුල්ලා නියෝජ්‍ය ඇමතිතුමා කියනවාද ඒ පාලම කැඩිලා නැහැ කියලා? මම ඔබතුමාට කිව්වා, මඩකලපුවට එනවා කියලා. ඔබතුමා කිව්වා, "එන්න එපා පාලම කැඩිලා තිබෙනවා" කියලා. පාලම කැඩිලා නැත්නම් මට එන්න එපා කිව්වේ මොකද? මම බෝට්ටුවෙන් ඒ පැත්තට ගියා.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
ඉස්සෙල්ලා ත්‍රිකුණාමලයේ ඉඳලා මඩකලපුවට යන්න තිබුණේ වැලිකන්ද හරහායි. ඒ සඳහා පාලම් පාරු තිබුණා. අපි කින්නියා පාලම හැදුවා, මුත්තූර් පාලම හැදුවා. උප්පාරු පාලම හැදුවා, වාකරේ පාලම හැදුවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා පාලම් හැදුවා. හැබැයි ඒ හදපු පාලමක් තමයි දැන් කැඩිලා තිබෙන්නේ.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
දන්නේ නැති ඒවා ගැන කථා කරන්න එපා. එක පාලමක්වත් කැඩිලා නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම අහනවා, දැන් ඒ පාලම කැඩිලා නැද්ද කියලා.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
එන්න, මාත් එක්ක යන්න. අසත්‍ය ප්‍රකාශ කරන්න එපා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම අභියෝග කරනවා. හිස්බුල්ලා නියෝජ්‍ය ඇමතිතුමනි, ඇයි, ඔබතුමා අසත්‍ය දේවල් කියන්නේ? ඔබතුමා මට ගිය සුමානයේ මඩකලපුවට එන්න කිව්වා. පස්සේ පාලම හදලා නැහැ කිව්වා. මොනවාද තව කියන්නේ? [බාධා කිරීම්] ඒකට ඕනෑ වෙලාවක ඔබතුමාට උත්තර දෙන්න පුළුවන්.

සංචාරක කර්මාන්තයට සම්බන්ධ හෝටල්වල අද කාමර 14,000ක් තිබෙනවාය කියනවා. මේ කාමර 14,000ට කොහොමද සංචාරකයින් ලක්ෂ 10ක් එන්නේ? මාලදිවයිනේ සංචාරක හෝටල් කාමර 975,000ක් තිබෙනවා. ඒ කාමර 975,000ට ඒගොල්ලන්ට එක දවසකට ඩොලර් 375ක් හම්බ වනවා. කොළඹ කීයද හම්බ වන්නේ? Sri Lanka Tourism Development Authority එකෙන් කියලා තිබෙනවා, දවසකට හම්බ වන්නේ US Dollars 75යි කියලා. මේ රටවල් දෙකේ සංචාරක කර්මාන්තය අතර තිබෙන වෙනස බලන්න.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
ඔබතුමා මීගමුවට එන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපි යන්නේ නැත්තේ කොහාටද? අපි කුඹුරට යන්නේ නැහැ.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
යන්නේ සිරිකොතට විතරයි. සිරිකොතට යන්නත් බැරි එකේ තව මොනවාද කථා කරන්නේ?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපි මඩකලපුවට යන්නේ නැහැ. අපි මීගමුවට යන්නේ නැහැ. මේක හරි වැඩක් නේ? ඔබතුමන්ලා හිතන්නේ අපි ටිම්බක්ටුවල ඉන්නවා කියලාද? ඉතින් ඇමතිතුමනි, ඔබතුමන්ලාගේ දත්ත තිබුණාට, ගිහිල්ලා හෝටල්වලින් අහන්න, මොකක්ද තත්ත්වය කියලා. ඔබතුමන්ලා කියනවා, ෂැන්ග්‍රි-ලා එනවා, කින්ස්බරි එනවා කියලා. ඒ ඔක්කොම සමාගම් එනවා. ඒක බොහොම හොඳයි.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
සාධාරණ විවේචනයක් කරන්න, අසත්‍ය ප්‍රකාශ කරන්නේ නැතිව.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක බොහොම හොඳයි. මේ රටට මෙතරම් සල්ලි එනවා නම්, මේ සංචාරකයින් ලක්ෂ 10 තුළින් ලැබෙන විදේශ මුදල් ටික කොහාටද යන්නේ?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
එහෙම කියලා ඔබතුමා සතුටු වන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපට එහෙම කිසිම කුහකභාවයක් නැහැ. අපි දේශපාලනය කරන්නේ ඒකෙන් ජීවත් වන්න නොවෙයි. ඔබතුමන්ලා තමයි ඒක කරන්නේ. එක දෙයක් මතක තියා ගන්න. අපි මේ කථා කරන්නේ සංචාරක කර්මාන්තයට සම්බන්ධව, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ අද ඉදිරිපත් කර තිබෙන නියමය ගැනයි. මතක තියා ගන්න, ඔබතුමන්ලාගේ සංචාරක කර්මාන්තය සියයට 30ක් corporate taxes -

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
පාලම් හදන්න ඉස්සෙල්ලා නැඟෙනහිර පළාතෙන් මුහුදට වැටෙන ගංගා කීයක් තිබෙනවාද කියලා කියන්න. ඒක නිසා කරුණාකරලා දන්නේ නැති ඒවා ගැන කථා කරන්න එපා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇයි නොදන්නේ? ඔබතුමා ඇමතිවරයා නිසා දන්න ඒවා තමයි ඔය. තේරුණාද?

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
නැඟෙනහිර පළාතෙන් මුහුදට වැටෙන ගංගා කීයක් තිබෙනවාද කියලා කියන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගාමිණී දිසානායක මැතිතුමාත් එක්ක කොත්මලේ ව්‍යාපාරය ක්‍රියාත්මක කළා කියලා ඔබතුමා දන්නවානේ. [බාධා කිරීමක්]

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
මේ ඉන්නේ නැඟෙනහිර පළාතේ මන්ත්‍රීවරු.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Corporate taxes වශයෙන් සියයට 30ක් hotelsවලින් ගෙවනවා. පිට රට කොම්පැනි ගෙවන්නේ සියයට 10යි.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
ලංකාවේ තිබෙන ගංගාවන් ගණන විතරක් කියන්නකෝ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම American citizen කෙනෙක් නොවෙයි. මම American පුරවැසියෙක් නොවෙයි, මම ලංකාවේ පුරවැසියෙක්. ඉතින් මේ සම්බන්ධයෙන් කථා කරන කොට මුළු වක්‍රශීලී tax එක සියයට 27ක් ගෙවනවා. මාලදිවයින ගෙවන්නේ සියයට 6යි. මේ දෙක අතර තිබෙන පරතරය ඒකෙන් පෙනෙනවා. හෝටල් අයිතිකරුවන් අපෙන් අහනවා, "මේ මොන ප්‍රෝඩාවක්ද කරන්නේ ? " කියලා.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
මෙතුමා හෝටල් අයිතිකාරයෝ වෙනුවෙන් කථා කරන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කමක් නැහැ. මම කවුරු වෙනුවෙන් කථා කළත් මම වැඩ කරන ජනතාව වෙනුවෙනුත් කථා කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පෙබරවාරි මාසයේ 03වැනිදා "The Nation" පත්තරේ පළ වූ මෙම වාර්තාව ඔබතුමාගේ අවසරය ඇතුව මම **සභාගත*** කරනවා.

මේ සම්බන්ධයෙන් බලන කොට විදේශිකයන් අඩුවෙන්ම හෝටල් පාවිච්චි කරලා තිබෙන්නේ දෙසැම්බර් මාසයේ කියලා තමයි වාර්තා වෙලා තිබෙන්නේ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Ravi Karunanayake, please wind up now.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Please give me two more minutes.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
I cannot give you more time. Time is limited.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ සම්බන්ධයෙනුත් අපි අහනවා. ඔබතුමන්ලා බදු විරාම ඉල්ලනවා. අනිත් පැත්තෙන් නෙස්ලේ ලංකා පුද්ගලික සමාගමේ අයිතියෙන් සියයට 92ක් මේ රටට තිබුණත් සියයට 4 royalty එක සියයට 8ක් දක්වා වැඩි කරන්න මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය හෝ ශ්‍රී ලංකා මහ බැංකුව හෝ ඒ දෙක අතරමැදි සම්බන්ධයක් ඇති කර ගෙන මේ සම්බන්ධයෙන් බදු විරාමයක් ඇති කරලා දෙනවා. අද රුපියල් මිලියන 780ක් ගෙවන නෙස්ලේ ලංකා පුද්ගලික සමාගම හෙට අනිද්දා වෙන කොට සියයට 4,

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

සියයට 8ක් කළොත් ඒ ප්‍රමාණයෙන් මිලියන 380ක් අඩු වෙනවා. මේ රටට strategic development කියලා කොම්පැනි ගෙනැල්ලා එක පැත්තකින් ඒ අයට බදු විරාම දෙනවා. [බාධා කිරීමක්] අනෙක් පැත්තෙන් බදු ගෙවන කොම්පැනිවලට තවත් බදු වැඩි කරනවා. අහිංසක ළමයෙක් ඉස්කෝලෙන් ගේන්න කියාපු මුදල් ගෙවන්න පොල් ගෙඩි 8ක් සොරකම් කළාය කියලා රුපියල් 50,000ක් දඩ ගැහුවා. එහෙම තිබියදී සුද්දන්ට මේ වාගේ බදු විරාම දෙන එක පිළිබඳව විළිලජ්ජාවක් නැද්ද? ඒ සම්බන්ධව තමයි අපි අහන්නේ. ශ්‍රී ලංකාවේ සංවර්ධනයක් ඇති කරන එක විතරයි අවශ්‍ය වන්නේ.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
මේ රටේ ජනතාවට අයිති සමාගම් 4ක් තමයි මේකට යොමු වෙලා තිබෙන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සුද්දන්ට දෙන බදු විරාමවලින් රටක් සංවර්ධනය කරන්න බැහැ. ඔබතුමන්ලා එක්සත් ජාතික පක්ෂය ඉලක්ක කරලා කිව්වේ "ඒ බදු විරාමය දෙනවා, මේ බදු විරාමය දෙනවා" කියලා. අද මොනවාද වෙන්නේ? කොළඹ තිබෙන හැම බිම් අහලක්ම සුද්දන්ට විකුණනවා. ඉන්දියන් කොම්පැනියක් වෙන්න පුළුවන්, හොංකොං කොම්පැනියක් වෙන්න පුළුවන්, චීන කොම්පැනියක් වෙන්න පුළුවන්, ඒවාට අවස්ථාව දෙනවා. අපේ ලාංකික කොම්පැනිවලට ඒ අවස්ථාව දෙන්නේ නැහැ. ඉතින්, ඔබතුමන්ලා strategic development -

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Thank you. The next speaker is the Hon. M.L.A.M Hizbullah.

**ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා**
(மாண்புமிகு எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. M.L.A.M. Hisbullah)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා සිහින ලෝකයක ඉඳගෙනයි කථා කරන්නේ. ඔබතුමාට මේක පිළිගන්න බැහැ. [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. M.L.A.M Hizbullah, you can start your speech.

[பி.ப. 3.39]

**ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. M.L.A.M. Hisbullah - Deputy Minister of Economic Development)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, செயல் நுணுக்க அபிவிருத்திக் கருத்திட்டங்கள் சட்டத்தின் கீழான கட்டளை சம்பந்தமான இன்றைய விவாதத்தில் கலந்து கொள்வதில் மகிழ்ச்சியடைகின்றேன். இந்த நாட்டின் பொருளாதார அபிவிருத்தியை மேம்படுத்துவதற்காக உல்லாசப்பயணத் துறையைக் கட்டியெழுப்புவதன்மூலம் கிடைக்கும் வருமானம் சாதாரண பொதுமக்களுக்கும் சென்றடைய வேண்டும் என்ற நோக்குடன், அக்கறையுடன் செயற்பட்டு வருகின்ற பொருளாதார அபிவிருத்தி அமைச்சர் மாண்புமிகு பெஸில் ராஜபக்ஷ அவர்களை நாம் பாராட்டுகின்றோம்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இங்கு உரையாற்றிய மாண்புமிகு உறுப்பினர் ரவி கருணாநாயக்க அவர்கள் இந்த நாட்டில் என்ன நடைபெறுகிறது என்பதைப் புரிந்துகொள்ளாதவராக, வேறோர் உலகத்தில் இருந்து கொண்டு பேசியதையிட்டு நான் கவலைப்படுகின்றேன். அவர் இச்சபையிலே "மட்டக்களப்பு மாவட்டத்திலே கட்டப்பட்டுள்ள பாலங்கள் உடைந்து காணப்படுகின்றன" என்று உண்மைக்குப் புறம்பான ஒரு செய்தியைக் கூறினார். மாண்புமிகு அமைச்சர் பெஸில் ராஜபக்ஷ அவர்கள் குறிப்பிட்டுள்ளதைப் போன்று, கிழக்கு மாகாணத்திலே திருகோணமலை-மட்டக்களப்பு வீதியில் ஆறு பாலங்கள் இருந்தன. அந்த ஆறு பாலங்களையும் பயங்கரவாதிகள் தகர்த்ததனால் அவ்வீதி போக்குவரத்தின்றி முற்றாகத் துண்டிக்கப்பட்டிருந்தது. இன்று 'கிழக்கின் உதயம்' வேலைத்திட்டத்தின்கீழ் அதிஉத்தம ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்களுடைய தலைமையில், மாண்புமிகு அமைச்சர் பெஸில் ராஜபக்ஷ அவர்களுடைய வழிகாட்டலில் அந்த ஆறு பாலங்களும் புனரமைக்கப்பட்டுள்ளன. எனவே, கிழக்கு மாகாணத்திலே மீளமைக்கப்பட்டுள்ள எந்தவொரு பாலமும் உடைக்கப்படவில்லை என்னும் செய்தியை அங்கு வாழும் பாராளுமன்ற உறுப்பினர் என்ற வகையில் மிகவும் பொறுப்புணர்ச்சியுடன் நான் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன். மக்கள் மத்தியில் வெறுமனே பொய்களைச் சொல்லி அவர்களிடையே குழப்பத்தை ஏற்படுத்தி, மீண்டும் இந்த நாட்டை இருள்சூழ்ந்த யுகத்துக்குள் கொண்டுசெல்ல முயற்சிக்கின்ற எந்தவொரு சக்திக்கும் அரசாங்கம் இடமளிக்கமாட்டாது என்பதை நான் இச்சந்தர்ப்பத்திலே மிகத் தெளிவாகச் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

இன்று திருகோணமலையிலிருந்து மட்டக்களப்பு மாவட்டத்துக்குச் செல்லும் பாதையிலுள்ள பாலங்கள் யாவும் புனரமைப்புச் செய்யப்பட்டுள்ளன. இந்த நாடு சுதந்திர மடைந்த பின்னர் கடந்த பல வருட காலமாக மட்டக்களப்பிலிருந்து படுவான்கரைக்குச் செல்லும் மக்கள் ferry என அழைக்கப்படும் படகுச்சேவை மூலமாகத்தான் போக்குவரத்துச் செய்து வந்தார்கள். இன்று எமது பொருளாதார அபிவிருத்தி அமைச்சர் அவர்களின் முயற்சியினால் சுமார் 2500 மில்லியன் ரூபாய் செலவிலே மிகவும் நீளமான பாலமொன்று கட்டப்பட்டு வருகிறது. இவ்வாறு கிழக்கு மாகாணத்திலுள்ள பௌதிக வளங்களைக் கட்டியெழுப்புவதற்கும் மின்சார வசதியை ஏற்படுத்திக் கொடுப்பதற்கும் கோடிக்கணக்கான ரூபாய் செலவு செய்யப்பட்டு வருகிறது. நான் மாண்புமிகு ரவி கருணாநாயக்க அவர்களை மட்டக்களப்புக்கு வருகைதந்து அங்குள்ள அபிவிருத்தி நடவடிக்கைகளைப் பார்வையிடுமாறு அழைக்கின்றேன். இவர்கள் விடுதலைப் புலிகளுடன் ஒப்பந்தம் செய்திருந்த காலத்தில் மட்டக்களப்பு மாவட்டம் எவ்வாறு இருந்தது என்பதையும் இன்று இந்த அரசாங்கம் மட்டக்களப்பு மாவட்டத்தை எவ்வாறு மாற்றியிருக்கின்றது என்பதையும் வந்து பார்வையிட வேண்டும். மட்டக்களப்பு மாவட்டத்துக்கு வந்து அங்குள்ள அபிவிருத்தி நடவடிக்கைகளைப் பார்வையிடாது, கொழும்பிலே இருந்து கொண்டு அதுபற்றிப் பேசவேண்டாம். நீங்கள் பாசிக்குடா போன்ற பிரதேசங்களுக்கு வந்து அங்குள்ள அபிவிருத்தி நடவடிக்கைகளைப் பார்வையிட்ட பின்னர்

[ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා]

இச்சபையிலே அது பற்றிப் பேசுங்கள்! என்று நான் அவருக்குக் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

பாசிக்குடா பிரதேசத்திலே சுமார் ஆயிரம் அறைகளைக் கொண்ட பதினைந்துக்கும் மேற்பட்ட ஹோட்டல்கள் கட்டப்பட்டு வருகின்றன. அங்கு தினமும் ஆயிரக்கணக்கான வெளிநாட்டவர்கள் வருகை தந்தவண்ணம் இருக்கின்றார்கள். இதன்மூலம் எங்களுடைய பிரதேசங்களிலே வியாபாரம் தழைக்க ஆரம்பித்திருக்கின்றது. சர்வதேச தரத்துக்கு நிகராகக் கட்டப்பட்டுள்ள நான்கு நட்சத்திர, ஐந்து நட்சத்திர ஹோட்டல்களில் வேலைசெய்யும் வாய்ப்பு, மட்டக்களப்பு மாவட்டத்திலே ஆயுதமேந்திப் போராடிய நூற்றுக்கணக்கான இளைஞர்களுக்கு முதல் தடவையாகக் கிடைத்திருக்கின்றது. அந்தவகையில், பொருளாதார அபிவிருத்தி அமைச்சினூடாக இரவு பகலாக இந்த நாட்டைக் கட்டியெழுப்புகின்ற பணிகளை மேற்கொள்கின்ற அமைச்சர் மாண்புமிகு பெஸில் ராஜபக்ஷ அவர்களுக்கு நாங்கள் நன்றி செலுத்த வேண்டும். இவ்வாறான செயற்பாடுகளுக்கு எதிர்க்கட்சிகள் ஒத்துழைப்பு வழங்க வேண்டும். இந்த நாட்டின் பொருளாதாரத்தைக் கட்டியெழுப் புவது என்பது வெறுமனே பொதுசன ஐக்கிய முன்னணியி னுடையதோ அல்லது ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சியினு டையதோ பொருளாதாரத்தைக் கட்டியெழுப்புவது என்ற அர்த்தமல்ல. அதாவது, நாட்டிலே வாழ்கின்ற, சகல கட்சி களுக்கும் வாக்களித்த ஒவ்வொரு நபருடைய பொருளா தாரத்தையும் கட்டியெழுப்புகின்ற ஒரு வேலைத்திட்டமாகும். ஆகவே, எதிர்க்கட்சிகள் அரசாங்கத்தை விமர்சிப்பதை விடுத்து, எதிர்வரும் காலங்களில் அரசாங்கம் மேற்கொள்கின்ற நல்ல திட்டங்களுக்குப் பூரண ஒத்துழைப்பை வழங்க வேண்டும். பொருளாதாரத்தைக் கட்டியெழுப்பி, வறுமையைப் போக்கி, வருமானத்தை அதிகரித்து செல்வம்மிக்க ஒரு நாடாகக் இந்த நாட்டைக் கட்டியெழுப்புவதற்கு அவர்கள் பூரண ஒத்துழைப்புத் தரவேண்டும். எனவே, இந்தச் சபையிலே வெறுமனே உண்மைக்குப் புறம்பான விடயங்களைச் சொல்லி மக்களைத் தொடர்ந்தும் ஏமாற்றுவதை நிறுத்திக்கொள்ள வேண்டும் என்று கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

[අ.භා. 3.43]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා යටතේ වන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය අදාළ කර ගනිමින් තමයි අද මෙම හෝටල් සංකීර්ණය පිළිබඳ ගැසට් නිවේදනය පාර්ලිමේන්තුවේ විවාදයට ලක් කරන්නේ. නමුත් මේක විවාදයට ලක් කරද්දීම සරත් අමුණුගම ඇමතිතුමා ඒකට අවශ්‍ය කරන පසු බිම හදා ගත්තේ ආණ්ඩුවේ ස්ථාවරය පැහැදිලි කරමිනුයි. එතුමාගේ ස්ථාවරය වුණේ, "මේ රටේ ආයෝජකයෝ තෝරා ගන්නේත් අපි; ක්‍රියාත්මක කරන්නේත් අපි. අපිට ඕනෑ දේ තමයි කරන්නේ. අපිට ඕනෑ ආයෝජකයෝ තමයි ගෙනෙන්නේ. වැඩි ඡන්දයෙන් අපි මේක සම්මත කර ගන්නවා" කියන එකයි. ඇත්ත. මේ පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක්ම -වැඩි ඡන්දයක්- ආණ්ඩුවට තිබෙනවා. ප්‍රශ්නය තිබෙන්නේ මෙතැනයි. මේ ආයෝජකයෝ ගෙනෙන්නේත් මේ ආණ්ඩුවට ඕනෑ විධියට නම්, ආයෝජකයෝ තෝරා ගන්නේත් ආණ්ඩුව නම්, ව්‍යාපෘතිය තෝරා ගන්නේත් ආණ්ඩුව නම්, ඒකේ සියලුම ගුණාංග, කොන්දේසි සලකා බලන්නේත් ආණ්ඩුව නම් ඉතින් මේ නියමය පාර්ලිමේන්තුවට දාලා මොකටද? ඇයි මේ පාර්ලිමේන්තුව අපෙන් මතයක් අහන්නේ? මොකක්ද අපිට කියන්නේ? තමුන්නාන්සේලාට පුළුවන් නේ කියන්න, "මෙන්න මෙහෙම දෙයක් සම්මත කර ගන්නවා, මේක තමයි අපේ තීන්දුව" කියලා. නඩුත් හාමුදුරුවන්ගේ; බඩුත් හාමුදුරුවන්ගේ. මේ රටේ ජනතාවටයි, විපක්ෂයේ අපිටයි බලාගෙන ඉන්න තමයි තිබෙන්නේ. රජ කාලයේ හරකුන්ට අභය දානය දුන්නා වාගේ ජනාධිපතිතුමා යාපනයට ගිහිල්ලා පොලිස්පතිතුමාට කිව්වා, මේ ළමයි දෙදෙනා ගෙදර යවන්න කියලා. කැමැති නම් - [බාධා කිරීමක්]

**ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා**
(மாண்புமிகு எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. M.L.A.M. Hisbullah)

ඒකට විරුද්ධද?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

විරුද්ධ නැහැ. හොඳයි. ඒ වාගේම තමයි ගන්නත් පුළුවන්. රටේ නීතියක් නැහැ. ආපසු ගන්න කොටත් එහෙම තමයි. කැමැති නම් යවන්නත් පුළුවන්, කැමැති නම් ගන්නත් පුළුවන්. තමුන්නාන්සේලාට පාර්ලිමේන්තුවේ කැමැති දේ දමන්නත් පුළුවන්, අකුළා ගන්නත් පුළුවන්. මොකක්ද එතකොට මේක? මේකට කියන්නේ ප්‍රජාතන්ත්‍රවාදය කියලා නොවෙයි. මේකට කියන්නේ නිදහස කියලා නොවෙයි. මේකට නීතියක් ඕනෑ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ නියමය දිහා බලන කොට අපිට තේරෙන්නේ එක දෙයයි. සංචාරක කර්මාන්තය දියුණු කිරීම ගැන අපිට විවාදයක් නැහැ. ඒකට අපි එකඟයි. නමුත් මේ නියමයේ තිබෙන්නේ එහෙම නොවෙයි. මේ නියමයේ තිබෙන්නේ මොකක්ද? මේක හරියට එළදෙනකුට තණ කොළ කන්න දීලා, බොන්න දීලා, හදා වඩා නඩත්තු කරලා, කිරි ටික දොවා ගන්න තව කාට හරි බාර දෙනවා වාගේ වැඩක්. මේ නියමය අනුව මේ හදන කාමර 475ක හෝටල් පද්ධතිය අවසානයේ බදු ගෙවිය යුතු ලාභය, රජයට -දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට- ගෙවන ලාභාංශ බද්ද අවුරුදු දහයක කාල සීමාවක් සඳහා දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදනවලින් නිදහස් වෙනවා. එම වසර දහයක බදු නිදහස් කාල පරිච්ඡේදය තුළ සහ ඉන් මතු එක් වසරක කාල පරිච්ඡේදයක් සඳහා ලාභවලින් කොටස්කරුවන් හට බෙදා දෙනු ලබන ලාභාංශ සඳහා බදු නිදහස ලැබෙනවා. මේකේ කොටස්කරුවෝ කවුද? අපිට දැන් කියපු විධියට නම් අර රුපියල් දහයේ කොටස් ගත්ත ගාමිණී සෙනෙරත් මහතා ඇතුළු අය තමයි මේකේ කොටස්කරුවෝ. ඒ අය ඇතුළුව මේකට සම්බන්ධ වෙන අයට -[බාධා කිරීම්] කලබල වෙන්න එපා. කමක් නැහැ. ඔබතුමන්ලා ගෙනෙන ඒවා නේ. ඔබතුමන්ලාට කැමැති විධියට සම්මත කර ගන්න ඒවා. ඇයි මේ අපි කියන ඒවාට කලබල වෙන්නේ? හරි. ඒකට අවස්ථාවක් ඔබතුමන්ලාට තිබෙනවා. ඒ අවස්ථාවේදී අසත්‍ය නිවැරැදි කරන්න.

ඊ ළඟට ප්‍රශ්නය තිබෙන්නේ මෙතැනයි. "එකී බදු නිදහස් කාලය ව්‍යාපෘති සමාගම ලාභ උපයන මුල් වසරේ ආරම්භයේ සිට හෝ වාණිජමය කටයුතු ආරම්භ කිරීමෙන් වසර තුනකට පසු යන දෙකින් කලින් එළඹෙන දින සිට ආරම්භ වේ" කියලා තිබෙනවා. ඒකයි වැඩේ. ඒ කියන්නේ රජයට ලැබෙන්න තිබෙන බදු නිදහස දෙන්නේ ව්‍යාපාර කටයුතු ආරම්භ කරලා අවුරුදු තුනකට පස්සේ. කොච්චර කාලයකටද? අවුරුදු 15ක් යන තුරු. අවුරුදු 10ක් එක පැත්තකින් බදු නිදහස ලැබෙනවා. අනික් පැත්තෙන් තව අවුරුදු 15ක් ලබන ලාභයෙන් භාගයයි ලාභාංශ බද්දෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගන්නේ. අවුරුදු 15ක් ලබන ලාභයෙන් භාගයක් ලාභාංශ බද්දෙන් නිදහස් කරනවා. ඔක්කොම කාලය අවුරුදු 25යි. එතකොට අවුරුදු 25ක් ලාභාංශ බදු සහනයක් ලැබෙනවා. මේක අවසානයේ පවරන්නේ කාටද? මේ ක්‍රියාවලියට සම්බන්ධ කර ගන්නේ කවුද? ඒ කවුද කියලා ඔබතුමන්ලා අපට

කියන්න. ඒ අයට රජයේ ඉඩම් දෙනවා; රජයේ බදු සහන දෙනවා; ආයෝජන මණ්ඩල සහන දෙනවා; මේ ව්‍යාපෘතියට ගෙන්වන සියලු භාණ්ඩ -ආනයනය කරන ඒවා- සම්බන්ධයෙන් සහන දෙනවා. ඉදි කිරීම් කරන කොන්ත්‍රාත්කරුවන්ට පවා බදු සහන තිබෙනවා. මෙහි සඳහන් වෙනවා, "ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාලය තුළ දී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමැතිය සහිතව, ව්‍යාපෘති සමාගම සෘජුවම හෝ කොන්ත්‍රාත්කරුවන් මගින් ආනයනය කරනු ලබන ව්‍යාපෘතියට අදාළ සියලුම ආනයනයන් රේගු බදු අයකිරීම් වලින් නිදහස් වේ." කියලා.

ඒ සියලු නිදහස් කිරීම් කරලා, රජයේ වටිනාම ඉඩම් දීලා කරන මේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අවසානයේදී සිද්ධ වන්නේ මොකක්ද? මේකට සම්බන්ධ කර ගන්නා Hyatt International South-West Asia Limited ඇතුළු, ඇමෙරිකාවේ Hyatt Corporation සමාගමට අයිති සමාගම් chain එකට තමයි මේ සියලු ලාභාංශවල නිදහස් කිරීම් ලබා දෙන්නේ. ඔබතුමන්ලාට කියන්න පුළුවන්, "අපි තමයි තෝරා ගන්නේ, අපට පුළුවන් දේයි අප කරන්නේ, අපට තමයි කොමිස් හම්බ වෙන්නේ" කියලා. ඒ ඔක්කෝම ඇත්ත. නමුත් අවසානයේ සිදු වෙන්නේ මොකක්ද? මේක හරියට මොකක් වාගේද? අපේ රජය, රටේ ජනතාව, භාණ්ඩාගාරය, රජයේ සමාගම් කියන ඔක්කෝම මේකට සම්බන්ධ වෙලා, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රතිලාභීන්ගේ දේවල් මේකට එකතු කරලා අවසානයේදී මොකක්ද කරන්නේ? එළදෙනක නඩත්තු කරලා කිරි දොවා ගන්න වෙනත් කෙනකුට භාර දෙනවා වාගේ වැඩක් මේ කරන්නේ. ඒ වාගේ වැඩක් තමයි මේ කරන්නේ. සල්ලි උතුරන්න තිබෙනවා නම් කමක් නැහැ. ප්‍රශ්නය තිබෙන්නේ එහෙම නැති එකයි. දැන් අපේ එක පිරිසක් කියනවා, අපට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සල්ලි එපා, අපට ඇති තරම් සල්ලි තිබෙනවා කියලා. එහෙම නම් මෙහෙම කටයුතු කළාට කමක් නැහැ.

අපි දන්නවා තේ කර්මාන්තයට අදාළ පොහොර සහනාධාරයට වැය වූ මුදල කොම්පැනිවලට ගෙවා ගන්න බැරිවයි අද තමුන්නාන්සේලා ඉන්නේ කියලා. අද තමුන්නාන්සේලාගේ ආණ්ඩුව බවර් ඇතුළු කොම්පැනි හයකට විතර පොහොර සහනාධාරය වෙනුවෙන් රුපියල් බිලියන 50ක් පමණ ණයයි. ඒ කොම්පැනිවලට සල්ලි දෙන්න විධියක් නැහැ. ඒක නිසා අද තේ කර්මාන්තයට පොහොර දෙන්නේ නැහැ. ලක්ෂ්මන් යාපා අබේවර්ධන ඇමතිතුමා දන්නවා, අද එතුමාගේ ප්‍රදේශයේ -මාතර පැත්තේ- තේ කර්මාන්තයට පොහොර ටික නැහැ කියලා. [බාධා කිරීම්] අහලා බලන්න එතුමාගෙන්.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඉස්සර පොහොර සහනාධාරය දුන්නේ නැහැ. මේ ආණ්ඩුව තමයි පොහොර සහනාධාරය දුන්නේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
අද ඒ ප්‍රදේශයට පොහොර ටික නැහැ. ඒක තමයි ඇත්ත. එහෙම තියෙද්දියි මෙවැනි කටයුතු කරන්නේ. තමුන්නාන්සේලා ඊයේ-පෙරේදා තේ කර්මාන්තයේ තේ වෙන්දේසියේ අලෙවි වන ප්‍රමාණයට සියයට 5ක සෙස් බද්දක් ගැහුවේ ඇයි? එක පැත්තකින්, සල්ලි නැති නිසා ඒ විධියට සියයට 5ක සෙස් බද්දක් ගහනවා; සති පතා සෙස් බද්ද ගහලා භාණ්ඩාගාරයට සල්ලි ගන්න හදනවා. අනෙක් පැත්තෙන්, රජයේ මුදල් මේ ආකාරයට වෙනත් පැත්තකින් ගමන් කරවනවා. තමුන්නාන්සේලාට කියන්න පුළුවන්, "අපට බලය තිබෙනවා, අපට බහුතරය ඉන්නවා, අපට ජන මතය තිබෙනවා, අපට ජන වරම තිබෙනවා, අපට තුනෙන් දෙක තිබෙනවා, ඒක හින්දා අප කැමැති ආයෝජකයා තෝරා ගන්නවා, අප කැමැති ව්‍යාපෘතිය ගෙනෙනවා, මෙන්න අපේ බලය" කියලා. එහෙම පම්පෝරි කථා කියන්න පුළුවන්. නමුත් යථාර්ථයට අප මුහුණ දෙන්න ඕනෑකම තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසාන විග්‍රහයේදී මේ ආයෝජන රටේ ආර්ථිකයට එකතු කරන ආයෝජන නොවෙයි. රටේ ආර්ථිකයේ තිබෙන ප්‍රතිලාභ, තිබෙන ඵලදාව පවා අයින් කරන, දිය කර හරින ආයෝජන බවට තමයි මේවා පත් වන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රටේ ආර්ථිකය බංකොලොත් වුණාම, භාණ්ඩාගාරය හිඳුනාම, භාණ්ඩාගාරයේ සල්ලි නැති වුණාම, ඒ නිසා ආණ්ඩුව අපහසුතාවට පත් වන කොට ආණ්ඩුවේ සමහර ඇමතිවරුන් වාගේ කාලකණ්ණි සතුටක් අපි ලබන්නේ නැහැ. අපට එහෙම කාලකණ්ණි සන්තෝෂයක් ලබන්න විධියක් නැහැ. "දැන් ඔන්න කෙළවිලායි තිබෙන්නේ, අහවලායි වැරැදිකාරයා, අහවලාට ගහන්න ඕනෑ" කියලා කාලකණ්ණි සන්තෝෂයක් ලබන අය නොවෙයි අපි. මොකද, අවසාන විග්‍රහයේදී ඒ කාලකණ්ණි සන්තෝෂය භුක්ති විඳින්න සිදු වන්නේ, එහි අමිහිරි අද්දැකීම් භුක්ති විඳින්න සිදු වන්නේ මේ රටේ ජනතාවටයි. අපට දැන් දැන ගන්න ඕනෑ කාරණයක් තිබෙනවා. ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලයේ වග කිව යුතු ඇමතිවරයෙක් කියනවා, මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා ආර්ථික ඝාතකයෙක් කියලා, එතුමා තමයි මේ ආර්ථිකය විනාශ කරන්නේ කියලා. ප්‍රශ්නය මේකයි.

මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාට තනිවම ආර්ථිකය ඝාතනය කරන්න බැහැ, තනිවම ආර්ථිකය විනාශ කරන්න බැහැ. මොකද, හැම අමාත්‍යාංශයකම ලේකම්තුමා වග කියන විෂයය භාර ඇමතිවරයෙක් ඉන්නවා. මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා ආර්ථික ඝාතකයා නම් අපි අහනවා මුදල් අමාත්‍යාංශයේ ඇමතිතුමා කවුද කියලා. මුදල් අමාත්‍යාංශයේ ඇමතිතුමා ආර්ථික අලුගෝසුවාද? මොකද, අපේ රටේ මුදල් අමාත්‍යාංශයේ ඇමතිතුමා ජනාධිපතිතුමායි. මුදල් අමාත්‍යාංශය භාර ලේකම්තුමාට ආර්ථික ඝාතකයා කියන කොට ඒ විෂයය භාර ඇමතිතුමාට මොකක්ද කියන්නේ? ආර්ථික සංවර්ධන කටයුතු අමාත්‍යාංශයේ ඇමතිතුමා බැසිල් රාජපක්ෂ මැතිතුමායි. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශයේත් ලේකම්තුමා පී.බී. ජයසුන්දර මහත්මයායි. එතුමා ආර්ථික ඝාතකයකු නම් තමුන්නාන්සේ මොකක්ද ඒ ගැන කියන්නේ? තමුන්නාන්සේයි ඒ අමාත්‍යාංශයේ ඇමතිවරයා. තමුන්නාන්සේගේ ලේකම්තුමාට කියන කොට, ආර්ථික ඝාතකයා මෙයායි, ආර්ථිකය විනාශ කරන්නේ, ආර්ථිකය කන්නේ මෙයායි කියලා, අනෙක් පැත්තට එයින් කියන්නේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය කන්නේත් එයායි කියන එකයි. එතකොට තමුන්නාන්සේත් ඒකට සම්බන්ධ වෙලා තිබෙනවා.

ලේකම්වරයෙක් ආර්ථික ඝාතකයා වෙන කොට විෂය භාර ඇමතිතුමා සුද්දෝධන වෙන්නේ නැහැ; බෝධිසත්ව වෙන්නේ නැහැ; විෂය භාර ඇමතිතුමාට ගරුත්වයක් හම්බ වෙන්නේ නැහැ. අද එවැනි දේවල් කියන ඇමතිවරු කැබිනට් මණ්ඩලයේ ඉන්නවා. ඒක වෙන්නේ නැව් ගිලෙන කොට මීයෝ පනිනවා වාගෙයි. අපට පෙනෙන එක දෙයක් තමයි, දැන් නැව ගිලෙනවා කියන එක. රටේ ජනතාවට පෙනෙන දේ ඒකයි. නැව ගිලෙන කොට තමයි මීයෝ පනින්නේ. නැව ගිලෙන කොට මීයෝ පනිනවා වාගේ "අද ආණ්ඩුව වැරැදියි. ආණ්ඩුවේ අමාත්‍යාංශ වැරැදියි. මුදල් අමාත්‍යාංශය වැරැදියි. භාණ්ඩාගාරය වැරැදියි. ආර්ථිකය කන්නේ අහවලා, අහවලා" කියලා දැන් කියනවා. වගකීම පිට කහගන්නවා. යුද්ධයේ ජයග්‍රහණය ලබන කොට එහෙම නොවෙයි. යුද ජයග්‍රහණයට ඔක්කෝම සම්මාදම් වුණා.

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

යුද ජයග්‍රහණය මම තමයි, අපි තමයි කිය කියා හැමෝම කිව්වා. ජයග්‍රහණයට පියවරු සියයයි, හැබැයි පරාජය අවජාතකයි; පසු බැසීම අවජාතකයි. දැන් සිද්ධ වෙලා තිබෙන්නේ ඒකයි. ඒක තමයි ඇත්ත දේ. පරාජයට සාමූහික වගකීම් නැහැ. ජයග්‍රහණවලට සාමූහික වගකීම් තිබෙනවා. හැබැයි පසු බැමට, පරාජයට අවජාතකකම එනවා. දැන් ඒක නිලධාරි මහත්වරුන්ට පටවන්න හදනවා. ඒක පටවන්න හදන්නේ නිලධාරින්ගේ කර පිටට. [බාධා කිරීමක්] නැහැ, නැහැ. ඒක වෙනයි. [බාධා කිරීමක්]

ඊළඟට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය ගැන කථා කළා. [බාධා කිරීමක්] සරත් අමුණුගම ඇමතිතුමා එක වැදගත් දෙයක් මේ සභාවේදී කිව්වා. මම ඒකට එතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමා පැහැදිලිව කිව්වා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් අය වැය හිඟය පියවා ගැනීම සඳහා ණය අනුමත කර ගන්න ඉල්ලීම් කළාය කියන එක. ණය බලාපොරොත්තු වෙන්නේ අය වැය හිඟය පියවා ගන්න. හැබැයි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රතිපත්තිය ඉතා පැහැදිලියි.

ඒ අය ණය අනුමත කරන්නේ නැහැ, භාණ්ඩාගාරයේ ප්‍රශ්නවලට. ඒ අය ණය අනුමත කරන්නේ නැහැ, අය වැය හිඟය පියවා ගන්න. මොකද, අය වැය හිඟය පියවීමට ඒ අය කොන්දේසි පනවනවා. ඒ අය කියන්නේ අය වැය හිඟය පියවන්න නම් වියදම් කප්පාදු කරන්නය කියලායි; අධ්‍යාපන වියදම් කපන්න, පොහොර සහනාධාරය කපන්න, විශ්‍රාම වැටුප කපන්න, ගොවි විශ්‍රාම වැටුප කපන්න, වෙනත් වියදම් කප්පාදු කරන්න, රජයේ ආයතනවල තිබෙන දූෂණ නවත්වන්න, විදුලි බිල ඕනෑ නම් තව වැඩි කරන්න, ජල ගාස්තු වැඩි කරන්න කියලායි. අය වැය හිඟය පියවා ගන්න ඒ අය ඉදිරිපත් කරන්නේ යෝජනායි. ඒ අය ණය අනුමත කරන්නේ, SDR loan එක දෙන්නේ විදේශ වත්කම් සංචිතයටයි. විදේශ වත්කම් සංචිතය යන්නේ මහ බැංකුවට. තමුන්නාන්සේලා ණය ඉල්ලන්නේ භාණ්ඩාගාරයට. මෙතැනයි පරස්පරය ඇති වන්නේ. භාණ්ඩාගාරයේ තමයි දැන් අර්බුදය තිබෙන්නේ. "අපට සල්ලි තිබෙනවා, අපට අර්බුදයක් නැහැ, ඒ නිසා ණය දෙන්න හදද්දී අපි එපා කිව්වා" කියන ඒවා බොරු. ඇත්තටම ගත්තොත් ඒවා Parliament jokes තමයි. "දෙන්න හදද්දී අපි එපා කිව්වා" නොවෙයි, "අපි ඉල්ලුවා, ඉල්ලපු දෙයට දුන්නේ නැහැ" කියන එකයි හරි. ඉල්ලපු දෙයටයි දුන්නේ නැත්තේ. එතකොට ඒකයි රටට කියන්න ඕනෑ. "අපි ඉල්ලපු දෙයට අපිට ලැබුණේ නැහැ. ඒ නිසා අපි තවම අර්බුදයක ඉන්නවා" කියන එකයි හරි. එහෙම අර්බුදයක රට තිබෙද්දී තමයි තමුන්නාන්සේලා මේ "නැව ගිලුණත් බැන් චූන්" කථා කියන්නේ. ඒ නිසා එහෙම කියලා වැඩක් නැහැ. රටක ආර්ථිකයක් එක්ක අපි කොච්චර ක්‍රීඩා කළත්, කොච්චර සුදු නැටුවත්, කොච්චර විනෝදාංශ කරන්න හැදුවත් අවසානයේ යථාර්ථයට අපි මුහුණ දෙන්නට ඕනෑ. ඒක මොන තරම් අමිහිරි වුණත් ඒක යථාර්ථය නම් අපි ඒක පිළිගන්නට ඕනෑ.

රටක් හැටියට අද අපේ ආර්ථිකය තිබෙන්නේ කොතැනද, අපේ මූල්‍ය වත්කම් ප්‍රමාණය කොපමණද, අපේ අය වැය හිඟය අනුව ඊළඟ අවුරුද්දේ බලාපොරොත්තු වන ඉලක්කවලට යන්න පුළුවන්ද, ගෙවුම් ශේෂය තිබෙන්නේ කොයි මට්ටමේද, අපේ ඉපැයීම්වලින් කොච්චර ප්‍රමාණයක් අපිට ඊළඟට ආයෝජනය කරන්න පුළුවන් වෙයිද, එම ආයෝජන අපේ ඵලදාවට මොන තරම් බලපායිද කියන මෙන්න මේවා ගැන කල්පනා කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි අවධාරණය කරන්නේ මෙකයි. සංචාරක කර්මාන්තය අපේ රටට වැදගත් තමයි. අපේ රට පිහිටා තිබෙන ආකාරය, අපේ රටේ දේශගුණය, අපේ රටේ තිබෙන ස්වාභාවික සම්පත්, අපේ රටේ තිබෙන පද්ධතින්, ඒ ඔක්කොමත් එක්ක සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම පිළිබඳව අපට විවාදයක් නැහැ. නමුත් ගැටලුව තිබෙන්නේ අද ලෝක ආර්ථික අර්බුදයත් එක්ක, අද යුරෝපයේ ඇති වෙලා තිබෙන ආර්ථික අර්බුදයත් එක්ක, එදා නිවාඩුව ගත කරන්න යුරෝපයෙන් ලංකාවට ඇවිල්ලා සුද්දා වාගේ වියදම් කරපු සුද්දෝ අද එන්නේ නැති එකයි. සුද්දා වාගේ වියදම් කරපු සුද්දෝ වෙනුවට අද ලංකාවට එන්නේ බහුතරයක් තමන්ගේ ආර්ථික අර්බුදය පියවා ගන්න ජීවන වියදම් අර්බුදයට උත්තර සොයන සුද්දෝ. විශේෂයෙන් යුරෝපයෙන් පැමිණෙන අය. අපි ඒක පිළිගන්නට ඕනෑ. අද ඒ අය අපේ රටට ඇවිල්ලා වියදම් කරන ප්‍රමාණය අඩුයි. ඇත්ත දේ ඒකයි. ඒ නිසා අපට ලැබෙන එකතු කළ අගයේ වටිනාකම - value added කියන ප්‍රමාණය - ඇත්තෙන්ම අඩුයි. නිෂ්පාදන කර්මාන්තයට වඩා - [බාධා කිරීමක්] තමුන්නාන්සේට තර්කයක් තිබෙන්නට පුළුවන්, හිස්බුල්ලා නියෝජ්‍ය ඇමතිතුමනි. ඒක හරි. [බාධා කිරීමක්] ඒක හරි. මම පිළිගන්නවා. තමුන්නාන්සේලා විශ්වාස කරන දෙයත් එක්ක ඒ දේ ඇත්ත වෙන්නට පුළුවන්. නමුත් තේ කර්මාන්තය ලබන සියයට 100ක ඵලදාව තරම් අද සංචාරක කර්මාන්තයෙන් ඵලදාව ලබන්නට බැහැ. ඒක තමයි යථාර්ථය. නිෂ්පාදන කර්මාන්තයෙන් ලබන ඵලදාව තරම් සේවා කර්මාන්තයෙන් ඵලදාව ලැබෙන්නේ නැහැයි කියන එක ලෝක යථාර්ථයක්; ලෝක සත්‍යයක්. අපි ඒක පිළිගන්නට ඕනෑ. නිෂ්පාදන කර්මාන්තයත් දියුණු කරන ගමන් සේවා ආර්ථිකයත් දියුණු කරනවා නම් එහි ඵලදාවක් තිබෙනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මෙවැනි ව්‍යාපෘති තමුන්නාන්සේලා මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා ලෝකයට පෙන්වන්නට උත්සාහ කරනවා නම්, අවසානයේ රටට සිදු වන්නේ අයහපතක්ය කියන එක අවධාරණය කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Lalith Dissanayake. Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්,* නියෝජ්‍ය කථානායකතුමා (ගරු චන්දිම වීරක්කොඩි මහතා) *මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு,* குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் *அக்கிராசனத்தினின்று அகலவே,* பிரதிச் சபாநாயகர் (மாண்புமிகு சந்திம வீரக்கொடி) அவர்கள் *தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *took the Chair.*

[අ.භා. 4.00]

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)

(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම සුවිශේෂ වූ කටයුත්තක් ගැන තමයි අද අපි විවාද කරන්නේ. රවි කරුණානායක මන්ත්‍රීතුමා මට කලින් කථා කරලා ගියා. මේ ආයෝජන මණ්ඩලය එතුමන්ලා 1977 දී පමණ පටන් ගත්තාට මේ ආයෝජන මණ්ඩලයෙන් කෙරෙන කටයුතු සම්බන්ධයෙන් ඇත්තෙන්ම සොයා බැලීමක්, එහි විනිවිදභාවයක්, ඒවා ගැන පාර්ලිමේන්තුවට කරුණු ඉදිරිපත් කිරීමක් සිදු වුණේ නැහැ. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයේ තමයි ආයෝජන මණ්ඩලය පටන් ගත්තේ කියලා අද එතුමන්ලා කෑගහුවාට, එදා හිටපු අමාත්‍යවරයා ඒ සම්බන්ධයෙන් නියමයන් ගෙනල්ලා මේ විධියට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ නැහැ. කෝර්නල් සමාගම සම්බන්ධයෙන් එහෙම හුභාක් ගනුදෙනු තිබුණා. ඒවා රජයට පවරා ගෙන, තමනුත් සමාගමේ කොටස්කරුවන් බවට පත් වුණු ආයෝජනයන් ඒ කාලයේ තිබුණා. අද අපි මේ නියමය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා ඒ සම්බන්ධයෙන් විවාද කරන්නේ ඒ පිළිබඳ අපේ විනිවිදභාවයක් තිබෙන නිසායි. අපි භය නැහැ. බැසිල් රාජපක්ෂ මැතිතුමා ආර්ථික සංවර්ධන ඇමතිතුමා හැටියට මේ ගරු සභාවේ ඉඳගෙන එයට මුහුණ දෙනවා. එතුමා භය නැහැ. ඒ ඇයි?

එහෙම නම් අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුවෙන් අද ඒ තත්ත්වය ඇති කර තිබෙනවා. අපි ඇති කර තිබෙන්නේ එවැනි තත්ත්වයක්. ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුන්ලාගේ ප්‍රතිපත්තිය වෙනස්. එදා කළේ මොකක්ද? තමන්ගේ මතයට ගරු කරන්නේ නැත්නම් රට ඇවිල්ලා අර ගෙන යනවා. එහෙම නැත්නම් හැඳුනුම්පත් එකතු කර ගෙන යනවා. අද ඒ ගොල්ලෝ ඉන්දියාව කරන ආයෝජන ගැන කථා කරනවා. එදා තිබුණේ ඉන්දියාවෙන් ගෙන්වන බෙහෙත් පෙත්තක් ගත්තත් මරණ දඬුවම දෙන කාලයක්. ඉන්දියානු භාණ්ඩ වර්ජනය කරන තත්ත්වයක් තිබුණේ. එහෙම කිව්ව අය අද මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ආයෝජකයෝ ගැන කථා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආයෝජකයෝ නිකම් එන්නේ නැහැ. ඔවුන් මුදල් ආයෝජනය කරන්නේ යම් කිසි ප්‍රතිලාභයක් බලා ගෙනයි. මේ කියන සමාගම පෞද්ගලික සමාගමක් කියලා කියන්න මේ අය උත්සාහ කරනවා. නැහැ. මෙහි මූලික සමාගම් වන්නේ මොකක්ද? එකක් තමයි EPF එක. ඊළඟට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව. ඊළඟට ලිට්‍රෝ ගෑස් සමාගම. EPF එක රුපියල් මිලියන පන්සියයක් ආයෝජනය කරනවා. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව රුපියල් මිලියන පන්සියයක් ආයෝජනය කරනවා. ලිට්‍රෝ ගෑස් සමාගම රුපියල් මිලියන දෙසියයක් අයෝජනය කරනවා. එතකොට කැන්විල් සමාගම බවට පත් වන්නේ රජයෙන් මුදල් ආයෝජනය කරන මේ ආයතන තුනේ එකතුවයි. එතකොට ඒක ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාගේ කොම්පැනියක් නොවෙයි; අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කොම්පැනියක් නොවෙයි. මේක රජයේ මුදල් ආයෝජනය කරන සමාගමක් බවට පත් වෙලා තිබෙනවා. ඒක පෞද්ගලිකව වෙනත් තැනකට දෙන්න යන්නේ නැහැ. ඒ අනුව තමයි මෙහි ආයෝජනය ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 158.85ක් වෙන්නේ.

අපි මේ ආයෝජනය කරන්නේ මොකටද? එක පැත්තකින් මේ වන විට මේ රටට එන සංචාරකයන් දස ලක්ෂ දෙදහසක් පමණ වෙලා තිබෙනවා. ඒ වාගේම අපි 2013 වසරේ පොදු රාජ්‍ය මණ්ඩල නායක සමුළුව පවත්වනවා. අපි ඒ සඳහා එන අයට පහසුකම් සපයන්නට ඕනෑ. මම ඊයේ හවස මහනුවර නගරයට ගියා. දැක්කාම අපට බොහොම සන්තෝෂයි. මොකද, ඒ නගරය අද යුරෝපයේ නගරයක් වාගෙයි. සංචාරකයන්ගෙන් පිරිලා. ඒ අය බොහොම නිදහසේ ඉන්නවා. ඒ සංචාරකයන්ට නිදහසේ සැරිසරන්න පුළුවන් පරිසරයක් ඇති කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංචාරකයන් මේ විධියට වැඩි වෙන කොට අපි ඔවුන්ට පහසුකම් සලසන්න ඕනෑ. ඔවුන් රඳවා ගැනීමේ කටයුත්ත කරන්න ඕනෑ. ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා වෙනත් රටකට ගිහිල්ලා ආවොත් එතුමාත් සංචාරකයෙක් හැටියට ගණන් ගන්නවා කියලා ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා කිව්වා. එතුමාට වැරදිලා.

මොකද, රවි කරුණානායක මහත්තයා කියන්නේ අපේ හමුදාවල රණවිරුවෝ කිලිනොච්චියට යන කොට ඒ අය යන්නේ මැදවච්චියටයි කියලා කිව්ව එක්කෙනා. මම ඊයේ පෙරේදා කිලිනොච්චිය පසු කරලා ගියා. ඒ යන කොටත් මට මේ කථාව මතක් වුණා. දෙයියෝ සාක්කි!රණවිරුවෝ කී දෙනකුගේ ලේ, දහදිය පරිත්‍යාග කරලාද ඒවා ජයග්‍රහණය කරලා තිබෙන්නේ කියලා මම කල්පනා කළා. එදා කිලිනොච්චිය ජයග්‍රහණය කරන කොට එතුමා කිව්වා කිලිනොච්චියට කියලා යන්නේ මැදවච්චියට කියලා. එහෙම කිව්ව එක්කෙනා අද කියනවා ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා රටකට ගිහිල්ලා ආවත් එක සංචාරකයෙක් හැටියට ගැනෙනවා කියලා. එහෙම වෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ දස ලක්ෂයක් කියන්නේ අපි සම්පූර්ණයෙන්ම ආගමන හා විගමන දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් සංඛ්‍යා ලේඛන අනුවයි. අඩු ගණනේ dual visa තිබෙන කට්ටියවත් අපි ගණන් ගන්නේ නැහැ. ඒ වාගේම transit visa තිබෙන කට්ටිය ගණන් ගන්නේත් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ පෙරේදා ජනතා විමුක්ති පෙරමුණේ නායක සෝමවංශ අමරසිංහ කිව්වා, දැන් එන සංචාරකයෝ හිඟන්නෝ කියලා. මේවා කියලා ඒ අය කාලකණ්ණි සන්තෝෂයක් ලබනවා. අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ මේ රට නිදහස ලැබුවා. එදා රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගේ නායකත්වය යටතේ තිබුණ රජය ගිවිසුම් ගහලා, කොටින්ට කප්පම් ගෙවලා තමයි යාපනයට ගියේ. අද නිදහසේ යන්න පුළුවන්. බෞද්ධයාට, කිතුනු භක්තිකයාට, මුස්ලිම් ජාතිකයාට අද නිදහසේ යන්න පුළුවන්කම තිබෙනවා. එසේ නිදහසේ යන්න පුළුවන් රටක් අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඇති කළා. දැන් මේ ගොල්ලන්ට කියන්න දෙයක් නැහැ. සංචාරකයෝ එන කොට "මේ එන සුද්දන්ට සල්ලි නැහැ, හිඟන්නෝ තමයි මේ රටට එන්නේ" කියලා ඊයේ පෙරේදා රූපවාහිනී නාළිකාවක කියනවා මම දැක්කා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අය ඒ විධියට කියලා කාලකණ්ණි සන්තෝෂයක් ලබනවා. මේක ඉවසන්න බැහැ.

මේ ආණ්ඩුව තිබෙන්නේ තව ටික කාලයයි කිව්වා. ටික කාලයක් නොවෙයි තිබෙන්නේ. තුනෙන් දෙකේ බලය තිබුණාට අපි හිතුවක්කාරකම් කරන ආණ්ඩුවක් නොවෙයි. ක්‍රමෝපාය සංවර්ධන පනතට අද නියමයන් ගෙන එනවා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ මෙහෙම දෙයක් තිබුණේ නැහැ. මෙහෙම විනිවිදභාවයක් තිබුණේ නැහැ. අපි මේ පනත් ගෙනැල්ලා අනුමත කළ නිසා තමයි අද මේ විධියට මේවා විවාද කරන්න පුළුවන්කම ලැබිලා තිබෙන්නේ. මේ රටේ සිදු වන දියුණුව ගැන අද මේ අයට කථා කරන්න දෙයක් නැහැ. ආයෝජනය ගත්තාම ඒ සඳහා අපේ ඉලක්කයක් තිබෙනවා. අපි යන්නේ ඉලක්කයක් බලා ගෙනයි.

2016 වන විට විදේශීය සෘජු ආයෝජන ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4 දක්වා ඉහළට ගන්නට අපි බලාපොරොත්තු වෙනවා. ඒ විධියට අපට ඉලක්කයක් තිබෙනවා. එහෙම නම් ඒ ඉලක්කයට යන්න අපි ආයෝජකයන් සොයන්න ඕනෑ. මේ ගිවිසුම යටතේ මුළු ආයෝජන ප්‍රමාණය ගත්තාම ඇමෙරිකන් ඩොලර් මිලියන 158.85යි.

[ගරු ලලිත් දිසානායක මහතා]

එතකොට ඒක ලොකු ආයෝජනයක්. එතකොට අපි ඒ ආයෝජකයන්ට පහසුකම් දෙන්න ඕනෑ. ඒ පහසුකම් දෙනකොට බදු විරාමයක් දෙන්න ඕනෑ. මේ ප්‍රාග්ධන ආයෝජන යොදා ඉදි වන ගොඩනැඟිල්ල, ඉදි වන හෝටලය විදේශ ආයෝජකයන්ට අර ගෙන යන්න විධියක් නැහැ. ඒක මේ රටේ වත්කමක් බවට පත් වෙනවා. අද ගාලු මුවදොර ඉදි වන හෝටල් දිහා බැලුවාම අපට පෙනෙනවා, මීට කලින් ඒ ප්‍රදේශයේ නොතිබුණු හෝටල් ප්‍රමාණයක් ඉදි වන බව. එදා යුද හමුදා කඳවුර තිබුණු ස්ථානයේ අද විශාල හෝටලයක් ඉදි වෙනවා. ඒ ගැන අපට සතුටු වෙන්න පුළුවන්. වරායක් හැදුවත් තමුන්නාන්සේලාට ඒකත් වැරදියි; ණය අරගෙන හදනවාය කියනවා. ගුවන් තොටුපළක් හැදුවත් වැරදියි; ඒක හදන්නේ දකුණේය කියනවා. රටක් දියුණු වෙනකොට සියලු පහසුකම් අග නගරයේම තිබෙන්න ඕනෑ නැහැ. ඒවා ගම්වලට ව්‍යාප්ත වෙන්න ඕනෑ.

අද මොකද වෙලා තිබෙන්නේ? අධ්‍යාපනය ව්‍යාප්ත වුණු එකේ ප්‍රතිඵල අද අපට ලැබිලා තිබෙනවා. විශාඛා, රෝයල් වාගේ පාසල් නොවෙයි අද ඉදිරියට ඇවිල්ලා තිබෙන්නේ. අද ඒ තත්ත්වය ගමට ගිහින් තිබෙනවා. ඒ ගැනත් කියනවා, හම්බන්තොටින්ය ඉහළ ප්‍රතිඵල ලැබුණේ කියා. නමුත් අද ඒ පළාත්වල අහිංසක ළමයින්ගේ අධ්‍යාපන තත්ත්වය ඉතා ඉහළ මට්ටමක තිබෙන බව කියන්න ඕනෑ. මා නියෝජනය කරන ආසනයේ තිබෙන ජාතික පාසලකින් 'ඒ' සාමාර්ථ තුනක් ගත්තු ළමයෙක් වෛද්‍ය විද්‍යාලයට යන්න සුදුසුකම් ලබා තිබෙනවා. විශ්වවිද්‍යාලයට යන්න සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් 28 දෙනෙක් ඉන්නවා.

ඒ අනුව මේ අධ්‍යාපන සම්පත් ගමට ගලා ගෙන ගිහින් තිබෙන එක ගැන අපට සතුටු වෙන්න පුළුවන්. උසස් පෙළ ප්‍රතිඵලවලින් අද සබරගමුව පළාත ඉහළට ඇවිල්ලා තිබෙනවා; ඌව පළාත ඉහළට ඇවිල්ලා තිබෙනවා. ඒවායින් තමයි මේ රටේ සංවර්ධනය ගණනය කළ යුතු වන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දිවි නැගුම යටතේත් අපි විශාල ලෙස ආධාර ලබා දෙනවා. ඒ යටතේ 169 දෙනෙකුට අපි ලක්ෂ 38ක් දුන්නා. මේවා අලුත් දේවල් නොවෙයි. බිම් මල් වගාව, කිරි හරක් ඇති කිරීම වාගේ නිෂ්පාදන සඳහායි අපි ඒ මුදල් ලබා දුන්නේ. මොකද, මේ නිෂ්පාදන වැඩි කිරීම තුළින් පියවරෙන් පියවර දියුණුවක් ලබා ගන්නයි අපි කල්පනා කරන්නේ. අද අපි ඒ දියුණුව ලබා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රවි කරුණානායක මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් අහලා අද මේ සභාවේ කථා කළේ මොකක් ගැනද? පොහොර සහනාධාරය ගැනයි කථා කළේ. නමුත් අද අපි සන්තෝෂයෙන් එක දෙයක් කියන්න ඕනෑ. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජය යටතේ පහු ගිය අවුරුදු දෙක තුළ අපි හාල් ඇටයක්වත් පිටරටින් ගෙන්වූයේ නැහැ. පොහොර සහනාධාරය ලබා දීම තුළින් තමයි ඒ තත්ත්වය ඇති කළේ. තේ වගාව සඳහාත් අපි ඒ සහනාධාරය ලබා දුන්නා. තේ මිල පහළ යනකොට කුඩා තේ වතු හිමියන් රැක ගන්න අපි ඒ ආධාරය දුන්නා. ජනතා විමුක්ති පෙරමුණ නැගූ අසත්‍ය චෝදනාවක් සම්බන්ධයෙන් එදා මහින්ද සමරසිංහ ඇමතිතුමා පාර්ලිමේන්තුවේදී උත්තර දුන්නා. සෙස් බද්ද අරගෙන ඒක භාණ්ඩාගාරයට යවනවාය කිව්වා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ මුදල් භාණ්ඩාගාරයට යවන්නේ නැහැ. ඒකෙන් විශාල සේවාවක් වෙනවාය කියා එතුමා පාර්ලිමේන්තුවේදී හොඳ පිළිතුරක් ලබා දුන්නා. එකොට අකුළාගෙන යනවා. ඉතින් ඒවා අසත්‍යයි කියා කියන්න බැහැ. තේ වෙනුවෙන් සෙස් බද්දක් පැනවුවා. නමුත් ඒ සෙස් බද්දේ අරමුණ ගොවියාට වුණත්, කුඩා තේ වතු හිමියන්ට වුණත් ඒ අදාළ අංශයට උදව් කිරීමයි. මේ අය වැය ලේඛනයෙන් නව තේ වගාව සඳහා හෙක්ටෙයාරයකට දෙන ආධාර මුදල වැඩි කර තිබෙනවා; රබර් වගාව සඳහා දෙන ආධාර මුදල වැඩි කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ප්‍රගති සමාලෝචන රැස්වීම් අවුරුද්ද මුලදී පවත්වනවා. එහිදී හැම දෙපාර්තමේන්තුවක්ම තම සහයෝගය ලබා දෙනවා. ඒ ගැන මම එක උදාහරණයක් කියන්න ඕනෑ. මා නියෝජනය කරන මැතිවරණ කොට්ඨාසයේ අරනායක ප්‍රදේශයේ වී වගාවට අමතරව ගම්මිරිස්, කරාබු සහ පුවක් යන දේවල් තමයි ප්‍රධාන වශයෙන්ම වගා කරන්නේ. පුවක් පැළ 10,000ක් නොමිලේම ලබා දෙන්න අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියකු එකඟ වුණා. ඒ සඳහා සතයක්වත් අය කරන්නේ නැහැ. ගම්මිරිස් වගා කරන්නත් සතයක්වත් අය කරන්නේ නැතිව අවශ්‍ය දේවල් ලබා දෙනවා. ඒ සියලු දේ අපට නොමිලේම ලබා දෙනවා. මේ සියලු දේවල් යන්නේ ආර්ථිකය ශක්තිමත් කරන්නයි. ඇමෙරිකන් ඩොලර් මිලියන 157ක වියදමින් ලොකු හෝටල් හදනවා වාගේම අපි ගමේ ආර්ථිකයත් ශක්තිමත් කර තිබෙනවා. ඒ නිසා තමයි අද අපි බය නැතිව ගමට යන්නේ.

තමුන්නාන්සේලා කොතරම් කෑ ගැහුවත්, තමුන්නාන්සේලාට ඡන්ද ලැබෙන්නේ නැත්තේ, අපි හැම මැතිවරණයක්ම ජයග්‍රහණය කරන්නේ අපි ගමට ගිහින් තිබෙන නිසායි. දැනට තිබෙන ග්‍රාම සේවා වසම්14,000න් හැම වසමකටම රුපියල් ලක්ෂ 10 බැගින් දීලා අපි හැම වසමකම කොන්ක්‍රීට් පාරවල් හදා තිබෙනවා. තමුන්නාන්සේලා ඒ ගැන විවේචනය කරනවා. නමුත් අද අපට බොහොම සන්තෝෂයෙන් ගමට ගිහින් කටයුතු කරන්න පුළුවන්. අපේ රජය යටතේ රුපියල් 268,000ක් වියදම් කරලා ගෙවල් තුනකට විදුලිය දෙන්න කටයුතු යොදා තිබුණා. මම ගිය සතියේ ඉරිදා හවස ගිහින් ඒවා විවෘත කරලා ආවා. ඇයි මේ? ඒ ජනතාව අපට බුලත් දීලා වඳිනවා; ජනාධිපතිතුමා ගැන ඉතාම සන්තෝෂයෙන් කථා කරනවා. ඇයි? රුපියල් 268,000ක වියදමින් ගමට විදුලිය ගෙන යන්න අපට ශක්තියක් ලැබුණේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේයි. ගිය ඉරිදා තමයි මම ගිහින් ඒවා විවෘත කළේ. ඒ නිසා තමයි අපට පුංචි මිනිස්සුන්ගේ සහයෝගය ලැබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඉතින් ඒ ගැන ඊර්ෂ්‍යාවෙන් කෑ ගහලා වැඩක් නැහැ. රටට එන සංචාරකයන් හිඟන්නෝය; සතයක්වත් ලැබෙන්නේ නැහැ; ඉන්දියාවෙන් එන අයගෙන් කිසි මුදලක් ලැබෙන්නේ නැහැ කියා තමුන්නාන්සේලා අද ඊර්ෂ්‍යාකාර සතුටක් විඳිනවා. රූපවාහිනී නාළිකාවලින් ඒ ගැන කථා කරනවා අපි දැක්කා. ඒ අයට වෙන කියන්න දෙයක් නැහැ. අද මේ රට එක්සේසත් කරලා තිබෙනවා. මේ රටේ නිදහස තිබෙනවා. ඒ නිසා හලාල් ප්‍රශ්න වැනි විවිධ ප්‍රශ්න මතු කරනවා. ජාතීන් අතර අසමගිතාවය ඇති කරන්න විවිධ ප්‍රශ්න මතු කරනවා.

නමුත් මේවා ගැන අපි කල්පනා කරලා බලන්න ඕනෑ. මේ රටේ රණ විරුවන් දහඩිය, කඳුළු එහෙම නැත්නම් ජීවිත පූජා කරලා තමයි අපේ නිදහස ලබා ගත්තේ, අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ. තමුන්නාන්සේලා අද දූෂණය ගැන කථා කරනවා. එහෙම නම් ඒවා ඔප්පු කරන්න. මෙන්න මේ ගනුදෙනුව මෙයා කරලා තිබෙනවා කියලා කියන්න. නමුත් එහෙම දෙයක් කියන්න බැහැ. බොරුවට කථා කරනවා දූෂණය සිදු වනවා කියලා. ඒ නිසා අපි පැහැදිලිව කියනවා, අද අපි මේ ගෙනෙන නියමය මේ ආණ්ඩුවේ විනිවිදභාවය දැක්වෙන හොඳම දෙයක් කියලා. ඒක එදා එක්සත් ජාතික පක්ෂයට කරන්නට බැරි වුණ දෙයක්. ආයෝජන මණ්ඩලයට එන ආයෝජකයා කරන ගනුදෙනුව සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ අනුමැතිය ගන්න තමයි අද ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා මේ පාර්ලිමේන්තුවට මේ නියමය ගෙනැල්ලා තිබෙන්නේ. ඒ සඳහා

විවෘතව අනුමැතිය ගන්නයි අද කටයුතු කරන්නේ. එක්සත් ජාතික පක්ෂ රජය යටතේ මෙවැනි විනිවිදභාවයක් තිබුණේ නැහැ කියන කාරණය මා ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බල්ලෝ බිරුවාට තවලම ඉස්සරහට යනවා කියලා කථාවක් තිබෙනවා. ඒ නිසා කවුරු කෑ ගැහුවත් මේ රජය ජනතාවගේ ආශිර්වාදයත් සමඟ නිවැරදි මාවතක ඉස්සරහට යනවා. ඒක නවත්වන්න කාටවත් බැහැ. මහජන මතය සමඟ තමයි අතිගරු ජනාධිපතිතුමා ඇතුළු අපේ ආණ්ඩුව ඉන්නේ කියන කාරණය ප්‍රකාශ කරමින් මාගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 4.11]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොහොම ස්තුතියි.

නියෝජ්‍ය ඇමතිතුමා දිගින් දිගටම කථා කර ගෙන ගියා. නමුත් ඇත්තටම ඒ අදහස් පැහැදිලි ඒවා නොවෙයි. කෙසේ වෙතත් එතුමා අදහස් කිහිපයක් ප්‍රකාශ කළා. විශේෂයෙන්ම 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ මේ වන විට නියම කිහිපයක්ම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා. බැසිල් රාජපක්ෂ ඇමතිතුමා ඒ කාලයේ මේ විෂය භාරව නොසිටියත් අද එතුමා මේ විෂය භාරව කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද එක්සත් ජාතික පක්ෂයේ අපට අහ ගෙන ඉන්න සිදු වෙලා තිබෙනවා, ආයෝජන ගැන, විවෘත ආර්ථිකය කොහොමද ක්‍රියාත්මක කරන්නේ කියන එක ගැන විශේෂයෙන් වමේ පැළ වුණ මන්ත්‍රීවරු කරන කථා. දෛවයේ සරදම කියන්නේ ඒකටයි. බැසිල් ඇමතිතුමා ඒ ගැන කථා කළාට මගේ විරුද්ධත්වයක් නැහැ. එතුමා කාලයක් ගාමිණී දිසානායක මැතිතුමා සමඟ එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධව ක්‍රියා කළා. ඒ වාගේම අපේ ලක්ෂ්මන් යාපා ඇමතිතුමා කථා කළාටත් මගේ විරුද්ධත්වයක් නැහැ. මගේ විරුද්ධත්වය තිබෙන්නේ, විදේශ බලවේගවලට විරුද්ධ,විදේශ ආයෝජකයන්ට විරුද්ධ, සුද්දන්ට විරුද්ධ, රටේ සමාජවාදය ගැන කථා කරපු වමේ බලවේග, වමේ මන්ත්‍රීවරු අපට වැදි බණ කියන එක ගැනයි. සංචාරක ව්‍යාපාරය දියුණු කරන්නේ කොහොමද,විදේශ අයෝජකයෝ ගෙනෙන්නේ කොහොමද, විදේශ සල්ලි මේ රටට අවශ්‍ය ඇයි කියලා වමේ මන්ත්‍රීවරු කරන කථා එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු වන අපි අහ ගෙන ඉන්න ඕනෑ.

අද ඇමතිතුමා කථා කළේ ඩොලර්වලින්. දැන් එතුමා කියපු ගාමිණී සෙනරත් මහත්මයා කියන්නේ කවුද? ඒ මහත්මයාට කොහෙන්ද ඩොලර්? ඒ මහත්මයා හදපු මේ සමාගටම කොහෙන්ද ඩොලර් ආදායමක්, මේ සමාගමට විදේශ ආදායමක් ලැබිලා නැත්නම්, ආයෝජනයක් ඇවිල්ලා නැත්නම්. මේ සමාගම බිලියන 9.2කට දෙන්න තිබුණ සමාගමක්. ඒ නිසා තමයි මහත්මයෝ මෙතැන දූෂණයක් තිබෙනවා කියලා අපි කියන්නේ. බිලියන 9.2ක ලංසුවක් මේ සමාගමට ලැබුණා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
අසත්‍යය කියන්න එපා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
අසත්‍යය කියනවා නොවෙයි. ඔබතුමා ඔප්පු කරන්න එහෙම නොවෙයි කියලා. [බාධා කිරීමක්] ඔබතුමා ඔප්පු කරන්න එහෙම නොවෙයි කියලා. බිලියන 9.2යි. [බාධා කිරීමක්] එහෙම නම් ඔබතුමා දැන් දෙන්න අපට ඒ විස්තර. ඔබතුමාගේ කථාවේදී කියන්න. පුළුවන් නම් මේ සමගම දෙන්න ටෙන්ඩර් කැඳවන්න. රක්ෂණ සංස්ථාවෙන් බිලියන 6.2ට ඉල්ලුවා. ඒ නිසා බිලියන 4.5කට මේ සමාගම විකුණන්න ඕනෑ නැහැ ඇමතිතුමා. අසත්‍යය කියන්න එපා. බිලියන 9.2කට ඉල්ලුවා. මේ සමාගම දුන්න අවස්ථාවේදී විවිධ ලංසු තිබුණා. විශාල පිරිසක් ඉදිරිපත් වුණා ආයෝජකයෝ ගෙනෙන්න පුළුවන් කියලා. නමුත් ඔබතුමන්ලා ඒ අයට ලබා දුන්නේ නැහැ. මේ සමාගම බිලියන 9.2කට ඉල්ලුවා. ඔබතුමාට පුළුවන් නම්, මේ සමාගමේ තක්සේරුවක් ගන්න කීයට විකුණන්න පුළුවන්ද කියලා. [බාධා කිරීමක්] ඔබතුමා විවෘත තක්සේරුවක් ඉදිරිපත් කරන්න. අද ඉදිරිපත් කරන්න, පුළුවන් නම්. පුළුවන් නම් අද විවෘත market එකට මේ සමාගම දාන්න. නමුත් දාන්නේ නැහැ. ඔබතුමාගේ මේ ව්‍යාපාරයේ ආයෝජකයා ගාමිණී සෙනරත්ද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගාමිණී සෙනරත් මහත්මයාට සභාපති වෙන්න පුළුවන්.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
කොහොමද සභාපති වුණේ? කොහෙන්ද එතුමාට මේ මුදල් ලැබුණේ? [බාධා කිරීමක්] එතුමා ජනාධිපතිතුමාගේ අතිරේක ලේකම්. කොහොමද එතුමා මෙතැනට එන්නේ? ඇමතිතුමා, ඔබතුමා වග කිව යුතු ඇමතිවරයෙක් විධියට දැන ගන්න, මේවා විනිවිදභාවයෙන් සිදු වන්න ඕනෑ කියලා. මේ ව්‍යාපාර තමන්ගේ හෙංචයියන්ට, තමන්ගේ ලේකම්වරුන්ට, තමන්ගේ මල්ලිට, තමන්ගේ අයියාට දෙන්නේ නැහැ. [බාධා කිරීමක්] නීතියක් තිබෙන රටක විනිවිද භාවයක් තිබෙන්න ඕනෑ. ඒක තේරුම් ගන්න. සමාගමක් පත් කරලා හරියට නිලධාරින් පත් කරන්න. ඔබතුමන්ලා කොළේ වහලා ගහන්නේ. අපට කියනවා. ඔබතුමාගේ ඇමතිතුමාට ඒ විස්තර ඉදිරිපත් කරන්න කියන්න. [බාධා කිරීමක්] හරි, කථා කරන්න මට අවස්ථාව දෙන්න. මගේ අවස්ථාව ලබා දෙන්න මගේ අදහස් දක්වන්න. ඔබතුමාගේ අදහස් දක්වන්න ඔබතුමාගේ වාරයේ. ඔබතුමා අහගෙන ඉඳලා ඔබතුමාගේ වාරයේදී කථා කරන්න. ඔබතුමා දැන ගන්න මේ රටේ, මේ ලෝකයේ නීතියක් තිබෙන බව. තමන්ගේ ලේකම්වරු, තමන්ගේ සහෝදරයෝ, තමන්ගේ පවුලේ උදවිය දාලා ගනුදෙනු කරන්න බැහැ. ඒකට තමයි conflict of interest කියන්නේ. එතුමාට ඒ සමාගම ගන්න සල්ලි කොහෙන්ද? ජනාධිපතිතුමාගේ ලේකම් බිලියන 4.5ක සමාගමක කොටස් ගන්නවා. මොන රටක්ද මේක? [බාධා කිරීමක්] මේක බල්ලන්ගේ රටක් බවට පත් කළේ ඔබතුමන්ලා. තමන්ගේ නෝනා, තමන්ගේ පුතා, තමන්ගේ සහෝදරයා දාලා මේ වාගේ ගනුදෙනු කරනවා.

මේකද, රටේ තිබෙන සදාචාරය? මේකද, රටේ තිබෙන නීතිය? නැහැ, ඇමතිතුමනි නැහැ. ඔබතුමන්ලා කරන මේ කාර්ය භාරය වැරැදියි. එහෙම කරන්න එපා. සංවර්ධනය ඕනෑ නම්, ආයෝජනය ඕනෑ නම්, සංචාරකයන් ඕනෑ නම් ඔබතුමන්ලා ඒ විධියට ගනුදෙනු කරන්න. ඒකයි මා කියන්නේ. මන්ත්‍රීවරුන් වශයෙන් අපි කියන්නේ, තමන්ගේ පවුල් ඒ සඳහා සම්බන්ධ කර ගන්නේ නැතුව විනිවිදභාවයෙන් ඒ කටයුතු කරන්න කියලායි; මේ ගනුදෙනු කරන්න තමන්ගේ හෙංචයියන් දමන්න එපා කියලායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි පිළිගන්නවා, රටට ආයෝජනයක් තිබෙන්න ඕනෑ, සංචාරකයන් එන්න ඕනෑ කියලා. බැසිල් රාජපක්ෂ ඇමතිතුමා කිව්වා, සංචාරකයන් එනවා කියලා.

[ගරු සුජීව සේනසිංහ මහතා]

සංචාරකයන් එන බව අපි පිළිගන්නවා. ලලිත් දිසානායක නියෝජ්‍ය ඇමතිතුමා dual passport ගැන දන්නේත් නැතුව ඒ ගැන කථා කරනවා. Dual passport එකක් තිබෙන පුද්ගලයෙක් ඒ රටේ passport එකෙන් ලංකාවට ආවොත් සංචාරකයකු පැමිණි හැටියටයි සටහන් වන්නේ. බැසිල් රාජපක්ෂ ඇමතිතුමාටත් green card එකක් තිබුණා. එතුමාගෙන් අපි අහන්න ඕනෑ, එතුමා ලංකාවට එන කොට ආවේ ඇමෙරිකාවේ passport එකෙන්ද, ලංකාවේ passport එකෙන්ද කියලා. එතුමා ඇමෙරිකාවේ passport එකෙන් ආවා නම් සුද්දෙකු ආවා කියලායි සටහන් වන්නේ. ඒක තමයි සාමාන්‍ය ක්‍රමය. ඔබතුමන්ලාට ඒක නවත්වන්න බැහැ. ඒක රටේ නීතිය; ලෝකයේ නීතිය. Dual passport එකක් තිබෙන කෙනකු ඒ රටේ passport එකෙන් මේ රටට ආවොත් ඔහු කළු වුණත්, කට්ට කළු වුණත්, අපේ ස්වාමිනාදන් මන්ත්‍රීතුමා වාගේ කළු වුණත් ගණන් ගැනෙන්නේ සුද්දෙකු මේ රටට ආව හැටියටයි. මේක තමයි රටේ නීතිය. ඉතින් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටට සුද්දන් එන්නේ නැහැ කියන එක නොවෙයි අපි කියන්නේ. 2002 - 2003 දක්වා කාලයේ ලක්ෂ 7ක් පමණ සංචාරකයෝ ආවා. මේ වන කොට සංචාරකයෝ ලක්ෂ අටහමාරක්, ලක්ෂ නවයක්, ලක්ෂ නවයහමාරක් පමණ ඇවිල්ලා ඇති. විශේෂයෙන් බැසිල් රාජපක්ෂ ඇමතිතුමාට මා කියනවා, ඇමතිතුමනි, සුද්දෝ එනවා; අපි සුද්දෝ එන්නේ නැහැ කියන්නේ නැහැ.

ඇමතිතුමනි, රවි කරුණානායක ඇමතිතුමා කිව්ව කථාව නිවැරැදියි. අද කොළඹ අවට හෝටල් ගැන බැලුවොත්, තරු හතරේ, තරු පහේ හෝටල්වල සුද්දෝ ඉන්නවා. හැබැයි රට වටේට තිබෙන හෝටල් අරගෙන බැලුවොත්, සංචාරක ව්‍යාපාරය සම්බන්ධයෙන් විශාල ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමා දන්නවා ඇති, ඩොලර් 60ක්, ඩොලර් 70ක් වැනි මුදලකට කාමර සොයා ගෙන තමයි බොහෝ සංචාරකයන් ප්‍රමාණයක් එන්නේ කියලා. ඒ විධියේ සංචාරකයෝ එනවා. ඒ නිසා පොඩි හෝටල් තිබෙන උදවිය ලාභයක් ලබනවා. අපි ඒක නැහැ කියන්නේ නැහැ. අපි ඒක නොකියන්න තරම් කුහක වන්නේ නැහැ. මේ ක්ෂේත්‍රයේ යම් කිසි දෙයක් සිදු වනවා නම්, සුද්දන් එනවා නම් අපි ඒක නැහැ කියන්නේ නැහැ. හැබැයි, නිදහස ලබා දුන්නාට පස්සේ ඔබතුමන්ලා බලාපොරොත්තු වුණු ආකාරයට සංචාරක ව්‍යාපාරය දියුණුවක් ලබා නැහැ. මා ඒ සම්බන්ධයෙන් එදාත් ඇමතිතුමාට කිව්වා.

කාමරයක් සඳහා අය කළ යුතු අවම මුදලක් ඔබතුමන්ලා නියම කළා. සමහර කාමර ඩොලර් 300ක්, ඩොලර් 400ක් වනවා. එම නිසා ඇමතිතුමනි, සංචාරකයෝ මේ රටට එන්නේ නැතුව මැලේසියාව, තායිලන්තය වැනි රටවලට යන්න පුරුදු වුණා. ගිය අවුරුද්දේ ඒ නීතිය ගෙනාවාට පස්සේ සංචාරක ව්‍යාපාරිකයන් ලංකාවට තිබුණු තමන්ගේ ඇණවුම් විශාල ප්‍රමාණයක් තායිලන්තයට සහ මැලේසියාවට යොමු කළා. ඒ නිසා ඔබතුමන්ලා හොඳට ඒ ගැන දැනුවත් වන්න. සුද්දන් මේ රටට එනවාට අපි අකැමැති නැහැ. ඔබතුමන්ලා හෝටල් හදනවා නම් අපි ඒකටත් අකැමැති නැහැ. ඔබතුමන්ලා තමයි කිව්වේ අපේ දේපොළ සුද්දන්ට විකුණන්න එපා කියලා. එක්සත් ජාතික පක්ෂයේ අපි කවදාවත් කිව්වේ නැහැ, කාටවත් විකුණන්න එපා කියලා. ඔබතුමන්ලා ආයෝජනයක් ලබනවා නම්, විනිවිදභාවයෙන් යුතුව ඒ ආයෝජනය ලබනවා නම්, අවුරුදු පහක බදු සහන ලබා දෙනවා නම්, එය අවුරුදු 10 දක්වා දීර්ඝ කරනවා නම් අපේ විරුද්ධත්වයක් නැහැ.

ගරු ඇමතිතුමනි, ඔබතුමා මට පර්චස් 50ක් ආණ්ඩුවෙන් ලබා දෙන්න. මට පර්චස් 50ක් ලබා දීලා, ආයෝජනය කරන්න පුළුවන් ක්‍රමෝපායය මට හඳුන්වා දෙන්න. මා සංචාරක ව්‍යාපාරය කරන්න හෝටලයක් හදන්නම්. ඒ විධියට ලංකාවේ පුද්ගලයකුට එය හඳුන්වා දෙන්න. ලංකාවේ ව්‍යාපාරිකයකුට ඒ අවස්ථාව දෙන්න. පුළුවන් නම් පර්චස් 50ක් නොවෙයි, පර්චස් 30ක් අපට දෙන්න. අපිත් කාමර 10ක් හදා ගන්නම්. හැබැයි, ඔබතුමන්ලා කියනවා සුද්දන්ට නොවෙයි මේ ව්‍යාපාර දෙන්නේ කියලා. චීනයේ අය කහ පාට වුණාට ඒ අයත් සුද්දෝ. ඉන්දියාවේ අය කළු පාට වුණාට ඒ අයත් සුද්දෝ. ඔබතුමන්ලා මේ ව්‍යාපාර සුද්දන්ට දෙන්නේ නැහැ කියලා කහ පාට චීනුන්ටයි, කළු පාට ඉන්දියානුවන්ටයි දෙනවා. එහෙම නොවෙයි, ඇමතිතුමනි. ඔබතුමන්ලාට අපි කියන්නේ සාධාරණව -

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔබතුමා කථා කරන කොට වෙලාව වැඩියෙන් ගන්නවා. තත්පරයක් ගන්න.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
ඇමතිතුමා, ඇමතිතුමා කියා ඔබතුමා කිව්ව නිසායි මා කියන්නේ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මෙතැන ඇමතිතුමන්ලා තුන්දෙනෙක් ඉන්නවා.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
පළමුවන කාරණය මෙයයි. ඔබතුමා කිව්වා, මෙම ඉඩමට දෙන වන්දිය පිළිබඳව.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔබතුමා දීර්ඝ ලෙස කාලය ගන්නවා.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
පොඩ්ඩක් ඉන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
බැහැ, බැහැ. ඔබතුමාට දීර්ඝ වශයෙන් උත්තර දෙන්න ඉඩ දෙන්න බැහැ.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
උත්තර දෙන්න ඔබතුමා ඉඩ දෙන්නේ නැහැ නේ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔබතුමාගේ වාරයේදී උත්තර දෙන්න. මගේ වෙලාවෙන් නේ යන්නේ. ඔබතුමා මට වෙලාව දෙනවා නම් මා ඉඩ දෙන්නම්. එහෙම නම් ඔබතුමාට වෙන් කර තිබෙන කාලයෙන් මට විනාඩි 2ක් දෙන්න.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
මට නියමිත වෙලාවෙන් විනාඩි 2ක් ඔබතුමා ගන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බැසිල් රාජපක්ෂ ඇමතිතුමාට නියමිත වෙලාවෙන් මට විනාඩි 2ක් දුන්නා.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
මෙය, පාර්ලිමේන්තුවේ සම්මත කරන ලද පනතක් මඟින් පවරා ගත් දේපොළක්. එහි පැහැදිලිව තිබෙනවා, රජයේ තක්සේරුකරු තක්සේරු කරන මුදලට තමයි රජයට පැවරෙන්නේ කියලා. ඒ නිසා මේ දේපොළවලට එක් එක් කෙනාට ඕනෑ විධියට offers දෙන්න බැහැ. රජයේ තක්සේරුකරු කිව්වා, මෙහි වටිනාකම මෙපමණයි කියලා. ඒ මුදල රජය විසින් වෙනම ගිණුමක තැන්පත් කරන්න ඕනෑ. රජයට පවරා ගන්නා ඕනෑම දේපොළක් සඳහා රජයේ තක්සේරුකරුගේ මුදල විතරයි ගෙවන්න පුළුවන්.

ඊට වඩා ශතයක්වත් ගෙවන්න බැහැ. ඒ අනුව රජයේ තක්සේරුකරුගේ මිල තමයි රජය විසින් ඒ අයට තැන්පත් කර තිබෙන්නේ. පළමුවන උත්තරය ඒකයි. එම නිසා කවුරුවත් offers දුන්නාය කියා ඒකට කියන්න බැහැ.

දෙවන කාරණය මෙයයි. ඔබතුමා කිව්වා, පිට රට සුද්දන්ට දෙන්න එපාය කියා. මේක සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකාවේ ජනතාව සතු සමාගම් තුනකින් ආයෝජනය කරලා ගත් එකක්. මෙය තමයි පළමු වතාවට, මේ මෑත කාලයේ කළ විශාලතම ආයෝජනය. ඒක කෙරවලපිටියට ආයෝජනය කළා වාගෙයි. කෙරවලපිටිය විදුලි බලාගාරයත් මේ වාගේ ආයෝජනයක්. ඒකත් පුද්ගලික සමාගමකට නොදී අප ජනතාවගේ ආයෝජන යෙදෙව්වා. ඒ සමාගම් දෙක පෞද්ගලිකකරණය කර තිබුණු සමාගම් දෙකක්. ෂෙල් සමාගමට අයිතිය තිබුණු ගෑස් සමාගම, හැරී ජයවර්ධනට අයිතිව තිබුණු Sri Lanka Insurance Corporation එක.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම මේ කම්කරු ජනතාවගේ සල්ලි-[බාධා කිරීමක්] මේ ආයෝජනය- [බාධා කිරීමක්] ඒ ආයෝජන තුන වෙනුවෙන් තමයි මේ අධ්‍යක්ෂ මණ්ඩලය නම් කර තිබෙන්නේ.[බාධා කිරීමක්] ඔබතුමා කියන්නේ කවුරු හෝ කිව්ව වැරදි කරුණක්.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
හරි. හරි. විනාඩි දෙකක් ගියා. දැන් මගේ අවස්ථාව. බොහොම ස්තුතියි ඇමතිතුමනි. මා අහගෙන හිටියා. [බාධා කිරීමක්] අපේ සදාචාරයක් තිබෙනවා. අහගෙන ඉන්න විතරක් නොවෙයි. [බාධා කිරීමක්] අප ගරු ඇමතිතුමාට කථා කරන්න විනාඩි දෙකක් දුන්නා. අපි හොඳට අහගෙන හිටියා. එතුමාට උත්තර දෙන්නටත් අප සූදානම්.

ගරු ඇමතිතුමනි, ඔබතුමා සඳහන් කළ ආකාරයට රජයේ තක්සේරුවක් දෙන්න පුළුවන් රජයේ ඉඩමකටයි. ඒක නොවෙයි මෙතැන තිබෙන ප්‍රශ්නය. මේ ආයතනය අයත්ව තිබුණේ- ගෝල්ඩන් කී සම්බන්ධයෙන් විශාල මුදල් ප්‍රමාණයක් මගේ තාත්තා - විශේෂයෙන් - [බාධා කිරීමක්]

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
ඒවා කර තිබෙනවා, පැහැදිලි ලෙස.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
හරි. හරි. ඔබතුමා [බාධා කිරීමක්] දැන් ඔබතුමා මට කථා කරන්න අවස්ථාව දෙන්න. මම ඔබතුමාට අවස්ථාව දුන්නා නේ. දැන් ඔබතුමා මට පැහැදිලි කරන්න ඉඩ දෙන්න.

මෙහි ප්‍රශ්නය තිබෙන්නේ ඔබතුමන්ලා රජයේ තක්සේරුව ගන්න එක නොවෙයි. රජයේ තක්සේරුව අර ගෙන ඔබතුමන්ලාට පුළුවන් රජයේ ඉඩමකට ඒ ආකාරයෙන් ක්‍රියාත්මක වෙන්න. මේක පෞද්ගලික ඉඩමක්. [බාධා කිරීමක්] නැහැ. ඊට පස්සෙයි රජයට පවරා ගත්තේ. [බාධා කිරීම්] නැහැ.මේක ඔබතුමන්ලා පෞද්ගලික ආයෝජකයින්ගෙන් පවරා ගත්තේ. [බාධා කිරීමක්] හරි. හරි. ඔබතුමා අහගෙන ඉන්න. පෞද්ගලික ආයෝජකයාට දෙන්න නම් කලින් දුන් අවස්ථාවේ ඔබතුමන්ලාට වැඩිම ලංසුව ලබා ගන්න ඕනෑ. මොකද? මේකේ මුදල අනිවාර්යයෙන්ම ලැබෙන්න ඕනෑ, [බාධා කිරීමක්] නැහැ, [බාධා කිරීමක්] ආණ්ඩුවට පවරා ගත් එක නොවෙයි. [බාධා කිරීමක්] නැහැ. [බාධා කිරීමක්]

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
ඒක තමයි මූලික සිද්ධාන්තය.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මූලික සිද්ධාන්තය අප දන්නවා. [බාධා කිරීමක්] හරි.හරි. ඔබතුමන්ලා ඕක භාර දෙන්න. විවෘත ලංසුවක් කැඳවන්න. කී දෙනෙක්ද? [බාධා කිරීමක්] අප ගන්නට කැමතියි. ඔබතුමා [බාධා කිරීමක්] එහෙම නම් ඔබතුමන්ලා කාටද දෙන්නේ ? [බාධා කිරීමක්] එහෙමනම් කොහොමද තව ආයතන තුනකට දෙන්නේ? මේක පෞද්ගලික ආයතනයක්. [බාධා කිරීමක්]එහෙම නම් මේක කාගේ ආයතනයක්ද?[බාධා කිරීමක්] රජයේ ආයතනයක්? මේ කොම්පැනිය රජයේ ආයතනයක් වෙන්නේ කොහොමද? [බාධා කිරීමක්] මේ කොම්පැනිය රජයේ ආයතයනක් වෙන්නේ කොහොමද? මේක රජයේ ආයතනයක් නොවෙයි. [බාධා කිරීමක්] ඕකනේ නැට්ට පටලවා ගන්නවාය කියන්නේ. මේක පෞද්ගලික ආයතනයක්. කොහොමද, රජයේ ආයතනයක් වෙන්නේ? රජයේ ආයතනයකට ඔබතුමන්ලා විකුණන්න ඕනෑ නැහැ. රජයේ ආයතනයකට මොකටද විකුණන්නේ? කොහෙන්ද මේ මුදල්? ඩොලර් මිලියන එකසිය පණහක් රජයට කොහෙන්ද ? [බාධා කිරීමක්] ඩොලර් මිලියන එකසිය පණහක් රජයට කොහෙන්ද? ගරු ඇමතිතුමා කිව්වා, ඩොලර් මිලියන එකසිය පණහක් ආයෝජනය කරනවාය කියා. මේ මුදල් රජයට කොහෙන්ද? [බාධා කිරීමක්] කොහෙන්ද රජයේ ආයතනයකට මේ ඩොලර් මිලියන එකසිය පණහක්?[බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
රජය සතු විදේශ විනිමය. [බාධා කිරීමක්]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
විදේශ විනිමය? විදේශ විනිමය කොහෙන්ද? රජයේ තක්සේරුවට රුපියල්වලින් ගනුදෙනු කරන්න ඕනෑ. ඔබතුමන්ලා මේ ගේන්නේ කළු සල්ලි. අපට කොළය වහන්න එපා, ඇමතිතුමා. මේ ගේන්නේ කාගේවත් කළු සල්ලි. අපට නිකම් බෝල බස්සන්නට හදනවා. අප දන්නවා. ඔබතුමන්ලා මේක රජයේය කියා කියනවා. ඩොලර් මිලියන එකසිය පණහක් එනවාය කියනවා. මේවා පිටරට කළු සල්ලි, ඇමතිතුමා. ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන ඇමතිතුමා, ඔබතුමා දැන් ආයෝජන ප්‍රවර්ධන ඇමති වෙලා ඉන්නවා නේ. ඔබතුමා බලන්න. රැකියා සම්බන්ධයෙන් කයිවාරු ගහනවා. ඉදිරි අනාගතයේදී ඔබතුමා ගැන අපේ බලාපොරොත්තුවක් තිබෙනවා. ඔබතුමා වැඩ කාරයෙක්. ඔබතුමා එක්සත් ජාතික පක්ෂයේ ඉඳලා ගිය ඇමතිවරයෙක්. දැන් බලන්න ඇමතිතුමා, 2012 සිට BOI එකේ employment opportunities සම්බන්ධයෙන් මට තොරතුරු ලැබී තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා කියන ආකාරයට මේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමයෙන් BOI එකට - ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට- විශාල රැකියා ප්‍රමාණයක් ලැබෙනවා නම්; මේ රටේ රැකියා එක් ලක්ෂ පණස් දාහක් ඇති වෙනවා නම්, - ඔබතුමන්ලා ව්‍යාපාර ගණනාවක් හඳුන්වා දුන්නා නේ.- මේකෙන් සිදු වන්නේ මොකක්ද? ගරු ඇමතිතුමනි, මේකෙන් සිද්ධ වෙන්නේ, පිට රට කළු සල්ලි තිබෙන පුද්ගලයෝ මේ රටට ගෙනැවිත් අවුරුදු 99 කට ඒ අයට බදු දෙනවා. අප නිදහස ලබා ගෙන අවුරුදු ගණනක් ගතවෙලා තිබෙනවා. අපට මතකද, නිදහස ලබා දුන් දිනය?

ඔබතුමාගේ පියාට මතකද ඒක? අවුරුදු හැට ගණනක් ගතවෙලා තිබෙනවා. ඒක අපට මතක නැහැ. විශාල කාලයක් ගත වෙලා. ගරු ඇමතිතුමනි, අවුරුදු 99කට බදු දෙනවාය කියන්නේ මේ ඉඩම සින්නක්කර දුන්නා වාගෙයි. අවුරුදු 100ක් යන කොට මොන සුද්දාද මේක ගත්තේ කියලා අපට මතකවත් නැති වෙයි. ඔබතුමන්ලාගේ-

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
එහෙම තමයි.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
එහෙම තමයි කියන්නේ කොහොමද? ඔබතුමන්ලා කියන්නේ සුද්දන්ට දෙන්න එපාය කියලා නේ.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
ඔයිට වඩා අඩුවෙන් බදු දීලා තිබෙන්නේ කොයි එකේද?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
අඩුවෙන්? ඇයි, අවුරුදු 39කට දෙන්නකෝ.

ඔබතුමන්ලාගේ ආණ්ඩුව කියන්නේ සුද්දන්ට දෙන්න එපා කියලායි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කවුද කියන්නේ?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
කවුද කියන්නේ? ජනාධිපතිතුමා කියනවා සුද්දන්ට දෙන්නේ නැහැ කියලා. ඇමතිතුමන්ලා කියනවා සුද්දන්ට දෙන්නේ නැහැ කියලා. ඉඩම් ඇමතිතුමා කිව්වා සුද්දන්ට දෙන්නේ නැහැ කියලා. කාටද එතකොට මේ දෙන්නේ? මේ ඔක්කොම දෙන්නේ සුද්දන්ට. සුද්දන්ට දෙන්නේ, ටාටා ආයතනයට. ඔබතුමන්ලා ටාටා ආයතනයට දෙනවා අක්කර 7ක්. ටාටා ආයතනයට දෙනවා සින්නක්කර අයිතියත් එක්ක. ටාටා ආයතනයට අයිතිය තිබෙනවා සින්නක්කරව ඒ ඉඩම විකුණන්න. මිලියන 120යි.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
නැහැ, නැහැ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔබතුමා නැහැ කියන්න එපා. මම දන්නවා. මගේ ළඟ තිබෙනවා මේ ගිවිසුම. මිලියන 120යි. ඒ ගිවිසුම අනුව ටාටා ආයතනයට අක්කර 7ක් දෙනවා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
2003 දීත් දුන්නා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
2003 සිද්ධිය ගැන නොවෙයි මම කථා කරන්නේ. මේ හෙට අනිද්දා වෙන්න යන එක ගැන. කොම්පඤ්ඤ විදියේ. සින්නක්කර විකුණන්න අයිතිය තිබෙනවා, එතුමන්ලාට. ඔබතුමන්ලා රටට අසත්‍ය ප්‍රකාශ කරන්න එපා. සින්නක්කර විකුණන්න හදන condominium. බිලියන 110යි, 120යි. මේවා සින්නක්කර විකුණන්න පුළුවන්. කොහෙන්ද මේ නීති එතකොට? ඒ ලබා දෙන්නේ මොන නීති අනුවද?

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
ගරු මන්ත්‍රීතුමනි, ඔප්පු අංක 939 යටතේ-

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු ඇමතිතුමනි, ඔබතුමා මට හැම වෙලේම බාධා කරනවා.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
නාගරික සංවර්ධන අධිකාරිය මේක ලලිත් කොතලාවල මහත්මයාගේ සමාගමක් වන Ceylinco Homes International (Lotus Tower) Limited එකට දුන්නේ බද්දට. ඒ අනුනව අවුරුද්දකට. 2003 දී දුන්නේ. ඒක අපි රජයට පවරා ගත්තා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මම ඒක දන්නවා.

ඔබතුමා කෑ ගැහුවාට මම ඒක ගැන නොවෙයි මේ කියන්නේ. මම කියන්නේ වෙන එකක් ගැනයි. මම කථා කරන්නේ කොම්පඤ්ඤ වීදියේ ඉඩම ගැන. [බාධා කිරීම්] කොහේද යන්නේ කියලා ඇහුවාම මල්ලේ පොල් කිව්වා වාගෙයි ඔබතුමා කථා කරන්නේ. ඒ ගැන නොවෙයි මම කථා කළේ. මම කිව්වේ කොම්පඤ්ඤ වීදියේ ඉඩම ගැනයි. ඒ අක්කර හත ගැනයි. ඔබතුමා මේ මොනවාද කථා කරන්නේ? [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප කථා කළේ කොම්පඤ්ඤ වීදියේ අක්කර 7ක් පවරා ගත්තා ආකාරය ගැන. මෙතුමා කියන දෙය නොවෙයි අප කථා කළේ. අප දන්නවා ලලිත් කොතලාවල මහත්මයාට දුන්න බව. කොතලාවල මහත්මයාට දුන්නා පමණක් නොවෙයි, අහිංසක දුප්පත් ජනතාවගෙන් මන්ත්‍රීවරු හොරා කෑවා. ඒ මුදල අනිවාර්යයෙන්ම ගෙවන්න තිබුණා. හැබැයි ගෝල්ඩන් කී එකේ එක් කෙනෙකුටවත් මේ මුදල ගෙවන්න දුන්නේ නැහැ. ඔබතුමන්ලා විකුණුවා නම් ඒ සල්ලි ටික ලබා දෙන්න ගෝල්ඩන් කී තැන්පත්කරුවන්ට. එහෙම දුන්නාද?

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
ඒවා දුන්නා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
කොහේද දුන්නේ? එක්කෙනෙකුටවත් දීලා නැහැ. දුන්න සල්ලි හොයා ගන්නත් නැහැ. පැළ වුණු තැනකුත් නැහැ. ගරු ඇමතිතුමනි, නියෝජ්‍ය කථානායකතුමනි, අද වෙන කොට කාටවත් දීලා නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංසුව තියපු වෙලාවේ මිලියන 9.2කට දුන්නා නම් අනිවාර්යයෙන්ම සියලු ගෝල්ඩන් කී තැන්පත්කරුවන්ගේ ප්‍රශ්න විසඳන්න තිබුණා. ඒ විතරක් නොවෙයි, ලලිත් කොතලාවල මහත්මයා දැන් ලන්ඩන්වල ඉන්නේ. එතුමාට කොහේ දෙන්නද? ලලිත් කොතලාවල මහත්මයා ඉන්නේත් එංගලන්තයේ, එතුමාගේ නෝනා ඉන්නේත් එංගලන්තයේ. ඒ අයට සල්ලි දීලා නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ කථාවේදී ඉදිරිපත් කරන්න මෙන්න මේ මේ මුදල් ප්‍රමාණය ගෝල්ඩන් කී තැන්පත්කරුවන්ට දුන්නාය කියලා.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
දුන්නා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔබතුමා උත්තර දෙන විට කියන්න. ඔබතුමාට ඒක කියන්න බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක්සත් ජාතික පක්ෂය අවුරුදු දෙකකටයි ආණ්ඩුව ගත්තේ. එතකොට ආර්ථික වර්ධන වේගය සෘණ 1.5යි. ගරු ඇමතිතුමනි, බලන්න 2000 දී BOI ආයතනයේ රැකියා ප්‍රමාණය 14,546යි. ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන ඇමතිතුමනි, ඔබතුමාට මම මේ කියන්නේ. ඔබතුමා දක්ෂයෙක්. ඉදිරි අනාගතයේදී මොනවා හරි කරයි. 2001 දී ඒ ප්‍රමාණය 13,254යි. 2002 දී BOI ආයතනයේ රැකියා ප්‍රමාණය 28,165යි. 2005 වන විට ඒක 7,780ට අඩු වෙලා තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඔය ඇඟලුම්.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඇඟලුම් නැත්නම් යට කලිසම් හරි කමක් නැහැ. ඔබතුමා උත්තර දෙන්නකෝ. ඇඟලුම් විතරක් නොවෙයි. [බාධා කිරීමක්] ඔබතුමා ඉන්න කාලයේ ඇඟලුම් කර්මාන්තශාලා එකසිය ගණනක් වැහිලා තිබුණේ. මේ තිබෙන්නේ ඇඟලුම් කර්මාන්තය විතරක් නොවෙයි. ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා අනුව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ආයෝජන සේවා නියුක්තිය, ව්‍යවසායන් ගණන 1978 සිට 1995 දක්වා විස්තර මා ළඟ තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා හිටිය ආණ්ඩුවේ. බලාගන්න මේක. ඔබතුමන්ලා කරපු කාර්ය භාරය. අනුමත ආයෝජන. ව්‍යවසායන් ගණන 1,953යි. ගිවිස ගත් ආයෝජන ප්‍රමාණය 1,277යි. දැනට ඇති ආයෝජන 710යි. විදේශ ආයෝජන ප්‍රමාණය රුපියල් දසලක්ෂ 5 22,037යි. සමස්ත ආයෝජන ප්‍රමාණය රුපියල් දසලක්ෂ 631,588යි. ඒ විතරක් නොවෙයි, කම්හල් 200 වැඩසටහන යටතේ ව්‍යාපෘතිද ඇතුළු වාණිජමය නිෂ්පාදනයන්හි නියැලුන ව්‍යාපෘති ගණන 767ක් විය. මේවායින් ව්‍යවසායයන් 92ක් කටුනායක අපනයන සැකසුම් කලාපය තුළද, 45ක් බියගම අපනයන සැකසුම් කලාපය තුළද, 11ක් කොග්ගල අපනයන සැකසුම් කලාපය තුළද, 619ක් මෙම කලාපයන්ගෙන් පිටතද පිහිටා ඇත.

රුපියල් දසලක්ෂ 8385කට ආසන්න විදේශ ආයෝජන ප්‍රමාණයක් යෙදවීමෙන් දකුණු කොරියාව ශ්‍රී ලංකාවෙහි විශාලම ආයෝජකයා බවට පත්ව ඇත. කොරියානු ආයෝජන රෙදිපිළි නිෂ්පාදනය, පාවහන්, සැහැල්ලු සෙල්ලම් බඩු, පිහන් භාණ්ඩ, රබර් නිෂ්පාදන සහ කාර්යාල සහ නිවාස සංකීර්ණ ඉදි කිරීම වැනි විවිධ ව්‍යාපාරික අංශවලට යොමු වී ඇත.

රුපියල් දස ලක්ෂ 6,860ක විදේශ ආයෝජන ප්‍රමාණයක් යෙදවීමෙන් සිංගප්පූරුව දෙවැනි විශාලතම ආයෝජකයා වූ අතර, රුපියල් දසලක්ෂ 6, 032ක් යොදවමින් ජපානයද, රුපියල් දසලක්ෂ 3,578ක් යොදවමින් ඕස්ට්‍රේලියාවද ඉන්පසු විශාලතම ආයෝජනයන් කළ රටවල් විය.

ඒ විතරක් නොවෙයි ගරු ඇමතිතුමනි. ව්‍යාපෘතීන්ගේ සංඛ්‍යාව සලකා බලන කල ශ්‍රී ලංකාවේ ආයෝජකයන් ඉහළම ව්‍යවසායයන් සංඛ්‍යාව වූ 185කට දායක වූ අතර දකුණු කොරියාවේ ආයෝජකයන් ව්‍යවසායයන් 76කට සහ හොංකොං ආයෝජකයින් ව්‍යවසායයන් 50කට දායක වී ඇත.

එපමණක් නොවෙයි ගරු ඇමතිතුමනි, එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ ආයෝජන ඇති කළේ මෙහෙමයි; රට සංවර්ධනය කළේ මෙහෙමයි. 1978 ආරම්භයේ සිටම, ආයෝජන මණ්ඩලයෙහි අපනයනයන් ක්‍රමිකව වර්ධනය වූ අතර, 1996 වන විට එය මුළු කාර්මික නිෂ්පාදන අපනයනයන්ගෙන් සියයට 80කට දායක වූ අතර, මුළු අපනයනයන්ගෙන් සියයට 60කට දායක විය. එපමණක් නොවෙයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එක්සත් ජාතික පක්ෂ කාලය තුළ කටුනායක ව්‍යාපාරික ආයතන සංඛ්‍යාව 92යි. බියගම ව්‍යාපාරික ආයතන සංඛ්‍යාව 45යි. කොග්ගල ව්‍යාපාරික ආයතන සංඛ්‍යාව 11යි. ව්‍යාපාරික ආයතන සංඛ්‍යාවේ එකතුව 148යි.

මේ විධියට ආයෝජන මණ්ඩලය භාවිතා කර -ගරු ඇමතිතුමනි, ඔබතුමාට කාර්යය භාරයක් තිබෙනවා.- ආයෝජන මණ්ඩලය මුවාවෙන් සුද්දන්ට මේ ඉඩම් ටික විකුණලා, රටේ වටිනාකමින් වැදගත්ම ඉඩම් ටික 99 අවුරුද්දකට දුන්නාය

[ගරු සුජීව සේනසිංහ මහතා]

කියන්නේ නිකම්ම දුන්නා කියන එකයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අවුරුදු 25කට දීමෙන් මේ කරන සූරා කෑම උහුලන්නේ නැහැ කියන එකයි මම කියන්නේ. තමන්ගේ හිතවතුන්ට, තමන්ගේ සහෝදරයන්ට, තමන්ගේ ලේකම්ලාට ඒවා විකුණලා මේ කරන විනාශය; මේ කරන හොරකමට ඉදිරි අනාගතයේදී ඔබතුමන්ලා වගකියන්න ඕනෑ කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. [බාධා කිරීම්]

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
එක දවසක්වත් මේ පාර්ලිමේන්තුවට හෝ ජනතාවට පෙන්වා තිබෙනවාද තමුන්නාන්සේලා දීපු සහන? එක සහනයක් තියෙනවාද? [බාධා කිරීම්] මට කථා කරන්න පුළුවන්. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අදාළ ඇමතිතුමාට කථා කරන්න පුළුවන්. මීළඟට ගරු ශාන්ත බණ්ඩාර මහතා.

[අ.භා. 4.32]

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේදී ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය සාකච්ඡාවට ගන්නවා. විශේෂයෙන්ම අපේක්ෂිත ආයෝජනයන් ඇමෙරිකානු ඩොලර් මිලියන 158.89ක්. ඒ වාගේම ඉඩමේ වටිනාකම රුපියල් මිලියන 1028ක්. ඉඩමේ ප්‍රමාණය ගත්තාම අක්කර 1යි, රූඩ් 02 පර්චස් 1.73ක්. විශේෂයෙන්ම අපේක්ෂිත සංවර්ධනය අපි දන්නවා. අපේක්ෂිත සංවර්ධනය නේවාසික සුපිරි නිවාස 70ක්. ඒ වාගේම සීමාසහිත සිනෝ ලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගමේ පෞද්ගලික ව්‍යාපෘතිය යටතේ බදු සහන ලබා දීම පිළිබඳවයි අපි කථා කරන්නේ. පසු ගිය පාර්ලිමේන්තුවේවත් හිටපු නැති අය -සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා- කියනවා, එක්සත් ජාතික පක්ෂ රජයේ සංවර්ධනය ගැන; එක්සත් ජාතික පක්ෂ රජය රැකියා දුන් හැටි; එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කටයුතු කළ හැටි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයේ හැම අය වැයක්ම -2001, 2002, 2003- සකස් කරද්දී ඒ අය වැය හිඟය පියවන්න අදහස් කළේ එදා තිබුණු රාජ්‍ය ආයතන ටික විකුණලා දමලයි. ඒ මුදල්වලින් රට සංවර්ධනය කරන්න එහෙම නැත්නම් වෙනත් ආයෝජනයන් ගැන තමයි කථා කළේ. එක්සත් ජාතික පක්ෂයේ සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා අද කියනවා, එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ මේ සියල්ලම කරන්න වැඩ පිළිවෙළ හැදුවා කියා. ඉතිහාසයේ පළමුවන වතාවට ආණ්ඩුවක් හැටියට 16/1 චක්‍රලේඛය ගෙනත් රාජ්‍ය සේවයේ කිසිම රැකියාවකට බඳවා ගන්න අවස්ථාවක් දුන්නේ නැති ආණ්ඩුව තමයි එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව. මෙහෙම ආණ්ඩු තියා ගෙන මේ අය කියනවා, රැකියා විශාල ප්‍රමාණයක් ලබා දුන්නා කියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කිව්වා, නැව ගිලෙන්න යන විට මීයෝ ටික පනිනවා කියා. අපි ලෙනින්ගේ කථාවක් අහලා තිබෙනවා. ලෙනින් කියනවා, පරාජයට පත් වෙලා තිබෙන වෙලාවේ කඳවුරු ඔක්කොම එකතු වෙනවා; බලය තියෙද්දි කඳවුරු කැඩිලා යනවා කියා. ඒ ලෙනින්ගේ න්‍යායවත් අද සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමන්ලාට නැහැ. පරාද වෙලා, කඳවුරු විනාශ වෙලා, නැති වෙලා තිබෙන වෙලාවේ ඒ කණ්ඩායම් ඔක්කොම සුණු විසුණු වෙලා යනවා.

හිටියෙත් හතර දෙනායි. ඒ හතර දෙනාගෙන් එක් කෙනෙක් දැන් ස්වාධීනවයි ඉන්නේ. එහෙම අය තමයි අද අපේ ආණ්ඩුවේ ශක්තිය ගැන කියන්නේ, නැව ගිලෙන්න යනවා කියලා. එක්සත් ජාතික පක්ෂයේ සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාට අපි කියනවා, ඔය කෑ ගැහුවාට, තමුන්නාන්සේලාට ඒ පක්ෂයකින් ආසනයක්වත් වෙන් කරලා නැහැයි කියලා. එහෙම අවස්ථාවක්වත් දීලා නැහැ. පුංචි අවස්ථාවකට කථාවක් දුන්නාට පස්සේ දන්නේ නැති අසත්‍ය ප්‍රකාශ විශාල ප්‍රමාණයක් කරලා මේ සභාව සම්පූර්ණයෙන්ම නොමඟ යවනවා. සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා අසත්‍ය ප්‍රකාශ විශාල ප්‍රමාණයක් මේ සභාවට ඉදිරිපත් කළා. ඒ ආයතන අනූනව අවුරුදු බදු දුන්නේ කොයි කාලයේද? අපි කියනවා, 2003 තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කාලයේ තමයි ඒවා අනූනව අවුරුදු බදු දීලා තිබෙන්නේ කියලා. ඒවා තමයි විනාශයට පත් වන කොට අපේ ආණ්ඩුව නැවත පවරා ගත්තේ. ඒ නිසා තමුන්නාන්සේලා විශේෂයෙන්ම ඒවා පිළිබඳව අවධානයෙන් ඉන්න කියලා අපි කියනවා.

අද මේ රටට සංචාරකයන් එනවා. ඉස්සර කිව්වා, කිසි සංචාරකයෙක් එන්නේ නැහැයි කියලා. අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් මේ රටට සාමය උදා වුණාට පස්සේ විශේෂයෙන්ම ආරක්ෂාව පිළිබඳ හොඳ ස්ථාවරභාවයක් ඇති වෙලා, ඒ වාගේම ආර්ථිකය සම්බන්ධව හොඳ ස්ථාවරභාවයකට අපි යොමු වෙලා ඉන්න වෙලාවේ, දේශපාලන වශයෙන් ස්ථාවරභාවයක් ඇති වන වෙලාවේ අපේ රටට සංචාරකයෝ සහ ආයෝජකයෝ විශාල සංඛ්‍යාවක් එනවා. හැබැයි විපක්ෂය දිගටම කියා සිටියා, "සංචාරකයෝ එන්නේ නැහැ"යි කියලා. සංචාරකයෝ එන්න පටන් ගත්තාම කියනවා, "සංචාරකයෝ එනවා තමයි, ඒ ආවාට සංචාරකයන්ට සල්ලි නැහැ නේ" කියලා. ඒ නිසා මොනවා හෝ දෙයක් කියලා කාලකණ්ණි සතුටක් ලබා ගැනීම තමයි අද විපක්ෂයට වුවමනා වෙලා තිබෙන්නේ. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි බොහොම පැහැදිලිව කියනවා, විශේෂයෙන්ම අපේ රටේ ආයෝජනය අපි වැඩි කරන්න ඕනෑ; ඒ ආයෝජනය වැඩි කිරීම සඳහා ආයෝජකයන්ට සහන දෙන්න ඕනෑ බව. එහෙම සහන ලබා දෙන්නේ නැතුව ආයෝජනයන් වැඩි කරන්න කියලා කිව්වාට, "කෝ ආයෝජනයන්?" කියලා කිව්වාට වැඩක් නැහැ. ආයෝජකයන්ට සහන ලබා දෙන්න වැඩ පිළිවෙළක් ආණ්ඩුව හැටියට ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒ නිසා ඒ අයට සමහර විට බදු සහන දෙන්න ඕනෑ; එහෙම නැත්නම් සමහර විට පරිපාලනමය සහාය දෙන්න ඕනෑ.

මොකද, අපි දන්නවා, අපේ ග්‍රාමීය ප්‍රදේශවල ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර අවස්ථාවල කර්මාන්තශාලා ආරම්භ කරන්න ගියාම ප්‍රාදේශීය සභාවෙන් අවසර ගන්න ඕනෑ; ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අවසර ගන්න ඕනෑ; ඊළඟට ඉඩම් පිළිබඳ කොමසාරිස්වරයාගෙන් අවසර ගන්න ඕනෑ; පරිසර අධිකාරියෙන් අවසර ගන්න ඕනෑ. මේ මුළු මහත් සියල්ලගෙන්ම අවසර අරන් බලන කොට, ඒ පරිපාලනමය කටයුතු ටික ඉවර කර ගන්න කොට ඒ ව්‍යාපෘතියට අවුරුදු තුන හතරක් ගිහිල්ලා ඉවරයි. ඉතින් එහෙම ආයෝජකයෝ එන්නේ නැහැ. ඒ නිසා ඒ ආයෝජකයන්ට අවශ්‍ය පරිපාලනමය සහායත් ලබා දෙන වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒ එක් අවස්ථාවක් තමයි මේක. ඒ නිසා ඒ බදු සහන ලබා දෙනවා වාගේම ඊළඟට බැංකු ගනුදෙනුවල

සහායත් අපි ඒ ආයෝජකයන්ට ලබා දෙන්න ඕනෑ. ඒ වාගේම ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳ සහතිකය එහෙම නැත්නම් ඒ සහයෝගය අපි පැහැදිලිවම ලබා දෙන්න ඕනෑ. ඒ වාගේම ඒ අයට අවශ්‍ය සහයෝගය, උදවු ලබා දෙන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි, ඒ ආයෝජකයන්ට ධනාත්මක සහයෝගයක් අපි සමස්ත රටේ ජනතාව හැටියට මේ රටේ ආර්ථිකයට ඔවුන් ලබා දෙන දායකත්වයට ලබා දෙන්න ඕනෑ. එහෙම තැනකට එනවා විනා එහෙම නැතුව ඒ ආයෝජකයන්ව ආපහු හරවා යවන්න කටයුතු කිරීම නොවෙයි කළ යුත්තේ. එහෙම වුණොත් විපක්ෂයට කියන්න පුළුවන්, "අපේ රටේ කිසිම ආයෝජනයක් කරලා නැහැ, ආයෝජකයෝ ආපු සංඛ්‍යාවක් නැහැ, දේශීය ආයෝජකයොත් නැහැ, විදේශීය ආයෝජකයොත් නැහැ" කියලා. ඒ අයට සතුටු වෙන්න පුළුවන්. හැබැයි ආණ්ඩුවේ ප්‍රතිපත්තිය, ආණ්ඩුවේ වැඩ පිළිවෙළ ඒක නොවෙයි. අන්න ඒ නිසා තමයි මේ ආයෝජකයෝ දිරි ගැන්වීම සඳහා අවශ්‍ය බදු සහනද, අවශ්‍ය බැංකු සහායද, අවශ්‍ය පරිපාලනමය සහායද, අවශ්‍ය ආරක්ෂාවද ඒ සියල්ල ලබා දෙමින් දේශීය සහ විදේශීය ආයෝජකයන් ශක්තිමත් කිරීම සඳහා වැඩ පිළිවෙළක් මේ ආණ්ඩුව මඟින් ක්‍රියාත්මක කර ගෙන යන්නේ.

සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කිව්වා, බලය තිබෙන නිසා බලය පාවිච්චි කරලා ඕනෑම දෙයක් සම්මත කර ගන්නවා කියලා. අපි පැහැදිලි කියනවා, ඔව්, අපි බලය පාවිච්චි කරනවා තමයි. බලය තිබෙන්නේ පාවිච්චි කරන්න. මහින්ද රාජපක්ෂ අතිගරු ජනාධිපතිතුමා විධායක ජනාධිපතිවරයා කරන්න මේ රටේ මහජනතාවගෙන් අතිබහුතරයක් බලය ලබා දුන්නේ නිකම් ඉන්න නොවෙයි. ඒ වාගේම මේ උත්තරීතර පාර්ලිමේන්තුවට තුනෙන් දෙකේ බලයක් සහිත ආණ්ඩුවක් පත් කරලා එවලා මේ රටේ ව්‍යවස්ථාව වෙනස් කරන්න ඕනෑ නම් ව්‍යවස්ථාව වෙනස් කරන්න, අණපනත් වෙනස් කරන්න ඕනෑ නම්, සංශෝධනය කරන්න ඕනෑ නම් ඒ කටයුතු කරන්න, ජනතාව වෙනුවෙන් ගත යුතු නීත්‍යනුකූල තීන්දු තීරණ, ප්‍රතිපත්ති සකස් කරන්න ඕනෑ කියන අධිෂ්ඨානයේ ඉඳලා තමයි, ඒ විශ්වාසයෙන් තමයි ජනතාව මේ පාර්ලිමේන්තුව පත් කරලා තිබෙන්නේ. ඒ නිසා ජනතාව වෙනුවෙන් මේ බලය පාවිච්චි කරන්න ඕනෑම තමයි. ඒ නිසා ඒ බලය කුණු බක්කියට දමන්න අපි සූදානම් වන්නේ නැහැ. ඒ බලය පාවිච්චි කරලා ජනතාව වෙනුවෙන් සහ මේ රටේ ඉදිරි ගමන වෙනුවෙන්, ඉදිරි පරම්පරාව වෙනුවෙන් ගත යුතු තීන්දු තීරණ අරගෙන ක්‍රියාත්මක කර ගෙන යනවා. මෙයත් ඒ එක් අවස්ථාවක්.

පසු ගිය අවස්ථාවක අපි දිවි නැගුම පනත් කෙටුම්පත සම්මත කළා. ඒ දිවි නැගුම පනත් කෙටුම්පත සම්මත කළේ දිළිඳු භාවයෙන් තොර ශ්‍රී ලංකාවක් බිහි කිරීමේ අරමුණින්. ඒක අපේ රටේ ජනතාව වෙනුවෙන් ගත් වැදගත් තීන්දුවක්. එවැනි තීන්දු ගන්න පුළුවන් ජනතා පරමාධිපත්‍යයක් ලබා දීලා තිබෙනවා නම් ඒ බලය ඉතාම සුබවාදීව පාවිච්චි කරන්න ඕනෑ.

හැබැයි එක්සත් ජාතික පක්ෂය කොහොමද ඒ බලය පාවිච්චි කළේ? සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රජා අයිතිය අහෝසි කරන්නයි එදා ඒ බලය පාවිච්චි කළේ; මේ රටේ ක්‍රියාත්මක මැතිවරණ සිතියම අකුළා දමන්න, මැතිවරණ නොතියා ඔවුන්ගේ බලය දිගටම ක්‍රියාත්මක කරන්න තමයි එදා ඔවුන් බලය පාවිච්චි කළේ; ජනතා විමුක්ති පෙරමුණ අද කෑ ගහුවාට, ජනතා විමුක්ති පෙරමුණ කියන පක්ෂය අහිමි කරන්න, ඒ පක්ෂය තහනමට ලක් කරන්න තමයි එදා ඔවුන් බලය පාවිච්චි කළේ; 1988, 1989 කාලයේ මේ රටේ තරුණ තරුණියෝ 125,000ක් තැන් තැන්වල බල්ලෝ බළල්ලු වාගේ ඝාතනය කරන්නයි එදා එක්සත් ජාතික පක්ෂය බලය පාවිච්චි කළේ. අද මහින්ද රාජපක්ෂ ආණ්ඩුව එහෙම බලය පාවිච්චි කරන්නේ නැහැ. මේ රටේ දුප්පත් අහිංසක ජනතාව වෙනුවෙන්, මේ රටේ ගොවි ජනතාව වෙනුවෙන් අවශ්‍ය තීන්දු තීරණ ගනිමින් ඒ ලබා දී තිබෙන බලය ඉතාම සුබවාදී විධියට ක්‍රියාත්මක කරන්න අද කටයුතු කරනවා. අද ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ආයෝජකයන් දිරි ගැන්වීම සඳහා ගනු ලබන මේ ක්‍රියා මාර්ගයත් ඒ එක් අවස්ථාවක්ය කියන එක අපි විශේෂයෙන් මතක් කරනවා.

අද අපේ රටේ ඇති වෙලා තිබෙන ආරක්ෂාව, සාමය වාගේම ආර්ථික ස්ථාවරභාවය, දේශපාලන ස්ථාවරභාවය එක්ක අද අපේ රටට විශාල වශයෙන් සංචාරකයන් පැමිණෙමින් තිබෙනවා. ඒ සංචාරකයන්ගේ ආර්ථික මට්ටම් වෙනස් වෙන්න පුළුවන්. හැබැයි අපි දන්නවා සමහර සංචාරකයන් අති සුඛෝපභෝගී විධියට විශාල වියදමක් දරමින් කටයුතු කරන බව. ඒ වාගේම ආර්ථික මට්ටම් යම් ප්‍රමාණයකින් අඩු අයත් එනවා. ඒ කෙසේ වෙතත් අපි මේවා දිහා සුබවාදීව බලන්න ඕනෑ. සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න නම් මේ රටට ඇතුළු වන ගුවන් තොටුපළේ ඉඳලා අවශ්‍ය පහසුකම් ටික ඔවුන්ට ලබා දෙන්න ඕනෑ. මේ රටේ හෝටල් කාමර 50,000ක් ඉදි කරන්න ඕනෑ. සුපිරි විධියට කාමර 50,000කින් යුතු ඒ හෝටල් ඉදි කරලා, 2016 වන කොට මේ රටට සංචාරයකයන්ගේ පැමිණීමේ ඉලක්කය මිලියන 2.5 ඉක්මවා යන්නට අපි කටයුතු කරන්න ඕනෑ. මේ යෝජනාව ඒකට විශාල රුකුලක් වනවාය කියන එක මතක් කරමින් මා නිහඬ වෙනවා.

[අ.භා. 4.42]

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා (සමාජ සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - சமூக சேவைகள் அமைச்சர்)
(The Hon. Felix Perera - Minister of Social Services)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ මිත්‍ර සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාත් මේ විවාදයේදී කථා කළා. මා හිතන්නේ එතුමා කරුණු වරදවා තේරුම් ගත්තා කියලායි. එතුමාට නීතිඥයෙකු වශයෙන් අත් දැකීම් ඇති. නමුත් ව්‍යාපාර ක්ෂේත්‍රය පිළිබඳව එතුමා තව ටිකක් ඉගෙන ගන්න ඕනෑ.

සෙලින්කෝ සමාගම ඉස්සෙල්ලාම පටන් ගත්තේ 2003 දීයි. 2006 දී තමයි හදන්න පටන් ගත්තේ. ඒක ජනාධිපති මන්දිරයට එහා පැත්තේ නේ තිබෙන්නේ. 2009 දී ඒක හදන එක නැවතුණා. ඒ කාලයේ කොතලාවලගේ ව්‍යාපාර කඩා වැටෙන්න පටන් ගත්තා. මොකද, over business කරලා. Business 500ක් විතර කළා. එහෙම කළාම ව්‍යාපාර වැටෙනවා. සෙලින්කෝ සමාගම වැටෙන්න පටන් ගත්තාම මොකක්ද කළේ? සෙලාන් එකත් වැටෙන්න පටන් ගත්තා. එතකොට ඒක bailout කළා. සාමාන්‍යයෙන් ඇමෙරිකාවේ system එකක් තිබෙනවා, බැංකුවක් කඩා ගෙන වැටෙද්දී ඒකට ණය දීලා තමයි ස්ථාවර කරන්නේ. නමුත් අපේ රාජ්‍ය ප්‍රතිපත්තිය වෙනස්. අතිගරු ජනාධිපතිතුමා මේ ආයතනය රජයට පවරා ගෙන ආයෝජනය කළ අයගේ මුදල් සුරක්ෂිත කළා. ඒක තමයි අපි කළේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2011 දී සෙලින්කෝ එක හදන්න පටන් ගත්තා. 2012 දී තමයි මේ සිනෝ ලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් කියන සමාගම පිහිටෙව්වේ. ඒක දේශීය සමාගමක්. ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා ඒක පැහැදිලි කර දුන්නා. සම්පූර්ණයෙන්ම දේශීය ආයෝජනයක්. කවුද ඒකේ ආයෝජනය කළේ? Litro Gas Lanka Limited එකයි, Sri Lanka Insurance Corporation එකයි. ගාමිණී සෙනරත් මැතිතුමාට මේකේ අයිතියක් නැහැ. එතුමා සභාපති වශයෙන් ක්‍රියා කරද්දී ඒ කොටස් ලබා ගන්න එතුමාට හැකියාවක් තිබෙනවා. ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා ඒ තර්කය හොඳට පිළිගන්න. ඔබතුමා අහන්න; අහ ගෙන ඉන්න. සිංදුවකුත් තිබෙනවා නේ අහන්න අහ ගෙන ඉන්න කියලා. අහනවා විතරක් නොවෙයි, අහ ගෙන ඉන්න. මේක හොඳට අවබෝධ කර ගන්න. තමුන්නාන්සේ තරුණ

[ගරු ෆීලික්ස් පෙරේරා මහතා]

මන්ත්‍රීවරයෙක්. තමුන්නාන්සේට ලස්සන රූපයක් තිබෙනවා. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. [බාධා කිරීමක්] අහ ගෙන ඉන්න. වාඩි වෙන්න. වාඩි වෙන්න. වාඩි වෙලා අහ ගෙන ඉන්න. ඔබතුමාගේ හොඳටයි කියන්නේ.

අපි මේ විධියටයි කටයුතු කර ගෙන යන්නේ. තමුන්නාන්සේ කිව්වා සල්ලි ගන්න පුළුවන් කියලා. මේ හෝටලයේ කාමර හාරසිය ගණනක් තිබෙනවා. හයට් රීජන්සි සමාගමට මේක දුන්නාට, සියයට 80ක් fill වුණාට පසුව තමයි ගෙවීම් කරන්නේ. ඒ විධියටයි ගිවිසුමේ තිබෙන්නේ. බලන්න කොච්චර සාධාරණද කියලා. එහෙම නේද ඇමතිතුමා? සියයට 80ක් fill වෙන්න ඕනෑ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු ඇමතිතුමනි, සිනෝ කියන්නේ චීන නමක් නේ.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
සෙලින්කෝ කියන එකත්, සිනෝ ලංකා කියන එකත් අතර වචනවල වෙනස මොකක්ද කියලා කියන්න. සීනෝර් කියලාත් එකක් තිබෙනවා. ධීවර අමාත්‍යාංශයේ තිබෙනවා, සීනෝර් කියලා ආයතනයක්. එතකොට ඒකත් චීනයේ එකක්ද? තමුන්නාන්සේට නම් චීන නොවෙයි, වියට්නාමයේ කෙනෙකුගේ වාගේ ලස්සන මූණක් තිබෙන්නේ. [බාධා කිරීම්] ඔබතුමාගේ මූණ වියට්නාම් මූණක් වාගේයි. [බාධා කිරීම්] හෝ චි මිං මහත්මයාගේ ගෝලයා. [බාධා කිරීම්] හොඳයි, අහගන්න. මේක තමයි ඇත්ත තත්ත්වය. මේකේ තිබෙන ලොකුම දේ තමයි රැකියා 1,200ක් ලැබෙන එක.

මම හයට් රීජන්සි සමාගම ගැනත් කියන්නම් කෝ. ලෝකයේ රටවල හයට් රීජන්සි සමාගමට අයිති හෝටල් කාමර 135,327ක් තිබෙනවා. රටවල් 45ක ඒ ගොල්ලන්ගේ හෝටල් තිබෙනවා. ගරු ඇමතිතුමනි, මම ධීවර ඇමතිවරයා හැටියට ඉන්න කාලයේ තල්මසුන් පෙන්වන ව්‍යාපාරයක් පටන් ගත්තා. මේක පටන් ගත්තාට මට පුළුවන්ද තල්මසුන් පෙන්වන්න විදේශිකයන් ගෙනෙන්න? මම කීල්ස් එකත් එක්ක agreement එකක් ගැහුවා. කීල්ස් එකත් එක්ක agreement එකක් ගහලා කිව්වා, සංචාරකයන් ගෙනෙන්න කියලා. අපේ ගරු ඇමතිතුමා ආයෝජකයන් ගෙන්වා ගන්න පුළුවන් ශක්තිවන්ත ඇමතිවරයෙක්. එතුමා වැඩ කරන්න දන්නවා. කළමනාකරණය හොඳට දන්නවා. [බාධා කිරීම්] පොඩ්ඩක් අහගන්න. එහෙම කරලා තමයි සංචාරකයන් ගෙන්වා ගන්නේ. නැත්නම් ඒ වාගේ high-class hotel එකකට සංචාරකයන් ගෙනෙන්න ලංකාවේ අය යන්නද? [බාධා කිරීමක්] තල්මසුන් පෙන්වලා ඩොලර් මිලියන 20ක් උපයා ගත්තා. මොනවාද පෙන්වන්න බැරි? මීයෝ නොවෙයි, තල්මසුන් පෙන්වන්න පුළුවන්. පූසෝ, මීයෝ පෙන්වන්නත් පුළුවන්.

තල්මසුන් පෙන්වලා තමයි වැඩියෙන්ම සල්ලි ගන්න පුළුවන්. ඒක හොඳට මතක තියා ගන්න. මම තමුන්නාන්සේට කියන්න කැමැතියි, මේ වාගේ ආයතන ගෙන්වා ගන්න ඕනෑය කියලා. මේවා නිකම් ආයෝජන නොවෙයි, නිර්මාණශීලී ආයෝජන. සාම්ප්‍රදායික ආයෝජන නොවෙයි, නිර්මාණශීලී ආයෝජන. හැබැයි මේකට ඩොලර්වලිනුයි ගණන් හදලා තිබෙන්නේ. ඩොලර්වලින් loan එකක් වුණත් ගන්න පුළුවන්. කොච්චර එකක්ද? අපි මතක තියා ගන්න ඕනෑ අනෙක් කාරණය තමයි, අපට හෝටල් කාමර 50,000ක් ඕනෑය කියන එක. ඒ කාමර 50,000ක target එකට යද්දී ගරු ඇමතිතුමාගේ සංකල්පය, එතුමාගේ වැඩ පිළිවෙළ ගැන මම බැලුවා. මැලේසියාවට සංචාරකයන් මිලියන 2ක් එනවා. තවම අපේ රටට එන්නේ මිලියනයයි; ලක්ෂ 10යි.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මිලියන 100ක් එනවා.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ජනගහනය නොවෙයි.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
නැහැ. සංචාරකයන් මිලියන 100ක් විතර එනවා.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ඔව්. සංචාරකයන් මිලියන 100ක් විතර එනවා. මොකද ඒ රට දියුණු කෙරුවා. අනෙක් රට තමයි සිංගප්පූරුව. මම බැලුවා කොහොමද සිංගප්පූරුව දියුණු වුණේ කියලා. 1948 නිදහස ලබද්දී සිංගප්පූරුව කොහොමද තිබුණේ? අපිරිසිදු දූපතක්. දැනට අවුරුදු 15කට, 20කට ඉස්සෙල්ලා අපිත් ගිහිල්ලා තිබෙනවා. අනේ, හරිම cheap, හරිම cheap. ඒ වාගේම අපිරිසිදුයි. හැබැයි මේ සුමානේ ගිහිල්ලා ඇවිල්ලා තව මාසෙකින් ගියාම ඔන්න ගොඩනැඟිලි හැදිලා, පාරවල් වෙනස් වෙලා. හරියට දැන් ලංකාවේ වාගේ. ඒ මොකද? එතැන ප්‍රතිපත්තියක් තිබුණා. බ්‍රිතාන්‍ය හමුදා කඳවුරක් ලෙස නාවික ඒකකයක් තමයි ඒ රටේ තිබුණේ. පානීය ජලයත් නැහැ. පානීය ජලය ගෙනෙන්නේත් මැලේසියාවෙන්.

එතකොට කොහොමද සිංගප්පූරුව දියුණු වුණේ? ආකල්පවලිනුයි සිංගප්පූරුව දියුණු කෙරුවේ. මොනවාද තිබෙන්නේ? අමු ද්‍රව්‍ය තිබෙනවාද, තෙල් තිබෙනවාද, වතුර තිබෙනවාද, වවනවාද? මොකුත් නැහැ. අලුත් විධියට හිතලා, අලුත් විධියට ක්‍රියා කරලා රටක් දියුණු කරනවා මිසක් සම්ප්‍රදාය කිය කියා ආයෝජකයන් අධෛර්යවත් කරලා රටක් දියුණු කරන්න බැහැ. තමුන්නාන්සේලා මේ කාරණයත් මතක තියා ගන්න ඕනෑ. අපි plug වෙනවාටත් සමහර අය කැමැති නැහැ නේ. අපි ඇමෙරිකාවට plug වෙනවාට, ප්‍රංශයට plug වෙනවාට කැමති නැහැ. මොකද තමුන්නාන්සේලාට ඕනෑ අපිව තනි කරලා - හුදෙකලා කරලා- ආර්ථිකය වට්ටන්නයි. හුදෙකලා කරලා -තනි කරලා- ආර්ථිකය වට්ටන්න ලැහැස්ති වෙද්දී දක්ෂතා තිබෙන මිනිස්සු අනන්ත අප්‍රමාණ ඉන්නවා. හැකියාව තිබෙන, නිර්මාණශීලි දායකත්වයක් තිබෙන, වැඩ කරන්න පුළුවන්, කළමනාකරණය කරන්න පුළුවන්, පසු විපරම් කරන්න පුළුවන් කට්ටිය අපි ළඟ ඉන්නවාය කියන එක මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

සිංගප්පූරුව කොහොමද දියුණු කෙරුවේ? ප්‍රාග්ධනය තිබුණේත් නැහැ. තාක්ෂණය රටට ගෙන්වා ගත්තා. දේශපාලන ස්ථාවරත්වයක් තිබුණේත් නැහැ. ලී ක්වාන් යූ පළමුවෙන්ම කෙරුවේ දේශපාලන ස්ථාවරත්වයක් හදපු එකයි. මේ රටේ දේශපාලන ස්ථාවරත්වයක් හැදුවේ කවුද? අතිගරු ජනාධිපතිතුමා නේද? හිතන්න කෝ. ඉස්සර සංචාරකයෝ ආවාද? ගරු ඇමතිතුමනි, ඉස්සර යාපනයේ බෝම්බයක් පිපිරෙද්දී රොයිටර් වාර්තා කළේ කොළඹදී කියලායි. එතකොට හිතන්නේ කොළඹ තමයි පිපිරුණේ කියලා. එතකොට කවුද කොළඹට එන්නේ? කිලිනොච්චියේ හරි, පරන්තන්වල හරි, පූනරීන්වල හරි, එහෙම

නැත්නම් තවත් පැත්තක හරි බෝම්බයක් පිපිරුණාම රොයිටර් වාර්තා කරන්නේ කොළඹදී කියලායි. එතකොට කොළඹ තමයි highlight වෙන්නේ. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා අද කොළඹ සුන්දර නගරයක් කරලා තිබෙනවා.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
"Reporting from Colombo" කියලා දමන්නේ.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
හරියට හරි. "Reporting from Colombo" කියලා දමන්නේ. ඔය ආකල්ප වෙනස් කළේ කවුද? වෙනස් කළේ අපියි. ඉතින් මේකෙන් ප්‍රයෝජනයක් ගන්නකෝ. අපේ රටේ මේ තිබෙන සුන්දරත්වය පෙන්නලානේ, ලෙහෙසියෙන්ම සල්ලි හම්බ කරන්න පුළුවන්. පහසුම දේ ඒකයි. මොකද, රට මැද කඳු ටික තිබෙනවා; වටේට ගංගා ටික ගලනවා. ඒ ගංගා දෙසිය හැටහත්පොළකින් මුහුදට වැටෙනවා. ඊළඟට ස්විට්සර්ලන්තයට යනවා වාගේ පැය තුනක් ඇතුළත සීත පරිසරයකට යන්න පුළුවන්. අනෙක් පැතිවලට යන්නත් පුළුවන්.

ඊළඟට අරුගම්බේ පැත්තට ගියාම surfing කරන්න පුළුවන්. මුහුදේ කිලෝ මීටර් භාගයක් ඇවිදින්න පුළුවන්. ලස්සන මුහුදක් තිබෙනවා. හික්කඩුවට ගියාමත් එහෙමයි; ලස්සන පරිසරයක් තිබෙනවා. ඉතින් මෙවැනි , මේ ක්‍රමෝපාය සංවර්ධන වැඩ පිළිවෙළ පළමුවැනි වරට පාර්ලිමේන්තුවට ගෙනාවා. ඩොලර් මිලියන එකසියපහළොවක්සුන්දරත්වයක් මිශ්‍ර වුණු වෙනත් රටක් නැහැ. ඉතින් අපි මේ සංචාරක කර්මාන්තය market කර ගන්නේ කොහොමද? Market කර ගන්න එපායැ? උදාහරණයක් විධියට මාලදිවයිනේ market කර ගන්න මොනවාද තිබෙන්නේ කියා බලන්න. ඒ වාගේ අපි කොහොමද market කරන්නේ? ඉතින් මේ market කිරීමට සුදුසුම වැඩ පිළිවෙළක් අපේ ආර්ථිකය පැත්තෙන් අපි හදනවා. තමුන්නාන්සේලාට කලබල වෙන්න දෙයක් නැහැ; අපි වැටෙන්නේ නැහැ. ආර්ථිකය දවසින් දවස අපි ගොඩ ගන්න දන්නවා. වැටුණත් ගොඩ ගන්න දන්නවා. වැටෙනවා තමයි. වැටි වැටීනේ, නැඟිටින්නේ. එක පාරටම නැඟිටලා දුවන්න බැහැනේ. වැටෙනවා; නැඟිටිනවා; දුවනවා; අන්තිමේදී අපි දිනුම් කණුව ළඟට යද්දී තමුන්නාන්සේලා කිලෝමීටර් දෙකක් විතර පස්සෙන් ඉන්නවා. ඕක තමයි ඇත්ත තත්ත්වය. ඉතින් ඒ ගැන කියන්න කනගාටුයි. අපි මේවායේ අත් දැකීම් ලබා ගෙන කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි මේකට invest කරලා තිබෙනවා. එතකොට තමයි ක්‍රමෝපායක් දෙන්නේ. දැන් බලන්න මේ ව්‍යාපෘති නරකද කියලා. මන්නාරම් ද්‍රෝණියේ තෙල් සහ ගෑස් ගවේෂණය සඳහා ව්‍යාපෘතිය. දකුණු පළාතේ හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ සුඛෝපභෝගී හෝටලයක් සහ නේවාසික ඒකක -villas - ඉදි කිරීමේ ව්‍යාපෘතිය. බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොටුව උසස් ස්තරයේ නිවාස සහ-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කරුණාකර, නිශ්ශබ්ද වෙන්න. මේ අවස්ථාවේදී ගරු ජානක බණ්ඩාර මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු ජානක බණ්ඩාර මහතා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ජානක බණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஜானக பண்டார அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. JANAKA BANDARA *took the Chair.*

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ව්‍යාපෘති අතරට ඇතුළත් වනවා, බස්නාහිර පළාතේ කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ කොටුවේ උසස් ස්තරයේ නිවාස සහ නවීන කඩ සාප්පු සංකීර්ණයක් ඇතුළු මිශ්‍ර උපයෝගීතා සංකීර්ණයක්, සුඛෝපභෝගී හෝටලයක් ඉදි කිරීම. ඉදි කර ක්‍රියාත්මක කිරීමේ, පැවරීමේ පදනම මත කොළඹ වරාය ව්‍යාප්ත කිරීම ව්‍යාපෘතිය යටතේ කන්ටේනර් පර්යන්ත සහ සංවර්ධනය කිරීම සඳහා ව්‍යාපෘතිය. ඊළඟට මොනවාද? නවීන තාක්ෂණයෙන් යුත් නව වානේ කර්මාන්ත පිහිටු වීම සඳහා දැනට අතුරුගිරියේ පිහිටි කර්මාන්තශාලාවේ යන්ත්‍රාගාර ධාරිතාව ඉහළ දැමීම සඳහා වන ව්‍යාපෘතිය. කොතරම් ලොකු ආයෝජනයක්ද බලන්න. මේවාට තමයි ක්‍රමෝපාය සංවර්ධන අයිතිය දීලා තිබෙන්නේ. හැබැයි tax holidays දීලා තිබෙනවා. ඊළඟට ගෙන යන්න පුළුවන්කම දීලා තිබෙනවා. කවුද invest කරන්නේ? අපට ආදරේටද සුද්දෝ එන්නේ? සුද්දෝ අපිව බලන්න ඒවි. නමුත් ඒ ගොල්ලන් එන්නේ ආයෝජනයක් කරන්න. ඒ ආයෝජනය නැවත ගෙන යන්න පුළුවන් වන විධියටයි කටයුතු කරන්නේ. අපි දැන ගන්න ඕනෑ අපට ඒකෙන් ගන්න පුළුවන් දේ උපරිම, මිරිකලා, සූරලා ගන්න. වෙන රටවල එහෙමයි කරන්නේ. නැතිව මොනවත් දෙන්නේ නැහැ කිව්වොත් කවුද එන්නේ? කවුරුත් එන්නේ නැහැ. පාර්ලිමේන්තුවේ දිවා භෝජනාගාරයේ හොඳ රස කෑම තිබුණේ නැත්නම් තමුන්නාන්සේලා මෙහෙන් කනවාද? නැහැනේ? කොහෙන් හරි කෑම ටිකක් කාලා ඒවි. මොකද, මේවා සේරම මිනිස්සු වෙනුවෙන් කර තිබෙන ව්‍යාපෘති.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට, US Dollars 158,890,000ක මුළු ආයෝජනයකින් යුත් කාමර 475කින් යුක්ත නාගරික හෝටලයක් ඇතුළුව ඒකාබද්ධ නිවාස 90ක් බස්නාහිර පළාතේ කොළඹ 03, ගාලු පාර, අංක 116 දරන ස්ථානයෙහි ඉදි කිරීමේ ව්‍යාපෘතිය. Krrish Group නමැති ඉන්දියානු සමාගම මඟින් බස්නාහිර පළාතේ පිහිටි ට්‍රාන්ස්වර්ක්ස් චතුරශ්‍ර භූමියේ ඇමෙරිකානු ඩොලර් මිලියන 449ක් පමණ වන මුළු ආයෝජනයකින් යුතුව ඉදි කරන මිශ්‍ර උපයෝගිතා සංකීර්ණ ව්‍යාපෘතිය. ඊළඟට බස්නාහිර පළාතේ කොටුවේ ඉදි කරන ව්‍යාපෘතිය. මෙහි ව්‍යාපෘති සමාගම වන්නේ වෙල්කොම්ගෲප් හොටෙල්ස් පුද්ගලික සමාගමයි. මෙම ව්‍යාපෘතිවලට අදාළ බදු සහන මොනවාද කියලාත් අපි කියන්නම්කෝ. 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත අනුව වසර 10ක කාල සීමාවක් සඳහා ව්‍යාපෘති සමාගමෙන් බදු ගෙවිය යුතු ලාභය දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදනවලින් නිදහස් වෙනවා.

[ගරු ෆීලික්ස් පෙරේරා මහතා]

අන්න incentive එක දුන්නා. නැත්නම් ආයෝජකයෝ එන්නේ නැහැ. ආයෝජකයෝ ඇද ගන්න incentive එකක් දෙනවා. ඊළඟට වසර දහයක කාලය ඉක්ම යන තුරු වසරක කාල පරිච්ඡේදය සඳහා ලාභවලින් කොටස්කරුවන්ට බෙදා දෙනු ලබන ලාභාංශ සඳහා බදු නිදහසක් දෙනවා. මෙම බදු නිදහස ව්‍යාපෘතිය ආරම්භ වී මෙම සමාගම ලාභ උපයන මුල් වසර ආරම්භයේ සිට වාණිජමය කටයුතු ඇරඹීමෙන් පසු වසර තුනක් ක්‍රියාත්මක වෙනවා. මේ incentives වසර තුනක් ක්‍රියාත්මක වනවා. සමහරු incentives දෙනවා. Grace periods දෙනවා. වරායක් හැදුවාම අපි පළමුවෙන්ම අහන්නේ grace period එක කොපමණද කියලායි. Grace period එක නැතිව කවුද එවැනි කටයුතු භාර ගන්නේ? මොකද හෝටලය හදන්න පටන් ගත් දා ඉඳලා ණය ගෙවන්න බැහැ නේ? හදලා ක්‍රියාත්මක වුණාට පස්සේ ආදායමක් එද්දි තමයි ණය ගෙවන්න පුළුවන් වන්නේ. ණය ගෙවන තුරු ණය දෙන කෙනාගෙන් අපි සහනයක් ඉල්ලනවා. එය මේ ලෝකයේ පවතින ක්‍රමවේද නේ? මේ ක්‍රමවේදවලට පටහැනිව අපට යන්න බැහැ. එම නිසා මේ ක්‍රමවේද අපි හොඳට අධ්‍යයනය කරන්න ඕනෑ. අපි ආයෝජකයින්ට බදු නිදහස් කාල පරිච්ඡේද දෙනවා. සේවකයන් විසි දෙනෙකුට උපරිමයකට යටත්ව සමාගමේ ප්‍රවාර්ෂික සේවකයන් සම්බන්ධයෙන් උපයන විට ගෙවිය යුතු බද්ද, බදු ගෙවීමෙන් නිදහස් වෙනවා. මෙම බදු නිදහස ව්‍යාපෘතිය වාණිජමය කටයුතු සඳහා ඇරඹීමේ දින සිට වසර 15ක් දක්වා වෙනවා. සමහර වෙලාවට අපි වැට් එකත් නැති කරලා තිබෙනවා. අපි මේ විධියට ආයෝජකයින්ට සහන ලබා දෙනවා. වෙන රටවල මීටත් වැඩිය සහන දෙනවා. අපි සහන දෙන්නේ සම්පූර්ණයෙන්ම නොවෙයි. අපි දෙන්නේ යම් කිසි ප්‍රතිශතයක් පමණයි.

ආයෝජකයෙක් ඇවිල්ලා building එක හැදුවා කියමු කෝ. හෝටලය හදනවා. හෝටලය හදලා අවසන් වෙලා ඒ ආයෝජකයෝ ආපහු යනකොට ඔවුන්ට ඒ buildings ටික උස්සා ගෙන යන්න පුළුවන්ද? Buildings ටික දමා යන්න වනවා. එතකොට අවසානයේ ඉතිරි වන්නේ මොනවාද? ප්‍රාග්ධනය ඉතිරි වනවා. උදාහරණයක් විධියට අපි ගෙයක් හදනවා කියමු කෝ. මේ ගේ හැදුවාට පස්සේ මගේ ජීවිත කාලය අවසන් වෙලා මම මිය යනකොට මේ ගේ මට අරගෙන යන්න පුළුවන්ද? බැහැ. මේ ගේ තියලා යන්න වනවා. එතකොට කාටද මේ ගේ අයිති වන්නේ? එක්කෝ දරුවන්ට අයිති වනවා. එහෙම නැත්නම් ඥාතීන්ට අයිති වනවා. මේක තමයි ලෝකයේ සනාතන ධර්මය. අපට මේ ධර්මය අනුව ක්‍රියා කරන්න වනවා. ආර්ථිකයටත් ඒක වලංගුයි. ඉතින් තමුන්නාන්සේලා මොනවා කථා කෙරුවත්, ඔය ආර්ථික න්‍යායන් හරියට කල්පනා කරලා බැලුවොත් ඔබතුමන්ලා ගෙනෙන චෝදනා වලංගු වෙනවා කියලා මම හිතන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් කරුණු කාරණා රැසක් කියන්න තිබෙනවා. අපි අපේ රට දියුණු කර ගෙන යනවා. එහෙම දියුණු කර ගෙන යද්දි අවශ්‍ය මූලික දේ තමයි යටිතල පහසුකම් ඇති කිරිම. තමුන්නාන්සේලාගේ හිටපු නායකයෙක් වන ලලිත් ඇතුලත්මුදලි මහත්තයා කිව්වේ රටක් දියුණු කරන්න නම් මාර්ග පද්ධතිය ඉක්මනට හදන්න ඕනෑය කියලායි. අර Indian car එකක් තිබෙන්නේ "Maruti" කියලා. ඒ Maruti car එකකින් ගැස්සෙන්නේ, හෙල්ලෙන්නේ නැතිව ලංකාව වටේ යන්න පුළුවන් පාරවල් ටිකක් හදන්න අපේ බලාපොරොත්තුවක් තිබෙනවා. දැනටත් ඒ විධියට යන්න පුළුවන්.

ඉස්සර ජීප්වල යන්න පුළුවන් තැන්වලට දැන් Maruti car එකෙන් යන්න පුළුවන්. ඒකට හේතුව මොකක්ද? දැන් පාරවල් හොඳට හදලා තිබෙනවා. පාරවල් හොඳට හැදුවාම ඒ ගමන සඳහා ගත වන කාලය ඉතිරි වනවා. කාලය කළමනාකරණය වනවා. මනුෂ්‍යයෙක් ජීවත් වන සාමාන්‍ය කාලය අරගෙන බැලුවොත් 24X30 (මාසයක්) X 12 (අවුරුද්දක්) X 50 හැටියට calculator එකේ ගහලා බැලුවොත් ඕනෑ නම් පැය 400,000ක්, 425,000ක් විතර ඒ තැනැත්තා ජීවත් වෙයි. ඒ අපි ජීවත් වන කාලයෙන් තුනෙන් එකක් නිදා ගන්නවා. තුනෙන් එකක් ඉගෙන ගන්න ගත වනවා. මේ පොඩි කාලය තුළ නේද මේ හැම දේම කරන්නේ? මේ පොඩි කාලය තුළ අපි යමක් කෙරුවොත් එහෙම ඒ ආයෝජනය අන්තිමට ඉතිරි වන්නේ කාටද? රටට. සමහර විට අඹ ගහක්, පොල් ගහක් හිටෙව්වාම අවුරුදු 50ක්, 60ක් ගිහිල්ලා ඒවායේ ඵලදාව ලබා ගන්න අප ජීවත්ව ඉන්නේ නැති වන්න පුළුවන්.

නමුත් අපි ඒ පැළ හිටවන්නේ නැතිව හිටියොත් මොකද වෙන්නේ? ඒවායේ ඵලදාව අපට ලැබෙන්නේ නැහැ කියලා ඒ පැළ හදන්නේ නැතිව ඉන්න පුළුවන්ද? ඒ වාගේ අපේ ආණ්ඩුව තියෙද්දි මේ දේවල් හදලා දෙනවා. තමුන්නාන්සේලා බලයට එන්න බලාපොරොත්තු වනවා නම් තමුන්නාන්සේලා බලයට ආවාම ඉඳගන්න ලස්සනට seats හදලා තියෙනවා. ඇත්ත තත්ත්වය ඒකයි. දැන් අපි පාරවල් ටික හදලා දීලා තිබෙනවා. ඊළඟට තමුන්නාන්සේලාට තව කරුණක් මතක් කරන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුව හදලා දුන්නේ ජේ.ආර්. ජයවර්ධන මහත්තයා නේ. ඉස්සර අපි මේ පාර්ලිමේන්තුව හදන එකට බැන්නා, මොකක්ද මේ කරන විගඩම, ඇයි මෙච්චර වියදමක් කරන්නේ කියලා. අන්තිමේදී ඉඳගන්න මෙතැන ඉඩත් මදි වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැම ආයෝජකයෙක්ම අනාගතය බලා තමයි ආයෝජනය කරන්නේ. තමුන්නාන්සේලාට අපි ප්‍රකාශ කරන්න ඕනෑ, මේවා ගැන හොඳ positive ඇහැකින් බලන්න කියලා. Negative ඇහැකින් බලන්න එපා. Negative ඇහැකින් බැලුවොත් වැඩක් වන්නේ නැහැ. මොකද අපි සංචාරක ව්‍යාපාරය හරහා මේ රටේ ලොකු ගමනක් යන්න ඕනෑ. හැමිල්ටන් ඇළ සංවර්ධනය කරන්න ඊයේ ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා පටන් ගත්තා. කොළඹ ලස්සන කරනවා; සුන්දර කරනවා. මිනිස්සුන්ගේ ආකල්ප වෙනස් වනවා. සංචාරකයෙක් ලංකාවට ආවාම ඉස්සෙල්ලාම දකින දර්ශනයෙන් තමයි ඒ සංචාරකයාගේ මනස වෙනස් වන්නේ. දැන් බලන්න බංග්ලාදේශයට ගියාම තවමත් රික්ෂෝ තිබෙනවා. ඒ රටට ගිය හැටියේ ඕනෑ කෙනෙකුට හිතෙන්නේ හරි දුප්පත් රටක් නේ කියලායි.

මිනිස්සු බස්වල උඩ නැඟලා යනවා. මේ රට හරි දුප්පත්නේ. එහෙමයි හිතන්නේ. නමුත් අපේ රටේ තිබෙන කාර් ටික දැක්කාම, අපේ පාරවල්වල යන බෙන්ස් කාර් ටික දැක්කාම, අපේ පාරවල්වල යන ප්‍රාඩෝ ටික දැක්කාම, අපට තිබෙන පාරවල් පද්ධතිවල ලස්සන දැක්කාම විදේශිකයන් හිතනවා මේක හොඳ රටක් කියලා. ලංකාවට විරුද්ධව චෝදනා කරන්න ආපු අය යාපනයට ගියාට පස්සේ මොනවාද කියලා යන්නේ? "අපි හිතුවේ නැහැනේ මෙච්චර දියුණු වෙලා කියලා, අපි හිතුවේ නැහැනේ උතුර මෙච්චර සංවර්ධනය වෙලා කියලා, අපි හිතුවේ නැහැනේ නැඟෙනහිර මෙච්චර සංවර්ධනය වෙලා කියලා." එහෙම කියනවා. අන්තිමට ඒ ගොල්ලන්ගේ වාර්තාවේ සඳහන් කරන්නේ කොහොමද? ලංකාව හොඳට සංවර්ධනය වන රටක් කියලා තමයි ඒ අය report එක දීලා යන්නේ. ඒ report එක දීලා ගියාම තමුන්නාන්සේලාගේ ප්‍රාර්ථනා කඩ වෙනවා. මොකද, තමුන්නාන්සේලාට අවශ්‍ය, මේ රටේ භීෂණය තිබෙනවා, මේ රටේ සංවර්ධනය වෙන්නේ නැහැ, ද්‍රවිඩ ජනතාවට උදව් කරන්නේ නැහැ, ඒ කිසි දෙයක් නැහැ කියන්නයි.

හැබැයි එකක් මතක තියා ගන්න ඕනෑ. එක වතාවක් ජනාධිපතිතුමා කැබිනට් රැස්වීම කිලිනොච්චියේ පැවැත්තුවා. ඇයි ඒ කැබිනට් රැස්වීම කිළිනොච්චියේ පැවැත්තුවේ? කැබිනට් රැස්වීම කිලිනොච්චියේ පැවැත්තුවේ අපි එක තැනක ඉන්න මිනිස්සු නොවෙයි, මට කිලිනොච්චියත් එකයි, අරලියගහ මන්දිරයත් එකයි කියලා පෙන්වන්නයි. ඉතින්, මේ වාගේ ආකල්ප තමුන්නාන්සේලාට තිබුණේ නැහැ.

ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාට එතුමාගේ නායකතුමා තැනක් දෙන්නේත් නැහැනේ. පැත්තකට දාලානේ තිබෙන්නේ. කොහොමද තැනක් ගන්නේ? එහෙම නම් මේ පැත්තට එන්න. මේ පැත්තට ඇවිල්ලා, හොඳ ආයෝජකයෙක් හොයා ගෙන හෝටලයක් හදලා ජොලියේ ඉන්න. එහෙමයි කරන්න ඕනෑ. මම තමුන්නාන්සේට යෝජනා කරනවා ඒ විධියට කටයුතු කරන්න කියලා. නැත්නම් තමුන්නාන්සේත් කවදා හරි අනාථභාවයට පත් වෙනවා. අනාථභාවයට පත් වෙලා ආබාධිතයෙක් වුණොත් මගේ අමාත්‍යාංශයේ විෂය පථයට තමයි තමුන්නාන්සේවත් ගන්න වෙන්නේ. [බාධා කිරීමක්] ඔව්. ඔබතුමා ගන්න වෙනවා. හැබැයි මම කැමැති නැහැ ඔබතුමා ගන්න. ඔබතුමා ආබාධිත කරන්න මම කැමැති නැහැ. [බාධා කිරීමක්] ඔව්, කැමැති නැහැ. එහෙම කරන්න හොඳ නැහැනේ. තමුන්නාන්සේට එහෙම කරන්න හොඳ නැහැ.

හැබැයි, ඔය පැත්තේ හිටියොත් දේශපාලන ආබාධිතයකු බවට පත් වෙනවා. ආබාධිත බවට පත් වුණාම මොකද වෙන්නේ? ඇවිද ගන්න බැරි වෙනවා. එතකොට තමුන්නාන්සේට කිහිලිකරුවක් දෙන්න අපට සිද්ධ වෙනවා, රෝද පුටුවක් දෙන්න අපට සිද්ධ වෙනවා, නොයෙකුත් දේවල් දෙන්න අපට සිද්ධ වෙනවා. එම නිසා කරුණාකරලා විවේචනය කරන්න. හැබැයි ඵලදායී විවේචන කරන්න. හැම එකටම විරුද්ධ වෙන්න එපා.

මම තව එක කාරණයක් මතක් කරන්න ඕනෑ. විජය කුමාරණතුංග මහත්මයා මැරිලා දැනට අවුරුදු 25ක් වෙනවා. ඒ කාලයේ ගුවනින් ඇවිල්ලා උතුරේ මිනිසුන්ට පරිප්පු දැම්මා. පළාත් සභා මැතිවරණයේදී එතුමා කිව්වා, මේ ප්‍රශ්නයට විසඳුමක් දෙන්න ඕනෑ, නැත්නම් ඉන්දියාව අපේ රට අල්ලා ගනීවි කියලා. අපි පළාත් සභා ක්‍රමයට පක්ෂ වෙන්න ඕනෑ කියලා එතුමා කිව්වා. ආණ්ඩුවෙන් අපි හිරේට දැම්මා වුණත්, සුබවාදීව හිතලා අපි ඒ වෙලාවේ ආණ්ඩුවට උදව් කෙරුවා. ආණ්ඩුවේ ප්‍රතිපත්තියට අනුකූල වෙලා බලය විමධ්‍යගත කරන්න ඡන්දය ඉල්ලුවා. ඇයි එහෙම ඡන්දය ඉල්ලුවේ? එහෙම ඡන්දය රට වෙනුවෙන් හිතලා. බැසිල් රාජපක්ෂ මහත්මයා තමයි මතක් කළේ, එදා ඡන්දය ඉල්ලන්න ගිහිල්ලා මිනිස්සු 130 දෙනෙක් මැරුණා කියලා. 130 දෙනෙක් මැරිලාත් අපි අපේ ප්‍රතිපත්තිය රැක්කා. විජය කුමාරණතුංග මැතිතුමාට පාර්ලිමේන්තුවට එන්න බැරි වුණා. පළාත් සභාවට යන්න බැරි වුණා. නමුත් එතුමා ප්‍රතිපත්තිය රැකලා තිබෙනවා. තමුන්නාන්සේලාත් ප්‍රතිපත්තිය රකින්න.

ජනාධිපතිතුමා මේ රට බේරා ගත්තා, මේ රටේ ඒකීයභාවය ඇති කරලා දුන්නා, තුන්බිය නැති කෙරුවා. ඒක කවදාවත් අමතක කරන්න එපා. ත්‍රස්තවාදය තිබුණා. ඒ වාගේම එක පැත්තකින් භීෂණය තිබුණා. තමුන්නාන්සේලාගේ කාලයේ වෙච්ච දේවල් ගැන දන්නවානේ. මම ඒවා මතක් කරන්න කැමැති නැහැ. ඒවා නැති කරලා දාලා, අද විවේචනය කිරීමේ අයිතියත් තමුන්නාන්සේලාට දීලා තිබෙනවා. මතකද ඒ කාලයේ මේ පාර්ලිමේන්තුව ඇතුළේ බෝම්බ ගහපු හැටි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු අමාත්‍යතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

එහෙම නම් තවත් මන්ත්‍රීවරයෙකුට අවස්ථාව දෙන්න මගේ කථාව අවසන් කරන්නම්. ප්‍රශ්නයක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා හිටපු නඩුකාරයෙක් නිසා ඒ වචනයට කීකරු වෙන්න ඕනෑ. ඒ විනිශ්චය ලබා දීමා ගැන මම ස්තුතිවන්ත වෙමින්, ඔබතුමාට ගරු කරමින් මගේ කථාව අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා ගරු ඇමතිතුමනි.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

එහෙම නම් තව මොනවා හරි කියන්නම්.

දැන් බලන්න seaplanes ගැන. ඔබතුමන්ලා දැකලා තිබෙනවාද? ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා seaplanes පවා මේ රටට ගෙනැල්ලා තිබෙනවා. ඊළඟට බලන්න, දිවි නැගුම වැඩසටහන දෙස. දිවි නැගුම වැඩසටහනින් මොනවාද නොදෙන්නේ? කුකුළු පැටව් දෙනවා. ඒ සත්තු ඉබේටම හැදෙනවා. බලන්න, මේ conceptsවල තිබෙන වටිනාකම. කුකුළු පැටව් නොවෙයි වටින්නේ. කුකුළු පැටව් පැත්තකට දාන්නකෝ. මේ concept එක දිහා බලන්නකෝ. ඒ පැටව් ඇවිදිනවා, අහුලාගෙන කනවා, නිකම් දෙන ටික කනවා, කාලා ඉවර වෙලා බිත්තරයක් දානවා. අපි ඒ පෝෂණය ලබා ගන්නවා. ඒ කුකුළු පැටවෙක් නිකම් ලබා දෙන්න සිත පහළවීම තමයි ලොකුම ප්‍රතිපත්ති පෝෂණය කියලා අපට කියන්න පුළුවන්.

ඊළඟට මොකද කරන්නේ? පාරවල් ටික හදනවා. අලුත් නිර්මාණ එනවා. සාම්ප්‍රදාය රකින්නේ නැහැ. සාම්ප්‍රදාය රැකලා කවදාවත් දියුණු වෙන්න බැහැ.

සාම්ප්‍රදාය රැකලා, සුද්දෝ මෙහාට ගෙනැල්ලා ඔවුන්ට අපේ නටබුන් විතරක් පෙන්වලා හරි යන්නේ නැහැ නේ. මම ඔබතුමාට කියන්නේ කැසිනෝත් දාන්න කියලායි. ඒ ගැන කවුරු මොනවා කිව්වත් මට කමක් නැහැ. මේ රටට එන අයගෙන් කට්ටියක් වන්දනාවේ එනවා. තව කට්ටියක් විනෝද වෙන්න එනවා. තව කට්ටියක් එනවා වෙනත් නොයෙකුත් දේවල්වලට. කථාවක් මම කියන්නම් කෝ. මේ කථාව අහගන්න කෝ. තායිලන්තයේ අගමැතිතුමා වෙනත් රටකට ගියාම එතුමාගෙන් ඇහුවා, "තමුන්නාන්සේලාගේ බෞද්ධ රටේ මොකද මෙච්චර ගණිකාවෝ ඉන්නේ" කියලා. "හා, හා එහෙම කියන්න එපා" කියලා එතුමා කිව්වා. [බාධා කිරීමක්] තායිලන්තයේ අගමැති. එහෙම කියන්න එපා කිව්වා. "ඒ ගණිකාවෝ නොවෙයි, අපේ nurseලා" කිව්වා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

හොඳයි, ගරු අමාත්‍යතුමා. දැන් අවසන් කරන්න.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

Nurseලා කිව්වේ මොකද දන්නවාද? ඒක අහ ගන්න කෝ. මානසික ආතතියෙන් පෙළෙන අයට, කරදර වෙන අයට, සැනසීමක් ලබා දෙනවා නම් ඒ ගොල්ලෝ ගණිකාවෝ වෙන්න බැහැ, ඒ ගොල්ලෝ nurseලා කියලා අලුත් අර්ථ කථනයක් දුන්නා. මම ඒ පැත්ත කථා කරන්නේ නැහැ. ඒක අපිට ඕනෑ නැහැ. ඒකෙන් තේරෙනවා, මොන තරම් positive thinking එකක් එහේ තියෙනවාද කියලා. අන්න ඒක විතරක් මතක තියා ගන්න. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි, බොහොම ස්තුතියි. මී ළඟට ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

Order, please! කරුණාකර මේ අවස්ථාවේදී ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ජානක බණ්ඩාර මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ශාන්ත බණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, மாண்புமிகு ஜானக பண்டார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சாந்த பண்டார அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. JANAKA BANDARA *left the Chair, and* THE HON. SHANTHA BANDARA *took the Chair.*

[අ.භා. 5.07]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමනි, පොඩ්ඩක් ඉඳලා යන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතික පක්ෂයෙන් මේ සංචාරක ව්‍යාපාරයේ දේපොළවල අයිතිය ගැන කථා කරන හැම මොහොතකම ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා බොහොම සංවේදීව ඒකට පිළිතුරු සැපයුවා. මම බොහොම පරිස්සමින් මේ විවාදය සඳහා කරුණු සොයා බැලුවා. ඇත්තටම ඔබතුමා සඳහන් කරන ආකාරයට, මේ සමාගම සියයට සියයක් රජයට අයිතිය තිබෙන හා පෞද්ගලික වගකීම් සහිත සමාගමක් කියන අදහස තමයි ඉදිරිපත් වුණේ. මම බැලුවා, මේ සමාගමේ නම මොකක්ද කියලා. මේක Sinolanka Hotels and Spa (Pvt.) Limited. මට ප්‍රශ්නයක් තිබුණා, මේ සමාගම සම්පූර්ණයෙන් රජයට අයිති, රජයේ අයිතිවාසිකම් තිබෙන, රජයට ආයතනවලට කොටස් තිබෙන සමාගමක් නම්, මේ නම මොකක්ද කියලා. ඒ නම තමයි "Sinolanka". ගරු ඇමතිතුමනි, මම බැලුවා මේ වචනයේ තේරුම මොකක්ද කියලා. Merriam-Webster Dictionaryයට ගියාම "Sino" කියලා කියන්නේ "චීන" - Chinese - කියන අර්ථයයි. මේ සමාගමේ නමත් Sinolanka -"චීන - ලංකා", "ජපන්- ලංකා", "ඉන්දියා -ලංකා" වාගේ, මේකත් "චීන- ලංකා" මම මේ කථාව නිකම්ම කියනවා නොවෙයි. මම දැන් වෙබ් අඩවියට ගිහිල්ලා Merriam-Webster Dictionary එක බැලුවා. ඒ වාගේම විකිපීඩියා බැලුවා. විකිපීඩියා එකේ තිබෙන්නේත් මේ අර්ථයමයි. මට සියයට සියයක් විශ්වාසයි, මේ "Sino" කියන්නේ "චීන" කියන අදහස බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සියයට සියයක් රජයට අයිති සමාගමකට මේ "Sino" කියන නම දැම්මේ කොහොමද? මේ කියන සීමිත වගකීම් සමාගමේ විස්තර සමාගම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයෙන් බැලුවාම, මේ අධ්‍යක්ෂවරුන්ට නාමික කොටසක් - share එකක්- සහිතව, නාමික අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කරපු සමාගමක් තිබෙනවා. හැබැයි මේ ඇතුළේ තිබෙන ගැඹුරු අර්ථය මොකක්ද? මට බොහොම විශ්වාසයි,-[බාධා කිරීමක්] නැහැ ප්‍රශ්නය තිබෙන්නේ මෙතැනයි.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
ඔබතුමා වැදගත් දෙයක් කියන්නේ නැහැ. ඒ නිසා මම යනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමනි, "Sino" කැල්ල ආවේ කොහොමද කියන එක කියලා යන්න කෝ. "Sino" කියන්නේ "චීන" කියන එක. මේ සමාගම සම්බන්ධවත් චීනයත් එක්ක යට ගිවිසුමක් තිබෙනවාද? රහස් ගිවිසුමක් තිබෙනවාද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ලංකාවේ චීන restaurants දමනවා නේ. ඒවා චීනයේද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඒක නොවෙයි ප්‍රශ්නය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාමර 475ක් තිබෙන මේ රටේ හදවත වැනි ඉතාම වටිනා දේපළක් රාජ්‍ය සමාගමකට දෙනවා කියන අර්ථයෙන් නේ එතුමා මෙච්චර සරලව කථා කරන්නේ. "භය වෙන්න එපා. මේ සමාගම අයිති වෙන්නේ රජයේ ආයතනවලට. මේ අධ්‍යක්ෂවරු රජයේ සේවකයෝ, ඒ නිසා කිසිම ප්‍රශ්නයක් නැහැ" කියනවා.

හැබැයි ඒකට නම දමන කොට "Sinolanka". මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාවත් නොදන්නා, මේ රජයේ සාමාන්‍ය මන්ත්‍රීවරුන් නොදන්නා යට සැඟවුණු මොකක් හරි ගිවිසුමක් තිබෙන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාවත් ගිහිල්ලා ඒ ගැන සොයන්න.

මම අපේ ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාත් එක්ක එක අතකින් එකඟ වන්නේ නැහැ. 'සුද්දෝ' කිව්වාම, එක එක ජාතියේ සුද්දෝ ඉන්නවා නේ. යුරෝපයේ සුද්දෝ ඉන්නවා; ඇමෙරිකාවේ සුද්දෝ ඉන්නවා. චීන්නුත් කහ පාටට හුරු සුද්දෝ නේ. ඒ වාගේම, අප්‍රිකාවේත් සමහර තැන්වල සුද්දෝ ඉන්නවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
කළු සුද්දෝ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
කළු සුද්දෝත් ඉන්නවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
තමුන්නාන්සේ වාගේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
කළු සුද්දෝත් ඉන්නවා. හැබැයි, ප්‍රශ්නය මේකයි.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඇයි, බොරු සුද්දෝ?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඒ වාගේම, බොරු සුද්දෝත් ඉන්නවා, සුද්දන් වාගේ හැසිරෙන්න හදන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Sinolanka Hotels and Spa (Pvt.) Limited එකට මේ තරම් වටිනා - අතිශයින් වටිනා- දේපළක් පැවරෙනවා. නම දමනකොටම "Sino" -චීන- කියන කොටසත් දමනවා. එහි තේරුම තමයි, 'චීන ලංකා හෝටල් සහ ස්පා සමාගම' කියන එක. ඒකයි තේරුම. එහෙම නම් මේ යට ඉන්නවා චීනෙක්. මේ යට ඉන්නවා චීන ආයෝජකයෙක්. මේ යට ඉන්නවා චීන වෙළෙන්දෙක්. මේ යට ඉන්නවා චීන ජාවාරම්කාරයෙක්. ඒ ජාවාරම්කාරයා කල් තියාම කියනවා, "නම දමන කොට දැන්මම දාපන් 'චීන' කෑල්ල, අපි පස්සේ ගහමු ගිවිසුම." කියලා. එහෙම නැත්නම්, මෙලහකටත් ගිවිසුම ගහලා හංගලා. මෙලහකටත් ගිවිසුම ගහලා. මේක තමයි අපේ තිබෙන අවාසනාව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවට මේ වාගේ යෝජනාවක් ඉදිරිපත් කරන්නේ ඇයි? අර කිව්වා වාගේ අතිමහත් බහුතරය තිබෙනවා නම්, කැබිනට් මණ්ඩලය අනුමත කරනවා නම්, ඒ ඔක්කෝම තියෙද්දීත් මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ මේ ගිවිසුම පිළිබඳ, මෙයින් රටට වන යහපත පිළිබඳ සලකා බලන්නයි. හැබැයි එහෙම නම් අපට දැනගන්න අයිතියක් තිබෙනවා, මේ සමාගමේ සැබෑ අයිතිකාරයන් කවුද, මේ ගිවිසුම ඇතුළේ සැඟවුණු ගිවිසුම් තිබෙනවාද කියා. 'චීන ලංකා' කියන කොටස මෙහි නමට දමන්න හේතු වූ සැබෑ අර්ථය කුමක්ද කියලා සැක කරන්න හේතු තිබෙනවා. ඒ සැකය පැහැදිලි කරන්න ඕනෑ. ඒක විහිළු කළාට හරි යන කාරණයක් නොවෙයි. ඒක විහිළු කළ යුතු ප්‍රශ්නයක් නොවෙයි. එහි තිබෙනවා ගැඹුරක්, එහි තිබෙනවා බරපතළකමක්. ඒ නිසා අපට සැක කරන්න හේතු තිබෙනවා. ඒ සැකය වැඩි වන්න තවත් කාරණා තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නොරොච්චෝලේ විදුලි බලාගාරය කියන්නේ දැවැන්ත ව්‍යාපෘතියක්. අපේ රටට අවශ්‍ය කරන විදුලිය බලය පිළිබඳ ප්‍රශ්නයට විසඳුමක් විධියට ගල් අඟුරු බලාගාරයක් අවශ්‍යයි කියන පදනම මත විශාල ආයෝජනයක් කළා. ඒ වෙලාවේ ඒ සඳහා අධික පොලී මුදලකට චීනයෙන් ණය ගත්තා. ඒ වෙලාවේ කිව්වා, මෙහි අවශ්‍යතාව හුඟක් බරපතළයි, මේ බරපතළ අවශ්‍යතාව සලකන කොට අපි වැඩි මිලට හරි ණයක් ගැනීම මේ අවස්ථාවේ හැටියට අනිවාර්යයෙන් ගැළපෙනවා කියලා.

ඊට පස්සේ, මේ බලාගාරය සඳහා යොදාගත්තු තාක්ෂණය යල් පැන ගිය තාක්ෂණයක්, මීට වඩා හොඳ තාක්ෂණයක් අපට ජපානයෙන්, යුරෝපයෙන් ලබාගන්න පුළුවන්කම තිබුණා කියන කොට කිව්වා, "නැහැ, අපට චීන ණය ලැබුණු නිසා කොන්දේසියක් විධියට චීන තාක්ෂණය ගන්න අපට සිදු වුණා." කියලා. දැන් නොරොච්චෝලේ බලාගාරය කැඩි කැඩී දුවනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කැඩි කැඩී දුවන, යල් පැන ගිය තාක්ෂණයෙන් යුක්ත චීන බලාගාරය වෙනුවෙන් අපි දැන් ණය ගෙවන්න ඕනෑ. අපට පසු ගිය සතියේ ලැබුණු ආරංචිය මොකක්ද? චීන සමාගම කියනවා, ලංකාවේ ආණ්ඩුවට ණය ගෙවාගන්න අමාරු බව අපට තේරෙනවා, ඒ නිසා ණයට හිලව්වට මේ බලාගාරය අපට පවරා දෙන්න, අපි ලංකාවේ ආණ්ඩුවට මුදලට විදුලිය සපයන්නම් කියලා. අපේ රටේ වටිනාම ජාතික ව්‍යාපෘතියක් විධියට පටන්ගත්තු නොරොච්චෝලේ විදුලි බලාගාරය ණයට හිලව්වට තමන්ට දෙන්න කියලා චීනය කියනවා. මේක තමයි මෙතැන තිබෙන ප්‍රධානම ප්‍රශ්නය. ඒ විතරක් නොවෙයි. අපි දන්නවා නොරොච්චෝලේ විදුලි බලාගාරය හා සම්බන්ධ දෙවන සහ තුන්වන අදියරයන් තිබෙන බව. අප දන්නා තරමින් නොරොච්චෝලේ බලාගාරයේ දෙවන සහ තුන්වන අදියරවල වටිනාකම ඩොලර් මිලියන 950ක් විතර වෙනවා. ඩොලර් මිලියන 950ක් විතර වූ, නොරොච්චෝලේ බලාගාරයේ දෙවන සහ තුන්වන අදියරයන් ලංකාවේ ආණ්ඩුව - ලංකා විදුලිබල මණ්ඩලය- ක්‍රියාත්මක කළ යුතුයි කියන ස්ථාවරයේ චම්පික රණවක ඇමතිවරයා සිටියා. ඔහු තදින් ඒ ස්ථාවරයේ සිටියා. මෙය කිසිදු බාහිර සමාගමකට හෝ රටකට නොපැවරිය යුතුයි, මේක දැවැන්ත ව්‍යාපෘතියක් කියන ස්ථාවරයේ එතුමා සිටියා.

හැබැයි, අන්තිමට මේ දෙවැනි සහ තුන්වැනි අදියර චීන සමාගමකට පවරන්න අවශ්‍ය කටයුතු යොදන විට ඒකට එරෙහි වුණු නිසා, ඒකට අත්සන් කිරීම, ඒකට එකඟ වීම ප්‍රතික්ෂේප කරපු නිසා චම්පික රණවක ඇමතිවරයාට තමන්ගේ ධුරය අහිමි වුණා. ඒක තමයි ඇත්ත. දෙවැනි, තුන්වැනි අදියර විතරක් නොවෙයි, පළමුවැනි අදියරය බලාගාරයත් එක්කම දැන් චීනය ගන්න යනවා. මොකද, චීනයට දෙවැනි, තුන්වැනි අදියර කියන අනෙකුත් ඒ හා සම්බන්ධ ජාල ගොඩනැඟීම සහ අනෙකුත් කාරණාත් එක්ක ඒවා දෙනවා නම්, බලාගාරයත් එක්ක දුන්නාම හොඳයි. ඒක තමයි යථාර්ථය. චම්පික රණවක ඇමතිවරයාගේ ජාති වාදී දේශපාලනයත් එක්ක අපි එකඟ වන්නේ නැහැ. නමුත් මේ කාරණය සම්බන්ධයෙන් එතුමා ඉංජිනේරුවෙක් විධියට, විෂය පිළිබඳ දන්නා කෙනෙක් විධියට, එතුමා මේ රට වෙනුවෙන් හිතලා නොරොච්චෝලේ දෙවැනි, තුන්වැනි අදියර චීනුන්ට පවරන්නට එපා කියන ස්ථාවරය දරපු නිසා විදුලිබල හා බලශක්ති ඇමතිකම එතුමාට අහිමි වුණා. එම විෂය ගැන නොදන්නා කෙනෙක් එම ඇමති ධුරයට පත් වුණා. ඒක තමයි අපේ කරුමය. ඇයි මෙහෙම වෙන්නේ? මෙහෙම වෙන්න එක හේතුවයි තිබෙන්නේ. සියයට 10, සියයට 15 කොමිස් මුදල අදාළ බලධාරීන්ට යනවා. කවුද ඒ කියන කාරණය ගැන මා අමුතුවෙන් කියන්නට අවශ්‍යතාවක් නැහැ. ඔය කොමිස් මුදලට යට වෙලා, චීනුන්ගෙන් වැඩි පොලියට ණයට අරගෙන දැන් බලාගාරය චීනුන්ට පවරන්නට සිදු වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, දෙවැනි, තුන්වැනි අදියරත් චීනුන්ට දෙන්නට සිදු වෙලා තිබෙනවා, අද මේ කියන ගනුදෙනු නිසා. ඒ නිසා මේ රටේ වටිනාම තැන තිබෙන මේ හෝටල් ව්‍යාපෘතිය, රටේ වටිනාම භූමිය "Sinolanka Hotels and Spa (Pvt.) Limited" කියන සමාගමට පවරන තැනට අද කටයුතු සිදු වෙලා තිබෙනවා. මේක අපේ රටේ අවාසනාව නොවෙයිද? ඒ නිසා මේ කාරණා පිළිබඳව සොයා බැලීම අවශ්‍යයි.

ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා සඳහන් කළා, මේ රජයේ තක්සේරුකරුගේ තක්සේරුව කියලා. අපි දන්නවා, රජයේ තක්සේරුකරු මේ වාගේ සංවේදී වටිනා දේපොළ තක්සේරු කිරීම පිළිබඳව මොන විධියේ කීර්තියක්ද ඔහුට තිබෙන්නේ කියලා. දේශපාලනික බලපෑම් මත අදාළ ගැනුම්කරුගේ වුවමනාවන් ඉෂ්ට කර ගැනීමේ පටු අරමුණින්, ඒ වාගේම එතැන සිටින අතරමැදියාගේ අවශ්‍යතාව උදෙසා, රජයේ බලධාරීන්ගේ අවශ්‍යතාව උදෙසා අවම මිලට රජයේ තක්සේරුකරු විසින් මේ දේපොළ තක්සේරු කරපු අවස්ථා රාශියක් තිබෙනවා. මෙම සෙලස්ටියල් ගොඩනැඟිල්ල - කලින් සෙලින්කෝ සමූහ ව්‍යාපාරයට අයිති වෙලා තිබුණු ගොඩනැඟිල්ල - මුලින් තක්සේරු කරපු අවස්ථාවේ ඉඳලා රජයේ තක්සේරුකරුගේ තක්සේරුව අවස්ථා ගණනාවකදී අභියෝගයට ලක්වෙලා තිබෙනවා. ඒ වාගේම අවම මිලට තක්සේරු කිරීම උදෙසා බලපෑම් ඇති වුණු බව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ සිටින ස්වාධීන නිලධාරින් කම්පාවෙන් යුතුව ප්‍රකාශ කරනවා. අවස්ථා ගණනාවකදී එසේ සිදු වෙලා තිබෙනවා. මේක මේ පළමුවැනි වතාවට මෙම විවාදයේ දී කියන කාරණයක් නොවෙයි.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

අනෙක් කාරණය මෙයයි. දැන් මෙතැන හයට් හෝටලය හදන එක ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. එය ලෝකයේ තිබෙන වැදගත් හෝටල් සමාගමක්. ලෝකයේ තිබෙන පළමුවැනි පන්තියේ හෝටල් සමාගමක්. එම සමාගමට අවුරුදු 20ක කළමනාකරණ ගිවිසුමක් ඇතුළත් කරගෙන තිබෙනවා. හයට් හෝටල් සමාගම මෙම Sinolanka Hotels and Spa (Pvt.) Limited එක්ක ඇති කරගෙන තිබෙන කළමනාකරණ ගිවිසුම එක්ක මේ ලාභය කාටද යන්නේ කියන කාරණය හෙළිදරව් විය යුතුයි. ඒ අදාළ ගිවිසුම සභාගත කළ යුතුව තිබෙනවා. ඒ වාගේම අනාගතයේ දී මෙම Sinolanka Hotels and Spa (Pvt.) Limited කියන සමාගම අනාගතයේ දී තවත් චීන ආයෝජකයන් සමඟ ගිවිසුමක් තිබෙනවාද, නැද්ද කියන කාරණය, ඒ පිළිබඳව මේ වනකොටත් ගිවිසුමක් තිබෙනවාද, නැද්ද කියන කාරණය සම්බන්ධයෙන් මේ අවස්ථාවේ දී පිළිතුරක් ලබා දිය යුතුයි කියලා මා ඉල්ලා සිටිනවා. මා අභියෝග කරනවා, ඒ කාරණය හෙළිදරව් කරන්නය කියලා.

විමල් වීරවංශ ඇමතිතුමා මේ දවස්වල බොහොම විප්ලවකාරී චරිතයකට පණ දීලා තිබෙනවා. එතුමා කියනවා, ආණ්ඩුව ඇතුළේම ආර්ථික ඝාතකයෙක් සිටිනවා ලු. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය පී.බී. ජයසුන්දර තමයි ආර්ථික ඝාතකයා. ඒක එතුමා ඉතාම තදින් කියනවා. ඒ වාගේම අපි දන්නවා, සාමාන්‍යයෙන් පාර්ලිමේන්තු සම්ප්‍රදාය තුළ අමාත්‍යවරුන් වෙත සාමූහික වගකීම් පැවරී තිබෙන බව. ඒ අමාත්‍යවරුන්ගේ සාමූහික වගකීම් පිළිබඳ මූලධර්ම අනුව අමාත්‍ය මණ්ඩලය ඇතුළේ කථා කරන දේවල් එළියට දෙන්නේ නැහැ. සියලු ඇමතිවරුන් එක හඬින් කථා කළ යුතුයි. එක ස්ථාවරයක සිටිය යුතුයි. ඇතුළේ ප්‍රශ්න ඇතුළේ විසඳා ගත යුතුයි. ඇතුළේ ගිනි පිටතට නොදිය යුතුයි. හැබැයි විමල් වීරවංශ ඇමතිතුමා කියනවා, ආර්ථික ඝාතකයා ආචාර්ය පී.බී. ජයසුන්දර කියලා. දැන් මේ ආර්ථික ඝාතකයාව අමාත්‍යාංශයේ ලේකම් තනතුරට පත් කර ගත්තේ කවුද?

මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා. මේ ආර්ථික ඝාතකයා තවදුරටත් ධුරයේ තියා ගෙන ඉන්නේ කවුද? මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා. මේ ගැන කථා කරන කොට මේ තිබෙන පරස්පරය, මේ ඔක්කොම අවුල සිද්ධ වන්නේ, මේ රට ආර්ථික වශයෙන් ආපසු යන්නේ, රටේ එදිනෙදා පැවැත්මට අවශ්‍ය කරන මුදල් පවා සොයා ගන්න බැරි තත්ත්වකට පත් වෙලා තිබෙන්නේ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුවෙන් සහනදායී ණය මුදල් ලබා ගැනීමට නොහැකි තත්ත්වයකට පත් වෙලා තිබෙන්නේ රජයේ ප්‍රශ්නයක් නිසා නොවෙයි, රජයේ ප්‍රතිපත්තිවල අවුලක් නිසා නොවෙයි, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ගැන ප්‍රශ්නයක් නොවෙයි, මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රශ්නයක් නොවෙයි මේක පී.බී. ජයසුන්දර කියන මිනිහාගේ; ඒ ආර්ථික ඝාතකයාගේ ප්‍රශ්නයක් කියලා කියන්නයි මේ ලැහැස්ති වන්නේ. වගකීම කාගෙද? වගකීම මේ රජයේ; රජයේ ප්‍රතිපත්තියේ; ජනාධිපතිතුමාගේ. ජයග්‍රහණවල ගෞරවය ජනාධිපතිතුමාට අත් වෙන්න ඕනෑ වාගේම පරාජයන්හි අගෞරවයත් එතුමා ගත යුතුයි. දැන් මේ සිද්ධ වන්නේ නාටකයන් රඟ දැක්වීමයි. විමල් වීරවංශ මහත්මයා ජනාධිපතිතුමාගේ වචනයට පිටින් වැඩ කරන කෙනෙක් නොවෙයි. විමල් වීරවංශ මහත්මයා වෙනත් පක්ෂයක නායකයෙක් වුණාට එතුමා ජනාධිපතිතුමාගේ සුවච කීකරු ගෝලයා. එතුමා මේ කරන්න යන්නේ "අනේ අපේ ජනාධිපතිතුමා නොවෙයි, මේ නරක වැඩ ඔක්කොම කරන්නේ අමාත්‍යාංශයේ ලේකම්" කියලා මේ පව පවරන්නයි. ඒක තමයි මේ කරන රඟපෑම.

මේ රටේ ආයෝජනයන් පිළිබඳව ලොකු ප්‍රශ්න ගණනාවක් මතු වෙමින් තිබෙනවා. යුද්ධයෙන් පස්සේ මේ රටේ ආර්ථික සංවර්ධනයට දායක වන වැදගත් ආයෝජකයෝ ලංකාවට පැමිණීම පිළිබඳව විශාල බලාපොරොත්තුවක් තිබුණා. අපේ රටේ ස්වභාව සෞන්දර්යය, අපේ රටේ පිහිටීම, අපේ රටේ දේශගුණය, අපේ තිබෙන ශ්‍රේෂ්ඨ සංස්කෘතික උරුමය නිසා අපේ රටේ විවිධ ක්ෂේත්‍රවල ඉක්මන් සංවර්ධනයක් අපේක්ෂා කළා.

නමුත් අද පෙනෙන දේ තමයි ලෝකයේ සිටින මහා පරිමාණ ආයෝජකයෝ ලංකාව තුළ සෘජු ආයෝජන කරන්නේ නැති තත්ත්වය. අද එන ආයෝජකයෝත් ලංකාවේම බැංකුවලින් ණය අර ගෙන ආයෝජනය කරනවා. අපිට දෙයක් අලුතින් එකතු වන්නේ නැහැ. එහෙම නැත්නම් සුළු මුදලක් පමණක් ආයෝජනය කරනවා. දැන් මේ හයට් ආයතනය කියන ආකරයට ඔවුන් මේ ව්‍යාපෘතිය සඳහා ආයෝජනය කරන්නේ ඩොලර් මිලියන 40ක් විතරයි. ඔවුන්ගේ වෙබ් අඩවියට අනුව, ඔවුන්ගේ ගිවිසුම අනුව හයට් හෝටල් සමාගම මේ ව්‍යාපෘතියට ආයෝජනය කරන්නේ ඩොලර් මිලියන 40යි. ජාත්‍යන්තර වෙළෙඳාම අනුව අද ඩොලර් මිලියන 40ක් කියන්නේ සොච්චමක්. එතකොට මේ හයට් සමාගම ලංකාවේ විශාල ආයෝජනයක් කළාය කියලා අපට කියන්න බැහැ. මොකද, හයට් සමාගම මේ දේපොළ සංවර්ධනය කළා නම්, ඔවුන් සෘජු ආයෝජනයක් කළා නම් ඒක හරි. අනෙක් අතට ආණ්ඩුවේ තර්කය පිළිගත්තත් අද මේ ආයෝජනය කරන්න රටේම සමාගම්වලට දීලා තිබෙන්නේ ඇයි? ප්‍රමාණවත් තරම් විදේශ ආයෝජකයෝ එන්නේ නැති නිසා. ඒ දැවැන්ත ආයෝජන කරන්න පුළුවන් ආයෝජකයෝ එන්නේ නැහැ. ඒක තමයි ප්‍රශ්නය.

එහෙම වෙලා තිබෙන්නේ ඇයි? එහෙම වෙලා තිබෙන්නේ ලංකාවේ තිබෙන නීතිය හා සාමය පිළිබඳ ප්‍රශ්නය, ලංකාවේ තිබෙන මානව අයිතිවාසිකම් පිළිබඳ ගැටලුව, ලංකාවේ ආණ්ඩුවේ ඉහළ නිලධාරින්, ආණ්ඩුවේ ඉහළ බලධාරින්ගේ තිබෙන බරපතළ දූෂණ, ඒ වාගේම ලංකාව තුළ සාධාරණව ව්‍යාපාරයක් කර ගෙන යන්න අවශ්‍ය කරන ආර්ථික වාතාවරණය සහ නීතිමය වටපිටාව නොමැතිකම. මේවා තමයි අද තිබෙන ප්‍රශ්න. ඒ නිසා විශාල ආයෝජනයන් අර ගෙන, සෘජු ආයෝජනයන් කරන ආයෝජකයන් ලංකාවට එන්නේ නැති ප්‍රශ්නයක් තිබෙනවා. එන්නේ ජාවාරම්කාරයෝ. චීනය රටක් විධියටත්, චීන සමාගම් ඔවුන්ගේ ව්‍යාපාරික ප්‍රතිපත්තිය විධියටත් අද ලෝකයේ කටයුතු කරන්නේ ආක්‍රමණිකයන්ගේම තත්ත්වයෙන්; සීලාචාර වෙළෙඳ ප්‍රතිපත්තිවලින් එහාට ගිහිල්ලා. චීන ආයෝකයන් හැම වෙලාවේම විරුද්ධ පාර්ශ්වය තාප්පයට හේත්තු කරලා තමයි ඒ අදාළ ගිවිසුම් ඇති කර ගන්නේ. තමන්ට අවශ්‍ය කොන්දේසිවලට අසාධාරණ විධියට පොළඹවනවා. ඔවුන්ගේ තිබෙන ප්‍රාග්ධන ශක්තිය පෙන්වනවා. ඒ නිසා අපි චීනයෙන් ණයක් ගත්තොත් අපට ඒ ණය ගන්න වෙන්නේ අධික පොලියටයි. හම්බන්තොට වරාය සඳහා අපි ණය ගත්තේ ඉතා අධික පොලියට. ඒ වාගේම චීනයෙන් ගත් හැම ණයක් සඳහාම වාගේ වූ පොලිය ජාත්‍යන්තරව ලබා ගත හැකි සාමාන්‍ය පොලී අනුපාතයට වඩා ඉහළයි. සාපේක්ෂව ඔවුන්ගෙන් පහසුවෙන් ණය ගන්න පුළුවන්. මොකද, අපේ රටේ ආර්ථික තත්ත්වයේ තිබෙන ගැටලු නිසා අපට සාමාන්‍ය ක්‍රමයට අඩු පොලියට ණය දෙන හොඳ බැංකුවලින් ණය ගන්න බැරි තත්ත්වයක් තිබෙනවා.

ඒක IMF වෙන්න පුළුවන්; World Bank වෙන්න පුළුවන් ඔවුන් අපට කරන උදව්වල සීමාවන් තිබෙනවා. ඒ නිසා අද අපි අධික පොලියට ණය ගන්නවා වාගේම අසාධාරණ කොන්දේසි යටතේ චීන සමාගම් සමඟ ගිවිසුම්වලට ඇතුල් වීමට බල කරන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම ලංකාවේ ඉන්න දූෂිත පාලකයන් තමන්ට ලැබෙන කොමිස් මුදල වෙනුවෙන් -එය සියයට 10ක්, සියයට 15ක් නැත්නම් සියයට 20ක් වෙන්නත් පුළුවන්. ඒක ඒ වැඩේ හැටියටයි.- අපේ රටේ අනාගතය පාවා දෙනවා. ඒ නිසා මේ රටේ වටිනා භූමිය, වටිනා සම්පත් පිළිබඳව ගිවිසුම්වලට එළඹෙනකොට අපි කල්පනාකාරී විය යුතුයි. මම ඒ ගැන වැඩිදුර කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

නමුත් මේ සමාගම "Sino Lanka" වුණේ කොහොමද කියන එක ගැන මට පැහැදිලි පිළිතුරක් අවශ්‍යයි. [බාධා කිරීමක්] අස්වර් මන්ත්‍රීතුමනි, චීනයත් එක්ක නොවෙයි අපට ප්‍රශ්නය තිබෙන්නේ. චීන ප්‍රතිපත්තිය ගැනයි. වෙළෙඳාම් කරන හැටි ගැනයි. චීනයත් එක්ක නොවෙයි අපට ප්‍රශ්නය තිබෙන්නේ. චීන ආණ්ඩුව මොකක්ද කරන දේශපාලනය? චීන සමාගම් කරන දේශපාලනය කුමක්ද? චීන සමාගම් කරන ව්‍යාපාරවල තිබෙන වෙළෙඳ ප්‍රතිපත්තිය කුමක්ද? ඒ විතරක් නොවෙයි අපේ රටේ -

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

චීනයෙන් තමයි අපේ රටට හාල් ගෙනාවේ. චීන හාල් කාලා- [බාධා කිරීමක්]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

චීන හාල් කාපු පුරුද්දට වෙන්න ඇති එතුමා එහෙම කියන්නේ. ඒ කාලයේ චීන හාල් කාපු එකේ ණය ගෙවන්න වෙන්න ඇති දැන් අපේ රටේ වටිනා සම්පත් චීනුන්ට දෙන්නේ. එංගලන්තයේ සුද්දාට ලංකාව පාවා දුන්නත් එකයි; ඇමෙරිකන් සුද්දාට ලංකාව පාවා දුන්නත් එකයි; චීනයට ලංකාව පාවා දුන්නත් එකයි කියන කාරණය මතක් කරමින් අපේ රටේ වටිනා දේපළ පිළිබඳව බුද්ධිමත්ව තීරණ නොගත්තොත්, රට ගැන හිතා තීරණ නොගත්තොත් යුද්ධයෙන් ජය අරගෙන මේ රටේ ජනතාව බලාපොරොත්තු වෙච්ච සංවර්ධනය වෙනුවට, දියුණුව වෙනුවට විනාශය කරා යනවාය කියන කාරණය මතක් කරන්න කැමැතියි . ඒ වාගේම අවසාන වශයෙන් තව එකම එක කාරණයක් කියන්න ඕනෑ. ඒක නීතිය හා සාමය පිළිබඳව ඉතා වැදගත් වන කාරණයක්.

මොනරාගල සහ බදුල්ල ප්‍රදේශය භාර නියෝජ්‍ය පොලිස්පතිතුමා හැටියට සිටියේ එම්.ආර් ලතීෆ් මැතිතුමායි. එතුමා ඒ ප්‍රදේශයේ අපරාධකරුවන්ට විරුද්ධවත්, ඒ වාගේම දේශපාලනය හා සම්බන්ධකම් තිබෙන අපරාධකරුවන්ට විරුද්ධවත්, අපරාධ කරන දේශපාලනඥයින්ට විරුද්ධවත් තදින් හිටියා. එහි ප්‍රාදේශීය දේශපාලනඥයෙක් ඒ ප්‍රදේශයේ පොලිස් නිලධාරියෙකුට පහර දුන් අවස්ථාවේදී ඒ අපරාධකරු ආයුධත් සමඟම අත්අඩංගුවට අරගෙන ඔහු රිමාන්ඩ් භාරයට පත් කරන්න කටයුතු කළා. ඒ අවස්ථාවේදී පොලිස් සේවයේ ගෞරවය වෙනුවෙන්, ඒ ප්‍රදේශයේ ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන්, කටයුතු කරපු අවංක නිලධාරියෙක් වුණු ඒ නිලධාරියා මාරු කරන්නය කියා පොලිස්පතිතුමාට බලපෑම් ආවා. පොලිස්පතිතුමා කෙළින් ඉඳලා, ඒ නිලධාරියා වරදක් කරලා නැහැ, ඒ නිසා නියෝජ්‍ය පොලිස්පති එම්.ආර් ලතීෆ් මැතිතුමා මාරු කරන්න බැහැ කියන ස්ථාවරයේ තදින් හිටියා. පොලිස්පතිතුමා, එතුමා එහෙම මාරු කරන්න බැහැ කියනකොට ඒ සම්බන්ධයෙන් අපූරු ක්‍රමයක් අනුගමනය කර තිබෙනවා. කලින් ලතීෆ් මැතිතුමාට බදුල්ල සහ මොනරාගල කියන ප්‍රදේශ දෙකම භාරව තිබුණා. එතුමා නියෝජ්‍ය පොලිස්පතිකමේම තියලා එතුමාට බදුල්ල ප්‍රදේශය පමණක් ඉතුරු කරලා, එතුමාගේ බල ප්‍රදේශය වෙනස් කරලා, මොනරාගල ප්‍රදේශය එතුමාගේ බලයෙන් අයින් කරනවා. එතකොට ඒක මාරු වීමක් නොවෙයි. එතුමා නියෝජ්‍ය පොලිස්පතිකමේම ඉන්නවා. බදුල්ල ප්‍රදේශය එතුමාගේ භාරයේ තිබෙනවා.

හැබැයි මේ ප්‍රශ්නය මතු වෙච්ච මොනරාගල ප්‍රදේශය එතුමාගේ භාරයෙන් ඉවත් කරනවා. ඒක මාරු කිරීමක් හා සමානයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි කටයුතු නිසා අවංක පොලිස් නිලධාරින්ගේ ධෛර්යය හීන වෙනවා. අවංක පොලිස් නිලධාරින් තමයි මේ රටේ බහුතරයක්ම ඉන්නේ. සුළු පිරිසක් විතරයි වැරදි කරන්නේ. ඒ නිසා අවංක, දක්ෂ පොලිස් නිලධාරින්ට අසාධාරණ අන්දමින් ඒ විධියට සලකන්න එපා; මේ රටේ ඉන්න සියලු පොලිස් නිලධාරින්ගේ ආත්ම ගෞරවය ආරක්ෂා කරන්න; නීතිය හා සාමය වර්ධනය වුණොත් අපට මේ රටට ආයෝජකයන් වැඩිපුර ගෙන්වා ගන්න පුළුවන්ය කියන කාරණය මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

The next speaker is the Hon. Faiszer Musthapha - [*Pause*]. Not here. මී ළඟට පිළිතුරු කථාව ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා.

[අ.භා. 5.30]

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා (ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன - முதலீட்டு ஊக்குவிப்பு அமைச்சர்)
(The Hon. Lakshman Yapa Abeywardena - Minister of INVESTMENT PROMOTION)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වැනි වගන්තියේ (4) වැනි උප වගන්තිය යටතේ මේ පාර්ලිමේන්තුවට කරන ලද නියමයන් පරිදි ආයෝජනය සඳහා වූ යෝජනාවක් පිළිබඳව ගිවිසුම් ප්‍රකාරව අනුගමනය කරන ක්‍රියා මාර්ගය පිළිබඳව මේ පාර්ලිමේන්තුවට කරුණු ඉදිරිපත් කරන අවස්ථාවයි.

1978 ආයෝජන මණ්ඩල පනත මේ රටේ ක්‍රියාත්මක වුණාට පසුව කිසිම දවසක ආයෝජනයක් කරපු ආකාරය සහ බදු සහන පිළිබඳව මේ පාර්ලිමේන්තුවට වග කිව්වේ නැහැ. මේ ආයෝජන සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුවට වග කියන ආකාරයට 2008 දී මහින්ද රාජපක්ෂ ආණ්ඩුව යටතේ මේ පනත සංශෝධනය කළා. ඒ අනුව අපි බැඳිලා සිටියා පාර්ලිමේන්තුවට මේ කරුණු ඉදිරිපත් කරනවා කියලා. අද ඉදිරිපත් කළ සිනෝ ලංකා සමාගම සම්බන්ධ ආයෝජනය පිළිබඳව මේ ආණ්ඩුවට කිසිම ගැටලුවක් නැහැ. ඒක ඉතාම විනිවිදභාවයෙන්, රජයේ ආයතන සම්බන්ධ වෙලා කරන ආයෝජනයක්. ඒ ආයෝජනයේ ස්වභාවය සහ බදු සහන පිළිබඳව මේ පාර්ලිමේන්තුවට දැනුම් දෙන්න අපට ආත්ම ශක්තියක් සහ ආත්ම විශ්වාසයක් තිබෙනවා.

මේ නියමය පිළිබඳව කථා කළ විපක්ෂයේ මුල් මන්ත්‍රීවරයාගේ ඉඳලා අවසානයට කථා කළ ගරු අජිත් පෙරේරා මන්ත්‍රීතුමා දක්වා මේක මහා භයානක කාරණා කිහිපයක් එළි දැක්වූ පනතක් හැටියට හැඳින්වූවා; මේක සමාගම් සමඟ එකතු වී රජයේ දේපළ නාස්ති කිරීමක් හැටියට දැක්වූවා; ඒ වාගේම අනාගතයේදී චීන සමාගමක් සමඟ යටි ව්‍යාපාරයක් ඇති වෙනවා කියලා ජේන බැලීමක් කළා. සිනෝ ලංකා කියන්නේ මොකක්ද කියලා ගරු අජිත් පෙරේරා මන්ත්‍රීතුමා මගෙන් පිළිතුරු ඉල්ලුවා. මම එතුමාට කියනවා, එතුමාට චීන බියක් ඇති වුණාට මේ ආණ්ඩුවටවත්, මේ රටේ මිනිසුන්ටවත් චීන බියක් නැහැ කියලා. මේ රටට ආධාර දුන්නු, මේ රටට උදවු කළ ආසියානු රටක් පිළිබඳව මේ රටේ මිනිසුන්ට ප්‍රශ්නයක් ඇත්තේ නැහැ. ගරු මන්ත්‍රීතුමනි, සිනෝ ලංකා කියලා මේ සමාගමට නම තැබුවේ අරිසෙන් අහුබුදු මහත්මයාගේ දියණියයි. සිනෝ ලංකා කියන්නේ "මහා ඉදි කිරීම් ඇති භූමිය" කියන එකයි. මේක ලිට්රෝ ගෑස් සමාගම, රක්ෂණ සංස්ථාව, EPF එක සම්බන්ධ කර ගෙන හදපු, අපේ රටේ මහ ජනතාවගේ කොටස්වලින් සමන්විත වූ සමාගමක්. ආයෝජන මණ්ඩල පනත අනුව මෙවැනි සමාගමක් ස්ථාපිත කරන විට, අලුත් සමාගමක් පිහිටුවන විට එම සමාගම ලියා පදිංචි

[ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා]

වීමේ නීති රීති තිබෙනවා. ඒ අයගේ උපදෙස් අර ගෙන, මහා භාණ්ඩාගාරයේ උපදෙස් සහ අනුමැතිය අරගෙන තමයි මේ සමාගම පිහිටුවූයේ. නොයෙකුත් ආගම් අදහන අය ජීවත් වන මේ රටේ යම් දෙයක් කරන විට යම් යම් නිර්ණායකයන් තිබෙනවා. ඒක නැකතක් වෙන්න පුළුවන්; ඒක නාමයක් වෙන්න පුළුවන්; ඒක වෙලාවක් වෙන්න පුළුවන්. ඒ අනුව මේ සමාගම "මහා ඉදි කිරීම් ඇති භූමිය" යන තේරුම ඇතිව සිනෝ ලංකා නමින් ලියා පදිංචි වුණා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මොන භාෂාවෙන්ද? "Sino" කියන්නේ මොන භාෂාවෙන්ද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඔබතුමාට "සිනෝ" හරි, "සයිනෝ" හරි ඕනෑම දෙයක් හිතා ගන්න පුළුවන්.මොකද, ඔබතුමාට "psychosis" තිබෙන්න පුළුවන්. ඒක ඔබතුමාට ඕනෑ විධියට හිතන්න පුළුවන්. ඔබතුමා චීන බියක් ඇති කර ගෙන නේ. ඔබතුමන්ලා හම්බන්තොට වරාය හදන විටත් චීන බියක් ඇති කළා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගල් තිබෙනවා කිව්වා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඔව්, ගල් තිබෙනවා කිව්වා. ඒකේ ගල් කඩන්න බැහැ කිව්වා. නැව් නවත්වන්න පුළුවන්ද ඇහුවා. ඔබතුමන්ලා මත්තල ගුවන් තොටුපොළ හදන විටත් එක එක දේවල් කිව්වා. ඔබතුමන්ලා අධිවේගී මාර්ගය හදන විටත් එක එක දේවල් කිව්වා. ගරු හර්ෂ මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවේදී මගෙන් ප්‍රශ්නයක් ඇහුවා. මොකක්ද? ෂැන්ග්‍රි-ලා සමාගමත් සමඟ ගිවිසුම් අත්සන් කරලා වැඩ කටයුතු පටන් ගන්න මාස 6ක් පරක්කු වන විට මගෙන් ඇහුවා, ඕක කවදාවත් කෙරෙන්නේ නැහැ, ෂැන්ග්‍රි-ලා එකට එක උදැල්ලක් ගහන්න පුළුවන් වුණාද කියලා. අද ෂැන්ග්‍රි-ලා උදලු නොවෙයි piles බස්සන්න පටන් අරන් තිබෙනවා. ෂැන්ග්‍රි-ලා එක ඉදි කිරීම් පටන් අරන් තිබෙනවා. මේ බියක් තිබෙන්නේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
"Sino" කියන්නේ මොන භාෂාවෙන්ද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
තමුන්නාන්සේ භාෂාව අර්ථ කථනය කර ගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අනුනව අවුරුදු බද්ද ගැන කථා කළා. මේකේ මුල ඇති වුණේ කොහොමද? සෙලින්කෝ සමාගම කාගේද? නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩම සෙලින්කෝ හෝම්ස් ඉන්ටර්නැෂනල් පෞද්ගලික සමාගමක් ලෙස 2003 දී ලලිත් කොතලාවල මහත්මයාට දුන්නේ කවුද? රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති වශයෙන් සිටි කාලයේ 2003 ජූනි මාසයේ 05වන දා රුපියල් මිලියන 266කට අනුනව අවුරුදු බද්දකට ලලිත් කොතලාවල මැතිතුමාට මේ ඉඩම දුන්නා. දැන් සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා මේ ආණ්ඩුවෙන් අහනවා; බැසිල් රාජපක්ෂ ඇමතිතුමාගෙන් අහනවා, "බලන්න, විනාශකාරී විධියට අනුනව අවුරුදු බද්දකටයි දෙන්නේ. මේවා කොපමණ කාලයකට ආපසු ගන්නද" කියලා. එතකොට 2003 දී දුන්නේ කොහොමද? 2003 දී දුන්නේ කාටද? එදා 2003 දී සෙලින්කෝ සමාගමට අනුනව අවුරුදු බද්දකටයි දුන්නේ. ඊට පස්සේ සෙලින්කෝ ලෙෂර් ප්‍රොපටීස් පෞද්ගලික සමාගම මෙහි හෝටල් සංකීර්ණයක් ඉදි කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කළා. එයට සම්පූර්ණ බදු සහන දෙන්න එදා ආණ්ඩුව තීන්දු කළා. ඊට පස්සේ 2006 ජනවාරි මාසයේ ඉදි කිරීම් කටයුතු ආරම්භ වුණා. 2008 දී සෙලින්කෝ සමූහ ව්‍යාපාරයේ විශාල ආර්ථික අර්බුදයක් ඇති වුණා. ඒ බව තමුන්නාන්සේලා දන්නවා. 2008 දී සෙලින්කෝ සමූහ ව්‍යාපාරය, සෙලාන් බැංකුව ගැන මේ රටේ මිනිසුන්ට විශාල බියක් ඇති වුණා. සෙලාන් බැංකුව කඩා ගෙන වැටෙන කොට, පැය 24ක් යන්න පෙර මේ රටේ ජනාධිපතිවරයා හැටියට මහින්ද රාජපක්ෂ මැතිතුමා මිනිසුන්ගේ බිය නැති කරන්න තීන්දුවක් ගත්තා. ඊට පසුව දා උදේ වන කොට ලංකා බැංකුවේ කළමනාකාරිත්වය යටතට සෙලාන් බැංකුව ගත්තා. සෙලාන් බැංකුව කඩා ගෙන වැටෙන කොට එවැනි තීන්දුවක් ගන්න මේ ආණ්ඩුවට ශක්තියක් තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට පස්සේ 2009 අප්‍රේල් මාසය වන කොට සෙලින්කෝ එකේ ඉදි කිරීම් කටයුතු සම්පූර්ණයෙන් නැවතුණා. එම ඉදි කිරීම් කටයුතු නැවතුණාට පස්සේ මෙම සමාගමට ගෙනෙන ආයෝජන මොනවාද කියන එක පිළිබඳව සොයන්න ලක්ෂ්මන් ආර්. වටවල මහත්මයාගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් පත් කළා. ඒ ගැන ඔබතුමන්ලා දන්නවා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ එතුමා තමයි ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපති වශයෙන් කටයුතු කළේ. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ හිටපු සභාපතිවරයා හැටියට එතුමාගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් පත් කළා, මේ ආයෝජනය පිළිබඳව සොයන්න. වරලත් ගණකාධිකාරිවරුන්ගෙන් සමන්විත එම කොමිසමට "වටවල කොමිසම" කියලායි කිව්වේ. මෙය විශ්ලේෂණය කරලා, ව්‍යාපෘතියේ අරමුණු සාර්ථක කර ගැනීමට යෝජනා ගන්න වටවල කොමිසමට බැරි වුණා. නොයෙක් නොයෙක් යෝජනා ආවා. ඒ යෝජනාවල ප්‍රතිඵලයක් නැති වුණාම, අවුරුදු දෙකහමාරකට පස්සේ ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීම පනත යටතේ 2011 නොවැම්බර් මාසයේ මෙම ව්‍යාපෘතිය රජය විසින් නැවත පවරා ගත්තා. ඊට පස්සේ 2012 දී ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව රුපියල් ලක්ෂයක නාමික වටිනාකමට ඉඩම හා දේපොළ නාගරික සංවර්ධන අධිකාරියට පැවරුවා.

ඊළඟට රාජ්‍ය ආයතන ඇතුළත්ව පිහිටු වූ සමාගමකට මෙම ඉඩම හා දේපොළ පවරන්න 2012 මාර්තු මාසයේ 26වන දා කැබිනට් මණ්ඩලය තීන්දුවක් ගත්තා. මේවා ඔක්කොම කළේ විනිවිදභාවයෙන් යුතුවයි. මේවා ඔක්කොම කළේ කැබිනට් මණ්ඩලයට කියලායි. මේවා ඔක්කොම කළේ මිනිසුන්ට අදහස් ප්‍රකාශ කරන්න සති ගණන්, මාස ගණන් කල් දීලායි. යෝජනා ගෙනෙන්න විදේශිකයෝ වටවල කොමිසමට අයදුම් පත් දැම්මා. නමුත් ඒවා ප්‍රතික්ෂේප වුණා. ඒ ගොල්ලෝ යම් යම් කාරණා ඉල්ලුවා. එක අවස්ථාවක ඉන්දියානු සමාගමක් රුපියල් බිලියන 7.8කට මෙය ඉල්ලුවා. ඉල්ලලා මොකක්ද ඒකට යටින් කිව්වේ? ඒකට යටින් කිව්වා, නිදහස් දීමනාවක් යටතේ මේ ඉඩම් දෙන්නය කියා. ඒකයි ආණ්ඩුව දෙන්න බැහැ කිව්වේ. ආණ්ඩුව දෙන්න බැහැ කිව්වා. නිකම් ඉඩම පවරන්නය කිව්වා, ආයෝජන ගේන්න. ඊට පස්සේ නිසි බලධාරියෙක් පත් කර, දේපළ වන්දි ගෙවීමේ ක්‍රමයක් අනුගමනය කර ඉඩම දේපළ පුනරුදය කිරීමේ පහසුකම් සැපයෙන ආකාරයට එම රාජ්‍ය ආයතනය විසින් කටයුතු කරන්නට තීන්දු කළා. ඊට පස්සේ මෙම ව්‍යාපෘතිය ආරම්භ

කිරීමට සිනෝ ලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම මෙහි ව්‍යාපෘති සමාගම ලෙස හඳුනා ගත්තා. එම සමාගමට මෙම ව්‍යාපෘතිය භාර දෙන්නට තීන්දු කළා. කොහොමද ඒ සමාගමට ව්‍යාපෘතිය භාර දුන්නේ? නිකම් ව්‍යාපෘතිය භාර දුන්නේ නැහැ. මේ ව්‍යාපෘතිය දුන් සමාගම මොකක්ද? ශ්‍රී ලංකා රක්ෂණ සමාගම, ලිට්‍රෝ ගෑස් සමාගම කියන ලංකාවේ මිනිසුන්ගේ කොටස්වලින් පෝෂණය වුණු, ලාභ ලබන මේ සමාගම් එක්ක EPF එකත් එක්කාසු කරලා තමයි මේ සමාගම හැදුණේ. මේ සමාගම මේකට ඉදිරිපත් කරන කොට පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න ඇහුවා. මොකක් ද ඇහුවේ? මේක බිලියන 6.8ක දෙන්නට තිබුණා, බිලියන 6.8කට දෙන්නේ නැතිව බිලියන 4.8කට දුන්නේ ඇයි කියා ඇහුවා. නැහැ. ඒකට හේතුව මම කියන්නම්. ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා කිව්ව විධියට බිලියන 9.2කට කිසිම ඉල්ලීමක් ආවේ නැහැ. ඒක අමූලික අසත්‍යයක්. මා වගකීමෙන් කියනවා, එහෙම ඉල්ලීමක් ආවා නම්, ඒ පිළිබඳ විස්තර ගෙනැවිත් මේ පාර්ලිමේන්තුවේ ඊළඟ රැස්වීමේදී සභාගත කරන්නය කියා. කිසිම ඉල්ලීමක් ආවේ නැහැ. බිලියන 9.2කට ඉල්ලීමක් තිබුණා නම්, කොයි සමාගම ද ඉල්ලුවේ, කොයි දිනයේද ඉල්ලුවේ, ඉල්ලපු විධිය, ප්‍රතික්ෂේප කළේ කොහොමද කියා කරුණාකර මේ ගරු සභාවට ඉදිරිපත් කරන්න. එහෙම ඉල්ලුවේ නැහැ. මම කිව්ව විධියට බිලියන 7.8කට ඉන්දියානු සමාගමක් ඉල්ලුවා. නිදහස් දීමනා බලපත්‍රයක අයිතිය පැවරීම ඉල්ලීම වූ නිසා අප ඒක ප්‍රතික්ෂේප කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ බිලියන 6.8 ක යෝජනාවක් ගැන මේ සභාවේ කථා කළා. නමුත් මේ රටේ නීතියක් තිබෙනවා. ඒ නීතිය තමයි රජයේ තක්සේරුව. දැන් ගරු අජිත් පෙරේරා මන්ත්‍රීතුමා කිව්වා, රජයේ තක්සේරුව ගැන ප්‍රශ්න තිබෙනවාය කියා. අප කොහොමද තක්සේරු ගන්නේ? අප පෞද්ගලික ක්සේරුකරුවෙකුගෙන් තක්සේරු කර ගන්නද? එහෙම නැත්නම් අපට ඕනෑ විධියට තවත් සමාගමකට කියා තක්සේරු කර ගන්නද? නැහැ. මේ රටේ ඉඩම්, මේ රටේ දේපළ මේ ඔක්කොම තක්සේරු කරන්නේ රජයේ තක්සේරුවටයි. රජයේ තක්සේරුවට තමයි ෂැන්ග්‍රි-ලා සමාගම පර්ච් එක මිලියන 7ට යනකොට අක්කරය ලක්ෂ දොළොස්දාහ දක්වා තක්සේරු - value - කළේ. එක එක්කෙනාට ඕනෑ විධියට අඩුවට තක්සේරු කළේ නැහැ. ඒවා අමූලික බොරු. කාටවත් එහෙම බලපෑම් කරන්නට බැහැ. මේවායේ ක්‍රමවේදයක් තිබෙනවා. සමහර අවස්ථාවල අල්ලපු ඉඩම විකුණු ක්‍රමය තිබෙනවා. පවතින මිල ගණන් තිබෙනවා. වෙළඳ වටිනාකම තිබෙනවා. ඒ ඔක්කොම ගණන් බලා තමයි තක්සේරුවක් දෙන්නේ. ඒ තක්සේරුව අඩු නම්, නැත්නම් වැඩි නම් appeal එකක් කරන්නට පුළුවන්. Appeal එකක් කළාම නැවත ඒ පිළිබඳව කොමිටියකින් සලකා බලන්න පුළුවන්. මෙතැන එහෙම කිසි දෙයක්, වැරැද්දක් සිද්ධ වුණේ නැහැ. මා වගකීමෙන් කියනවා, රජයේ තක්සේරුව හැර වෙනත් ක්‍රමවේදයක් රජයේ දේපළකට නැහැ කියන එක. එම නිසා තක්සේරු අර ගෙන මේකට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර, ඒ කැබිනට් පත්‍රිකාවට අනුකූලව මේ සමාගමට මේ ව්‍යාපෘතිය ලබා දීලා මේ කරන්න හදන්නේ මොකක්ද? ලලිත් කොතලාවල මහත්මයාලා භාගයක් ඉදි කළ, එක පැත්තකින් තරුපහේ හෝටල් තිබෙන, අනික් පැත්තෙන් අරලිය ගහ මන්දිරය තිබෙන, අනික් පැත්තෙන් විශාල හෝටල් රාශියක් ක්‍රියාත්මක වන මේ රටේ ආර්ථිකයේ මර්මස්ථානයක තිබෙන ගරා වැටෙන්න ගිය ගොඩනැඟිල්ල ලෝකයේ තිබෙන ප්‍රබලම සමාගමක් එක්ක කළමනාකාරිත්වයට අප එක්කාසු කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ගරු අජිත් පෙරේරා මන්ත්‍රීතුමා හයිට් සමාගම ගැන කිව්වා. හයිට් සමාගම ලෝකයේ පිළිගත් සමාගමක්. දැන් කොළඹට ඇවිත් තිබෙන ෂැන්ග්‍රි-ලා හෝටල් සමගම ලෝකය පිළිගත් සමාගමක්.

කල්පිටියට එන්නේ Four Seasons එක. එයත් පිළිගත්ත සමාගමක්. Sheraton කියන්නේත් පිළිගත්ත සමාගමක්. මේ ඔක්කොම එක්ක හෙට අනිද්දා වෙන කොට තවත් සමාගම් තුනක් කොළඹ නගරයට ඇතුළු වෙනවා. මේවා ලෝකයේ හෝටල් ක්ෂේත්‍රයේ තිබෙන ප්‍රබලම සමාගම්. තවත් සමාගම් දෙකක් අපත් එක්ක එකඟ වෙලා තිබෙනවා ලබන සතිය වෙන කොට ඒ ආයෝජනත් ලංකාවට ගේන්න. මේවායේ වටිනාකම ඇති වුණේ හයිට් වාගේ, ෂැන්ග්‍රි-ලා වාගේ සමාගම් ලංකාවට ආව නිසායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ව්‍යාපෘතියෙන් අප මොකක්ද කරන්නේ? සුපිරි නිවාස 175ක් හදන්න මේ ව්‍යාපෘතියේ තිබුණා. අග්‍ර විනිශ්චයකාරවරියගේ දෝෂාභියෝග යෝජනාවේදී ඉදිරිපත් වුණු යම් යම් කරුණුවලින් අපට යම් යම් දේවල් පැහැදිලි වුණා. සමහර ආයතන අහිංසක මිනිසුන්ගේ මුදල්වලින් සමහර දේපළ මිලට අරගෙන තිබුණා. මේ නිසා ඒවායේ කොටස්කරුවන් අසරණ තත්ත්වයට පත් වුණා. ඒ කොටස්කරුවන් උසාවි ඉදිරිපිටට ගිහින් කෑ ගහලා තමන්ගේ මුදල් ඉල්ලුවා. ඒ අහිංසක මිනිසුන්ගේ මුදල් තමයි මේවාට යොදවලා තිබුණේ. ඒ මිනිසුන්ගේ ආරක්ෂණයත් ඉදිරි කාලයේදී මේවා තුළින් අප ලබා දිය යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට ආයෝජකයන් ආකර්ෂණය කර ගන්න ඕනෑ. ඒ නිසා විදේශීය සමාගම් කොටස්කරුවන් කර ගන්න පුළුවන්ද කියලා අප බැලුවා. මෙහෙම කරන එක ඊට වැඩිය හොඳයි කියලා අපට හිතුණා. ඔය කිව්ව විධියට මේ ගොඩනැඟිල්ල චීන සමාගමකට දුන්නා නම්, ඉන්දියානු සමාගමකට දුන්නා නම්, නැත්නම් වෙනත් විදේශීය සමාගමකට ආයෝජනය කරන්න දුන්නා නම් අද මේ සභාවේ කථා කරන්නේ ඔය කාරණය නොවෙයි. එහෙනම් අද මෙතුමන්ලා අහනවා, "රක්ෂණ සංස්ථාව ඉදිරිපත් වෙලා තිබුණා නම් රක්ෂණ සංස්ථාවට නොදුන්නේ ඇයි?' කියලා. "ලිට්‍රෝ ගෑස් එකට නොදුන්නේ ඇයි, ලංකාවේ සමාගම් ඉදිරිපත් වෙලා තිබුණා නම් ඒවාට නොදුන්නේ ඇයි?" කියලා තමයි අද මේ සභාවේදී මෙතුමන්ලා අහන්නේ. නමුත් අද මෙය දේශීය සමාගමකට දුන් නිසා දැන් එහි ඉන්න පුද්ගලයන්ගේ නම් කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සමාගම්වල සභාපතිවරු කවුරු හෝ වෙන්න පුළුවන්. ඒ සභාපතිවරයා ජනාධිපතිතුමාගේ අතිරේක ලේකම්තුමා වෙන්න පුළුවන්; ජනාධිපතිතුමාගේ හිතවත් කෙනෙක් වෙන්න පුළුවන්. නමුත් ඔවුන්ගේ ඉතිහාසය දෙස බලන්න. ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමා දන්නවා තිලක් මාරපන මහත්තයා ඇමති වෙලා සිටි කාලයේ කඩා වැටුණු මෝටර් රථ දෙපාර්තමේන්තුව නියම තත්ත්වයට ගෙනාවේ කවුද කියලා. කවුද ඒ? ගාමිනී සේදර සෙනරත් මහත්මයායි. ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ ගැන දන්නවා. ගාමිනී සේදර සෙනරත් මහත්මයා තමයි මෝටර් රථ දෙපාර්තමේන්තුව හරි මඟට ගෙනාවේ. ඇයි ඒ ගැන කථා නොකරන්නේ? රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ ආණ්ඩුව කාලයේ තිලක් මාරපන මහත්මයා ඇමති වෙලා ඉන්න කොට, මෝටර් රථ දෙපාර්තමේන්තුව කඩා වැටිලා තියෙන කොට, ගාමිනී සේදර සෙනරත් මහත්මයා තමයි ඒක නියම තැනට ගෙනාවේ. ඉස්සර passport office එක මිනිසුන්ගෙන් පගා ගන්න, කොමිස් ගන්න, වැඩ කර ගන්න ආව මිනිස්සු දහස් ගණනක් එළියේ රස්තියාදු වුණු තැනක්. අවශ්‍ය විස්තර සියල්ල computerize කරලා පැය 24ක් ඇතුළත passport එක ගන්න පුළුවන් විධියට, නැත්නම් වැඩියෙන් සල්ලි බැන්දාම පැය ගණනක් ඇතුළත passport එක ගන්න පුළුවන් ආකාරයට හැදුවේ ගාමිනී සේදර සෙනරත් මහත්මයායි. ඒවා අමතක කරන්න එපා. එතුමා මහජන බැංකුවේ සභාපතිවරයා වශයෙන් පත් කළේ ඒ නිසායි. ජනාධිපතිතුමා මහජන බැංකුවේ සභාපතිවරයා වශයෙන් කෙනෙක් පත් කරන්න ඕනෑ කරුණාජීව මහත්මයා හොඳට ගෙන ගිය මහජන බැංකුව එතුමා නැති වුණාට පස්සේ

[ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා]

කැඩෙන විධියට නොවෙයි. ඒක කරන්න පුළුවන් මිනිහෙක් මෙතැනට ගේන්න ඕනෑ. ඒකයි එතුමා ගාමිනී සේදර සෙනරත් මහත්මයා මහජන බැංකුවේ සභාපති කළේ. කාටවත් අත දිගු කරලා කියන්න බැහැ ගාමිනී සේදර මහත්මයා මේ ආයතනය විනාශ කරයි කියලා. එතුමාට පවරන ලද හැම ආයතනයක්ම එතුමා හොඳට පවත්වාගෙන ගියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට නීල් හපුහින්න මහත්මයා ගැන කිව්වා. මේවා මෙතැන කියැවුණු නම්. වැඩක් භාර දුන්නාම එතුමන්ලා ඒ වැඩේ හරියට කරනවා. ලිට්‍රෝ ගෑස් සමාගමත් එතුමාට දුන්නා. වැඩක් භාර දුන්නාම හරියට කළමනාකරණය කරලා එය පවත්වාගෙන යන්න පුළුවන් ශක්තියක් එතුමාට තිබුණා. ඒ වාගේ මේ සමාගම්වල සභාපතිලාගේ නම් කියලා කියනවා, මේ ආයතනයත් රක්ෂණ සංස්ථාවට දුන්නාම කොහොමද කියලා. රක්ෂණ සංස්ථාවේ සභාපතිත් එතුමායි. රක්ෂණ සංස්ථාව හැරී ජයවර්ධනගෙන් ගත්තාම ඒ සමාගමේ සභාපති කළේ ගාමිණී සේදර සෙනරත් මහත්මයායි.

රක්ෂණ සංස්ථාවට අපි මේ ආයෝජනය දුන්නාම මොකක්ද මේ පාර්ලිමේන්තුවට ඇවිත් කියන්නේ? "අන්න ඒක දීලා තිබෙන්නේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට නොවෙයි, ගාමිණී සේදර මහත්මයාට" කියලා කියනවා. මේ කරුණු පෞද්ගලික මට්ටමෙන් ආණ්ඩුවට මඩ ගහන්න යොදා ගන්න එපා. මේක දේශීය ආයෝජනයක්. ඒක හොඳට මතක තබා ගන්න. ඊළඟට සීනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) ආයතනයේ ආයෝජනය සම්පූර්ණයෙන්ම කොටස් දෙකකින් කරනවා. අජිත් පෙරේරා මන්ත්‍රීතුමනි, ඒ ඇමෙරිකන් ඩොලර් මිලියන 158.9 මෙන්න මේ ආකාරයටයි ආයෝජනය කරන්නේ. කොටස් හිමියන් ආයෝජනය කරන මුදල ඇමෙරිකන් ඩොලර් මිලියන 62.3යි. ඊට පසු බැංකුවලින් ගන්නවා, ඇමෙරිකන් ඩොලර් 96.6ක්. ඒ විධියට තමයි ඇමෙරිකන් ඩොලර් මිලියන 158.9 ආයෝජනය කරන්නේ. ඒ ගැන මේ පාර්ලිමේන්තුවට මම සහතිකයක් දෙනවා. මේ ඇමෙරිකන් ඩොලර් මිලියන 158.9 ආයෝජනය කළාට පසුව තමයි, අපි බදු සහනවලට අවශ්‍ය සහතිකය දෙන්නේ, ලංකාවේ සමාගමක් වුණත්. බදු සහන සඳහා සහතිකය ගන්න නම් ඇමෙරිකන් ඩොලර් මිලියන 158.9ම ආයෝජනය කරන්න ඕනෑ. ඒ මුදල ආයෝජනය කළාට පසුව තමයි ඒ සහතිකය දෙන්නේ. ඒ නිසා මේකෙන් කිසිම අසාධාරණයක් වන්නේ නැහැ.

මීට කලින් අපි පාර්ලිමේන්තුවේදී කිව්වා, මෙන්න මේ ආයෝජන ගෙනෙනවා කියලා. මීට මාස ගණනකට කලින් ඔබතුමන්ලා කිව්වේ, මේ ආයෝජනවලින් අපට මුදල් ලැබෙන්නේ නැහැ කියලායි. නමුත් අද ෂැන්ග්‍රි-ලා සමාගමේ මුදල් ලැබෙමින් පවතිනවා. අවසාන කොටස තමයි ලැබෙන්න තිබෙන්නේ. අද පාර්ලිමේන්තුවේදී කිව්වා, Krrish සමාගමේ ලබා ගත් ඉඩමේ මුදල් සියයට 64ක් ලැබිලා තියෙනවා කියලා. ඒ අක්කර 4ක ඉඩම UDA එකට අයිතියි කියන මතය අනුව ගිවිසුම් අත්සන් කළාට, එයින් අක්කර දෙකක් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවටයි අයිතිව තිබුණේ. ඒ නිසා නැවත කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරන්න සිද්ධ වුණා, ඒ අක්කර දෙක නැවත නාගරික සංවර්ධන අධිකාරියට පවරා ගන්න. ඒ නිසා ඒ කටයුතු මාස දෙකක් ප්‍රමාද වුණා. මේ පෙබරවාරි මාසයේ අවසානයේ හෝ මාර්තු මාසයේ මුල් සතිය වන විට Krrish සමාගමේ සියලුම මුදල් තැන්පත් කරන්න අවශ්‍ය පියවර ගන්නා බව කිසිම පැකිලීමක් නැතුව අපි මේ ගරු සභාවට කියනවා. දැන් ෂැන්ග්‍රි-ලා සමාගම ඒ අයගේ වැඩ කටයුතු පටන් අරගෙන තිබෙනවා. හම්බන්තොට පටන් අරගෙන තිබෙනවා; කොළඹ පටන් අරගෙන තිබෙනවා; වරාය සංස්ථාවේ වැඩ කර ගෙන යනවා; කොළඹ දකුණ බහලුම් වරායේ වැඩ කර ගෙන යනවා; සාම්පූර්වලට අදාළ ගැසට් පත්‍රයක් අත්සන් කර තිබෙනවා. Luxury Hotels Complex, Mixed Development Projects, Welcomgroup Hotels ආදියේ මූලික කටයුතු කර ගෙන යනවා. මේ ආයෝජනවලට අදාළ ගණන් හිලවු අද කිව්වා. නමුත් විරුද්ධ පක්ෂය ඒවා පිළිගන්න ලෑහැස්ති නැහැ.

2012 වර්ෂයේ සංචාරකයන්ගේ පැමිණීම මිලියනය ඉක්මවූවා. දැන් ඒ ගැනත් දුක හිතිලා තිබෙනවා. ඒ ගැන අද ගණන් හදනවා. කොහොමද ඒ ගණන් හැදුවේ? අපි මේ visaවලට අදාළව ආගමන හා විගමන පාලකගෙන් ගණන් හිලවු ගන්නවා. එක දිනකට වැඩිය ලංකාවේ නැවතුණු සංචාරකයන් ගණන බලලා, - හුවමාරුවට නැවතුණ උදවිය හැර- ඒ අනුව තමයි මේ මාසයේ පැමිණි ගණන ලක්ෂ 10 හැටියට ගණන් බැලුවේ.

ජනවාරි මාසයේ 31 වන කොට -ජනවාරි මාසයේ අන්තිම දක්වා ඇති ලේඛනය අපට ලැබුණා - සංචාරකයෝ 97,000ක් ලංකාවට ඇවිල්ලා තිබෙනවා. 97,000ක්! මේ 97,000ත් එක්ක මේ අවුරුද්දේ දෙසැම්බර් මාසය වන කොට අපට අපේ ඉලක්කය ඉක්මවන්නට පුළුවන්. සංචාරකයන් 15,00,000 ඉලක්කයට මේ අවුරුද්දේ අපට කිසිම පැකිළීමක් නැතිව යන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි විශේෂයෙන්ම ආයෝජන ගැන මේ සභාවේ කථා කළා. මම මේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ප්‍රගතිය දක්වන ප්‍රස්තාරය හැන්සාඩගත කිරීම සඳහා **සභාගත*** කරනවා. මෙලෙස හැන්සාඩගත කරන්නේ කාගේත් දැන ගැනීම සඳහායි.

මේ අවස්ථාවේදී හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ගරු සභාවේ නැති එක ගැන මා කනගාටු වනවා; සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා ගරු සභාවේ නැති එක ගැන ගැන මා කනගාටු වනවා. 1978 ආයෝජන මණ්ඩලය පිහිටවූවාට පසු , 1978 සිට1994 වන තෙක් - ඒ කියන්නේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ මුළු කාලයේම - ඇමෙරිකන් ඩොලර් මිලියන1,078ක ආයෝජන පමණයි ශ්‍රී ලංකාවට ඇවිත් තිබෙන්නේ. ඊළඟට, 1994 සිට 2005 වන තෙක් චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව කාලයේ ඇමෙරිකන් ඩොලර් මිලියන 2,068ක ආයෝජනයක් ඇවිත් තිබෙනවා. 2005 සිට 2012 වන කොට, මහින්ද රාජපක්ෂ ආණ්ඩුව යටතේ ඇමෙරිකන් ඩොලර් මිලියන 5,365ක ආයෝජන ඇවිල්ලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගණන් හදලා බැලුවාම මහින්ද රාජපක්ෂ ආණ්ඩුව යටතේ අනෙක් සියලුම ආණ්ඩු කාලවලට වඩා සියයට 64කින් ආයෝජන වැඩි වෙලා තිබෙනවා. එහෙම නම් ආයෝජන පිළිබඳව මොනවා කථා කළත්, ලංකාවට ආයෝජන වැඩියෙන්ම ආවේ මහින්ද රාජපක්ෂ ආණ්ඩුව කාලයේයි කියන එක ඉතාම පැහැදිලිව මේ පාර්ලිමේන්තුවට මා අද කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය වකවානුවේ ආයෝජකයන්ට මේ රටේ ඉඩම් දෙන කොට ඒ ඉඩම් ගන්න එපා කියලා ඔවුන් තුළ බියක් ඇති කළේ කවුද? ඒක කළේ මේ පාර්ලිමේන්තුවේ සිටින විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු. ඒ අය ෂැන්ග්‍රි-ලා හෝටලයට විරුද්ධව කථා කළා, කැතික් සමාගමට විරුද්ධව කථා කළා. ආයෝජකයන් බිය වැද්දුවා,

---

**** කථාව අවසානයේ පළ කර ඇත.***

** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*

** Produced at end of speech.*

ආයෝජකයන්ට නොයෙක් දේවල් කිව්වා, ඔවුන් කරන මේ ආයෝජනයේ ඇති අවදානම් තත්ත්වය කිව්වා. එහෙම තියෙද්දීත් මේ ආයෝජන මේ රටට ගෙනෙන්නට අපට පුළුවන්කමක් ලැබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අද ඉදිරිපත් කළ සියලුම කරුණු මේ සභාවට ඉදිරිපත් කරන්න කිසිම චකිතයක්, බියක් මේ ආණ්ඩුවට තිබුණේ නැහැ. මේ ආණ්ඩුව මේ ගනුදෙනුව ඉතාම විනිවිදභාවයෙන් කළ ගනුදෙනුවක්. මීට ඉස්සර, 1978 මේ පනත ගෙනා දවසේ සිට කිසිම දවසක කළ ආයෝජනයක් 2008 වන තෙක් මේ පාර්ලිමේන්තුවේ මහජන නියෝජිතයෙක් දැන ගෙන සිටියේ නැහැ. බදු සහන දුන්නේ කොයි විධියටද, ආයෝජනය කොච්චර ප්‍රමාණයක්ද, මේ ආයෝජනය මේ රටට කොයි ආකාරයටද ගෙනාවේ, ඒ සමාගම මොකක්ද කියන ඒ කිසිම දෙයක් මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් දැන ගෙන සිටියේ නැහැ. නමුත් 2008 මේ පනතෙන් පස්සේ, ඒ කරුණු විනිවිදභාවයෙන් මේ පාර්ලිමේන්තුවට කියන්න මේ ආණ්ඩුව පටන් ගත්තා. එහෙම නම් ඒ කරුණු මත තමයි අද මේ විවේචන සියල්ලම වුණේ.

අපි ආයෝජන ඉලක්ක කර ගන්නවා. අපි මේ අවස්ථාවේදී භය නැතුව කියනවා, 2013 දෙසැම්බර් මාසයේ 31 වන දින වන කොට ඇමෙරිකන් ඩොලර් බිලියන 2ක අවම ආයෝජනයක් මේ රටට ගෙනෙන්න අවශ්‍ය කටයුතු කරන බව. ඒ සඳහා පසුබිම අපි සකස් කරනවා. ආයෝජකයන්ට ඒ පහසුකම් ටික දෙන්න අපි පැකිළීමක් නැතිව කටයුතු කරනවා. ඒ අයට අවශ්‍ය බදු සහන දෙනවා. අපි මේ දෙන්නේ පනතකින් නියමානුකූල කරලා මේ පාර්ලිමේන්තුවෙන් සම්මත කළ බදු සහන. අද මේ ව්‍යාපෘතිය යටතේ දෙන බදු සහන හරහා මේ ව්‍යාපාරය සාර්ථක වුණොත්, සෙලින්කෝ ව්‍යාපාරයේ ගනුදෙනු කිරීමෙන් මුදල් අපහසුතාවට ලක්ව සිටින මේ රටේ ලක්ෂ ගණනක පිරිසකට අවුරුදු ගණනක් ගිහිල්ලා හෝ සහන ලැබෙනවා. ආණ්ඩුවට ඒ ගැන බැඳීමක් නැති වුණත්, ඔවුන්ට දෙන සහන පිළිබඳව ආණ්ඩුව කල්පනා කර තිබෙනවා. ඒ වාගේම අපි ඉදිරි කාලය ඇතුළතත් ආයෝජනවලට සහන ලබා දෙන බව අද පැහැදිලිව කියනවා.

අද විදේශික ආයෝජකයන් භය කර තිබෙනවා, ඉඩම් ප්‍රශ්නයක් ගැන කියලා. මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වන්නේ විදේශිකයන්ට ඉඩම් විකුණන එක නොවෙයි, බදු ක්‍රමයකට දේශීය හා විදේශීය ආයෝජනවලට ඉඩම් ලබා දීමයි. ඒ තීරණය අපි වෙනස් කරලා නැහැ. ඉදිරියටත් ඒ බදු ක්‍රමය යටතේ ඕනෑම ආයෝජකයකුට ලංකාවේ ඕනෑම තැනක ආයෝජනය කරන්න අවශ්‍ය යටිතල පහසුකම් වාගේම, අනෙකුත් පහසුකම්ද මේ ආණ්ඩුව යටතේ ලබා දෙන බව ප්‍රකාශ කරන අතර, සද්භාවයෙන් ඉදිරිපත් කරපු මේ යෝජනාව තමුන්නාන්සේලාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමින් මගේ වචන ස්වල්පය අවසන කරනවා. ස්තුතියි.

***සභාමේසය මත තබන ලද ප්‍රස්තාරය:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட வரைபு:*
*Graph tabled:*

**1. BOI Performance (ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ප්‍රගතිය)**

**1.1 FDI Inflows (1978 – 3Q/2012)**

**(විදෙස් ආයෝජන ගලා ඒම (1978 සිට 2012 / 3 වන කාර්තුව දක්වා)**




- BOI has received US$ 615 Mn. worth of FDI in 3Q/2012
  (2012 තුන් වන කාර්තුව වන විට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ඇ.ඩො.මිලියන 615 ක සෘජු විදෙස් ආයෝජනයක් උපයා ඇත.)
- Total Cumulative FDI received from 1978 to 3Q/2012 = US$ 7,805 Mn.
  (1978 සිට 2012 - 3 කාර්තුව දක්වා මුළු සමුච්චිත සෘජු විදෙස් ආයෝජන ප්‍රමාණය ඇ.ඩො.මිලියන 7,805 කි.)
- **64%** of total FDI (US$ 5,026)has received during the period 2006 – 3Q/2012
  (මුළු සෘජු විදෙස් ආයෝජන ප්‍රමාණයෙන් 64% ක් ලබා ඇත්තේ (ඇ.ඩො.මිලියන 5,026) 2006 සිට 2012 - 3 කාර්තුව දක්වා කාල පරාසය තුලය)

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
කල් තැබීමේ යෝජනාව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා.

## "උතුරු වසන්තය" සංවර්ධන වැඩසටහන් ඇගයීම
## 'வடக்கின் வசந்தம்' அபிவிருத்தித் திட்டங்களுக்குப் பாராட்டு
## APPRECIATION OF DEVELOPMENTS UNDER "UTHURU WASANTHAYA"

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய சபை ஒத்திவைப்புப் பிரேரணை நேரத்தில், நான் பின்வரும் பிரேரணையைச் சமர்ப்பிக்கின்றேன்:

> "மஹிந்த சிந்தனையின் 'வடக்கின் வசந்தம்' நிகழ்ச்சித் திட்டத்தின்கீழ் இந்த அரசாங்கத்தினால் முன்னெடுக்கப்படும் பாரிய அபிவிருத்தித் திட்டங்கள் குறித்து இச்சபை தனது ஆழ்ந்த பாராட்டுக்களைப் பதிவுசெய்கின்றது."

இதனுடைய ஆங்கில மொழிபெயர்ப்பையும் சிங்கள மொழிபெயர்ப்பையும் ஹன்சாட்டில் *பதிவுசெய்யுமாறு கேட்டுக்கொள்கின்றேன்.

இன்று நம் நாடு ஓர் எழுச்சிமிக்க நாடாகத் திகழ்கின்றது. தெற்கில் மாத்திரமன்றி வடக்கிலும் அபிவிருத்தி செய்ய வேண்டும் என்ற விழிப்புணர்ச்சி ஏற்பட்டிருக்கின்றது. அதற்குக் காரணமாக இருக்கின்ற ஒரேயொரு மனிதர் மேதகு மஹிந்த ராஜபக்ஷ அவர்கள். அவர் தனது மஹிந்த சிந்தனையில் வடக்கையும் கிழக்கையும் விட்டுவிடவில்லை. அவர் பகுதிகளையும் அதனுள் இணைத்து, அப்பகுதிகளின் அபிவிருத்திக்குக் கால்கோள் இட்டிருக்கின்றார். முதன்முறை அவர் ஜனாதிபதித் தேர்தலில் வெற்றிபெற்ற பின்னர், இரண்டாவது தடவையாகவும் பதினாறு இலட்சத்துக்கும் மேற்பட்ட மேலதிக வாக்குகளால் மீண்டும் ஜனாதிபதியாகத் தெரிவானார். அவரை இந்த நாட்டின் வடக்கு, கிழக்கு, தெற்கு, மேற்கு மற்றும் மலையகப் பகுதிகளில் வாழுகின்ற மக்கள் ஜனாதிபதியாகத் தேர்ந்தெடுத்தார்கள். அவரின் "புதியதோர் இலங்கை; வளமான எதிர்காலம்" என்று குறிப்பிட்டிருக்கும் "மஹிந்தவின் சிந்தனை தொலைநோக்கு" எனும் நூலின் 65ஆவது பக்கத்தில் மிகவும் அழகாக பின்வருமாறு விவரித்து இருக்கின்றார்:

> "30 ஆண்டுகளுக்கு மேற்பட்ட பழைமைவாய்ந்த பயங்கர வாதத்திற்கு தென்னிலங்கை மக்களைவிடத் துன்பத்தையும் மோசமான வாழ்க்கை நிலையையும் அனுபவித்தது வடக்கில் வாழ்ந்த மக்கள் என்பதை நான் அறிவேன். தற்போது நிரந்தரமான சமாதானம் உருவாகியுள்ளது."

அது உண்மை! மேதகு ஜனாதிபதி அவர்கள் சொன்னது போல் சமாதானத்தை உருவாக்கியிருக்கின்றார். இன்று சமாதான சூழ்நிலையில் வடபகுதி மக்கள் கொஞ்சி விளையாடுகின்றார்கள் என்பதை நான் இந்தச் சபையிலே மகிழ்ச்சியுடன் சொல்ல விரும்புகின்றேன். இந்த உண்மைக்கு மாறாக, பாக்குநீரிணைக்கு அப்பால் இருக்கின்றவர்கள் மேற்கொள்கின்ற பொய்ப் பிரசாரங்களையிட்டு நாங்கள் கடுமையாக விமர்சிக்கின்றோம்; கண்டிக்கின்றோம். வடக்கை அபிவிருத்தி செய்வதற்காக மேதகு ஜனாதிபதி அவர்கள் எடுக்கின்ற நடவடிக்கைகளைப் பாருங்கள்! ஆனால், வடக்கு எவ்வளவுதூரம் அபிவிருத்தி அடைந்து வருகின்றது என்பதைப் பற்றிப் பேசுவதற்குத் தமிழ்த் தேசியக் கூட்டமைப்பைச் சேர்ந்த ஓர் உறுப்பினர்கூட இந்தச் சபையிலே தற்பொழுது இல்லை யென்பதை நான் இங்கிருந்து தமிழ்நாட்டுக்குத் தெரியப்படுத்த விரும்புகின்றேன். அவர்கள் உரிமை! உரிமை! என்று கூறுகின்றார்களே ஒழிய, இத்தனை காலமாக தமிழ் மக்களுக்காக ஒரு பாதையை அமைத்துத் தரும்படியாவது கோரியிருக்கின்றார்களா? மாறாக, படுகுழியை எப்படித் தோண்டுவது என்ற பாடத்தைத்தான் அவர்கள் தமிழ் மக்களுக்குப் புகட்டி வருகின்றார்கள். அவர்கள் இச்சபையிலே ஒரு நாளும் ஒரு பாதையை, பாடசாலையை, பாலங்களை அமைப்பது பற்றியோ அல்லது மின்சாரத்தை வழங்குவது பற்றியோ ஒரு வார்த்தையேனும் பேசவில்லை.

அதுமாத்திரமல்ல, மேதகு ஜனாதிபதி அவர்கள் அண்மையில் வட பிரதேசங்களுக்குச் சென்றபொழுது, ஓர் இரகசியத்தைக் கண்டுபிடித்தார். அதாவது, இந்த அரசாங்கம் வடக்கின் அபிவிருத்திக்காக, வளர்ச்சிக்காக, வளத்துக்காக அளித்த கோடான கோடி ரூபாயை அந்தப் பகுதியிலுள்ள பிரதேச சபைகளை ஆளுகின்ற தமிழ்த் தேசியக் கூட்ட மைப்பினர் செலவழிக்காததால், அது திறைசேரிக்குத் திரும்பிவந்துள்ளது என்ற மிகவும் வெட்கக்கேடானதும் துக்கரமானதுமான செய்தியை ஜனாதிபதி அவர்கள் கண்டு பிடித்துச் சொன்னார். தமிழ்த் தேசியக் கூட்டமைப்பினரை அங்குள்ள மக்கள் ஜனநாயக முறைப்படிதான் தெரிவு செய்தார்கள். இன்று அந்த மக்கள் கண்ணீர் வடிக்கின்றார்கள். நான் இந்த இடத்திலிருந்து தி.மு.க.வின் தலைவர் கருணாநிதி யிடமும் ஜெயலலிதா அம்மையாரிடமும் ஒரு கேள்வியைக் கேட்க விரும்புகின்றேன். அதாவது, நீங்கள் இப்படியானவர் களுக்காகவா உங்களுடைய வாசல்களை - கதவுகளைத் - திறந்துவிடுகின்றீர்கள்? அவர்கள் அங்கு குளிர்காய்ந்துவிட்டு, நீங்கள் அளிக்கின்ற அன்பு, பாசத்துடனான வரவேற்பினைப் பெறுகின்றார்கள். ஆனால், இங்கே வந்து தமிழ் மக்களுக்கு ஒன்றும் செய்வதில்லை.

நான் சென்ற தேர்தல் காலத்தில் திருகோணமலை மாவட்டத்தில் இருக்கின்ற தென்னைமரவாடி என்ற கிராமத்

---

**** කථාව අවසානයේ පළ කර ඇත.***
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

துக்குச் சென்றேன். தென்னைமரவாடி என்பது ஒரு தமிழ் கிராமம். முப்பது ஆண்டுகளுக்கு மேலாக அக்கிராம மக்கள் வன்னிப் பிரதேசங்கள், வவுனியா போன்ற பகுதிகளில் இடம்பெயர்ந்து வாழ்ந்து, தற்பொழுது மீண்டும் தங்களது சொந்தக் கிராமங்களுக்குத் திரும்பி வந்திருக்கின்றார்கள். அவர்களைப் பிரதிநிதித்துவப்படுத்துகின்றவர் தமிழ்த் தேசியக் கூட்டமைப்பின் தலைவர் ஆர். சம்பந்தன் அவர்கள் என்பதை நான் இங்கிருந்து தமிழ்நாட்டுக்கு அறிவிக்கத்தான் வேண்டும். அன்று நான் அங்கு சென்றபொழுது, என்னுடன் இன்று எங்களுடைய அரசில் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சராக இருக்கின்ற கௌரவ சுசந்த புஞ்சி நிலமே அவர்களும் வந்திருந்தார். அங்கே அந்த மக்களுக்கு எந்த வசதியும் கிடையாது. இதனை நான் மேதகு ஜனாதிபதி அவர்களிடமும் சொன்னேன். கும்மிருட்டிலே இருந்த அந்த மக்களுக்கு மின்னொளியைக் கொடுத்தது ஜனாதிபதி அவர்கள். ஆகவே, கூட்டமைப்பினர் இந்த நாட்டிலே இனிமேலும் இப்படியான திருவிளையாடல்களில் ஈடுபட முடியாது. நாங்கள் தெற்கை அபிவிருத்தி செய்வது போன்று வடக்கையும் அபிவிருத்தி செய்கின்றோம். என்னிடத்திலே பல புள்ளிவிபரங்கள் இருக்கின்றன. நான் அதனை மத்திய வங்கியின் மூலமாகப் பெற்றிருக்கின்றேன். அந்தப் புள்ளிவிபரங்களை இங்கே வாசிக்க நேரம் போதாது. எனினும், ஹன்சாட்டிலே பதிவு செய்யப்பட வேண்டும் என்பதற்காக அவற்றை நான் சபாபீடத்தில் *சமர்ப்பிக்கின்றேன். அங்கே அரசாங்கம் கோடான கோடி ரூபாயைச் செலவழித் திருக்கின்றது.

The total number of beneficiaries and the amount of loans granted by the Central Bank of Sri Lanka to the Northern Province under "Uthuru Wasanthaya" from 2010 to 2012 is contained in Annex I. Since I do not have time to read the whole thing, I will **table*** it.

The total expenditure incurred for the development of the Northern Province by the Government of Sri Lanka during the period 2009 to 2012 is contained in Annex II, which I **table***.

Sir, all these amounts are stated in millions.There are so many ministries that have contributed to this development. The Ministry of Economic Development, the Ministry of Fisheries and Aquatic Resources Development and the Ministry of Transport including other ministries have spent a total sum of Rs. 33,343 million. All the details are mentioned in Annex II. If you want more details, you can ask from Mrs. C. Premaratne or Roshan Bukhari. They are ready to help even the Opposition MPs to get these statistics straight. Sir, the "Northern Spring" which is the "Uthuru Wasanthaya" - "வடக்கின் வசந்தம்" - is a development programme which caters to the needs of those in the Northern Province in regard to infrastructure development, electricity, water supply and sanitation.

The estimated development expenditure under "Uthuru Wasanthaya" for the year 2013 is contained in Annex III which I **table***.

மாண்புமிகு அமைச்சர் தினேஷ் குணவர்தன அவர்கள் அங்கு நீர் வழங்கியிருக்கின்றார். கோட்டே மற்றும் மஹரகமவுக்கு நீர் வழங்குவதைப்போன்று யாழ்ப்பாணத் துக்கும் வழங்கியிருக்கிறார். அள்ளி அள்ளி நீர் வழங்கக்கூடிய ஓர் அமைச்சர்தான் அரசாங்கக் கட்சிப் பிரதம கொரடாவாக இருக்கின்ற மாண்புமிகு தினேஷ் குணவர்தன அவர்கள் என்பதை நான் இந்த இடத்திலே பெருமையாகக் கூறிக் கொள்ள விரும்புகின்றேன்.

இந்த நாட்டிலே சிங்கள மக்களோடு முஸ்லிம்கள் ஒன்றாக வாழ்ந்து வருகின்றார்கள். ஆனால், இன்று அவர்களைப் பிரிக்கப் பார்க்கின்றார்கள். ஆனால், எங்களுக்குள் பிரச்சினை இல்லை. பிரச்சினைகள் இருந்தால் அன்று எங்களுடைய மாபெரும் தலைவர் ரீ.பி. ஜாயா அவர்கள் சட்ட சபையிலே கூறியதுபோன்று நாங்களே அவற்றைத் தீர்த்துக் கொள்ளலாம். இன்று நாட்டில் வெளிநாட்டுச் சக்திகளின் ஊடுருவல் காணப்படுகின்றது. அந்தச் சதிகாரர்களுடைய வலையில் சிக்கக்கூடாது என்றுதான் நான் தமிழ் மக்களிடம் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். அங்கே தமிழ்நாட்டிலே யார் கத்துகின்றார்? 'வைகோ'வாம்! 'வைகோ' இலங்கைக்கு வந்தால் நாங்கள் அவருக்கு வைக்கோல் கொடுக்கலாம். அவ்வளவுக்கு இன்று கிழக்கு மற்றும் வடக்கு மாகாணங் களிலே நெல் விளைச்சல் காணப்படுகின்றது. அதேபோன்று தான் அங்கே சீமான் என்ற ஒருவர் கத்துகின்றார். அவர்களுக்குத் தொழில் இல்லை. அவர்கள் வாழ வக்கில்லாதவர்கள். இன்று இலங்கையைச் சுட்டிக் காட்டிக் காட்டி வயிறு வளர்த்துக்கொண்டிருக்கின்றார்கள். அவர் ஒரு சீமானா? பிச்சைக்காரன்! அவரையும் நான் இங்கு வருமாறு அழைக்கின்றேன். ஏனெனில், அவர் இந்த நாட்டுக்கு வந்து தெவட்ட மரத்தடிப் பள்ளிவாசலிலே ஒரு வெள்ளைத் துணியைப் போட்டு அமர்ந்துகொண்டால், ஏதாவது காசைச் சேர்த்துக்கொண்டு போகலாம். இப்படியாகத் தமிழ் மக்களை ஏமாற்றவேண்டியதில்லை.

அடுத்த வாரம் இராமகிருஷ்ணமிசனிலே 'கம்பவாருதி' ஜெயராஜ் ஐயா அவர்களுடைய தலைமையில் கம்பன் விழா அழகாக, ஜோராக, ஜாம் ஜாம் என்று நடைபெறவிருக்கின்றது. இதற்காக இந்தியாவிலிருந்து தமிழ் அறிஞர்கள் பலர் இங்கே வந்திருக்கின்றார்கள். அவர்களுக்கு இங்கே வருவதற்குச் சுதந்திரம் இருக்கின்றது. இன்று இந்த நாட்டிலே கம்பன் விழா, கொழும்புத் தமிழ்ச் சங்கத்தின் விழாக்கள் மற்றும் புத்தக வெளியீட்டு விழாக்கள் எல்லாம் நடக்கின்றன. ஆகவே, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த நாட்டிலே தமிழ் சாகவில்லை; வளர்கின்றது. அதாவது இந்த நாட்டிலே மஹிந்த ராஜபக்ஷ அவர்களுடைய அரசின்கீழ் மெல்லெனத் தளிர்விட்டுத் தமிழ் வளர்கின்றது. ஆனால், தமிழ்நாட்டிலே தமிழ் மெல்லெனச் சாகின்றது என்று அங்கிருக்கின்ற பத்திரிகையாளர்களும் மற்றும் ஊடகவிய லாளர்களும் எழுதுகின்றார்கள். உலகத்திலே வாழ்கின்ற எட்டுக் கோடி தமிழர்களுக்காக இன்பத் தமிழிலே, அமுதத் தமிழிலே ஐக்கிய நாடுகள் தாய்ச் சங்கத்திலே உரையாற்றிய

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

ஒரேயொரு தனிப்பெரும் உலகத் தலைவர் மேதகு ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்களே என்பதை நான் இங்கு கூறிக்கொள்ள விரும்புகின்றேன்.

இங்கே என்னிடத்திலே 'தினமுரசு' பத்திரிகை ஒன்று இருக்கின்றது. அதில் மன்னார் முஸ்லிம்கள் மற்றும் வடக்கிலிருந்து வெளியேற்றப்பட்ட முஸ்லிம்கள் சம்பந்தமாகக் குறிப்பிடப்பட்டிருக்கின்றது. வடக்கிலிருந்து 75 ஆயிரத்துக்கும் மேற்பட்ட முஸ்லிம்களை ஒரேநாளிலே விரட்டியடித்தார்கள். இல்லாத காரணங்களைக் கூறி வடக்கில் பூர்வீகமாக வாழ்ந்த முஸ்லிம் மக்களை ஓரிரவுக்குள் வெளியேற்றித் தங்கள் கரங்களைக் கறைபடுத்திக்கொண்டவர்கள்தான் புலிகள். இந்தப் புலிகளுடைய பிரதிநிதிகள்தான் ரீ. என். ஏ. அவர்களோடுதான் எதிர்க்கட்சித் தலைவர் இப்பொழுது குந்திக்கொண்டிருக்கின்றார். என்ன கேவலம்? பதினொரு கட்சிகள் என்று சொல்லி, பதினொரு 'ஆட்டோ'க்களில் செல்லக்கூடியவர்ளைச் சேர்த்துத்தான் இந்த நாட்டை ஆளப்போகின்றார்களா? எவ்வளவோ பெரிய ஐக்கிய தேசியக் கட்சிக்கு இன்று எவ்வளவு இழிவான இடம்! யாழ்ப்பாணத்திலே, மன்னாரிலே முஸ்லிம்களுக்கு ஏற்பட்ட விளைவுகள் பற்றி எல்லாம் இந்தத் 'தினமுரசு' பத்திரிகையில் அருமையாக எழுதப்பட்டிருக்கின்றது.

அமைச்சர் ரீ.பி. ஏக்கநாயக்க அவர்கள் அங்கே முதன் முதலாகக் கலாசார உத்தியோகத்தர்களை நியமித்திருக்கின்றார். அங்கு கலாசார நிலையமும் அமைக்கப்பட்டு வருகின்றது. அங்கு கவிமடு நடத்தக்கூடிய ஏற்பாடுகளை எல்லாம் அவர்கள் செய்துகொண்டு போகின்றார்கள். ஆகவே, அங்கு கலாசாரத் துறையிலே, விவசாயத் துறையிலே மற்றும் உற்பத்தித் துறையிலே, சமூகத் துறையிலே, கல்வித் துறையிலே அதேபோன்று சுகாதாரத் துறையிலே முன்னேற்றம் ஏற்பட்டு வருகின்றது. இதற்காக மஹிந்த ராஜபக்ஷ அரசாங்கம் வடக்குக்குக் கோடான கோடி ரூபாயைச் செலவு செய்கின்றது. சரித்திரத்திலே ஒருகாலமும் எந்த அரசாங்கமும் இதுபோன்று செலவழிக்கவில்லை என்று சொல்லி விடைபெறுகின்றேன். ரொம்ப நன்றி!

**** සභාමේසය මත තබන ලද යෝජනාවේ සිංහල හා ඉංග්‍රීසි පරිවර්තනය:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட பிரேரணையின் சிங்கள மற்றும் ஆங்கில மொழிபெயர்ப்புக்கள்:*

**Sinhala and English versions of Motion tabled:*

"මහින්ද චින්තන ඉදිරි දැක්මෙහි සඳහන් උතුරු වසන්තය වැඩසටහන යටතේ රජය විසින් දියත් කර ඇති අති විශාල සංවර්ධන වැඩසටහන් මෙම ගරු සභාවේ ඉමහත් ඇගයීමට ලක් විය යුතු යැයි මෙම ගරු සභාවට යෝජනා කරමි."

"This House places on record its deepest appreciation of the mega developments launched by the Government under the "Uthuru Wasanthaya" Programme of the "Mahinda Chintana."

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. යෝජනාව ස්ථිර කිරීම, ගරු හුනෙයිස් ෆාරුක් මන්ත්‍රීතුමා.

**ගරු හුනෛයිස් ෆාරූක් මහතා**
(மாண்புமிகு ஹுனைஸ் பாறூக்)
(The Hon. Hunais Farook)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
කරුණාකර, නිශ්ශබ්ද වෙන්න. මේ අවස්ථාවේදී මූලාසනය සඳහා ගරු ජානක බණ්ඩාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ජානක බණ්ඩාර මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව*** **ගරු ශාන්ත බණ්ඩාර මහතා** ***මූලාසනයෙන් ඉවත් වූයෙන්,*** **ගරු ජානක බණ්ඩාර මහතා** ***මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு,* மாண்புமிகு சாந்த பண்டார அவர்கள் *அக்கிராசனத்தினின்று அகலவே,* மாண்புமிகு ஜானக பண்டார அவர்கள் *தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SHANTHA BANDARA *left the Chair and* THE HON. JANAKA BANDARA *took the Chair.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

**ගරු හුනෛයිස් ෆාරූක් මහතා**
(மாண்புமிகு ஹுனைஸ் பாறூக்)
(The Hon. Hunais Farook)
கௌரவ உறுப்பினர் அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்களால் முன்மொழியப்பட்ட இந்த ஒத்திவைப்புப் பிரேரணையானது காலத்தின் தேவையாக இருக்கின்றது. கடந்த வாரம் நாங்கள் வன்னிப் பிரதேசத்துக்கு ஒரு சுற்றுலாவை மேற்கொண்டிருந்தோம். எங்களது குழுவிலே ஆளுங்கட்சி, ஐக்கிய தேசியக் கட்சி மற்றும் தமிழ்த் தேசியக் கூட்டமைப்பு பாராளுமன்ற உறுப்பினர்கள் அடங்கியிருந்தனர். நாட்டின் அபிவிருத்தி தொடர்பாக நாங்கள் ஆராய்ந்தபொழுது எங்களுடன் வந்திருந்த எதிர்க்கட்சி உறுப்பினர்கள் திகைத்துவிட்டார்கள். ஏனென்றால், பெரும் பாலான எதிர்க்கட்சி உறுப்பினர்கள் இங்கே கொழும்பிலிருந்துகொண்டுதான் வடக்கிலுள்ள குறைபாடுகளைப் பற்றிக் கதைப்பார்கள். ஆனால், இவர்கள் அங்குள்ள நிலைமைகளை நேரடியாகப் பார்த்ததும் உண்மையை - யதார்த்தத்தைப் புரிந்துகொண்டார்கள்.

கடந்த யுத்த காலத்தில் அல்லது அதற்குப் பின்னரும்கூட வவுனியாவிலிருந்து முல்லைத்தீவுக்கு செல்வதென்றால் 4 - 5 மணித்தியாலங்கள் செல்லும். ஆனால், இப்பொழுது 45 நிமிடத்தில் வவுனியாவிலிருந்து முல்லைத்தீவுக்குச் செல்லக் கூடியதாக பாதை அபிவிருத்தி செய்யப்பட்டிருக்கிறது. இவ்வாறு எந்த அபிவிருத்தியை எடுத்துக்கொண்டாலும் ஒரு சிறந்த நிலைதான் அங்கு காணப்படுகின்றது. கல்வித் துறையை எடுத்துக்கொண்டால், கிளிநொச்சி மாவட்டத்தில் 17

மாணவர்களுக்கு ஓர் ஆசிரியர் இருக்கின்றார்; முல்லைத்தீவு மாவட்டத்தில் 16 மாணவர்களுக்கு ஓர் ஆசிரியர் இருக்கின்றார். அதேபோன்று, 2009, 2010, 2011, 2012ஆம் ஆண்டுகளில் O/L, A/L பெறுபேற்றை எடுத்துக்கொண்டால், அங்கு கல்வி மட்டம் உயர்ந்து செல்வதை எங்களால் அவதானிக்கக்கூடியதாக இருக்கின்றது.

ஒட்டுசுட்டான் பிரதேச செயலகத்துக்குட்பட்ட ஓர் இடத்தில் வைத்தியசாலையொன்றை நாங்கள் திறந்து வைத்தோம். அது பாரியளவு நிதியைக்கொண்டு நிருமாணிக்கப் பட்ட ஒரு வைத்தியசாலையாகும். அங்கு நாங்கள் மக்களோடு நேரடியாகக் கதைத்தபொழுது, "இன்று நாங்கள் நிம்மதியாக, சந்தோசமாக இருக்கின்றோம்; அபிவிருத்திப் பணிகளில் இராணுவத்தினர் எங்களோடு கைகோர்த்துச் செயற்படு கின்றார்கள்; அவர்கள் எங்களுக்கு உதவி செய்து கொண்டிருக்கின்றார்கள்" என்று அவர்கள் சொன்னார்கள்.

அதுபோல், நாங்கள் மருதையன்பற்று பிரதேசத்திலிருக் கின்ற கேப்பாப்புலவு என்ற ஓர் இடத்துக்கும் சென்றோம். அங்கு ஐம்பது பயனாளிகளுக்கு அரசாங்கத்தினால் 3,75,000 ரூபாய் வழங்கப்பட்டு வீடுகள் கட்டப்பட்டு வருகின்றது. அதற்குப் பொறுப்பாக இராணுவ உத்தியோகத்தர் ஒருவர் இருக்கிறார். அங்குள்ள நிலைமைகளை நாங்கள் மக்களிடமும் அவரிடமும் கேட்டோம். பொதுவாக அப்படி ஒரு வீட்டைக் கட்டுவதற்கு சுமார் 7 இலட்சம் ரூபாய் செலவாவதாக அவர்கள் சொன்னார்கள். அவர்களுக்கு 3,75,000 ரூபாயினை அரசாங்கம் கொடுக்கின்றது. 97 இராணுவ சிப்பாய்களும் 3 இராணுவ உத்தியோகத்தர்களுமாக மொத்தம் 100 இராணுவத்தினர் சேர்ந்து அங்கு வீட்டுப் பணிகளைச் செய்கின்றார்கள். அதாவது, கட்டிட நிர்மாணத்துக்குத் தேவையான கல், மண் போன்றவற்றைக் கொண்டுவருவது முதல் அத்தனை வேலைகளையும் இராணுவத்தினர் செய்வ தனால் ஒரு வீட்டுக்குச் செலவாகும் தொகையில் மூன்றேகால் இலட்சம் ரூபாய் மீதமாகின்றது. அங்கு இராணுவத்தினர் மக்களுடன் மிகவும் சுமுகமாக இருந்து அந்த வேலைகளை முன்னெடுப்பதை எங்களால் பார்க்கக்கூடியதாக இருந்தது. இந்த வகையில் வடக்கில் அபிவிருத்தி நடவடிக்கைகள் மிகவும் வேகமாக நடந்துவருகின்றன. சுமார் 30 வருடங்களாக அழிவுக்குட்பட்டு அபிவிருத்தி காணாத அந்தப் பிரதேசம் இன்று அபிவிருத்திப் பாதையை நோக்கிச் சென்று கொண்டிருக்கின்றது. இவ்வாறு அங்கு அபிவிருத்தி நடவடிக்கைகளை மேற்கொண்டு வருகையில் அரசாங்கத்தின் மீது பொறாமைகொண்ட சில விசமிகள் எதிர்காலத்தில் அரசாங்கத்தை அரசியல் ரீதியாகப் பலவீனப்படுத்த முடியாது என்பதை உணர்ந்து அங்கு பொய்ப் பிரசாரத்தை மேற்கொண்டு வருவதனை எங்களால் அவதானிக்க முடிந்தது. அது மிகவும் கவலைக்குரிய ஒரு விடயமாகும்.

நாங்கள் இடம்பெயர்ந்த வடக்கு முஸ்லிம்களையும் சந்தித்தோம். அவர்களின் ஆதங்கத்தைக் கேட்டபொழுது மிகவும் கவலையாக இருந்தது. அங்கு மீளக்குடியேறுவதற்குச் செல்கின்ற அந்த முஸ்லிம்களுக்கு பல சவால்கள் இருக் கின்றன. வடக்கின் வசந்தத்தின் மூலமாக அரசாங்கம் அங்கு அபிவிருத்தி நடவடிக்கைகளை மேற்கொண்டு வருகின்றது. மின்சார இணைப்புக்காக அரசாங்கம் பல கோடி ரூபாயைச் செலவு செய்கின்றது; பாதைகள் நிர்மாணிக்கப்படுகின்றன. இவ்வாறு அடிப்படை வசதிகளை அரசாங்கம் செய்து கொண்டிருக்கும்பொழுது மீள்குடியேற்றத்தில் பல தடைகளை எதிர்நோக்குவதாக அந்த முஸ்லிம்கள் கூறுகின்றார்கள். அதாவது அதிகரித்த சனத்தொகைக்கேற்ப உதவி அரசாங்க அதிபரினால் காணிகள் இனங்காட்டப்பட்டு, அவர்கள் அந்தக் காணிகளைத் துப்புரவுசெய்து அங்கு சட்டரீதியாக மீளக் குடியேறச் செல்கின்றபொழுதும்கூட வனத் திணைக்களம் அது தங்களுடைய காணி என்று சொல்கின்றது. நாங்கள் உதவி அரசாங்க அதிபர் காரியாலயத்திலுள்ள வரைபடத்தைப் பார்க்கும்பொழுது வனத் திணைக்களத்திற்கும் அந்தக் காணிக்கும் எந்தத் தொடர்பும் இல்லை. ஆனால், அந்த உத்தியோகத்தர்கள் வந்து அதில் தலையிடுகின்றார்கள். அதுமாத்திரமல்ல இவ்வாறு இந்த மக்கள் குடியேறுகின்ற போது அங்கிருக்கின்ற இனவாதத்தைத் தூண்டுகின்ற இனவாதிகள் சிலர் முஸ்லிம்கள் அங்கு அத்துமீறிக் குடியேறுவதாகப் பொய்ப் பிரசாரங்களைச் செய்கின்றார்கள். இன்றைய 'சுடர் ஒளி' பத்திரிகையில்,

> "வடக்கில் முஸ்லிம்கள் ஆக்கிரமிப்பு. இந்துத் தலைவர்களுடன் பேச்சு"

என்ற தலைப்பில் நான் ஒரு செய்தியைப் பார்த்தேன். அதாவது,

> "வடக்கில் இடம்பெறும் முஸ்லிம்களின் ஆக்கிரமிப்புக்களுக்கு எதிராக நடவடிக்கைகளை மேற்கொள்வதற்காக இந்து சமயத் தலைவர்களுடன் பேச்சு நடத்துவதற்குப் பொது பல சேனா அமைப்புத் தீர்மானித்துள்ளது"

என இந்தப் பத்திரிகையில் மேலும் குறிப்பிடப் பட்டிருந்தது. இதைப் பார்க்கும்பொழுது மிகவும் ஆக்ரோசமாக இருக்கின்றது. ஒரு முஸ்லிமுக்குரிய உரிமை, அவனது இடம், அவனது சொத்துக்கு மறுப்பு ஏற்படுகின்றபொழுது அல்லது அதனை யாராவது பலாத்காரமாக எடுக்க வருகின்றபொழுது அதற்கு எதிராக 'ஜிஹாத்' செய்வது அவனது கடமை என்று 'ஹதீஸ்'களில் கூறப்படுகின்றது. அல் குர்ஆனில் - முஸ்லிம்கள் நம்புகின்ற வேத நூலில் அதேபோன்று முஸ்லிம்கள் பின்பற்றுகின்ற நபி (ஸல்) அவர்களுடைய 'ஹதீஸ்'களில் சொல்லப்படுகின்றது ஒரு 'ஜிஹாத்'இல் மரணிக்கின்றவர் நிச்சயமாகச் சுவனத்துக்குச் செல்வார் என்று. அநியாயமாக இவ்வாறான பொய்ப் பிரசாரங்கள் மேற்கொள்ளப்படுகின்ற பொழுது முஸ்லிம்கள் 'ஜிஹாத்' ஐ நோக்கிச் செல்லவேண்டிய ஒரு துர்ப்பாக்கிய நிலை இந்த நாட்டிலே ஏற்படக்கூடும். இன்று மன்னார் மாவட்டத்திலே இனவாதத்தைத் தூண்டும் விதத்தில் ஒரு குழு செயற்படுகின்றது. 'பொது பல சேனா' அமைப்பும் இந்தக் குழுவுடன் இணைந்து செயற்படுமாயின் நிச்சயமாக இந்த நாட்டின் அரசியல்வாதிகள் மட்டுமன்றி முழு முஸ்லிம் சமூகமும் ஒன்று திரண்டு இச்செயற்பாட்டுக்குத் தக்க பாடம் புகட்டுவதற்காகச் செயற்பட வேண்டிய துர்ப்பாக்கிய நிலைமை ஏற்படும்.

நாங்கள் மன்னார் மாவட்டத்திலே முஸ்லிம் மக்களை மாத்திரம் குடியமர்த்தவில்லை. மடு றோட்டில் கடந்த 1990ஆம் ஆண்டுக்கு முன்னர் வாழ்ந்த 150க்கும் மேற்பட்ட சிங்கள சகோதரர்களையும் குடியமர்த்தியிருக்கின்றோம். அதேபோன்று புதிதாக இடம்பெயர்ந்த மூன்று இலட்சம் தமிழ்க் குடும்பங்களையும் குடியமர்த்தியிருக்கின்றோம். இத்தகையதொரு நிலைமையில் முஸ்லிம் மக்கள் குடியேறும்பொழுது மாத்திரம் சில தமிழ் இனவாதிகளாலும் சில சிங்கள இனவாதிகளாலும் ஏன் பிரச்சினைகள் ஏற்படுத்தப்படுகின்றன? என நான் கேட்கின்றேன். நான் துணுக்காய், பாண்டியன்குளம், மடு, முசலி, வவுனியா வடக்கு ஆகிய பிரதேசங்களின் அபிவிருத்திக்குழுத் தலைவராக இருக்கின்றேன். நான் இறைவனுக்குப் பயந்து நடப்பவன் என்பதால் அப்பிரதேசங்களில் யார் யாருக்குக் காணி இல்லையோ அவர்களை இனங்கண்டு காணி வழங்குவதற் காகச் சிபார்சு செய்து காணிகளை வழங்கிக் குடியமர்த்தி

[ගරු හුනෙයිස් ෆාරූක් මහතා]

யிருக்கின்றேன். அண்மையில் துணுக்காயிலும் பாண்டியன் குளத்திலும் நெடுங்கேணியிலும் உள்ள தமிழ் சகோதரர்களுக்கு காணி வழங்குவதற்குச் சிபார்சு செய்து காணிகளை வழங்கியிருக்கின்றேன். இந்த மூன்று பிரதேச செயலகப் பிரிவுகளிலும் 100 சதவீதம் தமிழ்ச் சகோதரர்களே வாழ்கின்றார்கள். அப்பிரதேச செயலகப் பிரிவுகளிலே காணி இல்லாத அத்தனை தமிழ்ச் சகோதரர்களுக்கும் நான் காணி வழங்கி மீள்குடியேற்றியிருக்கின்றேன். அதேபோன்று மடுப்பிரதேசத்திலே வாழ்ந்த 150க்கும் மேற்பட்ட சிங்கள சகோதரர்களுடைய குடும்பங்களுக்கு நான் காணி வழங்கு வதற்காகச் சிபார்சு செய்திருக்கின்றேன். ஆனால், முசலிப் பிரதேசத்தில் வாழ்கின்ற காணியில்லாத முஸ்லிம் குடும்பங்களுக்கு நாங்கள் காணி வழங்கும்பொழுது, கடந்த காலங்களில் சில தமிழ் இனவாதிகள் தூண்டிவிட்டிருந்த பிரச்சினையை அவர்களுடன் சேர்ந்து 'பொது பல சேனா' என்ற அமைப்பும் முன்னெடுக்கின்றதென்றால் இதற்குத் தக்க பாடம் புகட்ட வேண்டிய காலம் வந்துவிட்டதென்றே சொல்ல வேண்டும்.

வட மாகாணத்தில் குடியேறிய முஸ்லிம் மக்கள் இன்று சொல்லொணாத் துன்பங்களை அனுபவிக்கின்றார்கள். அங்கு குடியேறியவர்கள் மத்தியில் பழைய அகதி, புதிய அகதி என்ற பிரிவினை ஏற்படுத்தப்பட்டு பொது அமைப்புக்களால் வழங்கப்பட்ட நிதிக்கொடைகளும் மற்றும் உதவிகளும் மறுக்கப்பட்டன. அங்குள்ள அகதிகளுக்கு UNHCR 25,000/- ரூபாயை நன்கொடையாக வழங்கிய அதேவேளையில், மீள்குடியேறியுள்ள முஸ்லிம் மக்களை புதிய அகதிகள் எனக் காரணங்காட்டி அவர்களுக்கு அந்த நன்கொடை கொடுக்கப்படாமல் மறுக்கப்பட்டது. சென்ற வாரம் நானும் மாண்புமிகு அமைச்சர் றிஸாத் பதியுதீன் அவர்களும் அப்பிரதேசத்துக்குச் சென்றபொழுது அங்குள்ள முஸ்லிம் மக்கள் மரநிழலில் தங்கியிருப்பதைக் கண்டோம். அவர்களுக்கு ஒரு கொட்டில்கூட வழங்கப்படாத நிலை காணப்பட்டது. அரசாங்கத்தினால்கூட அதனை வழங்க முடியவில்லை. இன்று அப்பிரதேசங்களிலே முஸ்லிம் மக்கள்தாம் அகதிகளாக இருக்கின்றார்கள். எனவே, அங்கிருந்தால் அந்த முஸ்லிம் களுக்கு உதவி வழங்க வேண்டுமென்ற காரணத்தினாலே அப்பிரதேசங்களிலிருந்து NGOக்கள் வெளியேறிவிட்டன.

இந்த நாட்டில் யுத்தத்தை முடிவுக்குக் கொண்டுவருவதற்கும் சுதந்திரத்தையும் சமாதானத்தையும் ஏற்படுத்துவதற்குமாக முஸ்லிம்கள் பங்களிப்புச் செய்திருக்கிறார்கள். இன்று இந்த நாட்டில் தமிழர்கள், சிங்களவர்கள், முஸ்லிம்கள் என்ற பேதமின்றி அனைத்து இன மக்களும் அச்சமின்றி நடமாடுவதற்காக எத்தனையோ முஸ்லிம்களின் உயிர்கள் பலியிடப்பட்டு இரத்தம் சிந்தப்பட்டிருக்கின்றது. எத்தனையோ முஸ்லிம்களின் சொத்துக்கள் அழிக்கப்பட்ட நிலையில் தமது சொந்த இடங்களைவிட்டு 22 வருட காலமாக அகதி முகாம் களில் வாழ்ந்து தியாகம் செய்திருக்கின்றார்கள். அவர்கள் இறைவனிடம் செய்த பிரார்த்தனையின் பயனாகவே இன்று இந்த நாட்டில் சமாதானம் நிலவுகின்றது; இந்த நாட்டிலுள்ள மக்கள் நிம்மதியாக வாழ்கின்றார்கள். எனவே, இத்தகைய சூழலை எவரும் குழப்ப முனைய வேண்டாம் என நாங்கள் அன்பாகக் கேட்டுக்கொள்கின்றோம்.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, please wind up your speech now.

**ගරු හුනෙයිස් ෆාරූක් මහතා**
(மாண்புமிகு ஹுனைஸ் பாறூக்)
(The Hon. Hunais Farook)
Give me just one more minute, Sir.

முஸ்லிம் மக்கள் இனச்சுத்திகரிப்புக்கு உள்ளாக்கப் படுவதற்காகத்தான் வடபகுதியிலிருந்து பலவந்தமாக வெளியேற்றப்பட்டிருக்கின்றார்கள் என LLRC Report இன் 9.1.9.2 பந்தியில் குறிப்பிடப்பட்டிருக்கிறது. அத்துடன், ஆணைக்குழு ஒன்றை அமைத்து அதனூடாக முஸ்லிம்களின் மீள்குடியேற்ற நடவடிக்கைகளைச் செய்தால்தான் அது திருப்திகரமான குடியேற்றமாக அமையும் என LLRC அறிக்கையில் குறிப்பிடப்பட்டிருக்கின்றது. 'பொதுபல சேனா' அமைப்புக் கூறுகின்றது, "இது விடயத்தில் முஸ்லிம்கள் பலவந்தப்படுத்துகின்றார்கள்" என்று. எந்த வகையில் முஸ்லிம்கள் பலவந்தப்படுத்துகின்றார்கள் என்று அவர்கள் நிரூபிக்கட்டும் என்று நான் இந்த நேரத்திலே சவால் விடுகின்றேன். அதாவது, எந்த முஸ்லிமாவது சிங்கள சகோதரர்களுடைய காணியை அல்லது தமிழ்ச் சகோதரர் களுடைய காணியை அத்துமீறிப் பிடித்திருக்கின்றார்கள் என்று அவர்கள் முடியும் என்றால் நிரூபித்துக் காட்டட்டும்! ஆனால், முஸ்லிம்களின் எத்தனையோ உறுதிக் காணிகள் அல்லது அரச permit கொடுக்கப்பட்ட வயல் நிலங்கள் மற்றும் காணிகள் எல்லாம் பலராலும் பறிக்கப்பட்டிருக்கின்றன, பலருக்கு அவற்றின் உரித்து மாற்றம் செய்யப்பட்டிருக்கின்றது என்பதை நாங்கள் நிரூபிக்கத் தயாராக இருக்கின்றோம். ஆனால், இவ்வாறு பொய்ப் பிரசாரம் செய்கின்றவர்கள் அதனை நிரூபிப்பதற்குத் தயாரா? என்று நான் இந்த நேரத்தில் கேட்டு, விடைபெற்றுக் கொள்கின்றேன். நன்றி வஸ்ஸலாம்.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට ගරු වෛද්‍ය ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කොපමණ වේලාවක් තිබෙනවාද? විපක්ෂය වෙනුවෙන් මා විතරයි කථා කරන්න ඉන්නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
බොහොම ස්තුතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ හිතවත් ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා අද දින ඉදිරිපත් කළ මේ යෝජනාව පිළිබඳව ද්වේෂයෙන්, වෛරයෙන් තොරව විපක්ෂයේ අදහස් ඉදිරිපත් කිරීමට මා සූදානම්.

විශේෂයෙන්ම මා එදා ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ රජයේ පුනරුත්ථාපනය, නැවත පදිංචි කිරීම සහ අනාථ වූවන් පිළිබඳ අමාත්‍යවරයා ලෙස උතුර ප්‍රදේශය භාරව කටයුතු කළා. නිදහසින් පසු දකුණෙන් පත් වුණු සිංහල පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් උතුරේ ජනතාවගේ වගකීම මා භාර ගත්තා වාගේම උතුරේ ජනතාව ජාති භේදයෙන්, ආගම් භේදයෙන්

තොරව මාව පිළිගන්නට, මා සමඟ වැඩ කරන්නට ක්‍රියා කළාය කියන එක මා විශේෂයෙන් මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ වෙලාවේ මතක් වෙනවා මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා 2013 පෙබරවාරි මාසයේ 04 වැනිදා නිදහස් උත්සවයට සහභාගි වෙලා කරපු කථාව. මම රූපවාහිනියෙන් එය බලා ගෙන සිටියා, අසා ගෙන සිටියා. ආගම්වාදය පතුරවන අය බෙදුම්වාදයට උඩගෙඩි දෙන, රටට ද්‍රෝහිකම් කරන කොට්ඨාසයක් හැටියටයි ජනාධිපතිවරයා හඳුන්වා දුන්නේ. පාර්ලිමේන්තු කාල සීමාව තුළම ආගම්වාදයටත්, ජාතිවාදයටත් විරුද්ධව  සටන් කළ, ක්‍රියා කළ, පෙනී සිටි මන්ත්‍රීවරයකු හැටියට මට එක අතකින් සතුටක් දැනුණා. නමුත් ඒ සතුට වචනයකට පමණක් සීමා විය යුතු නැති බව මා මේ අවස්ථාවේදී කියන්නට කැමැතියි.

අද ගරු අස්වර් මන්ත්‍රීතුමා උතුරු වසන්තය ගැන කථා කරනවා; ඉදි වෙලා තිබෙන මහා මාර්ග, අනෙකුත් යටිතල පහසුකම් ගැන කථා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නැවත පදිංචි කිරීම් පිළිබඳව බැලුවොත් දෙමළ වේවා, මුස්ලිම් වේවා, සිංහල වේවා ඒ නැවත පදිංචි වූ අය වෙනුවෙන් අංග සම්පූර්ණ පහසුකම් ලැබී නැහැ කියලා සාක්ෂි ඇතිව මට ඔප්පු කරන්නට පුළුවන්. ඔවුන්ට අවශ්‍ය කරන අධ්‍යාපනික පහසුකම්, වෛද්‍ය පහසුකම්, නිවාස පහසුකම් පමණක් නොවෙයි,  වසර ගණනාවක් අවතැන් වූ ජනතාවක් හැටියට ජීවත් වෙලා තමන්ගේ පාරම්පරික ගම් ප්‍රදේශවලට ගියත් ඔවුන්ට ජීවනෝපාය ක්‍රමවේදයක් පවා අද වන තුරු සකස් වෙලා නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පාරවල් ඉදි වෙන එක ඇත්ත; පාලම් ඉදි වෙන එක ඇත්ත.  හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අහිංසක මිනිසුන්ගේ මානුෂික අයිතිවාසිකම් සහ අවශ්‍යතාවන් තවම ඉටු වෙලා නැහැ.

ගරු අස්වර් මන්ත්‍රීතුමා දකුණු ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තයේ වර්තමාන මහ අමාත්‍ය ජයලලිතා මහත්මිය ගැන කථා කළා. ඒ වාගේම  එහි විපක්ෂ නායකවරයා වන කරුණානිධි මහත්මයා ගැන කථා කළා.  හැබැයි අපි අමතක කරන්න හොඳ නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලාංකීය සරණාගතයින්ට අවුරුදු ගණනක් සෙවණ සහ රැකවරණය ලබා දුන්නේ ඉන්දියානු මධ්‍යම රජයේ අනුග්‍රහය යටතේ තමිල්නාඩු ප්‍රාන්ත රජයයි කියන එක. ශ්‍රී ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට එදා අවතැන් වූවන් පිළිබඳ වගකීම දරන ඇමතිවරයා හැටියට මට තමිල්නාඩුවට යන්නට අවස්ථාව ලැබුණා. ඒ අවස්ථාවේදී පමණක් තමිල්නාඩුවේ ශ්‍රී ලාංකීය සරණාගත කඳවුරු 111ක් තිබුණා.

ඒ කඳවුරුවල ශ්‍රී ලාංකීය සරණාගතයින් ලක්ෂයකට අධික පිරිසක් සිටියා. තවත් ලක්ෂයක් තමිල්නාඩුවේ තමන්ගේ ඥාති මිත්‍රාදීන් අතර සිටියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සරණාගතයින්ගේ දරුවන් බොහෝ දෙනෙක් තමිල්නාඩුවට පිං සිද්ධ වෙන්න අධ්‍යාපනය ලබා ගෙන -විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබාගෙන- අද වෛද්‍යවරුන්, ඉංජිනේරුවරුන්, තාක්ෂණිකයන්, විද්වතුන් හැටියට ඉන්නවා. අපි දැන්  ජයලලිතා මහත්මියව විවේචනය කරනවා.  අපි දැන් කරුණානිධි මහත්මයාව විවේචනය කරනවා. ශ්‍රී ලාංකීය ද්‍රවිඩ සරණාගතයින්ට දශක දෙකකට වඩා වැඩි කාල සීමාවක් තුළ රැකවරණය ලබා දීමට හා  ඒ අයගේ දරුවන්ට පාසල් අධ්‍යාපනය, විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබා දීමටත් කටයුතු කිරීම ගැන මම මේ අවස්ථාවේදී කිසිම භයක්, සැකක් නැතුව මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ ඉදිරි පෙළ මන්ත්‍රීවරයෙකු, සිංහල මන්ත්‍රීවරයෙකු හැටියට ඉන්දියාවේ මධ්‍යම රාජ්‍යයටත්, විශේෂයෙන්ම තමිල්නාඩු රාජ්‍යයටත්, කරුණානිධි සහ ජයලලිතා කියන ඒ ද්‍රවිඩ දේශපාලන නායකයාට සහ නායිකාවටත් ස්තුතිවන්ත වෙනවා; කෘතවේදී වෙනවා. ශ්‍රී ලාංකීය ජාතිය කෙළෙහි ගුණ සලකන ජාතියක්. අන්න ඒ නිසා පටු දේශපාලන වාසි ලබා ගැනීමකින් තොරව තමිල්නාඩු රජයට මේ අවස්ථාවේදී අපේ ගෞරවය, ආචාරය විපක්ෂය වෙනුවෙන් මම පුද කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාව ස්ථිර කරමින් කථා කළ අපේ ගරු මන්ත්‍රීතුමා මේ අවස්ථාවේදී හොඳ අදහසක් මේ සභාවේ අවධානයට යොමු කළා. මොකක්ද? මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ රජයම පත් කළ ජනාධිපති කොමිෂන් සභාවක් වන උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන පිළිබඳ වූ ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාව පිළිබඳව. විපක්ෂයක් හැටියට අපි හැම දාම පුන පුනා කියනවා, මේ වාර්තාව මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ වාර්තාවක්, මහින්ද චින්තනයට අනුව ස්ථාපිත කළ කොමිසමක වාර්තාවක්, මේ වාර්තාව ක්‍රියාවට නංවන්න කියලා. ගිය අවුරුද්දේ මාර්තු මාසයේ ජිනීවාහි පැවති මානව හිමිකම් කවුන්සිලයේදී මේ වාර්තාවේ නිර්දේශ ක්‍රියාවට නංවනවා කියලා කිව්වේ අපි නොවෙයි; ආණ්ඩුව වෙනුවෙන් ඒ මානව හිමිකම් කොමිසමට ගිය මේ රජයේ වග කිව යුතු ඇමතිවරුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයක් හැටියට අපි ඉල්ලා සිටින්නේත් මේ ජනාධිපතිවරයා පත් කළ උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන පිළිබඳ වූ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ අඩංගු නිර්දේශ වහාම ක්‍රියාත්මක කරන ලෙසයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද "උතුරු වසන්තය" ගැන කථා කරන කොට බියෙන්, සැකෙන් තොරව,  ඒ අහිංසක මිනිස්සුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් සහ මානව අයිතිවාසිකම් ආරක්ෂා වෙන ආකාරයට ජීවත් වෙන්නට සුදුසු පරිසරයක් තවමත් උදා වෙලා තිබෙනවාද? උතුරේ පළාත් සභා ඡන්දය මේ වන තුරු පවත්වලා තිබෙනවාද? අස්වර් මන්ත්‍රීතුමා කථා කරන කොට කිව්වා, ද්‍රවිඩ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරු මේ සභා ගර්භයේ නැහැයි කියලා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් සුළු ජන කොට්ඨාසයක් නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්. සිංහලයෙක් වුණාට මමත් මේ රටේ සුළු ජන කොට්ඨාසයක් නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්. නමුත් ගරු මන්ත්‍රීතුමනි, මේ උතුරු පළාතේ මන්ත්‍රීවරු පමණක් උතුරේ ජනතාව ගැන කථා කරන්න අවශ්‍යතාවක් නැහැ. අද ඔබතුමා නගන තර්කය අනුව මේ සභාව කල් තැබීමේ යෝජනාව එසේ නම් ගෙන ආ යුතුව තිබුණේ ඩග්ලස් දේවානන්ද ඇමතිතුමා හෝ රිසාඩ් බදියුදීන් ඇමතිතුමායි. උතුරෙන් පත් වුණු ඇමතිවරු අද මේ සභා ගර්භයේ නැති බව ඔබතුමාට අමතක වීම ගැන මම කම්පා වෙන්නේ නැහැ.

වීදුරු ගෙවල්වල ඉඳලා ගල් ගහන එකේ වැදගත්කමක් නැහැ. [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අස්වර් මන්ත්‍රීතුමාගේ කථාවට මම බාධා කළේ නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට බාධා කරන්න එපා.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.)  Jayalath Jayawardana)
එතුමාගේ කථාවට මම බාධා කළේ නැහැ. මම තනියම මේ ස්ථානයේ ඉඳලා ඒ කථාව අහගෙන හිටියා. ගරු අස්වර් මන්ත්‍රීතුමනි, කරුණාකර හරි හෝ වැරැදි හෝ මගේ කථාව අහගෙන ඉන්න වැදගත්කමක් ඔබතුමාට තිබෙන්නට ඕනෑ. මේක මගේ අවස්ථාව. මේ මට අදහස්, උදහස් ප්‍රකාශ කරන්න තිබෙන අවස්ථාවයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වහාම උතුරේ පළාත් සභා ඡන්දය පවත්වන්න කියලා අපි ආණ්ඩුවට බල කර සිටිනවා. කවුරු දිනුවත්, කවුරු පැරදුණත් ප්‍රශ්නයක් නැහැ. මේ තරම් සංවර්ධනයක් කරලා තිබෙනවා නම්, මේ තරම් මහා සුරංගනා

[ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා]

ලෝකයක් උතුරේ ඇති කරලා තිබෙනවා නම්, උතුරේ පළාත් සභා මැතිවරණය පවත්වන්නට ආණ්ඩුව කල් මරන්නේ ඇයි කියන එක පිළිබඳව ගැටලුවක් අපට තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂ නායකතුමා උතුරට යනවා. උතුරේ සංචාරය කරනවා. එතුමා මහජන නියෝජිතයෙක්. එතුමාට උතුරට යන්න අයිතියක් නැද්ද? [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොටි ත්‍රස්තවාදය අවසන් කිරීමේ -හමුදාමය වශයෙන් පරාජය කිරීමේ- සටනේදී අපේ හමුදාවත් සමඟ සෘජුව සටන් කරලා පසුව හමුදාවට භාර වුණු කොටි සෘජු සාමාජිකයන් 12,000ක් පුනරුත්ථාපනය කරලා ඒ අයව සමාජගත කිරීම වැරැදිද? එය වැරැදියි කියලා අපි කියන්නේ නැහැ. මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා කොටින් එක්ක වාඩිවනවා කියලා අපි කියන්නේ නැහැ. කොටි කියන පිරිස අපි සලකන්නේ අවිආයුධ ගත්, වැරැදි මාර්ගයට යොමු වුණු අපේම සහෝදර සහෝදරියන් හැටියටයි. ඔවුන්ට මොන නම කිව්වත් අපට ප්‍රශ්නයක් නැහැ. කොටියා කිව්වත්, බූරුවා කිව්වත්, බල්ලා කිව්වත්, නම ගැන නොවෙයි, මනුෂ්‍යත්වය ගැනයි අපි හිතන්නට ඕනෑ. මේ සෘජු කොටි සාමාජිකයින් මේ ආකාරයට පුනරුත්ථාපනය කරලා සමාජගත කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා හිටපු මහේස්ත්‍රාත්වරයෙක් හැටියට මේ නීති-රීති ගැන ඉතා හොඳින් දන්නවා. කොටින්ට වතුර ටිකක් දුන්, කොටින්ට බත් පාර්සලයක් දුන්, කොටින්ට නවාතැන් දුන් අහිංසක මිනිසුන් කොටි සැක කරුවන් හැටියට සලකා ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ තවම අවුරුදු 10, 15 රිමාන්ඩ්ගත කර තිබෙනවා. සෘජු කොටි සාමාජිකයින්ට නිදහස ලැබෙන විට මේ සැක කරුවන්ට නිදහසක් ලබා දෙන්න කියලා විපක්ෂයෙන් ඉල්ලීම අසාධාරණද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කතෝලිකයෙක් හැටියට නත්තල් දවසේ මේ අයට බත් පාර්සල් ටිකක් ගිහිල්ලා දෙන එක අසාධාරණද, වැරැදිද, දේශ ද්‍රෝහී ක්‍රියාවක්ද කියලා මනුෂ්‍යත්වය ගරු කරන ඔබතුමාගෙන් මම ප්‍රශ්න කරනවා. එක රටක් තුළ ජීවත් වන සිංහල, දෙමළ, මුස්ලිම් කියන මේ හැම ජන කොටසකටම එකම අයිතිවාසිකම්, එකම උරුමයන් සහ එකම අවස්ථාවන් ලැබෙන දේශපාලන විසඳුමක් සොයා ගැනීමට තවමත් මේ රජය ක්‍රියා කරලා නැහැ. කොටි ත්‍රස්තවාදය යුදමය වශයෙන් පරාජය කළ එක ඇත්ත. 2009 මැයි මාසයේ 18වන දා කොටි පරාජය කිරීම සඳහා යුදමය වශයෙන් වූ ක්‍රියාදාමය රජය ජයග්‍රහණය කළා. ඒ ජයග්‍රහණය පිළිබඳව අප තුළ ද්වේශයක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි මේ රටේ ජාතික ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් ලැබිය යුතුයි.

මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා එතුමාගේ මහින්ද චින්තනයේත් මෙය පැහැදිලිව සඳහන් කරනවා. එපමණක් නෙවෙයි, 2009ට ප්‍රථම එතුමා කියනවා, මේ රටේ ජාතික ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් සොයා ගැනීමේදී හොඳම අත්තිවාරම -මුල්ගල, පදනම- දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කියලා. ඊට පසුව එතුමා කියනවා, "2009ට ප්‍රථම මම සූදානම්, දහතුනෙන් එහා ගිය දේශපාලන විසඳුමක් සොයා ගන්නට" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වන තුරු එහෙම විසඳුමක් මේ රජය ප්‍රකාශයට පත් කරලා නැහැ. [බාධා කිරීමක්]

විශේෂ කාරක සභා පත් කිරීම ගැන කථා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අග්‍ර විනිශ්චයකාරවරිය නෙරපීම සඳහා පත් කළ ඒ විශේෂ කාරක සභාව ඒකපාක්ෂිකව හා අත්තනෝමතිකව ක්‍රියා කිරීම පිළිබඳව මේ රටේ ජනතාව පමණක් නොවෙයි විදේශ ප්‍රජාව පවා අද ඉතා හොඳින් දන්නවා. ඉතින්, එවැනි පාර්ලිමේන්තු විශේෂ කාරක සභා පිළිබඳව මේ රටේ ජනතාව තුළ,-

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට රීති ප්‍රශ්නයක් නඟන්න තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා, මොකක්ද රීති ප්‍රශ්නය?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඒ විශේෂ කාරක සභාව පත් කළේ පාර්ලිමේන්තුව විසින්. ඒක නිසා මේ විධියට ප්‍රකාශ කිරීම පාර්ලිමේන්තුව බාල්දු කිරීමක්. මෙතුමා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක්. ඒකපාක්ෂිකව නොවෙයි ඒක කළේ. ඒ කාරක සභාවේදී සාකච්ඡා කරලා පාර්ලිමේන්තුවෙන් සම්මත කරලා තමයි ඒ කටයුත්ත කළේ. Do not devalue Parliament. You are an honourable Member.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
නැහැ, නැහැ. ඒ විශේෂ කාරක සභාව ක්‍රියා කරපු ආකාරය ගැනයි ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමා කථා කළේ. ගරු ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම විශේෂ කාරක සභාව ගැන අද මුළු රටම, මුළු ලෝකයම දන්නවා.

මේ ජාතික ප්‍රශ්නය අපේ පරම්පරාවෙන් පස්සේ තවත් පරම්පරාවකට භාර දෙන, තවත් ඔඩු දුවන්න සලස්වන සෙල්ලම වහාම නවත්වන්න කියලා මා මේ අවස්ථාවේදී වගකීමෙන් යුතුව කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මතක ඇති එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක අගමැතිවරයා ගත් ඒ තීන්දුවට වන්දි ගෙව්වේ එතුමාගේ පරම්පරාවේ අය නොවන බව. එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක අග්‍රාමාත්‍යවරයා සිංහල පමණක් මේ රටේ රාජ්‍ය භාෂාව කිරීමට ගත් ඒ දේශපාලන තීන්දුව නිසා ඊට අවුරුදු 30කට, 40කට පස්සේ වන්දි ගෙව්වේ අපේ පරම්පරාවයි. ඒ නිසා අද ගන්නා වැරැදි දේශපාලන තීන්දුවලට වන්දි ගෙවන්නේ අපි නොවෙයි, අපේ දරුවන්ගේ, දරුවන්ගේ දරුවන්ය කියන එක අමතක කරන්න හොඳ නැහැයි කියන එක මා මේ අවස්ථාවේදී මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අසරණ වුණු, අවතැන් වුණු ජනතාව වෙනුවෙන් ඉන්දීය රජය නිවාස 50,000ක් සඳහා ප්‍රතිපාදන ලබා දුන්නා. ඉන්දීය රජය නිවාස 50,000ක් ඉදි කිරීම සඳහා අවශ්‍ය කරන මූල්‍ය ප්‍රතිපාදන ලබා දුන්නා. ඒ නිවාස 50,000න් නිවාස 4,000ක් මධ්‍යම කඳුකරයේ ද්‍රවිඩ ජනතාව වෙනුවෙන් ලබා දීමටත් ඉන්දීය රජය එකඟ වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වන තුරු ඒ ඉන්දියානු මූල්‍ය ආධාර යටතේ උතුරේ නිවාස කොපමණ ප්‍රමාණයක්ද ඉදි වෙලා තිබෙන්නේ? නිවාස 50,000න් සියයට 10ක්වත් ඉදි වෙලා නැහැ. නිවාස 5,000ක්වත් තවම ඉදි වෙලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ මධ්‍යම කඳුකරයේ ඉන්දියානු සම්භවයක් ඇති ද්‍රවිඩ ජනතාව වෙනුවෙන් නිවාස 4,000ක් ඉදි කරන්නට ඉන්දියානු රජය විසින් ලබා දුන් මූල්‍ය ප්‍රතිපාදනවලින් එක ගෙයක්වත් හදන්නට අද වන තුරු බිම් අඟලක්වත් මේ ආණ්ඩුව ලබා දීලා නැහැයි කියන එක මම වගකීමෙන් යුතුව කියනවා. මෙන්න සංහිඳියාව! මෙන්න වසන්තය උදා වන හැටි!! අපේ රටේ අපේ ජාතික ධනයෙන් නොවෙයි, අපේ ජනතාවගේ මුදල්වලින් නොවෙයි, අපේ බදු මුදල්වලින් නොවෙයි ඒ කටයුත්ත කරන්නේ. කාලකන්නි සාපරාධී යුද්ධය නිසා පීඩා විඳි, අවතැන් වුණු අපේම සහෝදරයන් වෙනුවෙන් අපේ රටේ නිවාස 50,000ක් ඉදි කරන්න අපේ ප්‍රධානම අසල්වැසි රට වන ඉන්දියාව මූල්‍ය ආධාර ලබා දෙන්න එකඟ වෙලා ඒ සඳහා කටයුතු කරද්දීත්, 2009 ඉඳලා මේ වන තුරු එයින් නිවාස සියයට 10ක්වත් ඉදි වෙලා නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මෙන්න උතුරු වසන්තය! මේවා මම කියන්නේ ද්වේශයෙන්, වෛරයෙන් නොවෙයි. විපක්ෂයක කාර්ය භාරයක් තිබෙනවා. ඒ තමයි රජයේ අඩු පාඩු සද්භාවයෙන් පෙන්වා දීම. ජනතාවගේ මතය මේ පාර්ලිමේන්තුව තුළ ප්‍රකාශ කිරීම. විපක්ෂයේ මන්ත්‍රීවරුන් හැටියට අපේ වගකීමක් හා යුතුකමක් නිසායි මේ අවස්ථාවේදී මා මේ කරුණු කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ මව් බිමේ, අපේ රටේ, අපේ ශ්‍රී ලංකාවේ කීර්ති නාමය, ගෞරවය, අභිමානය කැලැල් වෙනවාට, හැල්ලු වෙනවාට, එයට අපහාස වෙනවාට අපි කිසිම දවසක කිසිසේත් කැමැති නැහැ. ඒ වාගේම අපේ රටට කිසිම විදේශ ආක්‍රමණයක්, බලපෑමක් එන්න අපි ඉඩ දෙන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි ඒකෙන් අදහස් කරන්නේ නැහැ අපේ රටේ ජනතාවගේ අයිතිවාසිකම් ගැන කථා නොකරන බවක්.

අද බලන්න, උතුරේ අතුරුදන් වුණු දහස් ගණනක් දරුවන්ගේ අම්මලා තාත්තලා තවමත් අඬනවා; වැලපෙනවා. මේ ආණ්ඩුවට වග කීමක් තිබෙනවා ඒ අතුරුදන් වුණු අය ඉන්නවාද මැරිලාද කියා කියන්න. යුද්ධයකදී ඉවක් බවක් නැතුව දෙපැත්තේම අය මැරෙන එක ප්‍රායෝගිකව සිදු වන දෙයක්. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අම්මලා තාත්තලාට අයිතියක් තිබෙනවා තමන්ගේ දරුවන් ජීවතුන් අතර ඉන්නවාද කියා දැන ගන්න. තමන්ගේ දරුවා අතුරුදන් වෙලා. තමන්ගේ දරුවා තවමත් කොහේ හෝ හිර ගෙදරක, නැත්නම් රැඳවුම් කඳවුරක සිටිනවාද කියා දැන ගැනීමේ පරම අයිතිය ඒ දෙමවුපියන්ට තිබෙනවා. මාත් දරුවන් දෙදෙනෙකුගේ තාත්තා කෙනෙක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා විනිසුරුතුමෙකු හැටියට පිළිගන්නා සිද්ධාන්තයක් තිබෙනවා. අවුරුදු ගණනක් ගිහිල්ලා හෝ අඩු තරමින් ඒ දරුවන්ගේ මරණ සහතිකයක්වත් ඒ දෙමවුපියන්ට ලබා දීම කොයි තරම් සාධාරණද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? අද ඒවා සිදු වෙලා නැහැ මේ උතුරු වසන්තය තුළ. අපි භෞතික සංවර්ධනය ගැන කථා කරනවා. නමුත් මොන තරම් භයෙන්ද ඒ අය ජීවත් වෙන්නේ.

විපක්ෂ නායකතුමා එතුමාගේ සංචාරය පිළිබඳව මේ පාර්ලිමේන්තුවේදී විවෘත ප්‍රකාශයක් කරයි. එතුමා ඒ අවස්ථාවේ කියයි, හමුදාවේ අනෙකුත් ප්‍රධාන නිලධාරින් නොදැනුවත්ව හමුදාවේ එක්තරා ප්‍රධානියකු යටතේ ක්‍රියාත්මක වන හංගපු ස්ථාන - safe houses - උතුරේ කොයි තරම් ක්‍රියාත්මක වනවාද කියලා.

අපි අධි ආරක්ෂිත කලාප ගැන කථා කරනවා. දැන් යුද්ධයක් නැහැ. ආණ්ඩුව කියනවා, "ත්‍රස්තවාදය සියයට සියයක් සම්පූර්ණයෙන්ම විනාශ කළා, පරාජය කළා" කියලා. එහෙම නම් ඒ අධි ආරක්ෂිත කලාපවල පදිංචිවීමේ පරම අයිතිය, උරුමය ද්‍රවිඩ වේවා, මුස්ලිම් වේවා ඒ ජනතාවට ලබා දෙන්නට ඕනෑ. අඩු තරමින් දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ උතුරේ පළාත් සභාව පිහිටුවන්නට මේ ආණ්ඩුව ඇලිමැලි කරනවා නම්, හත් දෙවියනේ! ඒ පළාතේ ආණ්ඩුකාරවරයා හැටියට මුස්ලිම් හෝ වේවා, සිංහල හෝ වේවා, දෙමළ හෝ වේවා සිවිල් නිලධාරියෙකු -සිවිල් පුරවැසියෙකු- මේ රටින් හොයා ගන්න බැරිද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඇයි ඒකට විශ්‍රාමික හමුදා නිලධාරින් පත් කර ගන්නේ? ඒ ආණ්ඩුකාරතුමා පිළිබඳව මගේ පෞද්ගලික වෛරයක් නැහැ; තරහක් නැහැ. නමුත් අපේ අස්වර් මන්ත්‍රීතුමා ඒ තනතුරට නුසුදුසුද? එහෙම නැත්නම් වෙනත් මුස්ලිම් නායකයෙකු හෝ සිවිල් නායකයෙකු ඒ සඳහා නුසුදුසුද? මේ ආණ්ඩුවත් එක්ක විශ්වාසයෙන් වැඩ කරන තව එක ද්‍රවිඩ මහත්තයෙකු හොයා ගන්න බැරිද,? මේ ආණ්ඩුවත් එක්ක විශ්වාසයෙන් වැඩ කරන, ජනාධිපතිවරයාත් එක්ක විශ්වාසයෙන් වැඩ කරන ජාති වාදය, ආගම් වාදය නැති එක සිංහල මහත්තයෙකු සොයා ගන්න බැරිද? අන්න ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි -

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
අඩු පාඩුව මොකක්ද?

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
අඩු පාඩුව නොවෙයි. මේක තේරුම් ගන්න ගරු අස්වර් මන්ත්‍රීතුමාට බුද්ධිය පහළ වෙන්න ඕනෑ. එතුමා හිටපු හමුදා නිලධාරියෙක්. අවුරුදු තිහක්, හතළිහක් මේ අහිංසක ද්‍රවිඩ මිනිසුන් දැක්කේ හමුදාවේ නිලධාරින්. ඒ නිසා ඒ පරිසරය තුළ සිවිල් පරිපාලනය නැවත වරක් ස්ථාපිත වෙන්න ඕනෑ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 25ක කාලයක් ලබා දුන්නා.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයෝ උද්සෝෂණ කරනවා; වර්ජන කරනවා. රුහුණු විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයෝ උද්සෝෂණ කරනවා; වර්ජන කරනවා. කොළඹ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයෝ උද්සෝෂණ කරනවා; වර්ජනය කරනවා. ඒ තමයි විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්ගේ ගතිය. මා කොළඹ විශ්වවිද්‍යාලයෙන් උපාධිය ලබා ගත්ත උපාධිධාරියෙක්. යාපනය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ඒ අයිතිය නැද්ද? උද්සෝෂණ කරන්න, වර්ජන කරන්න ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක් ඒ අයට නැද්ද? අපි නැවත වරක් මේ කොහාටද යන්න යන්නේ?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි, ගරු මන්ත්‍රීතුමා අවසන් කරන්න.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
මම පැහැදිලිව කියනවා, ප්‍රායෝගිකව මොන සංවර්ධනය තිබුණත් මේ අහිංසක මිනිසුන්ගේ නිදහස, මේ අහිංසක මිනිසුන්ගේ සමාන අයිතිවාසිකම්, මේ අහිංසක මිනිසුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය ආරක්ෂා වෙලා නැති බව. එක මන්ත්‍රීතුමෙකු සඳහන් කරපු ආකාරයට උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම තාමත් සිදු වෙලා නැහැ. ඒ

[ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා]

ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය, ඒ සිවිල් අයිතිය, ඒ මානව හිමිකම් අයිතිය, බියක් සැකක් නැතිව ජීවත් වීමේ අයිතිය ඒ ජනතාවට ලබා දෙන්නේ නැතිව මොන වසන්තය තිබුණත් වැඩක් නැහැයි කියන පණිවුඩය දෙමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අස්වර් මන්ත්‍රීතුමා ඉතාම වැදගත් යෝජනාවක් අද මේ සභාවට ගෙනැල්ලා තිබෙනවා. අපේ ජයලත් ජයවර්ධන ගරු මන්ත්‍රීතුමා කිව්වා, මේ යෝජනාව ඩග්ලස් දේවානන්ද ඇමතිතුමා හෝ රිසාඩ් බදියුදීන් ඇමතිතුමා වාගේ කෙනෙකු ගෙනාවා නම් හොඳයි කියලා. නමුත් ඩග්ලස් දේවානන්ද ඇමතිතුමාට, රිසාඩ් බදියුදීන් ඇමතිතුමාට සභාව කල් තබන යෝජනා ගෙනෙන්න පුළුවන්ද බැරිද කියන කාරණය පිළිබඳව එතුමා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයකු හැටියට තේරුම් ගත්තොත් හොඳයි කියන එක මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ. අස්වර් මන්ත්‍රීතුමා එතුමාගේ ප්‍රදේශයේ ප්‍රශ්නයක් නොව, ජාතික වශයෙන් වැදගත් වන, කථා බහට ලක් කළ යුතු මාතෘකාවක් තමයි අද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව හැටියට ගෙනැල්ලා තිබෙන්නේ.

අපේ ජයලත් ජයවර්ධන ගරු මන්ත්‍රීතුමා හිතනවා, භෞතික සංවර්ධන කිසිවක් නොකර LLRC වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කළාම, ඒ නැති වෙච්ච අය පිළිබඳව තොරතුරු ටික ලබා දුන්නාම මේ සංහිඳියාව ඇති වෙයි කියලා. ගරු ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමනි, ඉස්සෙල්ලාම ඔබතුමාට කියන්න ඕනෑ මේ ප්‍රදේශවල බිම් බෝම්බ ඉවත් කරන්න මේ ආණ්ඩුවට සිදු වුණ බව.

එල්ටීටීඊ ත්‍රස්තවාදීන් අල්ලාගෙන තිබුණු උතුරේ ප්‍රදේශවල හැම තැනකම බිම් බෝම්බ තිබුණා. අහිංසක දෙමළ ජනතාව ජීවත් වූ ඒ ප්‍රදේශවල බිම් බෝම්බ ඉවත් කිරීමේ කාර්ය භාරය තමයි අපේ ආණ්ඩුව රජයක් හැටියට විශේෂ අවධානයක් යොමු කරලා ඉටු කළේ. ඒ බව අමතක කරන්න එපා. LLRC වාර්තාවේ නිර්දේශත් ක්‍රියාත්මක කරමු. අපේ රණ විරුවෝත් අතුරුදහන් වුණා; නැති වුණා. ඒ අයගේත් අම්මලා තාත්තලා දුකෙන් තමයි ඉන්නේ. තවමත් ඒ අය දුකෙන් ඉන්නේ. රෑට ගෙයි මිදුලේ ගහකින් ගෙඩියක් වැටුණත් ඒ අම්මා තාත්තා තවමත් නැඟිටිනවා තමන්ගේ දරුවා ඇවිල්ලා දොරටවත් ගැහුවාද කියලා හිතලා. උතුරේ වාගේම දකුණේත් ඒ විධියට දුක් විඳින, අහිංසක අම්මලා තාත්තලා ඉන්නවා. කමක් නැහැ, අපි ඒවා පැත්තක තියලා උතුරේ අම්මලා තාත්තලාටත් අවශ්‍ය සහයෝගය ලබා දෙමු. හැබැයි එහේ බිම් බෝම්බ ටික ඉවත් කළේ නැත්නම්, විනාශ කරලා තිබුණු, ඒ ප්‍රදේශයට යන පාරවල් හැදුවේ නැත්නම්; ඒ-9 මාර්ගය හදන්නේ නැත්නම්, ඒ ප්‍රදේශවල විනාශ කරපු බෝක්කු, පාලම් ඉදි කරලා දෙන්නේ නැත්නම් සංහිඳියාවක් ඇති වෙනවාද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ප්‍රදේශවල අහිංසක දරුවෝ දැන් පාසල් ගිහිල්ලා අධ්‍යාපනය ලබනවා. ජයලත් ජයවර්ධන ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය ගැන කථා කළා. මේ අවුරුද්දේ උසස් පෙළ ප්‍රතිඵල ආවා. ගණිතය සහ විද්‍යා අංශවලින් පළමුවැනි ස්ථානය ලබා ගත් දෙදෙනා ඉන්නේ කොහේද? ඒ දෙදෙනා ඉන්නේ අපේ දකුණේ හම්බන්තොට දිස්ත්‍රික්කයේයි. ඊළඟට, දෙවැනියා ඉන්නේ කොහේද? දෙවැනියා ඉන්නේ උතුරේයි. ඒ තත්ත්වය නිර්මාණය වුණේ මේ නිදහස ලැබීම නිසා නොවෙයිද කියන එක අපි තමුන්නාන්සේලාගෙන් අහනවා.

තමුන්නාන්සේලා අද සංහිඳියාව ගැන කථා කරනවා. 1983 දී තමුන්නාන්සේලා කළු ජූලියට නායකත්වය දුන්නා. එදා සංවර්ධන සභා මැතිවරණයේදී කුරුණෑගල දිස්ත්‍රික් එක්සත් ජාතික පක්ෂ නායකයන් ඇතුළු විශාල පිරිසක් යාල්දේවි දුම්රියේ නැඟලා ගිහින් ආසියාවේ විශාලතම පුස්තකාලය ගිනි තැබුවා. ඒ ප්‍රදේශයේ අහිංසක දෙමළ ජනතාවගේ අධ්‍යාපනය කඩාකප්පල් කරන්න නායකත්වය දුන්නේ එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ තමුන්නාන්සේලා නොවෙයිද කියලා අපි අහනවා. ඒ නිසා මේ මොනවාවත් නොදන්නා තොත්ත බබාලා විධියට මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ කථා කරන්න එපා. අපි මේ වෙලාවේ අගය කළ යුතු දේ අගය කරන්න ඕනෑ. තමුන්නාන්සේලා දන්නවා, බෙදුම්වාදී එල්ටීටීඊ ත්‍රස්තවාදය නිසා මේ රටේ ජීවිත සහ දේපළ විශාල ප්‍රමාණයක් විනාශ වුණු බව. ඒ විතරක් නොවෙයි. එදා ඒ අහිංසක දෙමළ ජනතාවගේ ළමයින්ට ඉස්කෝලයේ යන්න තිබුණු, අධ්‍යාපනය ලබන්න තිබුණු අයිතිය කඩාකප්පල් කරලා, ඒ අයිතිය කප්පාදු කරලා, ඔවුන් බලයෙන් එල්ටීටීඊ සංවිධානයට බඳවාගෙන, සයනයිඩ් කරල බෙල්ලේ එල්ලලා, ළමා සොල්දාදුවන් හැටියට පාවිච්චි කළා. ඒ වාගේම, ඒ ප්‍රදේශවල දෙමළ ජනතාවගේ ජන ජීවිතය සම්පූර්ණයෙන් කඩාකප්පල් කරලා, කෘෂි කර්මාන්තය විනාශ කර දාලා ඒ මිනිස්සු අන්ත අසරණ තත්ත්වයට පත් කළා.

තමුන්නාන්සේලා කියනවා ඉන්දියාව සරණාගතයන්ට රැකවරණය දුන්නා කියලා. සරණාගතයන් බිහි වුණේ අප හින්දාද? මේ ආණ්ඩුව නිසාද? මහින්ද රාජපක්ෂ මැතිතුමා නිසාද? ඔවුන් සරණාගතයන් බවට පත් කළේ එල්ටීටීඊ සංවිධානයයි. ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මේවා පිළිබඳව දැන්වත් සුභවාදීව දකින්න. අද වයිකෝලා උද්ඝෝෂණය කරනවා. අද බෙදුම්වාදී සංකල්පවලින් මිදිලා නැති වයිකෝලා වැනි අය වෙනුවෙන් කඩේ යන්න එපා කියලා අපි මේ වෙලාවේ විපක්ෂයට කියන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් මේ යෝජනාව ඉදිරිපත් කළේ රජය උතුර ප්‍රදේශයේ විශාල සංවර්ධනයක් කර තිබෙන නිසයි. ඊයේ පෙරේදා අතිගරු ජනාධිපතිතුමා ඒ ප්‍රදේශයට ගිහිල්ලා, යාපනය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව කැඳෙව්වා. ඒ ප්‍රදේශයේ පළාත් පාලන ආයතනය තිබෙන්නේ TNA සංවිධානය යටතේයි. නමුත් එතුමා ඔවුන්ට අවශ්‍ය පහසුකම් ටික දීලා, ඒ පළාත් පාලන ආයතනවලට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර ලබා දීලා ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කරන්න අවශ්‍ය මඟ පෙන්වීම කළා. ඒ ප්‍රදේශයේ වගකීම් දරන සමහර අය රජයෙන් ලබා දුන් මුදල්වත් හරියට පරිහරණය කරලා අහිංසක ජනතාව වෙනුවෙන් යුතුකම් ඉෂ්ට කරලා තිබුණේ නැහැ, ඒ ප්‍රදේශයට ලබා දීලා තිබෙන මුදල් හරියාකාරව යොදවා නැහැ. රාජ්‍ය නායකයා හැටියට අතිගරු ජනාධිපතිතුමා ගිහින් ඒවා පිළිබඳව කථා කරන තෙක් ඒ මුදල්වලින් ප්‍රයෝජන ගන්නවත් කටයුතු කර නැහැ. ඇයි ඒ? ඒ, එහෙම කටයුතු කළොත් ඒ තුළින් මේ ආණ්ඩුවට යම්කිසි වාසියක් අත් වේවි කියලායි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මහින්ද රාජපක්ෂ අතිගරු ජනාධිපතිතුමා වීරෝදාර රණ විරුවනුත් එක්ක එකතු වෙලා මානුෂික මෙහෙයුම ඔස්සේ උතුර නිදහස් කරගෙන, "උතුරු වසන්තය" ආරම්භ කරලා, ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාට එහි නායකත්වය, වගකීම බාර දීලා පියවරෙන් පියවර ඉදිරියට ගිය නිසා අද ඒ ප්‍රදේශයේ මාර්ග පද්ධතිය සංවර්ධනය වෙලා; අධ්‍යාපන පද්ධතිය සංවර්ධනය වෙලා; පාසල් ටික ඇරිලා; ආගමික මධ්‍යස්ථාන ටික වැඩිදියුණු වෙලා; වාරි පද්ධතිය දියුණු කරන්න, කෘෂි කර්මාන්තය දියුණු කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ නිර්මාණය වෙලා; ඒ වාගේම, සංචාරක ව්‍යාපාරය, ධීවර ව්‍යාපාරය ඇතුළු සියලු කර්මාන්ත ඉදිරියට ගෙනෙන්න කටයුතු කෙරිලා ශීඝ්‍ර සංවර්ධනයකට උතුර ප්‍රදේශය යොමු කරලා තිබෙනවා. ඒ නිසා ඒ වෙනුවෙන් ඇප කැප වූ අපේ රටේ රාජ්‍ය නායකයා වන අතිගරු ජනාධිපතිතුමාටත්, මේ රජයටත් අපේ ගෞරවය පුද කිරීම, ඒ කටයුතු මේ උත්තරීතර

පාර්ලිමේන්තුවේ ඇගයීමට ලක් කිරීම ඉතාම වැදගත්ය කියන කාරණය මා සඳහන් කර සිටිනවා.

අද දින මෙම යෝජනාව ඉදිරිපත් කරමින් මේ පිළිබඳව අපේ අවධානය යොමු කරවන්නට කටයුතු කරපු ගරු අස්වර් මන්ත්‍රීතුමාට අපේ ගෞරවය සහ ස්තුතිය පළ කරමින් මා නිහඬ වනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට පිළිතුරු කථාව කිරීමට ගරු එස්.එම්. චන්ද්‍රසේන නියෝජ්‍ය අමාත්‍යතුමා.

**ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. S.M. Chandrasena - Deputy Minister of Economic Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උතුරු වසන්තයේ සංවර්ධන කටයුතු පිළිබඳව ගරු අස්වර් මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද සභාව කල් තැබීමේ යෝජනාව පිළිබඳව කථා කරන්නට ලැබීම ගැන මා ඉතාම සතුටු වනවා. මොකද, එල්ටීටීඊ ත්‍රස්තවාදය අවසන් වන අවස්ථාව වනකොට මා ජාතිය ගොඩනැඟීමේ අමාත්‍යවරයා හැටියටයි කටයුතු කරමින් සිටියේ. යුද්ධය අවසන් වනවාත් එක්කම එම ප්‍රදේශ නැවත ගොඩනඟන්නට ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා ඇතුළු අප සියලු දෙනා එහි වැඩ කටයුතු ආරම්භ කළා. යුද්ධයේ අළු යට ගිනි තිබෙන වෙලාවක තමයි අප එහි ගියේ. ඒ නිසා එම කටයුත්තේ බැරෑරුම්කම අපට හොඳින් තේරුණා. ඒ නිසා එදා උතුරේ තිබුණු තත්ත්වයත්, අද උතුරේ තිබෙන තත්ත්වයත් හඳුනා ගන්නට බැරි නම්, උතුරු වසන්තය පිළිබඳව තේරුම් ගන්නට බැරි නම්, අපට මොකක් හරි මානසික ආබාධයක් තිබෙන්නට ඕනෑ.

මට මතකයි යුද්ධය අවසන් වනවාත් එක්කම, අපට අපහසුවකින් තොරව අනුරාධපුරයේ සිට උතුරට යන්න හැකියාව ලැබුණා. එදා අනුරාධපුරයේ සිට උතුරට යන්න විතරක් පැය පහක පමණ කාලයක් ගත වුණා. අද අපි පැය දෙකක්, දෙකහමාරක් වැනි කාලයක් තුළ අනුරාධපුරයේ සිට උතුරට ගමන් කරනවා. ඒකට තමයි වසන්තය කියන්නේ. ගාට ගාට, වළවල්වල වැටි වැටී ගිය කාලයට වඩා පහසුවෙන් එහි යන්න එන්න පුළුවන් හොඳ වසන්ත කාලයක් දැන් උදාවෙලා තිබෙනවා. ඒ වාගේම ප්‍රභාකරන් අවසන් වුණු දවසේ තමයි උතුරට වසන්තය එළඹුණේ. ඒක තමයි පළමුවැනි උතුරු වසන්තය. අපි A9 පාර හදලා උතුරේ ජනතාවට එහා මෙහා යන්න පහසුකම් සපයනකොට ඒකට තමයි වසන්තය කියන්නේ. ඒක ගැන තමයි අද අපේ ගරු අස්වර් මන්ත්‍රීතුමා සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ.

ඊළඟට වල් බිහි වෙලා තිබුණු, එල්ටීටීඊ ම්ලේච්ඡ ත්‍රස්තවාදීන් විසින් බෝම්බ වළ දමලා විනාශ කරලා තිබුණු වැව් පද්ධතිය අද හදලා තිබෙනවා. ඒ වාගේම විදුලි කණු කඩලා, අවුරුදු 30ක් තිස්සේ ජනතාව අඳුරේ තබපු ඒ උතුරට අද වනකොට විදුලි ආලෝකය ලබා දෙන්න රුපියල් කෝටි ගණනක් මුදල් වියදම් කරලා තිබෙනවා. ඒවා නිකම් කෙරෙන්නේ නැහැ. මේ නිකම් වැල් අදිනවා නොවෙයි. විශාල වියදම් දරලා ඒ කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම ජල සම්පාදන ක්‍රම ඇති කරමින් උතුරේ ජනතාවට ජලය ලබා දෙන්න අවශ්‍ය කටයුතු කරගෙන යනවා. මේවා එක රැයින් කරන්න පුළුවන් දේවල් නොවෙයි. අවුරුදු 30ක් තිස්සේ කරපු විනාශයක් තිබෙන්නේ. අද වව්නියාවේ ඉඳලා උතුර දක්වා දුම්රිය මාර්ගය හදාගෙන යනවා. එක පැත්තකින් තලෙයි මන්නාරම දක්වා දුම්රිය මාර්ගය හදාගෙන යනවා. අවුරුදු 30ක් තිස්සේ එල්ටීටීඊ ත්‍රස්තවාදීන් විසින් මේවා විනාශ කර තිබුණේ අවුරුදු දෙකකින් ගොඩගන්නට පුළුවන් විධියට නොවෙයි. ඒ නිසා ශ්‍රී ලාංකිකයන් හැටියට අපි ආඩම්බර වන්නට ඕනෑ, අපේ රාජ්‍ය නායකයා ලෙස අතිගරු ජනාධිපතිතුමා විසින් යුද්ධයෙන් පීඩාවට පත් වුණු උතුරේ ජනතාවට එහි ජීවත් වන්නට හොඳ පරිසරයක් මෙවැනි කෙටි කාලයක් තුළ යළි සකස් කර දීම ගැන.

අපේ ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමාත් කියපු ආකාරයට යුද්ධය ආරම්භ කළේ අපි නොවෙයි. 1983 පැවැති කළු ජූලියත් එක්ක තමයි මේ යුද්ධය ආරම්භ වුණේ. අපි දන්නවා, කොළඹ හිටපු දෙමළ ජනතාවට ගැහුවා. ඒ අය පදිංචි වී සිටි ස්ථාන ගිනි තැබුවා. මේවා හොරෙන් කියන දේවල් නොවෙයි. සාවද්‍ය දේවල් නොවෙයි. අන්තිමට හොඳින් හිටපු මිනිසුන්ව කොටි ත්‍රස්තවාදීන් බවට පත් කළේ එදා පැවැති ආණ්ඩුවයි. එදා පැවැති ආණ්ඩුව තමයි දෙමළ මිනිසුන්ව කොටි ත්‍රස්තවාදීන් බවට පත් කළේ. ඒක කවුරුත් දන්නවා. ඒ කාලයේම නියපොත්තෙන් කඩන්නට තිබුණු දේ ඊට පසුව අවුරුදු 30 ගණනක් තිස්සේ මහා ගහක් බවට පත් කළා.

අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා සිටියේ නැත්නම් උතුරට වසන්තය නොවෙයි, කොහේටවත් වසන්තය නැහැ. එහෙටත් වසන්තය නැහැ; මෙහෙටත් වසන්තය නැහැ. දකුණටත් වසන්තය නැහැ; උතුරටත් වසන්තය නැහැ. ශ්‍රේෂ්ඨ නිර්භීත නායකයකු හැටියට එතුමා මේ කටයුත්ත අතට අරගෙන මේ ජයග්‍රහණය ලබා ගත් නිසා තමයි අපට අද මෙහෙම කථා කරන්නට පුළුවන් වෙලා තිබෙන්නේ.

එදා පාරක යන්න බැහැ. Barriers දමාගෙන checkpoints කීයකින් පරීක්ෂාවට ලක් වන්නට සිදු වුණාද? වාහනයකින් ගමනක් යන ජනතාවට කී පොළකින් බහින්න සිදු වුණාද? මම හිතන විධියට අනුරාධපුරයේ සිට කොළඹට එද්දී දහ පොළකින් විතර පරීක්ෂාවට ලක් වන්නට සිදු වුණා. ඇඟ හැම තැනම අතගාලා පරීක්ෂා කරලා බලල තමයි මෙහාට එව්වේ. checkpointsවලින් ඇඟ හැමතැනම අතගාලා බලලා තමයි මෙහාට එව්වේ. ඒ විධියේ තත්ත්වයක් රටේ තිබුණේ. ඒ කාලයේ අපි ඉස්පිරිතාලයක් ළඟට ආවත් ඒ ඉස්පිරිතාලය ළඟත් බෝම්බ.

ළමයා ඉස්කෝලෙට යන කොටත් එහෙමයි. අපි ඒවා අමතක කරන්න හොඳ නැහැ. ළමයා ඉස්කෝලෙට යවලා දෙමවුපියෝ දෙදෙනා ගේට්ටුව ළඟ ඉන්නවා, ළමයා ආපසු අර ගෙන එන්න. මොකද, ඉස්කෝලෙට යවන ළමයා නැවත ගෙදරට එයිද කියලා සැකයි. අපේ ප්‍රදේශවල අනුරාධපුර ප්‍රදේශයේ හේනට ගිය ගොවි මහත්තයා ආපසු ආවේ නැහැ. බෙල්ල කපලා මරා දමලා. විලච්චිය ප්‍රදේශයේ කුඹුරේ වට්ටක්කා ඇට ටික හිටවන්න ගිය ගෙවිලියත් ගොවියාත් මරලා ඔවුන්ගේ බත් මුල කොටි අර ගෙන ගිහිල්ලා කාලා තිබුණා. ඔවුන් මරලා අන්තිමට බත් ටිකත් අර ගෙන ගිහිල්ලා කාලා. ඒ තරම් ම්ලේච්ඡ විධියට හැසිරුණ ත්‍රස්තවාදයක් තිබුණ රටක් මේක. ඒවා අමතක කරලා කථා කරන එක ගැන අපි ඉතාම කනගාටු වෙනවා.

අපේ ගරු ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමා කිව්වා එතුමා ඒ රජය යටතේ උතුර පුනරුත්ථාපනය කරන්න භාර දීලා හිටපු ඇමතිවරයා කියලා. නමුත් ගරු අස්වර් මන්ත්‍රීතුමාට කියනවා, දැන් මෙතැන උතුරේ අය නැහැයි කියලා. එහෙම නම් එදා තමුන්නාන්සේලාත් උතුර පුනරුත්ථාපනය කරන්න උතුර සංවර්ධනය කරන්න ඇමති ධුරය දුන්නේ මෙහේ කෙනකුට නේ. එහෙම නම් ගරු අස්වර් මන්ත්‍රීතුමාට උතුර වෙනුවෙන් කථා කරන්නත් පුළුවන්, දකුණ වෙනුවෙන් කථා කරන්නත් පුළුවන්, බටහිර වෙනුවෙන් කථා කරන්නත් පුළුවන්. එතුමාට නැඟෙනහිර වෙනුවෙනුත් මේ පාර්ලිමේන්තුවේ කථා කරන්න පුළුවන්. උතුර

[ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා]

පුනරුත්ථාපන කටයුතුවලට ඇමතිවරයා හැටියට සිංහල මන්ත්‍රීවරයෙක් දැම්මා නම් ගරු අස්වර් මන්ත්‍රීතුමාට මෙතැන උතුර ගැන කථා කරන්න බැරිද? අපි කථා කරන කොට අනෙක් අය ගැනත් හිතලා කථා කරන්න ඕනෑ. එතුමා ඒ විධියට කථා කිරීම ගැන මම හරි කනගාටු වුණා.

විශේෂයෙන්ම මේ පාර්ලිමේන්තුවේ සිංහල, දෙමළ, මුස්ලිම් ජාතීන් හැටියට අප සියලු දෙනාටම රට ගැන කථා කරන්න පුළුවන්; ඇමතිකම් කරන්න පුළුවන්; උතුර වෙනුවෙනුත් පුළුවන්; දකුණ වෙනුවෙනුත් පුළුවන්. එකමුතු වුණු ශ්‍රී ලාංකික ජාතියක් හැටියට අපි මේ පාර්ලිමේන්තුවේ එහෙම ඉන්න ඕනෑ. අපට ඒක බෙදන්න බැහැ. අපි දන්නවා, අතිගරු ජනාධිපතිතුමා මේ රටේ ත්‍රස්තවාදය ඇති කළේ  නැහැ, ත්‍රස්තවාදය අවසන් කළා. ඒ වාගේම අද ඒ අය පුනරුත්ථාපනය කරනවා. බරපතළ වැරදි කරපු අය ජීවත් කරවන්න කරන්න පුළුවන් හැම දෙයක්ම කරන බව අපි දන්නවා.

එල්ටීටීඊ සංවිධානයේ හිටපු අය අද අපේ සිවිල් ආරක්ෂක සේවයට බඳවා ගෙන ඉන්නවා. කොච්චර පරිවර්තනයක්ද?  යුද හමුදාවට බඳවා ගන්නවා. අපි ඒ අය කොන් කරලා නැහැ. ඒ නිසා අද ලොකු එකමුතුවක් -ඒකාබද්ධ කිරීමක් - කර ගෙන යන වෙලාවක්. ඒ නිසා එකම ජාතියක් හැටියට අපි ඔක්කොම එකතු වෙලා, එහාට මෙහාට කඩේ යන්නේ නැතිව, මේවාට සහයෝගය දීලා නැවතත් මේවා නොවෙන්න කටයුතු කරන්න ඕනෑ. ජයලලිතා වර්ණනා කරලා වැඩකුත් නැහැ. තවත් කෙනෙක් වර්ණනා කරලා වැඩකුත් නැහැ. ජයලලිතාගේ කාලයේ කරපු දේවල් අපි දන්නවා. නොදන්නා අය නොවෙයි නේ. කවුරුත් ඒවා දන්නවා නේ. ඒ විධියට ජාතිවාදය ඇති කරලා වෙනත් රටවලින් ලකුණු ගන්න අපි කටයුතු කරන්නේ නැහැ. අපට එහෙම ලකුණු අර ගෙන වැඩකුත් නැහැ. [බාධා කිරීමක්] ඔව්. මුදල් දුන්නා. උදවු කළා. අපි විතරක් නොවෙයි, ඒ ගොල්ලොත් ඉල්ලා ගෙන කෑවා. අද හැම දෙනාම බේරා ගෙන, රට සහ පරිසරය ගොඩ අර ගෙන තිබෙනවා.

අද අපි කරන්න තිබෙන්නේ මේ රට බේරා දුන්න නායකයා ආරක්ෂා කරන එකයි. අද ජනාධිපතිවරයා වශයෙන් ඉන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයා ද, විරුද්ධ පක්ෂයේ කෙනෙක් කියලා ඉන්න නොවෙයි තිබෙන්නේ. එතුමා රටට කරන්න තිබෙන යුතුකම් ඉටු කළා. ජාතියට යුතුකම් ඉටු කළා. ඒ නිසා අපි එතුමාට ගරු කරන්න ඕනෑ. ගෞරව කරන්න ඕනෑ. ජීවත්ව ඉන්න කොට කවුරුත් ගරු කරනවා අඩුයි කියලා අපි දන්නවා. මම හිතන්නේ මේ පරම්පරාව විතරක් නොවෙයි, මේ රට බේරා  ගත් නායකයා හැටියට එතුමාට අවුරුදු දහස් ගණනකට ඉතිහාසගත වෙලා ඉවරයි.  මොනවා කථා කළත් එතුමාට ජාත්‍යන්තරයෙනුත් ඒ ගෞරවය ලැබෙනවා.

මම මීට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. අපේ රටට නිදහස ලබා දීලා, උතුර නිදහස් කර ගෙන උතුරට වසන්තය උදා කර දෙන්න විශාල සේවයක් කරන අතිගරු ජනාධිපතිතුමාට අපේ ස්තුතිය සහ ගෞරවය පුද කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 7.08 ට, 2013 පෙබරවාරි 20 වන බදාදා අ.භා. 1.00 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி. ப. 7.08 மணிக்கு பாராளுமன்றம், 2013 பெப்ரவரி 20, புதன்கிழமை பி.ப.1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Adjourned accordingly at 7.08 p.m. until 1.00 p.m. on Wednesday, 20th February, 2013.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.**

**சந்தா ;** ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.